198 වන කාණ්ඩය - 5 වන කලාපය
தொகுதி 198 - இல. 5
Volume 198 - No. 5

2011 මාර්තු 24 වන බ්‍රහස්පතින්දා
2011 மார்ச் 24, வியாழக்கிழமை
Thursday, 24th March, 2011

පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

අන්තර්ගත ප්‍රධාන කරුණු

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්:
අල් ජමියාතුල් ග්හව්සියා (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත -[ගරු හුනෙයිස් ෆාරුක් මහතා] - පළමුවන වර කියවන ලදී

වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනත් කෙටුම්පත:
දෙවන වර සහ තුන්වන වර කියවා සම්මත කරන ලදී

බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත:
දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී

සුරාබදු (සංශෝධන) පනත් කෙටුම්පත:
දෙවන වර සහ තුන්වන වර කියවා සම්මත කරන ලදී

විදුලිසංදේශ බදු පනත් කෙටුම්පත:
දෙවන වර සහ තුන්වන වර කියවා සම්මත කරන ලදී

දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත:
දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී

බදු අභියාචනා කොමිසම පනත් කෙටුම්පත:
දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී

කල් තැබීමේ යෝජනාව:
පළාත් පාලන මැතිවරණය පැවැති දින සහ ඊට පෙර රාජ්‍ය සම්පත් අනිසි භාවිතය

பிரதான உள்ளடக்கம்

வினாக்களுக்கு வாய்மூல விடைகள்

தனி உறுப்பினர் சட்டமூலங்கள்:
அல் ஜாமியாத்துல் கவ்ஸிய்யா (கூட்டிணைத்தல்)– மாண்புமிகு ஹுனைஸ் பாரூக்] – முதன்முறை மதிப்பிடப்பட்டது

துறைமுக, விமான நிலைய அபிவிருத்தி அறவீடு சட்டமூலம்:
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது

வங்கிகளால் வழங்கப்பட்ட கடன்களை அறவிடுதல் (விசேட ஏற்பாடுகள்) (திருத்தம்) சட்டமூலம்:
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு, திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

மது வரி (திருத்தம்) சட்டமூலம்:
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது

தொலைத்தொடர்பு அறவீடு சட்டமூலம்:
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது

உண்ணாட்டரசிறை (திருத்தம்) சட்டமூலம்:
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு, திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

வரி மேன்முறையீட்டு ஆணைக்குழு சட்டமூலம்:
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு, திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

ஒத்திவைப்புப் பிரேரணை:
உள்ளூராட்சித் தேர்தல் தினத்திலும் அதற்கு முன்னரும் அரச வளங்களின் துஷ்பிரயோகம்

PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS

PRIVATE MEMBERS' BILLS:
Al-Jamiathul Ghawsiyyah (Incorporation) Bill - [The Hon. Hunais Farook] - Read the First time

PORTS AND AIRPORTS DEVELOPMENT LEVY BILL:
Read a Second, and the Third time, and passed.

RECOVERY OF LOANS BY BANKS (SPECIAL PROVISIONS) (AMENDMENT) BILL:
Read a Second, and the Third time, and passed as amended.

EXCISE (AMENDMENT) BILL:
Read a Second, and the Third time, and passed.

TELECOMMUNICATION LEVY BILL:
Read a Second, and the Third time, and passed.

INLAND REVENUE (AMENDMENT) BILL:
Read a Second, and the Third time, and passed as amended.

TAX APPEALS COMMISSION BILL:
Read a Second, and the Third time and passed as amended.

ADJOURNMENT MOTION:
Misuse of State Resources Prior to and on Day of Local Government Election

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2011 මාර්තු 24 වන බ්‍රහස්පතින්දා
2011 மார்ச் 24, வியாழக்கிழமை
Thursday, 24th March, 2011

අ. භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය. නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது. பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சந்திம வீரக்கொடி] தலைமை வகித்தார்கள்.
The Parliament met at 1.00 p.m., MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] *in the Chair.*

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2011 මාර්තු මස 24 වන බ්‍රහස්පතින්දා, එනම් අද දින පස් වරු 4.00ට ගරු කථානායකතුමාගේ නිල කාමරයේදී පැවැත්වීමට නියමිත බැවින් ඊට පැමිණ සහභාගි වන ලෙස ගරු සභික මන්ත්‍රීන් සියලු දෙනාටම මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

පිළිගන්වන ලද වාර්තා
சமர்ப்பிக்கப்பட்ட அறிக்கைகள்
REPORTS PRESENTED

ශ්‍රී ලංකා ආර්ථික විද්‍යා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
இலங்கை பொருளியற் கழகம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
SRI LANKA ECONOMIC ASSOCIATION (INCORPORATION) BILL

ගරු සිල්වෙස්ත්‍රි අලාන්ටින් මහතා
(மாண்புமிகு சில்வேஸ்திரி அலன்றின்)
(The Hon. Silvastrie Alantin)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, "ஏ" நிலையியற் குழுவின் தவிசாளர் சார்பாக, நான் இலங்கை பொருளியற் கழகம் (கூட்டிணைத்தல்) சட்டமூலம் பற்றிய "ஏ" நிலையியற் குழுவின் அறிக்கையையும் அதன் கூட்ட அறிக்கையையும் சமர்ப்பிக் கின்றேன்.

"அறிக்கை

சட்டவரைஞரால் செய்யப்பட்ட திருத்தங்களுடன் கூடிய "இலங்கை பொருளியற் கழகம் (கூட்டிணைத்தல்)" சட்டமூலத்தை குழு பரிசீலித்து, இணைக்கப்பட்டுள்ள மறுபதிப்பில் திருத்தப்பட்ட வாறு ஏற்றுக்கொண்டுள்ளது."

පනත් කෙටුම්පත "ඒ" ස්ථාවර කාරක සභාව විසින් වාර්තා කරන ලද පරිදි 2011 මාර්තු 25 වන සිකුරාදා සලකා බලනු ලැබේ.

சட்டமூலம் நிலைக்குழு "ஏ" இனால் அறிக்கை செய்யப்பட்ட வாறு 2011 மார்ச் 25, வெள்ளிக்கிழமை பரிசீலிக்கப்படவிருக்கிறது.

Bill, as reported by Standing Committee "A", to be considered upon Friday, 25th March, 2011.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු ජීවන් කුමාරණතුංග මහතා (තැපැල් සේවා අමාත්‍යතුමා)
(மாண்புமிகு ஜீவன் குமாரணதுங்க - தபால் சேவைகள் அமைச்சர்)
(The Hon. Jeewan Kumaranatunga - Minister of Postal Services)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) රත්මලාන, මාලිගාව පාර, ඩෙල්මේජ් රොටරිපුර, අංක 30 දරන ස්ථානයේ පදිංචි ආර්. ශ්‍රී නිමල් ඩයස් මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) මොරටුව, කොරලවැල්ල, ජනප්‍රිය මාවත, අංක 30/1 දරන ස්ථානයේ පදිංචි එම්.එස්. ප්‍රනාන්දු මහතාගෙන් ලැබුණු පෙත්සම.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු ගාමිණී ලොකුගේ මහතා - පැමිණ නැත.

ගරු ඩිලාන් පෙරේරා මහතා - පැමිණ නැත.

ගරු රංජිත් සියඹලාපිටිය මහතා (විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමා)
(மாண்புமிகு ரஞ்ஜித் சியம்பலாபிட்டிய - தொலைத் தொடர்புகள், தகவல் தொழில்நுட்பவியல் அமைச்சர்)
(The Hon. Ranjith Siyambalapitiya - Minister of Telecommunication and Information Technology)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

01. ගලිගමුව නගරය, බල්ලපාන, බී 254, "ගැමුණුවිලා"හි පදිංචි ආර්.ආර්. කුසුමලතා මහත්මියගෙන් හා ඒ.ආර්. ලීලාවතී මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

02. කොළඹ 14, වෙල්ස්කුමාර මාවත, ගිනි නිවීම් සේවා දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු ඩබ්ලිව්.ජේ.එල්. පෙරේරා මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

03. නෙළුම්දෙණිය, අක්වත්ත පදිංචි ඩබ්ලිව්.එච්.එම්. ලූවිස් සිංඤ්ඤෝ මහතාගෙන් ලැබුණු පෙත්සම.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු ලසන්ත අලගියවන්න මහතා - පැමිණ නැත.

ගරු නිර්මල කොතලාවල මහතා - පැමිණ නැත.

ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා - පැමිණ නැත.

ගරු ෆයිසර් මුස්තාපා මහතා - පැමිණ නැත.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා - පැමිණ නැත.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා - පැමිණ නැත.

ගරු දයාසිරි ජයසේකර මහතා - පැමිණ නැත.

ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා - පැමිණ නැත.

ගරු හුනෛයිස් ෆාරූක් මහතා - පැමිණ නැත.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.

சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.

Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

අම්බලන්තොට කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන පාසල්: විස්තර
அம்பலாந்தோட்டை கோட்டக் கல்விக் காரியாலயத்தினால் பரிபாலிக்கப்படும் பாடசாலைகள்: விபரம்
SCHOOLS COMING UNDER AMBALANTOTA DIVISIONAL EDUCATION OFFICE: DETAILS

0226/'10

1. **ගරු ජෝන් අමරතුංග මහතා (ගරු සජිත් ප්‍රේමදාස මහතා වෙනුවට)**
(மாண்புமிகு ஜோன் அமரதுங்க - மாண்புமிகு சஜித் பிரேமதாச சார்பாக)
(The Hon. John Amaratunga on behalf of the Hon. Sajith Premadasa)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් අම්බලන්තොට කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල්වලින් දැනට වසා ඇති හෝ වැසීමට තීරණය කර ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම කොට්ඨාසයට අයත් පාසල්වල අතිරික්ත ගුරුවරුන් සිටින්නේද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) ගුරු ඌනතා ඇති පාසල්වල නම් කවරේද;

(iv) ඌනතාවන් පවතින්නේ කුමන විෂයයන් සඳහාද;

(v) මෙම ගුරු ඌනතා පවතින පාසල් සඳහා ගුරුවරුන් ලබා දීමට කටයුතු කරන්නේද;

(vi) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදී ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா

(அ) (i) அம்பாந்தோட்டை மாவட்டத்தில் அம்பாந் தோட்டை வலயக் கல்விக் காரியாலயத்திற்குட்பட்ட அம்பலாந்தோட்டை கோட்டக் கல்விக் காரியாலயத் தினால் பரிபாலிக்கப்படும் அரசாங்கப் பாடசாலை களின் எண்ணிக்கை என்னவென்பதையும்,

(ii) அப்பாடசாலைகளின் பெயர்கள் யாவையென் பதையும்,

(iii) மேற்படி பாடசாலைகளில் தற்போது மூடப் பட்டுள்ள அல்லது மூடுவதற்குத் தீர்மானிக்கப் பட்டுள்ள பாடசாலைகளின் எண்ணிக்கை எவ்வள வென்பதையும்,

(iv) அப்பாடசாலைகளின் பெயர்கள் யாவையென் பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) இக்கோட்டத்திற்குரிய பாடசாலைகளில் மிகை யான ஆசிரியர்கள் உள்ளனரா என்பதையும்,

(ii) அவ்வாறான பாடசாலைகளின் பெயர்கள் யாவை யென்பதையும்,

(iii) ஆசிரியர்கள் பற்றாக்குறை நிலவும் பாடசாலை களின் பெயர்கள் யாவை என்பதையும்,

(iv) பற்றாக்குறை நிலவுவது எந்தப் பாடங்களுக்கு என்பதையும்,

(v) இவ்வாறு ஆசிரியர் பற்றாக்குறை நிலவும் பாடசாலைகளுக்கு ஆசிரியர்களைப் பெற்றுக் கொடுக்க நடவடிக்கை எடுப்பாரா என்பதையும்,

(vi) அவ்வாறாயின் அது எவ்வளவு காலத்தினுள் நடைபெறுமென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House of -

(i) the number of Government schools coming under the purview of the Ambalantota Divisional Education Office which is under the Hambantota Zonal Education Office of the Hambantota District;

(ii) the names of those schools;

(iii) the number of schools that have already been closed down or decided to be closed down, out of the schools mentioned in (ii) above ; and

the names of those schools?

(b) Will he state -

(i) whether there are overstaffed schools belonging to this division;

(ii) the names of those schools;

(iii) the names of schools with shortage of teachers;

(iv) the subjects for which shortages exist;

(v) whether action will be taken to provide teachers to the schools with shortage of teachers; and

(vi) if so; the time frame within which it will be done?

(c) If not, why?

ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා (අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா - கல்வி பிரதி அமைச்சர்)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa - Deputy Minister of Education)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

*** සභාමේසය මත තබන ලද පිළිතුර:**

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*

** Answer tabled:*

(අ) (i) පාසල් සංඛ්‍යාව 29යි.

(ii) ඇමුණුම I හි දක්වා ඇත.

(iii) නැත.

(iv) අදාළ නොවේ.

(ආ) (i) ඔව්.

(ii) ඇමුණුම II හි දක්වා ඇත.

(iii) 01. හ/බෝලාන මහා විද්‍යාලය

02. හ/වලවේවත්ත කනිෂ්ඨ විද්‍යාලය

03. හ/රොටවල කනිෂ්ඨ විද්‍යාලය

04. හ/පුංචිහේනයාගම ජනානන්ද කනිෂ්ඨ විද්‍යාලය

05. හ/කරඹගල්මුල්ල කනිෂ්ඨ විද්‍යාලය

(iv) ඇමුණුම III හි දක්වා ඇත.

(v) ඔව්.

(vi) ඉදිරි මාසවලදී පත්වීම් ලබා දීමට නියමිත කලා උපාධිධාරී හා විද්‍යාපීඨ ගුරුවරුන්ගෙන් මෙම ඌනතාවන් සම්පූර්ණ කරනු ඇත.

(ඇ) අදාළ නොවේ.

ඇමුණුම - I

අම්බලන්තොට කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල් සංඛ්‍යාව

අනු අංකය	පාසල
1	හ/ හුංගම විජයබා ජාතික පාසල
2	හ/ ථේරපුත්ත ජාතික පාසල
3	හ/ මාමඩල මහා විද්‍යාලය
4	හ/ අම්බලන්තොට මහා විද්‍යාලය
5	හ/ වැලිපටන්විල මහා විද්‍යාලය
6	හ/ බෝලාන මහා විද්‍යාලය
7	හ/ කොග්ගල්ල මහා විද්‍යාලය
8	හ/ වලවේවත්ත මහා විද්‍යාලය
9	හ/ වැටිය ධර්මපාල මහා විද්‍යාලය
10	හ/ කුඩාබෝලාන පසද්සදාසිහ මහා විද්‍යාලය
11	හ/ අල් - අක්බාර් මුස්ලිම් මහා විද්‍යාලය
12	හ/ බැම්මියන්විල කනිෂ්ඨ විද්‍යාලය
13	හ/ ඇත්බටුව කනිෂ්ඨ විද්‍යාලය
14	හ/ හැඩවින්න කනිෂ්ඨ විද්‍යාලය
15	හ/ රොටවල කනිෂ්ඨ විද්‍යාලය
16	හ/ ලූණම දුටුගැමුණු කනිෂ්ඨ විද්‍යාලය
17	හ/ දෙනිය පිංගම කනිෂ්ඨ විද්‍යාලය
18	හ/ මූලන කනිෂ්ඨ විද්‍යාලය
19	හ/ කිවුල කනිෂ්ඨ විද්‍යාලය
20	හ/ බටඅත දකුණ කනිෂ්ඨ විද්‍යාලය
21	හ/ කණුකැටිය කනිෂ්ඨ විද්‍යාලය
22	හ/ මහවෙල කනිෂ්ඨ විද්‍යාලය
23	හ/ පුංචිහේනායාගම ජනානන්ද කනිෂ්ඨ විද්‍යාලය
24	හ/ මූරවැසිහේන කනිෂ්ඨ විද්‍යාලය
25	හ/ කරඹගල්මුල්ල කනිෂ්ඨ විද්‍යාලය
26	හ/ සමනලගම කනිෂ්ඨ විද්‍යාලය
27	හ/ වෙලන්ගහවෙල කනිෂ්ඨ විද්‍යාලය
28	හ/ බටඅත උතුර ප්‍රාථමික විද්‍යාලය
29	හ/ ථේරපුත්ත ප්‍රාථමික විද්‍යාලය

ඇමුණුම - II

අම්බලන්තොට කොට්ඨාසයට අයත් අතිරික්ත ගුරුවරුන් සිටින පාසල්

අනු අංකය	පාසල
1	හ/ හුංගම විජයබා ජාතික පාසල
2	හ/ ථේරපුත්ත ජාතික පාසල
3	හ/ කොග්ගල්ල මහා විද්‍යාලය
4	හ/ වැටිය ධර්මපාල මහා විද්‍යාලය
5	හ/ කුඩාබෝලාන පසද්සදාසිහ මහා විද්‍යාලය
6	හ/ ඇත්බටුව කනිෂ්ඨ විද්‍යාලය
7	හ/ හැඩවින්න කනිෂ්ඨ විද්‍යාලය
8	හ/ රොටවල කනිෂ්ඨ විද්‍යාලය
9	හ/ බටඅත දකුණ කනිෂ්ඨ විද්‍යාලය
10	හ/ මූරවැසිහේන කනිෂ්ඨ විද්‍යාලය
11	හ/ වෙලන්ගහවෙල කනිෂ්ඨ විද්‍යාලය
12	හ/ බටඅත උතුර ප්‍රාථමික විද්‍යාලය

ඇමුණුම - III

ඌනතාවයන් පවතින විෂයයන්

අනු අංකය	පාසල	විෂයය
1	හ/ බෝලාන මහා විද්‍යාලය	ප්‍රාථමික/රසායන විද්‍යාව/ඉංග්‍රීසි
2	හ/ වලවේවත්ත මහා විද්‍යාලය	ගණිතය
3	හ/ රොටවල කනිෂ්ඨ විද්‍යාලය	ගණිතය
4	හ/ පුංචිහේනායාගම ජනානන්ද කනිෂ්ඨ විද්‍යාලය	ඉංග්‍රීසි
5	හ/ කරඹගල්මුල්ල කනිෂ්ඨ විද්‍යාලය	ඉංග්‍රීසි

ගාලු මුව දොර මුහුදු ප්‍රදේශය තුළ අක්කර 500ක් පිරවීමේ ව්‍යාපෘතිය: ශක්‍යතා අධ්‍යයනය
காலிமுகத்திடல் கடல் பிரதேசத்தில் 500 ஏக்கரை நிரப்பும் கருத்திட்டம்: சாத்தியக்கூற்று ஆய்வு
PROJECT TO FILL 500 ACRES OF SEABED IN GALLE FACE: FEASIBILITY

0384/'10

2. ගරු ජෝන් අමරතුංග මහතා (ගරු රවි කරුණානායක මහතා වෙනුවට)

மாண்புமிகு ஜோன் அமரதுங்க- மாண்புமிகு ரவி கருணா நாயக்க சார்பாக)

(The Hon. John Amaratunga on behalf of the Hon. Ravi Karunanayake)

වරාය සහ මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) ගාලු මුව දොර සිට වැල්ලවත්ත දක්වා මුහුදු ප්‍රදේශය තුළ අක්කර 500ක් ගොඩ කරනු පිණිස ශක්‍යතා අධ්‍යයනයක් සිදු කෙරෙමින් පවතින බව සත්‍යයක් දැයි එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම ශක්‍යතා අධ්‍යයනය සිදු කරන්නේ කවරෙක්ද;

(ii) මුහුදු පතුල පිරවීමට යන වියදම කොපමණද;

(iii) එයින් පරිසරයට බලපෑම් ඇති කෙරෙන්නේද;

(iv) මෙම ව්‍යාපෘතියේ දේශීය හා විදේශීය විශේෂඥ උපදේශකවරු සහ අයෝජකයෝ යන පාර්ශ්ව කවරේද;

(v) එබඳු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමේ පරමාර්ථය කුමක්ද;

(vi) ඒ සඳහා වැය කරනු ලබන මුදල ආපසු ගෙවිය යුතු කාල සීමාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

துறைமுகங்கள், நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) காலிமுகத் திடல் முதல் வெள்ளவத்தை வரை கடல் பிரதேசத்தில் 500 ஏக்கர் காணியினை நிரப்புவதற்கான சாத்தியக்கூற்று ஆய்வு தற்பொழுது மேற்கொள்ளப்பட்டு வருகின்றது என்பது உண்மையா என்பதை அவர் இச் சபைக்கு அறியத்தருவாரா?

(ஆ) (i) சாத்தியக்கூற்று ஆய்வினை மேற்கொள்பவர் யார் என்பதையும்,

(ii) கடற்படுகையினை நிரப்புவதற்கான செலவினையும்,

(iii) அது சூழலைப் பாதிக்குமா என்பதையும்,

(iv) இதன் உள்நாட்டு மற்றும் வெளிநாட்டு ஆலோசகர்கள் மற்றும் முதலீட்டாளர்கள் யார் என்பதையும்,

(v) இவ்வாறான கருத்திட்டத்தினைச் செய்வதன் நோக்கத்தினையும்,

(vi) இதற்கான கடனை மீளச் செலுத்துவதற்கான காலப்பகுதியினையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Ports and Highways:

(a) Will he inform this House whether it is correct that there is feasibility being carried out to fill 500 acres of land from Galle Face to Wellawatte ?

(b) Will he state -

(i) the person who is doing the feasibility;

(ii) the cost of filling the seabed;

(iii) whether it affects the environment;

(v) the parties who are the local and foreign consultants and investors;

(vi) the purpose of doing such project; and

the payback period?

(c) If not, why?

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා (වරාය හා මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன - துறைமுகங்கள், நெடுஞ்சாலைகள் பிரதி அமைச்சர்)
(The Hon. Rohitha Abeygunawardana - Deputy Minister of Ports and Highways)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වරාය හා මහාමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

*** *සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
** Answer tabled:*

(අ) ගාලු මුවදොර සිට කොල්ලුපිටිය දක්වා මුහුදු ප්‍රදේශය තුළ අක්කර 300 – 400ක පමණ ප්‍රමාණයක් ගොඩ කිරීම පිණිස ශක්‍යතා අධ්‍යයනයක් සිදු කෙරෙමින් පවතී.

(ආ) (i) ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සහ මොරටුව විශ්වවිද්‍යාලයේ විද්වතුන්ගෙන් සමන්විත මණ්ඩලයක් විසිනි.

(ii) මූලික ඇස්තමේන්තුව අනුව දළ වශයෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 300ක් පමණ වේ.

(iii) පරිසරයට සිදු වන බලපෑම පිළිබඳ අධ්‍යයනයක් සිදු කෙරෙමින් පවතී.

(iv) දේශීය උපදේශකවරු - ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සහ මොරටුව විශ්වවිද්‍යාලයේ විද්වතුන්ගෙන් සමන්විත මණ්ඩලයක්

විදේශීය උපදේශකවරු - අවශ්‍යතාව අනුව කෙටි කාලීන සේවයක් සඳහා පමණක් සහභාගි කරවා ගැනීමට අපේක්ෂිතය

ආයෝජකයෝ - ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් එය දැනට තීරණය කර නොමැත.

(v) 01. කොළඹ නගරය තුළ පවතින අක්‍රමවත් ගොඩනැඟිලි මාර්ග පද්ධතිය හා බැඳුණු අපහසුතා මග හැර සැලසුම් සහගත නගර සැලැස්මක් අනුව ක්‍රමවත් ආර්ථික මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම.

02. කොළඹ වරාය සංවර්ධන ක්‍රියාවලියට සමගාමීව ආයෝජන අවස්ථා පුළුල් කොට දැවැන්ත ආර්ථික සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම.

(vi) මෙම ව්‍යාපෘතිය සඳහා වැය කරනු ලබන මුදල අවු. 3 - 5 අතර කාලයක ආපසු ලබා ගත හැකි වන අතර මෙම ව්‍යාපෘතිය සඳහා මූල්‍ය පහසුකම් ලබා ගැනීම පිළිබඳ තවම තීරණයක් ගෙන නොමැති බැවින් එම මුදල් ආපසු ගෙවිය යුතු කාල සීමාව දැනට කිව නොහැක.

(ඇ) පැන නොනඟී.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න ඇමතිතුමන්ලා නැහැය කියා හැම දාම කියනවා. අද පිළිතුරු දෙන්න ඇමතිතුමන්ලා ඉන්නවා. නමුත් ප්‍රශ්න අහන විපක්ෂය නැහැ.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මම අහනවා. [බාධා කිරීම්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඒ අදාළ මන්ත්‍රීවරු වෙනුවෙන් ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා පමණක් ඉන්නවා. එතුමා අහනවා. [බාධා කිරීම්]

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
වැඩ වර්ජනය.

ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
අපි ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා ගැන කනගාටු වනවා. [බාධා කිරීම්]

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
අනෙක් කාරණය, අනුන්ගේ උලුක්කුවක් මේ අදින්නේ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
වැඩ වර්ජනය නොවෙයි, ජය සමරනවා.

නැගෙනහිර පළාතේ ඇතුළත වටරවුම් මාර්ගය සංවර්ධනය: විස්තර

கிழக்கு மாகாண உள்ளக சுற்றுவட்ட வீதி அபிவிருத்தி: விபரம்

INNER CIRCULAR ROAD DEVELOPMENT IN EASTERN PROVINCE: DETAILS

0528/'10

3. ගරු ජෝන් අමරතුංග මහතා (ගරු දයාසිරි ජයසේකර මහතා වෙනුවට)

(மாண்புமிகு ஜோன் அமரதுங்க - மாண்புமிகு தயாசிறி ஜயசேகர சார்பாக)

(The Hon. John Amaratunga on behalf of the Hon. Dayasiri Jayasekara)

ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) නැගෙනහිර පළාතේ ඇතුළත වටරවුම් මාර්ගය සංවර්ධනය කිරීම සඳහා යෝජිත මාර්ගයක්ද;

(ii) එසේ නම්, එම මාර්ගය මේ වන විට සංවර්ධනය කරමින් පවතින්නේද;

යන්න එතුමා දන්වන්නෙහිද?

(ආ) මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු කරනු ලබන්නේ නම්,

(i) එහි දිග කිලෝමීටර් කොපමණද;

(ii) එහි වැඩ අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

(iii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) ඒ ඒ ආයතන විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් මිල ගණන් කවරේද;

(iv) ටෙන්ඩරය පිරිනමන ලද ආයතනය හා අදාළ ටෙන්ඩර් මුදල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත මුළු මුදල දේශීය අරමුදල්වලින් ලබා ගත්තේද;

(ii) නො එසේ නම්, විදේශ ආධාර මගින් ලබා ගත්තේද;

(iii) විදේශ ආධාර ලබා ගත්තේ නම්, ආධාර ලබා දුන් රටේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නො එසේ නම්, ඒ මන්ද?

பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கிழக்கு மாகாணத்தின், உள்ளக சுற்றுவட்ட வீதி யானது அபிவிருத்தி செய்வதற்காக உத்தேசிக் கப்பட்டுள்ளதொரு வீதியா என்பதையும்,

(ii) ஆமெனில், இவ்வீதி தற்போது அபிவிருத்தி செய்யப் பட்டு வருகின்றதா என்பதையும்

அவர் அறிவிப்பாரா?

(ஆ) இவ்வீதியில் அபிவிருத்திப் பணிகள் இடம்பெற்று வருமாயின்,

(i) அதன் நீளம் எத்தனை கிலோ மீட்டர்கள் என்பதையும்,

(ii) இதன் பணிகளை முடிவுறுத்துவதற்கு உத்தேசிக்கப் பட்டுள்ள திகதி யாது என்பதையும்,

(iii) இதற்காக மதிப்பிடப்பட்டுள்ள தொகை எவ்வள வென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) இவ்வீதியின் நிர்மாணப் பணிகளுக்காக கேள்விப் பத்திரம் கோரப்பட்டதா என்பதையும்,

(ii) ஆமெனில், கேள்விப் பத்திரங்களைச் சமர்ப்பித்த நிறுவனங்களின் பெயர்கள் யாவை என்பதையும்,

(iii) அந்தந்த நிறுவனங்களால் சமர்ப்பிக்கப்பட்ட கேள்விப் பத்திர விலைகள் யாவையென்பதையும்,

(iv) கேள்விப் பத்திரம் ஒப்படைக்கப்பட்ட நிறுவனம் மற்றும் குறித்த கேள்விப் பத்திரத் தொகை யாதென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஈ) (i) இவ்வீதியை நிர்மாணிப்பதற்காக மதிப்பீடு செய்யப் பட்ட மொத்தத் தொகை உள்நாட்டு நிதியங்களி லிருந்து பெறப்பட்டதா என்பதையும்,

(ii) இன்றேல், வெளிநாட்டு உதவிகளிலிருந்து பெறப் பட்டதா என்பதையும்,

(iii) வெளிநாட்டு உதவி பெறப்பட்டிருப்பின், உதவி வழங்கிய நாட்டின் பெயர் யாதென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(உ) இன்றேல், ஏன்?

asked the Minister of Economic Development:

(a) Will he inform-

(i) whether inner circular road in the Eastern Province is a road proposed for development ;

(ii) if so, whether this road is being developed by now?

(b) If this road is being developed, will he inform this House of-

(i) its length in kilometres ;

(ii) the proposed date for the completion of its work ;

(iii) the amount of money estimated for this purpose?

(c) Will he state-

(i) whether tenders were called for the construction of this road ;

(ii) if so, the names of institutions that submitted tenders ;

(iii) the bids forwarded by the respective institutions ;

(iv) the institution for which the tender was awarded and the price of bid?

(d) Will he inform this House-

(i) whether the total amount of estimated money for the construction of this road was obtained from local funds ;

(ii) if not, whether it was obtained through foreign aid ;

(iii) if foreign aid was obtained, the name of the donor country?

(e) If not, why?

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Lakshman Yapa Abeywardena - Deputy Minister of Economic Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
** Answer tabled:*

(අ) (i) ඔව්.
(ii) නැත.

(ආ) (i) කි.මී. 60.5
(ii) 2010-12-31
(iii) රුපියල් මිලියන 550

(ඇ) (i), (ii), (iii), (iv) - නැත.

මෙම මාර්ග සංවර්ධන ව්‍යාපෘති අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් ලබා දුන් අවල දේශපාලන නායකත්වය යටතේ වූ මානුෂික මෙහෙයුමෙන් මුදා ගත් නැඟෙනහිර පළාතේ ක්‍රියාත්මක වූ නැඟෙනහිර නවෝදය වැඩසටහන ඇසුරින් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා යුද හමුදා ඉංජිනේරු බල කාය විසින් ඉටු කරනු ලබයි. මෙම මාර්ගයේ ඉදිකිරීම් කටයුතු රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා යුද හමුදාව විසින් ඉටු කරනු ලබයි.

(ඈ) (i) ඔව්, නැඟෙනහිර නවෝදය - ජාතික සවිය ප්‍රතිපාදන යටතේ.
(ii) නැත.
(iii) අදාළ නොවේ.

(ඉ) පැන නොනඟී.

කොළඹ රාජකීය විද්‍යාලයේ 2010 රෝයල් පැරේඩ්: චක්‍රලේඛයට පටහැනිව මුදල් එකතු කිරීම
கொழும்பு றோயல் கல்லூரியின் றோயல் பரேட் 2010: சுற்றறிக்கைக்கு முரணான நிதி வசூலிப்பு
2010 ROYAL PARADE OF COLOMBO ROYAL COLLEGE : COLLECTION OF MONEY IN VIOLATION OF CIRCULAR

0621/'10

4. **ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛ අංක 2008/41 මඟින් පාසල් ආදී ශිෂ්‍ය සංගම් හා වෙනත් විවිධ සංගම් මඟින් පාසල් සිසුන්ගෙන් සහ දෙමාපියන්ගෙන් යම් යම් හේතු දක්වා මුදල් එකතු කිරීම තහනම් කර ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) එසේ තිබියදී කොළඹ රාජකීය විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමය 2010 රෝයල් පැරේඩ් (Royal Parade) නමින් රු. 600ක් වටිනා කොටු කාඩ්පත් ළමුන් අතර බෙදා එමගින් මුදල් එකතු කරන බව එතුමා දන්නෙහිද?

(ඇ) උක්ත චක්‍රලේඛයට පටහැනිව මුදල් එකතු කර තිබේ නම්, ඒ වෙනුවෙන් ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) கல்வி அமைச்சின் செயலாளரது 2008/41ஆம் இலக்க சுற்றறிக்கையின்மூலம் பாடசாலை பழைய மாணவர் சங்கம் மற்றும் பல்வேறு சங்கங்களினால் பாடசாலை மாணவர்களிடமும் பெற்றோர்களிடமும் சில காரணங் களைக் காட்டி நிதி வசூலிப்பது தடை செய்யப்பட்டுள்ளது என்பதை அவர் ஏற்றுக்கொள்வாரா?

(ஆ) அவ்வாறிருக்கையில், கொழும்பு றோயல் கல்லூரியின் பழைய மாணவர் சங்கம் 2010 Royal Parade எனும் பெயரில் ரூபா 600.00 பெறுமதியான கட்டமிடப்பட்ட அட்டைகளை பிள்ளைகளுக்கும் பகிர்ந்தளித்து அதனூ டாக நிதி வசூலிக்கின்றது என்பதை அவர் அறிவாரா?

(இ) குறிப்பிட்ட சுற்றறிக்கைக்கு முரணாக நிதி வசூலிக்கப் பட்டிருப்பின் இது தொடர்பாக மேற்கொள்ளப்படும் நடவடிக்கை யாதென்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he admit that the collection of money from school children and parents by past pupils associations and various other associations citing various reasons has been banned through circular No. 2008/41 of the Secretary to the Ministry of Education?

(b) Despite it being so, is he aware that the Old Boys' Association of Royal College, Colombo has distributed collection cards titled "2010 Royal Parade" to the value of Rs. 600/- among children and collected money through them?

(c) Will he inform this House of the measures that will be taken, if money has been collected in violation of the above circular?

(d) If not, why?

ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) ඔව්.

(ආ) ඔව්.

(ඇ) ඔව්.

පාසලේ සංවර්ධනය උදෙසා යම් යම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා පාසල් සංවර්ධන සමිතියේ හෝ පාසල් සංවර්ධන කමිටුවේ එකඟතාව මත ලැබෙන ආධාර මුදල් පාසල් සංවර්ධන සමිති ගිණුමට හෝ පාසල් නඟා සිටුවීමේ වැඩසටහන යටතේ පිහිටුවා ඇති ගිණුමට ගිණුම්ගත කිරීමට හැකියාව ඇත. විද්‍යාලයක විෂය සමගාමී කටයුතු

මෙන්ම වෙනත් සංවර්ධන හා නඩත්තු කටයුතු සඳහා ද අවශ්‍ය වන මුදල් සම්පූර්ණයෙන්ම රජය වෙතින් ලබා දීමට හැකියාවක්ද නොමැත. එබැවින් පාසල් සිසුන්ගේ හා පාසලේ දියුණුවට අදාළ වන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රජාවේ මෙන්ම දෙමව්පියන්ගේ දායකත්වය ලබා ගැනීම සඳහා පාසල් සංවර්ධන සමිති හා පාසල් සංවර්ධන කමිටු මඟින් අරමුදල් එකතු කිරීම හා ඒවා අදාළ කාර්යයන් සඳහා වැය කිරීමට හැකියාව ඇත.

(ඇ) අදාළ නොවේ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. පළමුවැනි ප්‍රශ්නයට උත්තරය හැටියට ඔබතුමාම පිළිගන්නවා, අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛ අංක 2008/41න් ඒ විධියට දෙමව්පියන්ගෙන්, ආදි ශිෂ්‍ය සංගම් හැටියට හරි මුදල් එකතු කරන එක තහනම් කරලා තිබෙනවාය කියලා. හැබැයි ඒකේම ඊ ළඟ උත්තරය හැටියට තිබෙන්නේ එහෙම මුදල් එකතු කරනවාය කියලායි. ඔබතුමාගේ පැහැදිලි කිරීම තිබෙන්නේ එහෙම අවශ්‍යතාව අනුව රජයෙන් දෙන්න විධියක් නැති නිසා මුදල් එකතු කරන්න සිද්ධ වෙලා තිබෙනවාය කියලායි.

ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ප්‍රශ්නය තවම ඇහුවේ නැහැ. එතකොට එම චක්‍රලේඛය උල්ලංඝනය කිරීම ගැන ඔබතුමාට තිබෙන උත්තරේ මොකක්ද?

ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රශ්නයේ තියෙනවා 2010 රෝයල් පැරේඩ් (Royal Parade) නමින් රුපියල් 600ක් වටිනා කොටු කාඩ්පත් ළමුන් අතර බෙදා එමඟින් මුදල් එකතු කරන බව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පාසල් තුළ උප සංස්කෘතීන් තිබෙනවා; විවිධ සංගම් තිබෙනවා; societies තිබෙනවා. මෙතුමන්ලා මේ රටේ පොළොවේ පය ගහලා ඉන්න අය නොවෙයි. මෙතුමන්ලා ළමයි ඉස්කෝලේ යවලාද කියන එක ගැනත් මට ටිකක් විචිකිච්ඡාවක් ඇති වනවා. ඒ නිසා ළමයි ඉස්කෝලේ යවන කොට ළමයින්ගේ අඩු පාඩු සොයා බලන්න. එතකොට ඔබට මේ පිළිබඳව තේරෙයි. Royal College එකේ, ආනන්ද, නාලන්ද, Trinity College වැනි විවිධ පාසල්වල පාසල් පද්ධතිය තුළ මේ වාගේ උප සංස්කෘතීන් තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දෙමව්පියන් එකතු වෙලා, ළමයින් එකතු වෙලා ඒ දරුවන්ගේ බාහිර ක්‍රියාකාරකම් වර්ධනය කිරීම සඳහා මුදල් එකතු කරලා ඒ කටයුතු කරනවා. ඒ නිසා මේ චක්‍රලේඛවල තිබෙන නීතිය - ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නීතියටම අනුව අපට පාරේ යන්න බැහැ නේ; වාහනයක් එළවන්න බැහැ නේ. වැරැදි ගොඩක් වෙනවා. හැබැයි -

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඇති. ඇති. තේරෙනවා.

ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ඇතිද?

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඇති. උත්තරය දුන්නා. දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ඇති වෙන කල් මෙයාලට දෙන්න ඕනෑ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
හොඳට තේරෙනවා, උප සංස්කෘතිය.

ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
මොකක්ද?

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දෙමව්පියන් බදු ගෙවනවා, පාසල්වල ගුරුවරුන්ට වැටුප් ගෙවන්න සහ ඉදි කිරීම්වලට. ඊට පස්සේ දෙමව්පියන්ට සිද්ධ වෙලා තිබෙනවා ළමයින්ව ටියුෂන් පන්තිත් යවන්න. ඊට අමතරව පාසල් යන දරුවාව කොටු පුරවන්න ඉස්කෝලෙන් යොදවනවා. මේක ස්වේච්ඡාවෙන් ළමයින් එකතු වෙලා කොටු පුරවන එකක් නොවෙයි. නියෝජ්‍ය අධ්‍යාපන ඇමතිතුමනි, ළමයින් එකතු වෙලා ස්වේච්ඡාවෙන් කොටු පනිනවා. ඒ කියන්නේ අර සෙල්ලමට. මේක සෙල්ලමට කොටු පිරවිල්ලක් නොවෙයි.

ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
මම හිතුවා ඔබතුමා පනින කොටු කියලා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මේ කරන්නේ සංවිධානාත්මකව. බලපෑම් කරලා. ඔබතුමා කොටුව පැන්නට කොටු පුරවපු සංස්කෘතිය දන්නවාද කියලා මම දන්නේ නැහැ. ඒ නිසා කරුණාකරලා මේක හොයලා බලන්න. මේක රාජකීය විද්‍යාලයේ ආදි ශිෂ්‍ය -

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகால மைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ඒ ප්‍රශ්නයට පිළිතුර ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා ලබා දෙයි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ප්‍රශ්නය යොමු කරන්න.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ ප්‍රශ්නය මේකයි. කොටු පුරවන එකයි, කොටු පනින එකයි දෙකක්. කොටු පුරවන එක සාධාරණයි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ගැන මම යමක් පැහැදිලි කරන්න කැමැතියි. පසු ගිය වාරයෙත් මා මේ කාරණය පැහැදිලි කළා. යළිත් මේක ආපහු අහලා තිබෙනවා. 2010 වර්ෂය රාජකීය විද්‍යාලයට සුවිශේෂී වසරක්. වසර 175ක් පිරෙන අවස්ථාවේදී තමයි මේ parade එක ලැහැස්ති කළේ. මේ parade එක හැම දාම තිබෙන parade එකක් නොවෙයි. පාසලකට වසර 175ක් පිරෙනවාය කියන්නේ සුවිශේෂී අවස්ථාවක්. ඒ වෙනුවෙන් තිබුණු දෙයක් ගැනයි මේ විවේචනය කරන්න උත්සාහ දරන්නේ. එය දෙමව්පියන්, ආදි ශිෂ්‍යයන්, උදවු කරන්න කැමැති අය සියලු දෙනාගේ සතුටක් හැටියට තමයි කළේ. අපි, මේ පාර්ලිමේන්තුවේ ඉන්න බොහෝ මන්ත්‍රීවරු -මට කියන්න අවසර දෙනවා නම් පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමා පවා- ඒ parade එකේ ගියා. ආදි ශිෂ්‍යයන් හැටියට අපට ඒක සතුටක්.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු ඇමතිතුමනි, parade එකේ පා ගමනින් යන එකයි, ළමයින්ට කියලා කොටු පුරවන එකයි කියන්නේ දෙකක්.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
හැම පාසලකටම අභිමානයක් තිබෙනවා. අවුරුදු 25ක්, අවුරුදු 50ක්, අවුරුදු 75ක්, අවුරුදු 100ක් පිරෙන අවස්ථා පාසලකට අභිමානයක්.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
නමුත් අභිමානයක් වෙනුවෙන් කැමැත්තෙන් යමක් කරනවා නම් ඒක වෙනම දෙයක්. [බාධා කිරීමක්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ පිළිතුර දෙන්න.

ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ parade එක පටන් ගත්තේ 2000 වර්ෂයේ. මේක සුවිශේෂී අවස්ථාවක්. දෙමව්පියෝ කැමැත්තෙන් ඉදිරිපත් වුණේ. මගේ දරුවාත් ඉන්නවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි කැමැත්තෙන් මේ කටයුතු කරන්නේ. පාසලේ වගකීම රජයටම භාර නොදී පාසල්වල වග කීමට හා දරුවන්ගේ වග කීමට අමතරව බාහිර ක්‍රියාකාරකම්වලට, ක්‍රීඩා තරගවලට, ඒවාට අවශ්‍ය උපකරණවලට, ක්‍රිකට් සංගමයට, නෙට් බෝල් සංගමයට, වොලි බෝල් සංගමයට අවශ්‍ය යම් යම් අනුපාන එකතු කර ගැනීම දෙමව්පියන්ගේ වග කීමක්. ඒක කෙරෙනවා. Royal College එකේ විතරක් නොවෙයි, ඒක මේ රටේම පාසල්වල කෙරෙනවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු ඇමතිතුමනි, කැමැත්තෙන් කොටු පුරවා ගන්න එකේ ප්‍රශ්නයක් නැහැ. ඔබතුමාගේ පුතාට ලැබෙන කාඩ් එක ඔබතුමාගේ පුතා ගෙනාවාට පස්සේ, රුපියල් 600ටම අදාළ කොටු ටික ගෙදරදීම පුරවලා යවනවා. මෙතැන ප්‍රශ්නය තිබෙන්නේ මේකයි. පහ වසර ශිෂ්‍යත්ව විභාගය පාස් වෙලා එන ඈත දුෂ්කර පළාත්වල දෙමව්පියන්ගේ දරුවෝත් රාජකීය විද්‍යාලයේ ඉන්නවා. ඒ දරුවන්ටත් මේ අවස්ථාවට මුහුණ දෙන්න සිද්ධ වෙනවා; ඒ කොටු පුරවන්න සිද්ධ වෙනවා. එහෙම නම් ඔබතුමන්ලා වැනි ඇමතිතුමන්ලාගේ පුතාලාට කැමැත්තෙන් ගෙදරදී කොටුව පුරවලා රුපියල් 600 දෙන්නයි, අකැමැති ළමයින්ට භාර නොගෙන ඉන්නයි ක්‍රමයක් ඔබතුමන්ලා හදන්න ඕනෑ. මෙතැන තිබෙන ප්‍රශ්නය හැම ළමයකුට මේක දෙන එකයි. ප්‍රායෝගිකව වන දේ ඒකයි. ඒ නිසා කැමැති අයට අවස්ථාවක් දීලා අකැමැති අයට නොදී ඉන්න ඔබතුමා ඉඩ දෙනවාද? [බාධා කිරීම්]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා ප්‍රශ්නයට පිළිතුරු දෙන්න. ගරු හඳුන්නෙත්ති මන්ත්‍රීතුමනි, දැන් ගරු නියෝජ්‍ය ඇමතිතුමා පිළිතුරු දෙයි.

ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමන්ලාට මේක තේරුම් ගන්න අපහසුකමක් තිබෙනවා. ජනතා විමුක්ති පෙරමුණට පුළුවන්කම තිබෙනවා හැම තැනම ගිහිල්ලා "ටකං ටකං" ගාලා කැට හොළවන්න. ඊ ළඟට ජනතා විමුක්ති පෙරමුණට පුළුවන්කම තිබෙනවා තුණ්ඩු කැල්ල දාලා "ටොක් ටොක්" ගාලා ගහලා බඩු අතට ගන්න. මේක එහෙම දෙයක් නොවෙයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි. පාසලට යම් දරුවෙක් යනවා නම් ඒ සංස්කෘතියට, ශිෂ්ටාචාරයට ගැළපෙන විධියට තමන්ගේ දරුවාට එවැනි යුතුකම් ඉටු කිරීම දෙමාපියන්ගේ වග කීමක්. "බැහැ" කියලා ඒක අත් හරින්න පුළුවන්කමක් නැහැ. මේ ශිෂ්‍යත්ව ළමයා, මේ අනෙක් ළමයා, මේ ඇමතිවරයාගේ ළමයා, මේ මන්ත්‍රීවරයාගේ ළමයා කියලා නීතියක් නැහැ පාසල් පද්ධතිය තුළ. පාසලේ නීතිය කාටත් එකයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

VOIP අන්තර්ජාතික දුරකථන සේවාව: ගිවිසුම
VOIP சர்வதேச தொலைபேசிச் சேவைகள்: உடன்படிக்கை
VOIP INTERNATIONAL TELECOMMUNICATION SERVICE: AGREEMENT

0761/'10

5. **ගරු රවි කරුණානායක මහතා (ගරු තිස්ස අත්තනායක මහතා වෙනුවට)**
(மாண்புமிகு ரவி கருணாநாயக்க - மாண்புமிகு திஸ்ஸ அத்தநாயக்க சார்பாக)
(The Hon. Ravi Karunanayake on behalf of the Hon. Tissa Attanayake)

විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (4):

(අ) (i) ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම විසින් VOIP අන්තර්ජාතික දුරකථන සේවාවන් සම්බන්ධයෙන් ටෙලිකොම් ඒෂියා සමාගම සමඟ ගිවිසුමකට එළැඹුණේද;

(ii) ඒ සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ව අනුමතිය ලැබුණේද;

(iii) එම ගිවිසුමට එළැඹීමට පෙර අන්තර්ජාතික දුරකථන ඇමතුම් වෙනුවෙන් විනාඩියකට ඇමෙරිකානු ඩොලර් (US$) 0.075ක මුදලක් ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමට ලැබුණේද;

(iv) එම ගිවිසුම නිසා ඉහත මුදල විනාඩියකට ඇමරිකානු ඩොලර් (US$) 0.069 දක්වා අඩු වී තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සමාගම සමඟ ගිවිසුමට එළැඹෙන ලෙස වර්ෂ 2009 සැප්තැම්බර් මස දී මුල් වරට යෝජනාවක් ඉදිරිපත් කරනු ලැබුවේද;

(ii) ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය එම යෝජනාව නීතිමය හා මූල්‍යමය කරුණු මත ප්‍රතික්ෂේප කළේද;

(iii) එසේ නම්, එම සමාගම ශ්‍රී ලංකාවට නැවත ගෙන්වනු ලැබුවේ කවුරුන්ද;

(iv) එම ගිවිසුම අත්සන් කර ඇත්තේ අදාළ සාමාන්‍ය කාර්ය පටිපාටියට පටහැනිවද;

(v) එම ගිවිසුම අත්සන් කිරීමෙන් ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමට සිදු වන අලාභය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

தொலைத்தொடர்புகள், தகவல் தொழிநுட்பவியல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) ஸ்ரீ லங்கா ரெலிகொம் நிறுவனம் VOIP சர்வதேச தொலைபேசிச் சேவைகள் தொடர்பில் ரெலிகொம் ஏஷியா நிறுவனத்துடன் உடன்படிக்கையொன்றைச் செய்துள்ளதா என்பதையும்,

(ii) இதற்கு ஸ்ரீ லங்கா ரெலிகொம் நிறுவனத்தின் பணிப்பாளர் சபையின் முன் அனுமதி கிடைத்ததா என்பதையும்,

(iii) இந்த உடன்படிக்கையை செய்துகொள்வதற்கு முன்னர் சர்வதேச தொலைபேசி அழைப்புகளுக்காக ஒரு நிமிடத்திற்கு (US $) 0.075 அமெரிக்க டொலர் ஸ்ரீ லங்கா ரெலிகொம் நிறுவனத்திற்குக் கிடைத்ததா என்பதையும்,

(iv) இந்த உடன்படிக்கை காரணமாக, மேற்படி தொகை ஒரு நிமிடத்திற்கு (US $) 0.069 அமெரிக்க டொலர் வரை குறைந்துள்ளதா என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) மேற்படி நிறுவனத்துடன் உடன்படிக்கை செய்து கொள்ளுமாறு 2009 ஆம் ஆண்டு செப்ரெம்பர் மாதத்தில் முதல் தடவையாக பிரேரணையொன்று சமர்ப்பிக்கப்பட்டதா என்பதையும்,

(ii) ஸ்ரீ லங்கா ரெலிகொம் நிறுவனத்தின் பணிப்பாளர் சபை மேற்படி பிரேரணையை சட்டம் மற்றும் நிதி ரீதியிலான விடயங்களினடிப்படையில் நிராகரித்ததா என்பதையும்,

(iii) ஆமெனின், அந்நிறுவனத்தை மீண்டும் இலங்கைக்கு வரவழைத்தது யார் என்பதையும்,

(iv) மேற்படி உடன்படிக்கை பொது நடைமுறைகளுக்கு முரணாக கையொப்பமிடப்பட்டதா என்பதையும்,

(v) மேற்படி உடன்படிக்கை கையொப்பமிடப்பட்டதன் மூலம் ஸ்ரீ லங்கா ரெலிகொம் நிறுவனத்திற்கு ஏற்படும் நட்டம் எவ்வளவென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Telecommunication and Information Technology:

(a) Will he state -

(i) whether the Sri Lanka Telecom Limited entered into an agreement with the Telecom Asia Company regarding the VOIP International Telecommunication Service;

(ii) whether the prior approval of the Board of Directors of the Sri Lanka Telecom Limited granted for it;

(iii) whether the Sri Lanka Telecom Limited, received US $0.075 per minute for international telephone calls before entering into the above mentioned agreement;

(iv) whether the aforesaid amount has come down to US $ 0.069 per minute as a result of the above mentioned agreement?

(b) Will he state -

(i) whether a proposal for entering into the above mentioned agreement with the aforesaid company was submitted for the first time in September 2009;

(ii) whether the Board of Directors of the Sri Lanka Telecom Limited; rejected that proposal on legal and financial ground;

(iii) if so, the names of the persons who brought that company to Sri Lanka again;

(iv) whether the above mentioned agreement has been signed against the relevant accepted procedure;

(v) the loss incurred by the Sri Lanka Telecom Limited as a result of signing the above mentioned agreement?

(c) If not, why?

ගරු රංජිත් සියඹලාපිටිය මහතා (විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමා)
(மாண்புமிகு ரஞ்ஜித் சியம்பலாபிட்டிய - தொலைத் தொடர்புகள், தகவல் தொழில்நுட்பவியல் அமைச்சர்)
(The Hon. Ranjith Siyambalapitiya - Minister of Telecommunication and Information Technology)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
** Answer tabled:*

(අ) (i) ඔව්, 2010 ජුලි 6 වන දින ශ්‍රී ලංකා ටෙලිකොම් සභාපතිතුමා සහ සමාගමේ අධ්‍යක්ෂවරයෙකු විසින් අත්සන් කරන ලදී.

(ii) අවශ්‍යතාවක් පැන නොනඟී. ගිවිසුම අත්සන් කරන ලද්දේ සභාපතිවරයා හා අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු විසිනි. පූර්ව අනුමැතිය ලබා දෙනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජික නොවන අයෙකුට යම් ගිවිසුමක් අත්සන් කිරීමට බලය පවරන විටය.

(iii) ඔව්, ප්‍රදානය කරන ලද අවම මිල වට්ටම් රහිතව ඇමෙරිකානු ඩොලර් (US$) 0.075 වේ. (දශම බින්දුවයි හතයි පහ)

(iv) නැත.

(ආ) (i) නැත. මෙම ඉල්ලීම මුල් වරට ඉදිරිපත් කර ඇත්තේ 2009 මැයි මාසයේදීය.

(ii) නැත.

(iii) පැන නොනඟී.

(iv) සාමාන්‍ය කාර්ය පටිපාටියට අනුව අත්සන් කර ඇත.

(v) ගිවිසුම ක්‍රියාත්මක කිරීමෙන් සමාගමට අලාභයක් අත් නොවේ. කෙසේ වෙතත් මෙම ගිවිසුම අනුව මෙතෙක් සේවා ආරම්භ කර නැත.

(ඇ) මෙය ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමට අමතර ආදායමක් සහ ලාභයක් උපයා ගැනීමට අවස්ථාව ලබා දෙන අතර ඒ ආකාරයෙන්ම ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම, විදේශීය ක්‍රියාකරුවන් විශාල සංඛ්‍යාවක් සමඟ වෙනත් ආකාරයේ ඇමතුම් ප්‍රවාහනය අවසාන කිරීමේ ගිවිසුම්වලට එළැඹී ඇත.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 6-0870/'10- (1), ගරු ශාන්ත බණ්ඩාර මහතා.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක් කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 7-0902/'10- (1), ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමුපකාර හා අභ්‍යන්තර වෙළෙඳ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති හයක් කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 8-0923/'10- (1), ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වරාය හා මහාමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සතියක් කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 9-0978/'10-(1), ගරු එම්.ටී. හසන් අලි මහතා.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු එම්.ටී. හසන් අලි මහතා වෙනුවෙන් මම එම ප්‍රශ්නය අහනවා.

ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා (පළාත් පාලන හා පළාත් සභා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு இந்திக பண்டாரநாயக்க - உள்ளூராட்சி, மாகாண சபைகள் பிரதி அமைச்சர்)
(The Hon. Indika Bandaranayake - Deputy Minister of Local Government and Provincial Councils)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

හම්බන්තොට කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන පාසල්: යටිතල පහසුකම්
அம்பாந்தோட்டை கோட்டக் கல்விக் காரியாலயத் தினால் நிருவகிக்கப்படும் பாடசாலைகள்:உட்கட்டமைப்பு வசதிகள்
SCHOOLS COMING UNDER HAMBANTOTA ZONAL EDUCATION OFFICE: INFRASTRUCTURE FACILITIES

10. **ගරු ජෝන් අමරතුංග මහතා (ගරු සජිත් ප්‍රේමදාස මහතා වෙනුවට)**
(மாண்புமிகு ஜோன் அமரதுங்க -மாண்புமிகு சஜித் பிரேமதாச சார்பாக)
(The Hon. John Amaratunga on behalf of the Hon. Sajith Premadasa)

0240/'10

අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2) :

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්, හම්බන්තොට කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයෙන් පාලනය වන රජයේ පාසල්වල යටිතල පහසුකම් සහ පොදු අවශ්‍යතාවන්ගේ ඌනතාවන් පවතින බැව් එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාසල් පද්ධතිය තුළ ඇති විදුලිය නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) මෙම පාසල් පද්ධතිය තුළ ඇති විදුලිය නොමැති ගුරු නිවාස සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවා අයත් පාසල්වල නම් කවරේද;

(v) ලී බඩු අවශ්‍යතා ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(vi) එම අවශ්‍යතාවන් කවරේද;

(vii) විද්‍යාගාර සහ පුස්තකාල නොමැති පාසල් සංඛ්‍යාව කොපමණද;

(viii) එම පාසල්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් අවශ්‍යතා ඉටු කර ලීමට අවශ්‍ය ප්‍රතිපාදන එම පාසල් සඳහා වෙන් කර දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ කොපමණ කාලයක් තුළදීද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) அம்பாந்தோட்டை மாவட்டத்தில் அம்பாந்தோட்டை வலயக் கல்விக் காரியாலயத்திற்குரிய அம்பாந்தோட்டை கோட்டக் கல்விக் காரியாலயத்தினால் நிருவகிக்கப்படும் அரசாங்கப் பாடசாலைகளில் உட்கட்டமைப்பு வசதிகளுக் கும் பொதுவான தேவைகளுக்கும் பற்றாக்குறை நிலவு கிறதென்பதை அவர் அறிவாரா?

(ஆ) (i) இப்பாடசாலை முறைமையில் மின்சார வசதியற்ற பாடசாலைகளின் எண்ணிக்கை எவ்வளவென்ப தையும்,

(ii) அப் பாடசாலைகளின் பெயர்கள் யாவையென்ப தையும்,

(iii) மேற்படி பாடசாலை முறைமையில் மின்சார வசதியற்ற ஆசிரியர் விடுதிகளின் எண்ணிக்கை எவ்வளவென்பதையும்,

(iv) அவற்றிற்குரிய பாடசாலைகளின் பெயர்கள் யாவையென்பதையும்,

(v) மரத்தளபாடங்களுக்கான தேவை காணப்படும் பாடசாலைகளின் எண்ணிக்கை எவ்வளவென் பதையும்,

(vi) அத்தேவைகள் யாவையென்பதையும்,

(vii) விஞ்ஞான கூடங்கள் மற்றும் நூலகங்கள் அற்ற பாடசாலைகளின் எண்ணிக்கை எவ்வளவென்ப தையும்,

(viii) அப் பாடசாலைகளின் பெயர்கள் யாவையென்ப தையும்

அவர் இச்சபைக்குச் சமர்ப்பிப்பாரா?

(இ) (i) மேற்படி தேவைகளைப் பூர்த்திசெய்யத் தேவை யான நிதியை அப்பாடசாலைகளுக்கு ஒதுக்க நடவடிக்கை எடுப்பாரா என்பதையும்,

(ii) அவ்வாறாயின், அது எவ்வளவு காலத்தினுள் நடைபெறுமென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Is he aware that there is a shortage of infrastructure and common amenities in the Government schools coming under the purview of the Hambantota Divisional Education office belonging to the Hambantota Zonal Education office of the Hambantota District?

(b) Will he submit to this House -

(i) the number of school without electricity in the aforesaid school system;

(ii) the names of those schools;

(iii) the number of teachers' quarters without electricity in the aforesaid school system;

(iv) the names of schools to which they belong to;

(v) the number of schools with furniture requirements;

(vi) what those requirements are;

(vii) the number of schools without laboratories and libraries; and

(viii) the names of those schools?

(b) Will he state -

(i) whether action will be taken to make financial allocations required for those schools to fulfill the above mentioned requirements; and

(ii) if so, the period of time during which it will be done?

(c) If not, why?

ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

එතුමා දැන් ප්‍රශ්න අහන්න එන්නේම නැහැ නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඔබතුමා ඒකට කලබල වන්න එපා. ඔබතුමාගේ උත්තරය දෙන්න කෝ. එච්චරයි ඕනෑ.

ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
උත්තරය සභාගත කළා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
** Answer tabled:*

(අ) ඌනතාවක් තිබේ.

(ආ) (i) විදුලිය නොමැති පාසල් නොමැත.

(ii) අදාළ නොවේ.

(iii) විදුලිය නොමැති ගුරු නිවාස නොමැත.

(iv) අදාළ නොවේ.

(v) පාසල් සංඛ්‍යාව - 20යි.

(vi) ඇමුණුම 1හි දක්වා ඇත.

(vii) විද්‍යාගාර නොමැති පාසල් සංඛ්‍යාව - 03යි.

පුස්තකාල නොමැති පාසල් සංඛ්‍යාව - 10යි.

(viii) ඇමුණුම IIහි දක්වා ඇත.

(ඇ) (i) වාර්ෂිකව ලැබෙන ප්‍රතිපාදන මත කටයුතු කරමි.

(ii) අවශ්‍ය ප්‍රතිපාදන ලැබීම අනුව කාලය තීරණය වේ.

(ඈ) අදාළ නොවේ.

ඇමුණුම I

(vi)

අනු අංකය	පාසලේ නම	ගුරු මේස	ගුරු පුටු	ළමා මේස	ළමා පුටු	ළදරු මේස	ළදරු පුටු	මේස	පුටු	කබඩ්	කළු ලෑලි	වයිට් බෝඩ්
01.	හ/මහින්ද රාජපක්ෂ රොටරි මිත්‍රත්ව ආ.ප්‍රා.වි	-	-	50	100	-	බිත්ති කළුලෑලි 04				5	-
02.	හ/බඳගිරිය මුස්ලිම් ක.වි.	5	5	-	-	-	-	-	-	6	3	-
03.	හ/යහංගල ප්‍රා.වි.	2	2	10	20	20	25	-	-	-	-	-
04.	හ/පහළ අන්දරවැව ප්‍රා.වි.	4	4	30	30	15	30	6	30	පොත් රාක්ක 08	6	-
05.	හ/හම්බන්තොට ක.වි.	20	15	165	158	120	228	12	18	5	-	-
06.	හ/බැරගම ක.වි.	12	12	-	-	-	-	-	-	-	-	-
07.	හ/බැරගම ජනපද ක.වි.	8	8	15	-	-	-	-	-	-	-	-
08.	හ/මහආර ක.වි.	5	6	20	20	10	20	-	-	-	-	-
09.	හ/සියඹලාගස්විල ඥානෝදය ක.වි.	11	11	-	-	-	-	-	-	-	-	-
10.	හ/සියඹලාගස්විල ධර්මතිලක ක.වි.	-	9	-	-	-	-	-	-	-	-	-
11.	හ/ගොන්නොරුව ක.වි.	5	6	20	30	30	30	-	-	-	5	-
12.	හ/පල්ලෙමලල ක.වි.	6	8	22	15	18	28	-	-	-	-	-
13.	හ/උඩමලල ක.වි.	5	7	10	10	10	20	-	-	-	3	-
14.	හ/සමෝදාගම ක.වි.	6	8	-	-	-	-	1	2	2	2	-
15.	හ/මිරිජ්ජවිල ම.වි.	6	10	25	30	50	4	50	-	-	-	-
16.	හ/දෙහිගහලන්ද ම.වි	25	25	75	125	50	100	-	35	-	3	-
17.	හ/බඳගිරිය ම.වි.	6	6	55	60	50	50	-	-	-	5	-
18.	හ/ශාන්ත මේරි ජා.පා.	8	-	-	-	-	-	-	-	-	-	-
19.	හ/තෙළුල්ල ක.වි.	6	15	36	-	-	-	-	5	-	-	-
20.	හ/බූන්දල ක.වි	-	-	-	-	-	-	-	-	-	5	-

ඇමුණුම II

(vii) 1. විද්‍යාගාර නොමැති පාසල් සංඛ්‍යාව 03

2. පුස්තකාල නොමැති පාසල් සංඛ්‍යාව 10

(viii) 1. විද්‍යාගාර නොමැති පාසල් ලේඛනය

01	හ/බඳගිරිය මුස්ලිම් ක.වි.
02	හ/සියඹලාගස්විල ඥානෝදය ක.වි.
03	හ/උඩමලල ක.වි.

2. පුස්තකාල නොමැති පාසල් ලේඛනය

01	හ/ගල්වැව ප්‍රා.වි.
02	හ/ යහංගල ප්‍රා.වි.
03	හ/බූන්දල ම.වි.
04	හ/සියඹලාගස්විල ධර්මතිලක ක.වි.
05	හ/මහආර ක.වි.
06	හ/බැරගම ජනපද ක.වි.
07	හ/බැරගම ක.වි.
08	හ/හම්බන්තොට ක.වි.
09	හ/පහල අන්දරවැව ක.වි.
10	හ/බඳගිරිය මුස්ලිම් ක.වි.

(ඇ) (i) වාර්ෂිකව ලැබෙන ප්‍රතිපාදන මත කටයුතු කරමි.

(iii) අවශ්‍ය ප්‍රතිපාදන ලැබීම අනුව කාලය තීරණය වේ.

(ඈ) 1 සහ 1 ට අදාළ රාජකාරි සියල්ලම පළාත් අධ්‍යාපන ලේකම් විසින් සිදු කරනු ලබන බවද වාර්තා කරමි.)

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 11-0647/'10-(1), ගරු රවි කරුණානායක මහතා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඒ ප්‍රශ්නය අහනවා.

ගරු ගීතාංජන ගුණවර්ධන මහතා (මුදල් හා ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன - நிதி, திட்டமிடல் பிரதி அமைச்சர்)
(The Hon. Gitanjana Gunawardena - Deputy Minister of Finance and Planning)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාස දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රශ්නය අහන්නේ -

ගරු ගීතාංජන ගුණවර්ධන මහතා
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
නන්දිකඩාල් කළපුවේ මැයි 18 වන දා වූ ජයග්‍රහණයට මඩ ගහන්නයි මේ ප්‍රශ්නය අහන්නේ, -[බාධා කිරීම්] ඒකටයි මේ ප්‍රශ්නය අහන්නේ. අපි මැයි 18 වන දා නන්දිකඩාල් කළපුවේදී එල්ටීටීඊ නායක ප්‍රභාකරන් සහ ත්‍රස්තවාදය පරාජය කිරීමට - [බාධා කිරීම්] මාස දෙකකින් දෙන්නම් උත්තරය. [බාධා කිරීම්]

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please! ප්‍රශ්න අංක 12-0842/'10-(1), ගරු දයාසිරි ජයසේකර මහතා.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු දයාසිරි ජයසේකර මහතා වෙනුවෙන් මම එම ප්‍රශ්නය අහනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති 8ක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ජ්‍යෙෂ්ඨ පුරවැසියන්: හැඳුනුම්පත
மூத்த பிரசைகள்: அடையாள அட்டை
SENIOR CITIZENS: IDENTITY CARD

13. **ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා (ශාන්ත බණ්ඩාර මහතා වෙනුවට)**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்- மாண்புமிகு சாந்த பண்டார சார்பாக)
(The Hon. Alhaj A.H.M. Azwer on behalf of the Hon. Shantha Bandara))

0871/'10

සමාජ සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) අප රටේ පුරවැසියන් වෙනුවෙන් වැඩිහිටි සංවිධාන පිහිටුවා ඇති බව එතුමා දන්නේද;

(ii) එසේ නම්, දැනට රට තුළ පිහිටුවා ඇති වැඩිහිටි සංවිධාන සංඛ්‍යාව කොපමණද;

(iii) එම ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට වැඩිහිටි හැඳුනුම් පතක් ලබා දීමට කටයුතු කර තිබේද;

(iv) එම හැඳුනුම් පත සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම පිළිගනු ලබන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

சமூக சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) எமது நாட்டின் பிரசைகளுக்கான முதியோர் அமைப்புகள் தாபிக்கப்பட்டுள்ளனவென்பதை அவர் அறிவாரா என்பதையும்,

(ii) ஆமெனில், தற்போது நாட்டில் தாபிக்கப்பட்டுள்ள முதியோர் அமைப்புகளின் எண்ணிக்கை யாதென் பதையும்,

(iii) மேற்படி மூத்த பிரசைகளுக்கு முதியோர் அடையாள அட்டைகளை வழங்க நடவடிக்கை எடுக்கப்பட்டுள்ளதா என்பதையும்,

(iv) மேற்படி அடையாள அட்டை அனைத்து அரச நிறுவனங்களினாலும் ஏற்றுக்கொள்ளப்படுகின்றதா என்பதையும்

அவர் இச்சபைக்கு குறிப்பிடுவாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Social Services:

(a) Will he inform this House-

(i) whether he is aware that elders' associations have been established for citizens of our country ;

(ii) if so, the number of such elders' associations that have been established in our country at present;

(iii) whether arrangements have been made to provide senior citizens with an Identity Card for Elders;

(iv) whether that identity card will be given due recognition by every government institution ?

(b) If not, why ?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමාජ සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:**
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii)

වැඩිහිටි සංවිධාන වර්ග	සංඛ්‍යාව
ග්‍රාමීය වැඩිහිටි කමිටු	10,000
ප්‍රාදේශීය බල මණ්ඩල	206
දිස්ත්‍රික් බල මණ්ඩල	17
පළාත් බල මණ්ඩල	04

(iii) ඔව්.

(iv) ඔව්.

(ආ) අදාළ නොවේ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 14-0924/'10-(1), ගරු ජෝශප් මයිකල් පෙරේරා මහතා.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ජෝශප් මයිකල් පෙරේරා මහතා වෙනුවෙන් මම එම ප්‍රශ්නය අහනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති තුනක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව: නිර්දේශ
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு: விதப்புரைகள்
SRI LANKA HUMAN RIGHTS COMMISSION: RECOMMENDATIONS

0979/'10

15. **ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා (ගරු එම්.ටී. හසන් අලි මහතා වෙනුවට)**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்- மாண்புமிகு எம்.ரீ.ஹசன் அலி சார்பாக)
(The Hon. Alhaj A.H.M. Azwer on behalf of the Hon. M.T. Hassen Ali)
අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව නීතිමය පදනමක් යටතේ ස්ථාපිත ආයතනයක් බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) 1996 අංක 21 දරන පනත යටතේ පිහිටුවා ඇති එම කොමිෂන් සභාව, රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල ඇතුළු වෙනත් රාජ්‍ය ආයතන මඟින් සිදු කොට ඇති මානව හිමිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳව පුරවැසියන් විසින් කරනු ලබන පැමිණිලි විමර්ශනය කොට නිකුත් කරන නිර්දේශ හෝ නියම ක්‍රියාත්මක කිරීමට අදාළ ආයතන බැඳී සිටීද;

(ii) එම කොමිෂන් සභාවේ නිර්දේශ හෝ නියම ක්‍රියාත්මක කළ යුතු බවට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයක් නිකුත් කොට තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඉහත ආ (ii) හි පරිදි චක්‍රලේඛයක් නිකුත් කොට නොමැති නම්, එවැනි රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයක් නිකුත් කිරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு சட்டரீதியான அடிப்படையில் தாபிக்கப்பட்ட ஒரு நிறுவனம் என்பதை அவர் ஏற்றுக்கொள்வாவரா?

(ஆ) (i) 1996ஆம் ஆண்டு 21ஆம் இலக்க சட்டத்தின்கீழ் தாபிக்கப்பட்ட மேற்படி ஆணைக்குழு, அரசாங்க அமைச்சுகள், திணைக்களங்கள், கூட்டுத் தாபனங்கள், நியதிச் சட்ட சபைகள் உள்ளிட்ட ஏனைய அரசாங்க தாபனங்களினால் இழைக்கப் பட்டுள்ள மனித உரிமை மீறல்கள் தொடர்பில், பிரஜைகள் தாக்கல் செய்யும் முறைப்பாடுகளை புலனாய்வு செய்து வழங்கும் விதப்புரைகள் அல்லது பணிப்புரைகளை நடைமுறைப்படுத்துவதற்கு, குறிப்பிட்ட தாபனங்கள் கடப்பாடுடையவையாக உள்ளனவா என்பதையும்,

(ii) மேற்படி ஆணைக்குழுவின் விதப்புரைகளை அல்லது பணிப்புரைகளை நடைமுறைப்படுத்தல் வேண்டுமென பொது நிருவாக சுற்றறிக்கை யொன்று வெளியிடப்பட்டுள்ளதா என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) மேலே அ (ii) இற்கு ஏற்ப சுற்றறிக்கையொன்று வெளியிடப்படவில்லையெனில் அத்தகைய சுற்றறிக்கை யொன்றை வெளியிடுவதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதை இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Buddha Sasana and Religious Affairs:

(a) Will he admit that the Sri Lanka Human Rights Commission is an institution constituted under a legal basis?

(b) Will he state whether-

(i) the relevant institutions are bound to implement the recommendations and orders issued by the aforesaid commission, which is an institution

constituted under Act No. 21 of 1996, after investigating into complaints made by citizens regarding violations of human rights committed by the ministries, departments, corporations, statutory boards and other public sector institutions of the Government ; and

(ii) a Public Administration circular has been issued to the effect that the recommendations of the aforesaid commission should be executed?

(c) Will he inform this House whether action will be taken to issue such a circular, if a circular has not been issued as per (b) (ii) above?

(d) If not, why ?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
* *Answer tabled:*

(අ) ඔව් - 1996 අංක 21 දරන මානව හිමිකම් කොමිෂන් සභා පනත යටතේ ස්ථාපිත කර ඇත.

(ආ) (i) ඔව්.

(ii) ඔව්. 2005.10.05 අංක 17/2005 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය.

(ඇ) ඉහත පිළිතුර අනුව ප්‍රශ්නය පැන නොනඟී.

(ඈ) ඉහත කරුණු අනුව ප්‍රශ්නය පැන නොනඟී.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

මී ළඟට, ප්‍රධාන කටයුතු ආරම්භයේදී යෝජනා පිළිබඳ දැනුම් දීම. ගරු හුනෛයිස් ෆාරුක් මහතා.

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
தனி உறுப்பினர் சட்டமூலங்கள்
PRIVATE MEMBERS' BILLS

අල් ජමියාතුල් ඝව්සියා (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
அல் ஜாமியாத்துல் கவ்ஸிய்யா (கூட்டிணைத்தல்) சட்டமூலம்
AL-JAMIATHUL GHAWSIYYAH (INCORPORATION) BILL

ගරු හුනෛයිස් ෆාරුක් මහතා
(மாண்புமிகு ஹுனைஸ் பாறூக்)
(The Hon. Hunais Farook)

Hon. Deputy Speaker, I move,

"That leave be granted to introduce a Bill to incorporate Al-Jamiathul Ghawsiyyah".

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.

වාර්තා කිරීම සඳහා 47(5) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙත පවරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.

இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.

சட்டமூலம் நிலைக் கட்டளை இல. 47 (5)இன்படி பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.

Question put, and agreed to.

Bill accordingly read the First time, and ordered to be printed.

The Bill stood referred, under Standing Order No. 47(5), to the Minister of Buddha Sasana and Religious Affairs for report.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

දිනට නියමිත කටයුතු. අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සිට 6 දක්වා පනත් කෙටුම්පත් දෙවැනි වර කියවීම.

වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනත් කෙටුම්පත
துறைமுக, விமான நிலைய அபிவிருத்தி அறவீடு சட்டமூலம்
PORTS AND AIRPORTS DEVELOPMENT LEVY BILL

දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

[අ. භා. 1.20]

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, න්‍යාය පත්‍රයේ අංක 1 සිට 6 දක්වා වූ පනත් කෙටුම්පත් අද දින විවාදයට ගැනෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය"යි මම යෝජනා කරනවා. ගරු ඩිව් ගුණසේකර අමාත්‍යතුමා දැන් ඒ පිළිබඳව විස්තර කරනවා ඇති.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ඩිව් ගුණසේකර අමාත්‍යතුමා.

[අ. භා. 1.21]

ගරු ඩිව් ගුණසේකර මහතා (මානව සම්පත් අමාත්‍යතුමා)
(மாண்புமிகு டியூ குணசேகர - மனித வளங்கள் அமைச்சர்)
(The Hon. DEW Gunasekara - Minister of Human Resources)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2011 අය වැය වාර්තාව ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවේ ඔබතුමාට මතක ඇතිය කියා මා සිතනවා, මූල්‍ය බදු සහ ආයෝජන සම්බන්ධයෙන් විශාල වෙනසක් කරන බවට රජය ප්‍රතිඥාවක් දුන්න බව. ඒ අනුවයි මධ්‍ය කාලීන ප්‍රතිපත්ති රාමුව තුළ රජය අද මේ සංශෝධන පනත් කෙටුම්පත් ඉදිරිපත් කර තිබෙන්නේ.

අද මට වෙන් කර තිබෙන කාලය තුළ මා උත්සාහ ගන්නවා සංකල්පමය වශයෙනුත්, ප්‍රායෝගික වශයෙනුත් දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව අදහස් කිහිපයක් තමුන්නාන්සේලා වෙත ඉදිරිපත් කරන්න. මේ මුදල් පනත් කෙටුම්පත්වලින් අපේක්ෂා කරන්නේ කුමක්ද යන්න මම පළමුව කියන්නම්. [බාධා කිරීමක්]

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
Sir, I rise to a point of Order. අදට නියමිත පනත් කෙටුම්පත් ටික ඔක්කෝම එක වර ගන්නවාද; එහෙම නැත්නම් එක එක ඉදිරිපත් කරනවාද?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
මා දැන් කිව්වේ.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
අපට සංශෝධනයක් ඉදිරිපත් කරන්න තිබෙනවා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ඒක ගෙනෙන්න පුළුවන්. සංශෝධන ගෙන එන්නේ කාරක සභා අවස්ථාවේදී නේ. කාරක සභා අවස්ථාවට ආවාම ඔබතුමාට පුළුවන් සංශෝධනය move කරන්න.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මා මේ කියන්නේ අපේ පහසුව සඳහා. විශේෂයෙන්ම අංක 2 යටතේ ඉදිරිපත් කරන ලද, එනම් බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් -

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ඒක කෙරෙන්නේ Committee Stage එකේදී නේ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
You cannot move it now.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
That is right. We just want to give notice that we are moving an amendment to that Bill.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
We have already got notice of that. Do not worry about that. But, it will be defeated; we are not going to accept that.

ගරු ජෝන් අමරතුංග මහතා
((மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
We want to know whether you are opposing that?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
We are opposing that.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
That is all I want to know. Then, we will have to go for a Vote.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
Yes, of course. We are ready for a Vote. There is no problem.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
That is why I wanted to get that clarification.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Do you want a Vote?

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
There is no problem. It is just that I must know it because we have to inform our Members.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
Yes.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Do not worry.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
It is okay. It is all right. It is a matter of courtesy.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
They are busy somewhere else.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
It had been brought in by the Hon. Karu Jayasuriya. If you are not agreeing to that -

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
Not by the Hon. Sajith Premadasa, the Deputy to the Leader of the Opposition. Is it? The Hon. Karu Jayasuriya is the third.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
When the time comes, it will take place.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
Why should the third person move an amendment when the second person is available in the country?

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
Do not worry about our arrangements. We will look after ourselves.

ගරු ඩිව් ගුණසේකර මහතා
(மாண்புமிகு டியூ குணசேகர)
(The Hon. DEW Gunasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ මුදල් පනත් කෙටුම්පත්වලින් අපේක්ෂා කරන්නේ කුමක්ද? යටිතල පහසුකම් බද්ද ඉවත් කිරීම; සමාජ වගකීම් බද්ද ඉවත් කිරීම; හර බදු ඉවත් කිරීම; ආදායම් බදු සංශෝධනය කිරීම; ඇතැම් ගාස්තු ඉවත් කිරීම; යහපත් බදු ගෙවන්නන්ට විශේෂ සහන ලබා දීම; නව ගාස්තු හඳුන්වා දීම; නිෂ්පාදන බදු සංශෝධනය; අය කරනු ලබන නව බදු ප්‍රමාණය තීරණය කිරීම; ඇතැම් බදු ප්‍රභවයන්ට අදාළ අත් හිටුවීමේ බද්ද ඉවත් කිරීම; ආර්ථික සේවා ගාස්තු සංශෝධනය; සමාගම් බද්ද ප්‍රතිශෝධනය කිරීම; සමාජයේ හඳුනා ගත් ස්තරයන්ට සහන; බදු පදනම පුළුල් කිරීම; ඇතැම් ගාස්තු -මුද්දර ගාස්තු - පළාත් සභාවලට මාරු කිරීම; බදු අභියාචන කොමිසම; ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මූලික වශයෙන් මේ කාරණා තමයි මෙම පනත් කෙටුම්පත්වල අන්තර්ගත වෙලා තිබෙන්නේ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
Sir, I rise to a point of Order.

ගරු ඩිව් ගුණසේකර මහතා
(மாண்புமிகு டியூ குணசேகர)
(The Hon. DEW Gunasekara)
Yes, Hon. Member?

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
අද ඒවා නැහැ නේ. අද තිබෙන්නේ වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්ද පිළිබඳ -

ගරු ඩිව් ගුණසේකර මහතා
(மாண்புமிகு டியூ குணசேகர)
(The Hon. DEW Gunasekara)
නැහැ, නැහැ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
බැංකු මඟින් ප්‍රදානය කරන ණය අය කර ගැනීමයි, නිෂ්පාදන බදුයි. ඔබතුමා හරබදු ගැන කිව්වේ පෙරේදා.

ගරු ඩිව් ගුණසේකර මහතා
(மாண்புமிகு டியூ குணசேகர)
(The Hon. DEW Gunasekara)
නැහැ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඊයේ.

ගරු ඩිව් ගුණසේකර මහතා
(மாண்புமிகு டியூ குணசேகர)
(The Hon. DEW Gunasekara)
මම සමස්තයක් වශයෙන් කියන්නේ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඒ කථාවත් එක්කද?

ගරු ඩිව් ගුණසේකර මහතා
(மாண்புமிகு டியூ குணசேகர)
(The Hon. DEW Gunasekara)
මම කළේ අය වැයෙන් ඉදිරිපත් කරපු දේවල් ඊට පසුව නැවත මතක් කර දීමයි.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
හරි, හරි. මම හිතුවා අද තිබෙන ඒවා කියලා.

ගරු ඩිව් ගුණසේකර මහතා
(மாண்புமிகு டியூ குணசேகர)
(The Hon. DEW Gunasekara)
ඔය ගොල්ලන්ට අමතක වනවා නේ. මම පටන් ගන්න කොටම කිව්වා, මට තිබෙන වෙලාව අනුව දේශීය ආදායම්වලට අදාළව විතරයි කථා කරන්නේ කියලා. මගේ පූර්විකාවෙන් මම කියා සිටියා - [බාධා කිරීමක්] ඒ, එකයි නේ. මම ඊයේ කථා කළේ නැහැ. මම පෙරේදා කථා කළේ නැහැ. [බාධා කිරීමක්] ඒ අනුව මෙහිදී බදු ප්‍රතිපත්තිය, බදු නීතිය, බදු පරිපාලනය වෙනුවෙන් ප්‍රබල වෙනස් කිරීම් සිදු වනු ඇත. මෙහිදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට පැවරෙන්නේ විශාල වග කීමක්. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට රාජ්‍ය පරිපාලනයේ ඉතාමත් කීර්තිමත් නාමයක් තිබුණු බව අපි දන්නවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එක් අවධියකදී එහි සේවය කළ හිටපු බදු නිලධාරියෙක් වශයෙන් එම දෙපාර්තමේන්තුව ගැන මට කිව හැක්කේ අප එදා සිටියේ මහත් ආඩම්බරයෙන් බවයි. උගත්කම, නිපුණත්වය, අවංකභාවය, කාර්යක්ෂමතාව, බදු ගෙවන්නා පිළිබඳ ආකල්ප එදා ඉතාමත් ඉහළ මට්ටමක තිබුණා. ආදායම් බදු විශේෂඥයෙක් වූ, එදා බදු කොමිසමේ සභාපති වූ මහාචාර්ය නිකලස් කැල්ඩෝ මහතා "බදු නිලධාරියා" පිළිබඳව හඳුන්වා දුන්නේ, බදු නිලධාරියා වනාහි අර්ථ ශාස්ත්‍රඥයෙකු, නීතිවේදියෙකු සහ ගණකාධිකාරිවරයෙකු බවයි; ත්‍රිත්ව නිපුණත්වයෙන් යුත් පුද්ගලයෙකු බවයි. බදු නිලධාරියෙකු විධියට එදා ඒ කොමිෂන් සභාවේ සාක්ෂි දීපු කෙනෙකු හැටියට මම කියා සිටින්නේත් එයයි. ඒක තමයි අපි අපේක්ෂා කළේ. අද අපට එසේ "බදු නිලධාරියා" හඳුන්වා දිය හැකිද? මා කල්පනා කරනවා, තවමත් ඒ තත්ත්වය පවතිනවා කියා. එසේ නොමැති නම් මම හිතන්නේ එය නිලධාරින්ගේ වරද නොවෙයි. අප සමාජය විසින් එවැනි ත්‍රිත්ව දක්ෂකම්වලින් යුක්ත පුද්ගලයන් බිහි කර ඇත්තේ, ඇති නැති බවින් පමණයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එසේ නොතිබෙනවා නම් මේ තත්ත්වය අප විසින් වෙනස් කළ යුතුයි. එය වෙනස් විය යුතුයි. මෙහිදී නව බදු කොමිසමේ නිර්දේශයන් තමුන්නාන්සේලා වෙත ළඟදීම ඉදිරිපත් කරනවා ඇති. කොමිෂන් සභාවේ නිර්දේශයන් පදනම් කර ගෙනයි බදු පනත් කෙටුම්පත්වලට සමහර දේවල් අප අන්තර්ගත කර තිබෙන්නේ. ඊට පිටුවහලක් වන පරිදි බදු සංකල්පය පිළිබඳ මා යමක් කිව යුතුයි. අඩ සිය වසරකට පෙර බදු අය කිරීම දුටුවේ තෙරුමක් නැති අවශ්‍යතාවක් හැටියටයි. රජය දරන වියදම් පියවා ගැනීමට කරන අනර්ථ ව්‍යායාමයක් ලෙසයි එදා බදු ප්‍රතිපත්තිය; බදු පිළිබඳ සංකල්පය හඳුන්වා දුන්නේ. එහෙත් අද බදු පිළිබඳ සංකල්පය මුළුමනින්ම වෙනස්. අද එය යහ පාලනයට, ආර්ථික වර්ධනයට, සමාජ සාධාරණත්වයට, ආර්ථිකයේ ස්ථාවරත්වයට, භාණ්ඩ මිල තුලනයට, රැකියා සම්පාදනයට ආදී ජාතික ආර්ථිකයේ ප්‍රබල කාර්ය භාරයන් ඉටු කරන ප්‍රතිපත්තියක් බවට පත් වෙලා තිබෙනවා. මහාචාර්ය නිකලස් කැල්ඩෝ කියන විධියට බදු අය කිරීම සංවර්ධනයේදී මූලික කාර්යයන් දෙකක් ඉටු කරනවා. ඒ, ආයෝජන දිරි ගැන්වීම සහ ආයෝජන සම්පත් සම්පාදනය. ඒ අනුව අද බදු ප්‍රතිපත්තිය සංවර්ධන ප්‍රතිපත්තියට අදාළ අනිවාර්ය කේන්ද්‍රීය මෙවලමක්.

1977 වර්ෂයේදී නව ලිබරල්වාදයේ ආගමනයත් සමඟ ආර්ථික සංවර්ධනය සඳහා යොමු කරනු ලැබූ බදු ප්‍රතිපත්තිය මුළුමනින්ම ආ පස්සට හරවනු ලැබුවා. සිදු වූයේ කුමක් ද? 1977 දී දළ දේශීය නිෂ්පාදිතයේ සියයට විසිපහක් වූ රජයේ ආදායම 2004 වන විට සියයට 13 දක්වා ඇද වැටුණා. අය වැය හිඟය පුළුල් වුණා. සංවර්ධනයට මුදල් නැති වුණා, අය වෙනුවට ණය ආදේශ කළා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට යට වුණා, රටේ සංවර්ධනය බාල්දු වුණා, නව ලිබරල්වාදියේ දෘෂ්ටියට යට වුණා, දුප්පත් පොහොසත් පරතරය පුළුල් වුණා, එදා භාණ්ඩාගාරය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ දෙපාර්තමේන්තුවක් බවට පත් වුණා. පීඩනය, මර්දනය, දූෂණය, ඝාතනය සමාජයේ ඉහ වහා ගියා. මේවා සියල්ලක්ම ඒවායේ ඵල, නිෂ්පාදන.

මා හිතන්නේ ප්‍රේමදාස යුගයේදී මෙය ඉතාම බේදජනක තත්ත්වයකට පත් වුණා කියලායි. ඒ නිසා යළිත් වරක් අපේ රටේ ජනතාව ප්‍රේමදාස යුගයක් ඇති කරලීමට කිසි සේත් ඉඩ දෙන්නේ නැහැයි කියා මම කල්පනා කරනවා. මෙය තේරුම් කිරීමට -

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
කථාව කවදාද හැදුවේ?

ගරු ඩිව් ගුණසේකර මහතා
(மாண்புமிகு டியூ குணசேகர)
(The Hon. DEW Gunasekara)
දැන් හදා ගෙන ආවේ. වෙලාව මදි හින්දා මම ලියුවේ. නැත්නම් මම කොළය නැතිව කථා කරනවා.

මෙය තේරුම් ගැනීමට හුදෙක් ආර්ථික විද්‍යාව හැදෑරීම පමණක් ප්‍රමාණවත් නොවෙයි. එයට ඔබතුමා මාත් එක්ක එකඟ වනවා ඇති. ඒකට දේශපාලන අර්ථ ශාස්ත්‍රය හැදෑරිය යුතුයි. Political economy is not merely a political theory. එතැනදී තමයි හුඟක් අය පොට වරද්දා ගන්නේ. මෙය දේශපාලන ආර්ථිකය නැත්නම් ආර්ථිකයේ දේශපාලනය පිළිබඳව ප්‍රශ්නයක්. 1994 දී ආණ්ඩු වෙනසක් සිදු වුවද, අපට නව ලිබරල්වාදයෙන් මිදීමට තබා එයින් දුරස්ථ වීමටවත් බැරි වූයේ සාධක දෙකක් නිසායි. පළමුව, රට තුළ හා ආණ්ඩුව තුළ පැවැති බල තුලනයයි. දෙවනුව, නව ලිබරල්වාදයේ ප්‍රභවය වන ජාත්‍යන්තර සාධකය. රේගන්-තැචර් අධිපතිවාදය හරහා ඒකධ්‍රැව ලෝක රටාවක් නිර්මාණය වුණා. යුරෝපයේ සමාජවාදී කඳවුර බිඳ වැටුණා. ඒ නිසා ඊට ප්‍රබල ගැම්මක් ලැබුණා. දැන් මේ සාධක දෙක වෙනස් වෙමින් පවතිනවා. විසි එක්වන සිය වසේ ආරම්භයත් සමඟ ලෝක රටාව මෙන්ම ලෝක බල තුලනය වෙනස් වෙමින් පවතිනවා. ආසියාව ලෝක ආර්ථිකය මෙහෙයවන තත්ත්වයට පත් වෙමින් තිබෙනවා. ලතින් අමෙරිකානු පිබිදීම මේ ප්‍රවණතාවට ප්‍රබල ලෙස බල පා තිබෙනවා. මෙම ඓතිහාසික පසු බිම තුළයි මහින්ද රාජපක්ෂ පාලනය බිහි වන්නේ. "යළි පුබුදමු ශ්‍රී ලංකා" යන නව ලිබරල්වාදී චින්තනය වෙනුවට විකල්පයක් හැටියට මහින්ද චින්තනය ඉදිරිපත් කරනු ලැබුවේ එම ඓතිහාසික පසු බිම තුළයි. රට තුළ සහ ආණ්ඩුව තුළ බල තුලනය වෙනස් කර ලීමට එදා ඒ ජාත්‍යන්තර සාධකය ආධාර වුණා. [බාධා කිරීමක්] ඔව්. අනුර දිසානායක මන්ත්‍රීතුමනි, ඔබත් ඒකට සහයෝගය දුන්නා. ඒ ගෞරවය තවමත් අප සතුව තිබෙනවා. අපේ ආර්ථිකයේ මූලික වෙනස්කමට මඟ පෑදුණේ එම කොන්දේසි යටතේයි. රාජ්‍ය අංශය ව්‍යාප්ත වීම, රාජ්‍ය මැදිහත් වීම සංවර්ධනයේ නව මෙවලමක් බවට පත් වී තිබෙනවා. ඒ අනුව බදු ප්‍රතිපත්තිය, බදු නීතිය, බදු පරිපාලනය වෙනස් විය යුතුයි. රජයේ ආදායම් පහත වැටීමේ ප්‍රවණතාව අප නතර කර තිබෙනවා. රජයේ ආදායම් වැඩි වන්නට පටන් ගත්තේ වසර විසිපහකට පසුවයි. මේ තමයි ප්‍රතිපත්ති දෙකේ වෙනස. සංවර්ධනය අඩු මට්ටමේ පවතින විට රජයකට සිදු වන්නේ වක්‍ර බදු මත යැපීමටයි. එවිට පොදු ජනතාව මත බර පැටවෙනවා. ඒ නිසා ඍජු බදු කරා යෑම අවශ්‍යයි. අපේ බදු ප්‍රතිපත්ති සකස් වී තිබෙන්නේ ඒ සංවර්ධන අරමුණ අනුවයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මූලික වශයෙන් ගත්තාම අද ඉදිරිපත් කර තිබෙන පනත් කෙටුම්පත්වල ඒ අන්තර්ගතය පිළිබඳ කාරණාවල පෙරවදනක් වශයෙන් තමයි මම මේ විස්තර

ඉදිරිපත් කළේ. ඒ නිසා බදු ප්‍රතිපත්තියත්, බදු නීතියත්, බදු පරිපාලනයත් වෙනස් කරලීමේ ව්‍යායාමයක තමයි අප ඉන්නේ. ඊයේත්, පෙරේදාත්, අදත් -මේ දවස් තුන තුළ- විවිධ පනත් සංශෝධන අප ඉදිරිපත් කර තිබෙනවා. මේ හැම එකකින්ම අපි බලාපොරොත්තු වන ප්‍රධානම කාරණාවක් වන්නේ ක්‍රමානුකූලව ආර්ථික සංවර්ධනයට යොමු කරන බදු ප්‍රතිපත්තියක් ගොඩ නැඟීමයි. එහිදී අනිවාර්යයෙන්ම අපේ ප්‍රධාන අරමුණ රජයේ ආදායම වැඩි කිරීමයි. රජයේ ආදායම අවුරුදු 25ක් තිස්සේ පහත වැටුණා. 1977 දී රොනී ද මැල් මහත්මයා එක්සත් ජාතික පක්ෂයේ පළමුවැනි අය වැය ලේඛනය ඉදිරිපත් කරන කොට රජයේ ආදායම දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 25යි. 2004 වර්ෂය වන කොට එය සියයට 13ට බැහැලා තිබුණා. එහෙම බැස්සේ ප්‍රතිපත්තියක් නිසායි. එදා උපකල්පනය කළා නව ලිබරල් ආර්ථික ප්‍රතිපත්තිය වුණාම ආණ්ඩුවක් තිබෙන්නේ නීතිය හා සාමය සඳහා පමණයි කියලා. ඒකට තමයි "පුංචි ආණ්ඩුවක්" කියලා කියන්නේ. මේ නව ලිබරල්වාදයට දැන් ලංකාවේ ආර්ථික විද්‍යාඥයන් අතර හොඳ වචනයක් භාවිත වෙනවා. ඒක තමයි මේ පුංචි ආණ්ඩුවක කථාව. ආණ්ඩුවක කාර්ය භාරය වන්නේ නීතිය හා සාමය රැකීම මිස ආර්ථිකයට ඇඟිලි ගැහීමවත්, ආර්ථිකය මෙහෙයවීමවත්, ආර්ථිකය ගැන හොයා බැලීමවත් නොවෙයි කියන එක තමයි නව ලිබරල්වාදයේ හරය. මේ චින්තන දෙකේ වෙනස ඇති වන්නේ අන්න එතැනදීයි. අපි අවුරුදු 25ක අත් දැකීම් ලබා ගත්තා. ලතින් ඇමෙරිකාවත් අවුරුදු 30ක අත් දැකීම් ලබලා තිබෙනවා. ඇමෙරිකාව හැර, පුංචි කියුබාව හැර රටවල් 33ක් මේ ආර්ථික වැඩ පිළිවෙළ, ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරලා අන්තිමේදී ඉතුරු වුණේ මොනවාද? ඒ රටවල දුප්පත් පොහොසත් පරතරය, මන්ද පෝෂණය, විරැකියාව, අසහනය, විවිධාකාරයේ සමාජ දේශපාලන ප්‍රශ්න, ප්‍රජාතන්ත්‍රවාදය නැති වීම, නොයෙක් ආකාරයේ මර්දන, පීඩනය, දූෂණය -මේ සියල්ලක්ම- ඇති වන්නට පටන් ගත්තා. අන්තිමේදී ජනතා නැඟිටීම්වලින් තමයි මේ රටවල් සියල්ලක්ම ප්‍රතිසංස්කරණයට යොමු වුණේ. මෙක්සිකෝ රට හැරුණාම මා හිතන්නේ අනෙක් සියලුම රටවල් ප්‍රතිසංස්කරණයට යොමු වෙලා තිබෙනවා. ඒ නව ලිබරල් ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳ කෲර ලෙස අත් දැකීම් ලබා ගත් චිලී ජනතාව, තමන් ඡන්දයෙන් තෝරා පත් කර ගත් ඇලෙන්ඩේ ජනාධිපතිතුමාව ඝාතනය කරලා, ත්‍රිවිධ හමුදාවේ නිලධාරින් ඝාතනය කරලා, රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණයකින් බලය අල්ලා ගත්තා. පළමුවන වතාවට මිල්ටන් ෆ්‍රිඩ්මන් ආර්ථික විද්‍යාඥයාගේ න්‍යාය චිලී රටෙන් තමයි භාවිතයට පත් කළේ. මේ නව ලිබරල් ප්‍රතිපත්තිය තුන්වන ලෝකයේ රටක ස්ථාපිත කරලා, ප්‍රතිඵල ලබා ගන්න පුළුවන්ද කියලා බලන්න උත්සාහ කළා. ඇත්ත, ආර්ථික සංවර්ධනයක් සිදු වුණා. සියයට 7ක, 8ක ආර්ථික සංවර්ධනයක් ඇති වුණා. නමුත් දුප්පත් පොහොසත් පරතරය විශාල වන්නට පටන් ගත්තා. විරැකියාව වැඩි වන්නට පටන් ගත්තා. පොහොසතා තව තවත් පොහොසත් වුණා. දුප්පතා තව තවත් දුප්පත් වන්නට පටන් ගත්තා. අන්තිමේදී එම මෘග ඒකාධිපති පිනෝෂේගේ රජය ප්‍රජාතන්ත්‍රවාදී විධියට පෙරළා දමන්නට එම නව ලිබරල්වාදී ආර්ථිකයේ පීඩනයට ලක් වෙච්ච ජනතාව පෙලඹුණේ තමන් 1970 ගණන්වල ඉඳලා ලබපු අත් දැකීම් නිසායි. ඒ අනුවම අනෙක් රටවලුත් අත් දැකීම් ලැබුවා. අපිත් ඒ ආකාරයටම 1977 ඉඳලා අවුරුදු විසි ගණනක් තිස්සේ එම අත් දැකීම් ලබලා, දැන් ඒ තත්ත්වය වෙනස් කර ගෙන තිබෙනවා. නමුත් අපි කිව්ව ආකාරයට 1994 දී අපි ආණ්ඩු වෙනසක් ඇති කළාට, අපට එම නව ලිබරල් ආර්ථික ප්‍රතිපත්තියෙන් මිදෙන්නට නොවෙයි, දුරස් වෙන්නවත් පුළුවන්කමක් තිබුණේ නැහැ. ඒකට බාධක තිබුණා. ආණ්ඩුව තුළ තිබුණු බල තුලනයත්, ජාත්‍යන්තර සාධකත් ඒකට හරස්ව තිබුණා. නමුත් 2005 වසර වන කොට මහින්ද රාජපක්ෂ මැතිතුමා ජනාධිපති වීමත් සමඟම ජාත්‍යන්තර තත්ත්වයේ වාතාවරණය වෙනස් වුණා. ආසියාවේ මහා පිබිදීමක් ඇති වුණා. ලතින් ඇමෙරිකාවේ පිබිදීමක් ඇති වෙලා ජාත්‍යන්තර සාධකය වෙනස් වුණා. ඒ නිසා අපට ශක්තියක්, ආස්වාදයක් ලැබුණා, මෙහි වෙනසක් ඇති කරන්නට. ඊ ළඟට අපට පුළුවන්කම ලැබුණා බල තුලනය වෙනස් කරලා අද වන විට තුනෙන් දෙකක බලයක් ලබා ගන්න. එහෙනම් එම සාධක දෙකම අද අපි සපුරා තිබෙනවා. බදු ප්‍රතිපත්තියේ, බදු පරිපාලනයේ, බදු නීතියේ ප්‍රබල වෙනසක් ඇති කිරීමේ පනත් කෙටුම්පත් රාශියක් දවස් තුනක් තිස්සේ තමුන්නාන්සේලා හමුවේ සාකච්ඡා කරන්න පුළුවන් වෙලා තිබෙන්නේ ඒ නිර්මාණය වෙලා තිබෙන දේශපාලන වාතාවරණයත්, ජාත්‍යන්තර වාතාවරණයත් නිසායි. එම නිසා මෙය ප්‍රගතිශීලී ඉදිරි ගමනට කරන විශාල තල්ලුවක් කියා කල්පනා කරනවා. මගේ මිත්‍ර අනුර දිසානායක මන්ත්‍රීතුමාත් ආණ්ඩු පක්ෂය පැත්තේ සිටියා නම් අපට මීට වඩා වේගයෙන් මේක ඉදිරියට අරගෙන යන්න තිබුණා. එසේ නොවීම ඛේදවාචකයක්. බොහොම ස්තුතියි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

බොහොම ස්තුතියි. ඊ ළඟට ගරු කරු ජයසූරිය මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 20ක් තිබෙනවා.

[අ. භා. 1.40]

ගරු කරු ජයසූරිය මහතා
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද පනත් කෙටුම්පත් හයක් පාර්ලිමේන්තුවේ විවාද කෙරෙනවා. අපේ පක්ෂය නියෝජනය කරමින් කථිකයින් හය දෙනෙක් මේ සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කරනවා ඇති. මේ පනත් කෙටුම්පත් හයෙන් එක් පනත් කෙටුම්පතක් වන බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පතට පමණක් විශේෂයෙන්ම අද මගේ කථාව සීමා කරන්න මා බලාපොරොත්තු වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සංශෝධනය නැවත වරක් ඉදිරිපත් කිරීමට පෙලඹුණේ වර්තමාන දේශීය හා විදේශීය ආර්ථික අර්බුදය හමුවේ පීඩා විඳින දහස් සංඛ්‍යාත සුළු හා මධ්‍යම පරිමාණයේ ව්‍යවසායකයින් වෙනුවෙනුයි. මහා පරිමාණයේ ව්‍යාපාරිකයින්ට අසීමිත මූල්‍ය පහසුවක් ලැබෙතත්, සුළු ව්‍යාපාරිකයින්ට බැංකුවලින් ණය ලබා ගැනීමේදී නොයෙකුත් අපහසුතා ඇති වනවා. ඒ වාගේම සමහර අවස්ථාවල දේශපාලන අනුග්‍රහය ලැබ ණය ලබා ගත්තත්, මූල්‍ය පහසුකම් ලබා ගැනීමට බහුතරයකට ඒ ආශීර්වාදය ලැබෙන්නේ නැහැ.

අද මේ රටේ තිබෙන රජයේ සහ වාණිජ බැංකු ඉහළ ලාභ ඉපයීම ගැන අපි සන්තෝෂ වනවා. එමෙන්ම විවිධ හේතූන් මත තම ණය මුදල ගෙවා ගැනීමට නොහැකිව අසරණ වූ, පාරට වැටුණු, අනාථ වුණු ව්‍යාපාරිකයින් බොහෝ දෙනකු ගැන අපි දන්නවා. මා මෙසේ සඳහන් කරන්නේ, අවුරුදු 32ක් පෞද්ගලික අංශයේ සහ වෙළෙඳ මන්ත්‍රණ සභාවල නිලයන් හෙබ වූ, මේ ක්ෂේත්‍රය ගැන යම් කිසි අත් දැකීමක් ලත් පුද්ගලයෙක් වශයෙනුයි. එම නිසා රජයේ අවධානය, අනුකම්පාව සුළු හා මධ්‍යම පරිමාණයේ ව්‍යාපාරිකයන් වෙනුවෙන් යොමු විය යුතුයි කියලා අපි මේ අවස්ථාවේදී රජයට යෝජනා කරනවා. ඒ වාගේම ඒ අය නැවත නඟා සිටු වීම සඳහා යම් කිසි හදිසි වැඩ පිළිවෙළක් දියත් කිරීමේ අවශ්‍යතාවත් පෙන්වා දෙන්නට කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වර්තමාන ආර්ථික පසු බිම තුළ පීඩා විඳින කොට්ඨාස කිහිපයක් මා හඳුන්වා දෙන්නට කැමැතියි. පළමුවෙන්ම, නියමිත වෙලාවට මුදල් ලැබුණු හා නොලැබුණු සුළු හා මධ්‍යම පරිමාණයේ කොන්ත්‍රාත්කරුවන්.මේක විශේෂයෙන්ම බලපවත්වන්නේ රජයේ

[ගරු කරු ජයසූරිය මහතා]

කොන්ත්‍රාත්කරුවන්ට හා අසීමිත පාඩු ලැබූ ආයතනවලටයි. මේ හේතුවෙන් මුදල් ප්‍රමාද වීමෙන් පීඩා විඳි බංකොලොත් වූ ව්‍යාපාරිකයන් බොහෝ දෙනෙක් ඉන්නවා. ඒ සම්බන්ධයෙන් අපට අතිවිශාල සංඛ්‍යාවක් ගැන කරුණු ඉදිරිපත් කරන්න පුළුවන්. මේ මුදල් ලබා ගැනීමේදී සමහර විට මාස 6, 10, අවුරුද්ද ගිය අවස්ථා ගැනත් අප දන්නවා. මෙවැනි පීඩාවන්ට පත් වූ අය ඉහළ පොලියට තමයි කෙටි කාලීන ණය ලබා ගන්නේ. මේ හේතුවෙන් විශාල පාඩු ලැබූ අවස්ථා අප දැක තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ තත්ත්වය සිල්ලර වෙළෙන්දාටත්, තොග වෙළෙන්දාටත් තදින් බලපානවා. සිල්ලර වෙළෙඳාම හා තොග වෙළෙඳාම අද විශාල ගරා වැටීමකට ලක් වෙලා තිබෙනවා. ජනතාවගේ මිලදී ගැනීමේ හැකියාව අද බොහෝ දුරට අඩු වෙලා තිබෙනවා. මේ ක්ෂේත්‍රයට විශාල බලපෑමක් කිරීමට මෙය හේතු වෙලා තිබෙනවා. කලින් ආහාර ද්‍රව්‍ය කිලෝ එකක් ගත් අයෙක් අද ගන්නේ ග්‍රෑම් 200යි, එහෙම නැත්නම් ග්‍රෑම් 400යි. මෙන්න මේකයි යථාර්ථය. ඉස්සර 500 දෙනෙකුට මඟුල් ගෙදරකට ආරාධනා කළත් අද ආරාධනා කරන්නේ ඒකෙන් භාගයකටයි. මේ පනතේ යෝජිත පරාටේ ආවරණය මිලියන 5 සීමාව වර්තමාන ආර්ථික පසු බිම තුළ යථාර්ථයක් වන්නේ නැහැ කියන මතයේ තමයි අපි ඉන්නේ. සමහර ප්‍රදේශවල ඉඩම් පර්චසයක් රුපියල් මිලියන 4ක්, 5ක් වන විට මේ සීමාව කෙසේවත් සාධාරණ වනවාය කියා අපට දකින්න අමාරුයි. ඒ නිසා තමයි මේ සීමාව රුපියල් මිලියන 50 දක්වා ඉහළ දමන්නය කියා අප ඉල්ලා සිටින්නේ. වෙනත් රටවල ව්‍යාපාරිකයන් වෙනුවෙන්, එහෙම නැත්නම් අසරණ වූ ව්‍යාපාරිකයන් වෙනුවෙන් නැවත නඟා සිටුවීමේ ක්‍රමවේද ඇති කර තිබෙනවා. සමහර රටවල සංවර්ධන බැංකු තිබෙනවා. විශේෂයෙන්ම මෙන්න මේ ක්ෂේත්‍රයේ කුඩා හා මධ්‍යම පරිමාණයේ ව්‍යාපාරිකයා ගොඩ නැඟීම සඳහා, බේරා ගැනීම සඳහා, සංවර්ධනය කිරීම සඳහා යම් කිසි ක්‍රමවේදයක් වහාම ඇති විය යුතුයි කියන එකයි අපි දකින්නේ. ඒ වාගේම ආර්ථික සංවර්ධනයක් ගැන කථා කරන කොට අපි වාගේ කුඩා රටකට සුළු හා මධ්‍යම පරිමාණයේ ව්‍යවසායකයා ඉතාමත් වැදගත් වනවා. මේ ක්ෂේත්‍රය ශක්තිමත් කළොත් පමණයි අපට මේ රටේ සංවර්ධනයටත් මේ අය හවුල් කර ගන්න පුළුවන් වන්නේ. ඒ නිසා මේ කරුණු කිහිපය සලකා බලා අපි නැවත වරක් රජයට ආයාචනා කරනවා -ඉල්ලා සිටිනවා- මේ රටේ බලවත් සේ පීඩා විඳින කුඩා හා මධ්‍යම පරිමාණයේ ව්‍යාපාරිකයන් වෙනුවෙන් ඒ පරාටේ ආවරණය රුපියල් මිලියන 5, මිලියන 50 දක්වා වැඩි කරන්න කියලා. ඒ සම්බන්ධයෙන් අපි ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. ඔබතුමාට බොහොම ස්තුතියි.

[අ. භා. 1.46]

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා (වරාය හා මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன - துறைமுகங்கள், நெடுஞ்சாலைகள் பிரதி அமைச்சர்)

(The Hon. Rohitha Abeygunawardana - Deputy Minister of Ports and Highways)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දවසේදී මුදල් අමාත්‍යාංශයට අයත් පනත් කෙටුම්පත් කිහිපයක් ගැන සාකච්ඡා කරන අවස්ථාවේදී කථා කිරීමට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට මගේ ස්තුතිවන්තභාවය පුද කරනවා. අපි දන්නවා, පසු ගිය දින දෙක තුළම ඉදිරිපත් කරපු පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් මේ පාර්ලිමේන්තුව තුළ නොයෙක් වාද විවාද ආණ්ඩු පක්ෂයත්, විපක්ෂයත් අතර ඇති වුණාය කියා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දැක්කා මේ විවාදවලදී විශේෂයෙන්ම මාගම්පුර මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර වරාය සම්බන්ධයෙන් දයාසිරි ජයසේකර මන්ත්‍රීවරයා ඊයේ කරුණු දක්වපු ආකාරය. මේ වරාය කිසිම වැඩකට නැති, කිසිම ඵලදායිතාවක් නැති වරායක් බවයි ඔහු ප්‍රකාශ කළේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපි බොහොම පැහැදිලිව මතක් කරන්න ඕනෑ, කොළඹ වරායට සමගාමීව ජාත්‍යන්තරය සමඟ ගනුදෙනු ඇති කරන මෙවැනි ගොඩ බිමක් තුළ ඉදි කළ වරායක් මේ රටේ දරුවන්ට දායාද කිරීම ගැන මුහුදෙන් වට වුණු දූපතක ජීවත් වන ජනතාවක් හැටියට මේ රටේ ජනතාව මේ රටේ රාජ්‍ය නායකයාට ණය ගැති විය යුතුයි කියා. අපි මේ වරායේ වැඩ ආරම්භ කළේ 2008 ජනවාරි මාසයේ 15 වැනි දායි. එසේ වැඩ ආරම්භ කරපු වරායේ කර දියවර මංගල්‍යය 2010 නොවැම්බර් මාසයේ 18 වැනි දා කරන්න අපට පුළුවන් වුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2008 දී මෙම වරායේ වැඩ ආරම්භ කරන කොට ගොඩ බිම වළක් හාරනවාය කියා විපක්ෂය එදා කියනවා අපි දැක්කා. ගොඩ බිම වළක් හාරනවා, ඒකට ලෙහෙසියෙන් වතුර පුරවා ගන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ කියලා කිව්වා. දැන් අපි මීටර් දහනවයහමාරක් ගැඹුර තිබෙන වරායක් ගොඩ බිම හදලා -තව අවුරුදු 25කින්, 30කින් නිෂ්පාදනය කරන ලෝකයේ අතිවිශාල නෞකා ගෙනෙන්න පුළුවන් වරාය හදලා- කර දියවර මංගල්‍යය ඉවර වුණාම, ඊයේ දයාසිරි ජයසේකර මන්ත්‍රීවරයා අහනවා කවදාද මේකට නැව් එන්නේ කියලා. එතුමා දැන් හිටියා නම් හොඳයි, නැව් එන විධිය ගැන පැහැදිලි කිරීමක් කරන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් අපි එතුමාට මතක් කරන්න සිද්ධ වෙනවා, එම ජාත්‍යන්තර වරාය අද අපි මේ විධියට නිර්මාණය කළාම ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් ආයෝජකයන් 27 දෙනෙක් ඒ අයගේ ඉදිරි ව්‍යාපාරික කටයුතු කර ගෙන යන්න මේ වන විට ගිවිසුම් ගත වෙලා සිටින බව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආයෝජකයන් 27 දෙනෙක් මේ වන විට නොයෙකුත් කර්මාන්තශාලා සම්බන්ධයෙන් ඉදිරිපත් වෙලා ඉන්නවා. විශේෂයෙන්ම සිමෙන්ති කර්මාන්තශාලා, ඒ වාගේම වාහන එකලස් කරන කර්මාන්තශාලා, ඒ වාගේම ගෑස් කර්මාන්තශාලා, තේ නිෂ්පාදනය කරන, වැඩිදියුණු කරන කර්මාන්තශාලා, ඒ වාගේ කර්මාන්තශාලා 27ක් සඳහා ආයෝජකයෝ අද අපට එකතු වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ආයෝජකයෝ 27 දෙනා ඇමෙරිකානු ඩොලර් මිලියන 975ක් ආයෝජනය කරන්න මේ වන විට කටයුතු සූදානම් කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වරාය සඳහා අපට වියදම් වුණේ ඩොලර් මිලියන 360යි. ඩොලර් මිලියන 360ක් රජයක් හැටියට අපි වියදම් කරන කොට, පෞද්ගලික අංශය ඩොලර් මිලියන 975ක් වියදම් කරන්න ඒ පෞද්ගලික අංශයට මොකක් හරි ඇහේ අමාරුවක් තිබෙනවාද, දයාසිරි ජයසේකර මන්ත්‍රීවරයා ඔය කියන විධියට? දැන් දයාසිරි ජයසේකර මන්ත්‍රීවරයා කියන්නේ මේ වරායට නැව් එන්න ඕනෑය කියලායි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කසාද බැඳලා සතියෙන් දරුවෝ හම්බ වෙනවාද? දෙපැත්තේ පොරොන්දම් ගළපා, පෝරුවේ නග්ගලා, කසාද බැඳලා ගෙදරට ගිහිල්ලා සතියෙන් දරුවෝ හම්බ වෙන්න ඕනෑ වාගේ කථාවක් තමයි දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කියන්නේ. සමහර වෙලාවට වේලාසනින් මොනවා හරි වුණාම එහෙම හම්බ වෙනවා ඇති. එහෙම තමයි සිද්ධ වෙලා තිබෙන්නේ. නමුත් ජාත්‍යන්තර වරායක් සම්බන්ධයෙන් ඊට වැඩිය එහා ගිය වග කීමක් ඉටු කරන්න අද අපි බැඳිලා ඉන්නවා. ඒ වගකීම ඉටු කරන්න තමයි අපි ලෑස්ති වන්නේ.

මේ වන විට අපේ මාගම්පුර ජාත්‍යන්තර වරායත් එක්ක ඉදි වන තෙල් සංකීර්ණයේ වැඩ මේ මැයි මාසය අවසන් වන විට අපි අවසන් කරනවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ තෙල් සංකීර්ණයේ වැඩ මැයි මාසයේ අවසන් වන කොට මේ ජාත්‍යන්තර වරායට සමගාමීව තිබෙන නැව් මාර්ගයේ ගමන්

කරන නැව්වලට අවශ්‍ය කරන තෙල් පහසුකම සැලසීම අපි ජූනි මාසයේදී ආරම්භ කරනවා. තෙල් පහසුකම විතරක් නොවෙයි, ඒ වරාය කේන්ද්‍රස්ථානය කර ගෙන ඒ නැව්වලට අවශ්‍ය කරන අනෙකුත් සේවා සැපයුමත් අපි ආරම්භ කරනවා. එපමණක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ වරාය ආශ්‍රිතව එන ආයෝජකයෝ 27 දෙනාගේ ඒ වැඩ ආරම්භ වීමත් සමඟ අපි බලාපොරොත්තු වෙනවා වසරකට භාණ්ඩ ටොන් ලක්ෂ හතක් මේ වරායෙන් සැපයුම් සේවාව ලබා දීමට කටයුතු කරන්න. ඉතින් මේ වරාය දිහා බලලා මුලින් කිව්වා, "වළක් හාරනවා, වතුර පිරෙන්නේ නැහැ" කියලා. දැන් කියනවා, "නැව් එන්නේ නැහැ. මේකේ තිබෙන්නේ වැලි විතරයි" කියලා. මම දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාට කියනවා කොළඹ වරාය බලන්න එන්න කියලා. එච්චර දුර යන්න ඉස්සෙල්ලා කොළඹ වරායට ඇවිල්ලා බලන්න. කොළඹ වරායේත් මාසයකට වතාවක් විතර දිය කඩනයේ වැලි ටික ඉවත් කරන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නමුත් ඒකට සමගාමීව බලන කොට මාගම්පුර වරාය ස්වාභාවිකව රට ඇතුළත හදපු වරායක් නිසා ඒ බාධකය නැහැ.

ඊට පස්සේ කියනවා, ගල් අහු වෙලා ලු. යූඑන්පී එක කොහොමත් ගල්වලට බොහොම හිතවත්කමක් තිබෙනවා. නායකයාගෙන් පටන් ගත්තාම පහළට එන කල්ම අය පාෂාණ යුගයත් එක්ක ජීවත් වෙලා, ගල් සමඟ ලොකු සම්බන්ධයක් තිබෙනවා. ඒ නිසා සමහර වෙලාවට මොනවා හරි ගැන කථා කරන විට නායකයන්ගේ ආභාසයත් එක්ක ගල් ගැන කථා කරන එක අපට දැන් අහලා පුරුදු දෙයක්. මාගම්පුර වරායේත් -මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර වරායේත්- ගල් හම්බ වුණා. ඒ හම්බ වුණ ඒවා මීටර් දහනවයහමාරට වෙනකම් කඩලා අද මේ රටට අවශ්‍ය කරන mega ships ගේන්න පුළුවන් තත්ත්වයට, ලෝකයේ නිෂ්පාදිත ඕනෑම නැවක් ගේන්න පුළුවන් තත්ත්වයට අපි වරාය හදලා තිබෙනවා. ඒ වාගේම වරායට අවශ්‍ය කරන පරිපාලන ගොඩනැඟිලි ටික හදලා අවසන් කරනවා. ඒක අවසන් කරලා මේ අවුරුද්ද අවසානය වන කොට කොළඹ වරායට සමගාමීව ජාත්‍යන්තරය දිනා ගන්නා වරායක් බවට අපි මේ වරාය පරිවර්තනය කරනවා.

අසල්වැසි සිංගප්පූරුව වාගේ රටවල වරායවලට මේ වරාය බාධකයක් වෙලා තිබෙන බව අපි දන්නවා. එදා මේක හදන්න සූදානම් වන විට ඒ අය වක්‍රාකාරව මේකට දැඩි ලෙස බලපෑම් කළා. ඒ බලපෑම්වලට එදා එක්සත් ජාතික පක්ෂය යට වුණා. දැන් ඒ යට වෙච්ච එක පැත්තක තියලා මේක ඇතුළේ මොනවා හරි වෙන විප්ලවයක් ඇති කරන්න පුළුවන්ද බලනවා, දවසකට දෙකකට හරි මේ වැඩ නවත්වා ගන්න පුළුවන් ක්‍රමයක් ඇති කර ගන්න. ඒකයි අද තත්ත්වය. ඒ නිසා වරායට අදාළ යුතුකම සහ වගකීම හරියට ඉටු කරන්න අපි බැඳිලා ඉන්න බව බොහොම පැහැදිලිව මතක් කරනවා.

කථා කරන්න මාතෘකා නැතිව, අලුතෙන් මාතෘකා සොයා ගන්න බැරිව ඉන්න ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමන්ලාට, එක්සත් ජාතික පක්ෂයට තමන්ගේ ඇතුළේ තිබෙන ප්‍රශ්නය, අර්බුදය විසඳා ගන්න බැරිව අනාථ වෙච්ච තත්ත්වයක තමයි අද ඉන්න වෙලා තිබෙන්නේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒ විතරක් නොවෙයි මට තව කාරණයක් ඇහුණා, එක්සත් ජාතික පක්ෂයේ දකුණේ මන්ත්‍රීවරයෙකුගෙන්; අපේ පුංචි මන්ත්‍රීතුමාගෙන්. අපේ පුංචි මන්ත්‍රීතුමා කවුද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා. එතුමා පසු ගිය දවසක කියනවා මට ඇහුණා -අපේ මාධ්‍ය ආයතනවලින් කිව්වා- "අපි අප්‍රේල් මාසයේ 12 වෙනි දාට එක්සත් ජාතික පක්ෂයේ 8 වෙනි නායකයා ගේනවා" කියලා. කිරි බත් කාලා තමයි ගේන්නේ කිව්වා. "අපි අටවැනි නායකයාව ගෙනෙන්නේ කැවුම් කාලා, කිරි බත් කාලා" කියලා තමයි අර අඩි පහයි අඟල් නැති මන්ත්‍රීතුමා කිව්වේ. ඒක කිව්වා. [බාධා කිරීමක්] ඔව්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එය කියන ගමන් ඒ මන්ත්‍රීතුමාත් කියනවා මට ඇහුණා, "වරායට නැව් එන්නේ නැහැ" කියලා. මම දැන් සෙව්වා එතුමාව. එතුමා මෙතැන නැති හින්දා මාගම්පුර මහින්ද රාජපක්ෂ වරායේ මගේ ආරක්ෂක අංශවලට මම දැන් පණිවුඩයක් දුන්නා, කොට හාදයෙක් මාගම්පුර වරායට පැනලා ඉන්නවාද බලන්න කියලා. මොකද හේතුව? මට සැකයක් තිබෙනවා අර කියපු නායකයාව පත් කර ගන්න බැරි වුණු එකේ අසහනයට ඒ කොට මන්ත්‍රීතුමා මේ වන විට මාගම්පුර මහින්ද රාජපක්ෂ වරායට පැනලා ඉන්නවාද කියලා. ඒකයි තත්ත්වය. ඒ වාගේ ඉටු කර ගන්න බැරි සිහින ඒ අය මවා ගෙන ඉන්නවා. ඒකයි වෙලා තිබෙන්නේ. එහෙම හාදයෝ තමයි අද මේ එක්කාසු වෙලා කියන්නේ, "වරාය හැදුවා. නමුත් වරායට නැව් එන්නේ නැහැ, වරායේ වැලි පිරෙනවා." කියලා. Airport එක හැදුවාම කියනවා, "ඒකට ගුවන් යානා බස්සවන්න බැහැ" කියලා. අපි නොරොච්චෝලේ විදුලි බලාගාරය විවෘත කළා. දැන් ඒකට කියයි, "ඒ switch එක දැම්මත් ඒ light පත්තු වෙන්නේ නැහැ" කියලා. මේක තමයි විවේචනය. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ විවේචනයට දඬුවම පසු ගිය මාසයේ 17 වැනි දා මේ රටේ ජනතාව දුන්නා. නිසි දඬුවම දුන්නා.

ඔය කියන හාදයෝ ටික ජනතාව ඉදිරියට ගිහිල්ලා පොල් ගෙඩිය ගැන කිව්වා; හාල් සේරුව ගැන කිව්වා; එළවලු මිල ගැන කිව්වා. ඒවා කියලා, මේ ආණ්ඩුවට රතු එළිය පත්තු කරන්න ඕනෑ කියලා ජනතාවට කිව්වා. ඒ ටික හැම තැන්වලම ගිහිල්ලා කිව්වා. පත්තු කළා රතු එළියක් මේ රටේ සමස්ත ජනතාව. කාටද? පත්තු කළේ එක්සත් ජාතික පක්ෂය ඇතුළු පොදු විපක්ෂයට. ජනතා විමුක්ති පෙරමුණ ගැන කථා කරන්න දෙයක් නැහැ. ඒ අයට දෙයියන්ගේම පිහිටයි. රැවටිල්ලට නිමාව. ජීවිතය තිබෙන තුරු ආපහු වතාවක් මේ රටේ ජනතාව රවටන්න ලැබෙන්නේ නැහැ. එක්සත් ජාතික පක්ෂයේත් හොඳ මිනිස්සු ඉන්නවා. ජෝන් අමරතුංග මහත්මයා වාගේ නායකයෝ ඉන්නවා. අපි කියන්නේත් ඇත්තටම ඔය නියෝජ්‍ය නායකකම දෙනවා නම් දෙන්න තිබුණා එතුමාට. එතුමා සුදුස්සෙක්. දයාසිරි උන්නැහේලාට අපි මේ කියන්නේ. එතුමන්ලා මෙතැන සිටියා නම් හොඳයි. හැබැයි ඊයේ දවසේ සිදු වුණේ, හරියට අපේ ගමේ මරණාධාර සමිතියට වෙච්ච දේ. අපේ ගමේ මරණාධාර සමිතියක් තිබෙනවා. මේ සමිතියේ සභාපති තෝරනවා. ලේකම් තෝරනවා. ඊ ළඟට උප සභාපති, උප ලේකම්, භාණ්ඩාගාරික තේරුවාම මෙන්න දෙවි හාමුදුරුවනේ ගමේ සිටින සලකන්නත් ඕනෑ, නොසලකාත් බැරි කෙනෙක් එනවා. එයාට දෙන්න තනතුරක් නැති වුණාම හදනවා අනුශාසක කියලා තනතුරක්. දෙදෙනකු -ඩබලක්- හිටියොත් අනුශාසක තනතුරු දෙකයි. නොම්මර 1 අනුශාසක සහ නොම්මර 2 අනුශාසක. ඒ විධියට අපේ ගමේ මරණාධාර සමිතියේ ඇති කරනවා තනතුරු. ඒ තනතුරු දාන්නේ, ඒ තත්ත්වය ඇති කරන්නේ මරණාධාර සමිතිය ඉදිරියට ගෙන යන්න ඕනෑ හන්දායි. ඒ වාගේ දෙයක් තමයි ඊයේ සිද්ධ වුණේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි. වේදනාවයි. මොනවා කරන්නද ඉතින්. ඒ වාගේ තත්ත්වයක් තමයි අද ඇති වෙලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි බොහොම පැහැදිලිව කාරණයක් මතක් කරනවා. රජයක් හැටියට අපි මේ රටේ ජනතාවට පොරොන්දු දුන්නා. ඒ පොරොන්දු වෙච්ච දේවල් මා කියන්නම් ගරු නියෝජ්‍ය කථානායකතුමනි? මේ උත්තරීතර පාර්ලිමේන්තුව ඇතුළේදී අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා පොරොන්දුවක් වුණා, "මම මේ රටේ ජීවත් වන ජනතාවට මේ රටේ නිදහසේ ජීවත් වීමේ අයිතිය දෙනවා" කියලා. ඒ දෙනවාය කියපු අයිතිය අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ලබා දුන්නා. ඒ වාගේම එතුමා තවත් පොරොන්දුවක් වුණා මේ පාර්ලිමේන්තුවේදී. ඒ තමයි, "මේ රට ආර්ථික වශයෙන් නැඟිටුවනවා; මේ රටේ ජීවත් වන මිනිසුන් ඇති හැකි මිනිසුන් බවට පරිවර්තනය කරනවා; ස්වෛරී රාජ්‍යයක් තුළ ජීවත් වීමේ අයිතිය ලබා දෙනවා" කියන එක. අන්න ඒ යුතුකම, වගකීම ඉටු කරන්න තමයි, යුද්ධය දිනුවා සේ ඒ ජයග්‍රහණය ලබන්න තමයි අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා මුදල් අමාත්‍යාංශය

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

යටතේ ඊට අවශ්‍ය කරන මෙවැනි වෙනස්කම් කරලා අද මේ උත්තරීතර පාර්ලිමේන්තුවෙන් ඒ සඳහා අනුමැතිය ලබා ගන්න වැඩ කටයුතු කරන්නේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අන්න ඒ අවශ්‍යතාව ඉටු කරන වෙලාවේදී අපි කියනවා එක්සත් ජාතික පක්ෂයට, දෙයියන්ගේ පිහිටෙන් දැන් තිබෙන්නේ මේ ආණ්ඩුව මේ රට ඉදිරියට අර ගෙන යන වෙලාවේදී මේ මල් වට්ටියට පොඩ්ඩක් හරි අත ගහන එකයි කියලා. මේක, කරපු පරණ පව් ටික ගෙවා ගන්න පුළුවන් හොඳ වෙලාවක්. අන්න ඒක කරන්න කට්ටියත් එක්කම ලැස්ති වුණොත් හොඳයි කියා මම කියනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එය ඉටු කරන්න කියලා කියමින් ජෝන් අමරතුංග මගේ මිත්‍රයාට -අපේ හිතවතාට- මම කාරණයක් මතක් කරනවා. බලන්න, හැම දාම වෙන්නේ මේ වැඩේ නේ. අද සවස හයහමාරට ඡන්දය ගන්නවා කිව්වා. ඒ වන කොටත් "සඳ තනි වෙලා අහසේ" වාගේ එතුමා තනි වනවා. ඒ නිසා මා කියන්නේ -

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
වෙලාවට එනවා ඔක්කෝම.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
එනවා, එනවා. ඒක තමයි.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
වෙලාවට පැමිණෙයි.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
පැමිණෙයි. ඔබතුමා මගේ මිත්‍රයා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බලන්න, එතුමා තනිවම අදිනවා. විපක්ෂ නායකවරුන් හිටියාට, මරණාධාර සමිතියේ වාගේ නියෝජ්‍ය නායකවරුන් හැදුවාට අද තනිවම අදින්න වෙලා තිබෙන්නේ අපේ හිතවත් මේ මන්ත්‍රීතුමාට. අපි එතුමාට සහයෝගය දෙනවා. ජෝන් අමරතුංග මන්ත්‍රීතුමනි, ඔබතුමා ඔය තනිවම අදින බර හින්දා ඉල්ලන්න සංශෝධනයක්, "නැහැ, නියෝජ්‍ය නායක තනතුරු තුනක් හදන්න ඕනෑ." කියලා. ඒ තුන්වැනි තනතුර වෙනුවෙන් ආණ්ඩුව හැටියට අප අපේ සහයෝගයත් ලබා දෙනවා කියන එක මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
බොහොම ස්තුතියි ගරු නියෝජ්‍ය ඇමතිතුමා. මී ළඟට ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා.

[අ. භා. 2.03]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නැවතත් පනත් කෙටුම්පත් ගණනාවක් ඉදිරිපත් කර තිබෙන අවස්ථාවක මුදල් අමාත්‍යාංශය සහ අනෙක් අමාත්‍යාංශ සම්බන්ධයෙන් වචන ස්වල්පයක් කථා කිරීමට ඉඩ ප්‍රස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට මගේ ස්තුතිය.

එසේ කියන ගමන් මම කියන්නේ දැන් මෙතැන කථා කරපු නියෝජ්‍ය ඇමතිතුමා රටේ ආර්ථික සංවර්ධනය වෙනුවෙන් කරලා තිබෙන්නේ මොනවාද කියන එක පෙන්වන්න ගියා මිසක් අද ඉදිරිපත් කර තිබෙන පනත් කෙටුම්පත් ගැන වචනයක්වත් කථා කළේ නැති බවයි.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න. රටේ ආර්ථිකයට වරාය බලපානවාද, නැද්ද කියන එක මගේ මිත්‍ර රවි කරුණානායක මන්ත්‍රීතුමාට නොතේරීම මට ප්‍රශ්නයක්.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ පිළිබඳව සංශෝධනයක් නැහැ නේ. ඒ ගැන මෙතැන සංශෝධනයක් නැහැ නේ.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
ඔබතුමා බලන්න අද වරාය සම්බන්ධයෙන් පනත් කෙටුම්පතක් තිබෙනවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
බලන්න, මේකේ තිබෙන්නේ වරායට එන කොට එකතු කරන ආදායම සම්බන්ධයෙන් මිසක් වරාය සම්බන්ධයෙන් දෙයක් නැහැ නේ.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
ඉතින්, ඒවා තමයි මේ කිව්වේ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
කමක් නැහැ, ඉතින් කථා කරන්න දෙයක් නැති වුණාම ඒවාවත් කථා කරන්න ඕනෑ. [බාධා කිරීමක්] නැහැ, ඒ වාගේ කුහක දේශපාලනයක් අපේ නැහැ නේ. ඒවා නැහැ. කිව්ව ඒවා ඇත්ත වන්න පුළුවන්. ඒක වෙනම දෙයක්. [බාධා කිරීමක්] ඒ අනෙක් ඒවා ඕනෑ නැහැ. ඒ වාගේ ඒවා ඕනෑ නැහැ. එක්සත් ජාතික පක්ෂය සහෝදරත්වයෙන් වැඩ කර ගෙන යන ගමන තිබෙනවා. මරණාධාර සමිති ගැන කථා කළා. ඒවා ඉදිරියට බලන්න පුළුවන්. නමුත් ඒවා නොවෙයි, මෙතැන කියන්න අවශ්‍ය වන්නේ. මෙතැන කියන්න අවශ්‍ය වන්නේ අද රටේ ආර්ථිකය ගැනයි.

අද රටේ ආර්ථිකය ගැන කථා කරන මේ අවස්ථාවේ දී මුලින්ම අපේ නියෝජ්‍ය නායක ගරු කරු ජයසූරිය මන්ත්‍රීතුමා කථා කරපු ආකාරයට මේ රටේ යම් විධියක සාධාරණීකරණයක් ඉෂ්ට කරන්න අපට අවශ්‍යයි. සාධාරණීකරණයක් ඉෂ්ට කරනවා කිව්වාම අපේ සරත් ෆොන්සේකලාට සිදු වෙලා තිබෙන දේ ගැනත් මතක් කරන්න අවශ්‍යයි. නමුත් අද මේ සංශෝධන තුළින් පෙන්වන්න හදනවා, ණය මුදලේ වටිනාකම රුපියල් මිලියන 5කට වෙනස් කරනවා කියලා. හිටපු අගමැතිතුමා, සිටිය යුතු ඉතා වැදගත් ජ්‍යෙෂ්ඨ ඇමතිතුමෙක්. කරුණාකරලා ආණ්ඩුව නැවත මේ ගැන සලකා බලන්න කියලා අපි කියනවා. හිටපු අගමැතිතුමනි, අද රුපියල් මිලියන 5ක් කියන්නේ මොකක්ද? මේ ප්‍රමාණය රුපියල් මිලියන 50ක් ලෙස -රුපියල් ලක්ෂපන්සියයක්

ලෙස- වෙනස් කරන්නය කියා අපි බැගෑපත්ව ඉල්ලනවා. අද කොළඹ විතරක් නොවෙයි, ගම්පහ, කළුතර වාගේ ප්‍රදේශයකත් පර්ච් එකක් රුපියල් ලක්ෂ 15ක්, 20ක් විතර වෙනවා. මේ වාගේ පර්ච් තුනක් හතරක් පහක් ගත්ත කෙනකුගේ ඉඩමේ වටිනාකම මේ මිලියන 5 අභිබවා යනවා නම් මෙයින් ලැබෙන ප්‍රයෝජනය මොකක්ද? ඒ නිසා ආණ්ඩුව සල්ලි වියදම් කරලා මේවා වෙනස් කරලා කෙටුම්පත්වලට යම් සංශෝධනයක් ඇතුළත් කරන කොට එයින් ප්‍රයෝජනයක් තියෙන්න ඕනෑ. අහිංසක ජනතාව ණය බරතාවෙන් පෙළෙන්නේ ඒ අයගේ වැරැද්ද නිසා නොවෙයි, අද සියයට 80ක්, 90ක් මහ බැංකුව කරන අපරාධ නිසා; මුදල් අමාත්‍යාංශය ගන්නා වැරදි තීන්දු නිසා; ආණ්ඩුව වැරදි ප්‍රතිපත්තියක් ගත්ත නිසා ඇති වුණු ප්‍රතිවිපාකයන් නිසා. උද්ධමනය සියයට 35ට, 40ට තිබෙන විට සියයට 25ක පොලියක් දෙන කොම්පැනි ඇති වුණා. "සක්විති" වාගේ අය බිහි වුණා නේ. ඒවාට සල්ලි දමලා, ඒක නැති වුණාම අන්තිමට ආණ්ඩුව ඒකට වග කියන්න අවශ්‍යයි. මොකද, උද්ධමනය සියයට7ට ගියාම ඒ අයත් ජීවත් වන්න මාර්ගයක් බලනවා. හිටපු අගමැතිතුමනි, අපි මේ ගෙනෙන සංශෝධනයෙන් අපට වාසියක් ලැබෙන්නේ නැහැ. නමුත් අහිංසක ජනතාවට මේකෙන් සෙතක් වෙනවාමයි. අපේ ෆවුසි ඇමතිතුමනි, ඔබතුමා ජ්‍යෙෂ්ඨ ඇමති කෙනෙක් වශයෙන් මේ අදක්ෂ, කනිෂ්ඨ ආණ්ඩුවට කරුණාකරලා කියලා දෙන්න, මේ ජනතාව ජීවත් කරවන්න කියලා. එක පැත්තකින් ජීවත් වෙන්න බැරි තරම් ජීවන වියදමක් තිබෙනවා. අනෙක් පැත්තෙන් ණය ගත්තාම ණය ගෙවා ගන්න බැරි අවස්ථාවක් තිබෙනවා. ඉතින් මේ අය ගැන කරුණාකරලා කියන්න. ආර්ථික ප්‍රසාරණයක් කරන්න ආණ්ඩුව උදවු කරන්නේ නැත්නම්, අඩු ගණනේ මේකෙන් වැටුණාම, ප්‍රශ්නයක් ඇති වුණාම ඒ අයටවත් උදවු කරන්න කියන එක ඉතාමත් ඕනෑකමින් මම මතක් කරනවා. මම කනගාටු වුණා, නිමල් සිරිපාල ඇමතිතුමා කිව්වාම, "අපි මේක ප්‍රතික්ෂේප කරනවා" කියලා. බැරි වෙලාවත් කිව්වා නම් මිලියන 50 නොවෙයි, අපි මේක මිලියන 40 කරමු කියලා හරි, අවුරුද්දකට සැරයක් අපි මේකට මිලියන තුන හතරක් එකතු කරමු කියලා හරි, එහෙම නම් අපේ ණය ගන්න අහිංසක ජනතාවට උදව්වක් වෙනවා කියන එක තමයි අපි මේ අවස්ථාවේදී මතක් කරන්නේ.

හිටපු අගමැතිතුමනි, ෂැන්ග්‍රි-ලා වාගේ කොම්පැනි යූඑස් ඩොලර් මිලියන 200ක් නැතහොත් රුපියල් කෝටි 2,200ක බදු නොගෙවා තිබෙන අවස්ථාවක ආණ්ඩුව නීතිමය පියවර ගන්නේ නැතිව නිකම් ඉන්නවා. ඒක පිට රට තිබෙන කොම්පැනියක්. සියයට 100ක් බදු ගෙවන්න තිබෙනවා. අද බදු ගෙවන්නේ නැතිව ඉඩම් අරගෙන තිබෙන ඒ අයට මේ ආණ්ඩුව මොනවාද කරන්නේ? ඒ සල්ලි consolidated fund එකකට දමා මේ වාගේ recoveriesවලට උදවු කරන්න පුළුවන් වුණා නම් අන්න ලොකු සෙතක් වෙනවා නේද? මේවා ගැන උත්තර නැහැ. මේ අවස්ථාවේදී ඉතාමත්ම ඕනෑකමින් මම නැවත කියන්නේ ඒ ඉදිරිපත් කරන සංශෝධනය පිළිගන්න කියන එකයි.

ඒ වාගේම මේ නීතිගත කිරීම යම් විධියකින් retrospective effect එකක් ඇති වන ලෙස දැනට බැංකු සම්බන්ධයෙන් තිබෙන ප්‍රශ්නත් මේකට අඩංගු කරන්න කියලා මම ඉතාමත් බැගෑපත්ව මේ ආණ්ඩුවෙන් ඉල්ලනවා. අපට නීති දෙකක් තිබෙනවා. මේකෙන් සෙතක් ලබා ගන්න තමයි ආණ්ඩුව මේ සංශෝධනය ගෙනෙන්නේ. ඒක අපි අගය කරනවා. නමුත් ඒ සංශෝධනය ගෙනෙන කොට මේකත් එකතු කරලා, දැන් තිබෙන ණයත් මේකට යා කරලා වැඩ කරන්න පුළුවන් කටයුත්තක් ඇති කළොත් හොඳයි කියන එක මම මේ අවස්ථාවේදී යෝජනා කරනවා.

ඒ නිසා මෙතැන නොයෙක් නොයෙක් බදු සංශෝධන තිබෙනවා; කෙටුම්පත් සංශෝධන තිබෙනවා. මම මේ අවස්ථාවේදී මතක් කරන්නේ කරුණු තුනක් ගැනයි. අද බැංකු සම්බන්ධයෙන් කථා කරන කොට මේ හැම බැංකුවක්ම "a bank with a heart", "a bank with a smile", "a bank with compassion" ඔය වාගේ ලස්සන පාඨයන් යොදා ගන්නවා. හැම බැංකුවක්ම අද මිලියන පන්දහසක, හයදහසක ලාභයක් ලබනවා. ඒ ගැන කිසි ප්‍රශ්නයක් නැහැ. නමුත් ඒ ලාභය ලබන්නේ ඒ අයගේ profit එකෙන් සහ පාරිභෝගිකයා සූරා කෑමෙන්. රුපියල් ලක්ෂ දෙකක ණයක් ගන්න ඕනෑ නම් ලක්ෂ හතරක වත්කමක් ගෙනෙන්න කියනවා. යම් විධියකින් ලක්ෂ 10කට අඩු ණය ප්‍රමාණයක් collateral එකක් නැතුව ජනතාවට ලබා දෙන්න බැංකුවකට පුළුවන් නම් අන්න ඒ වාගේ බැංකු ක්‍රමයක් තමයි අපට අවශ්‍ය වන්නේ. ලංකාවේ බැංකු ක්‍රමයේ තිබෙන්නේ, "ඉර පායන කොට කුඩයක් දෙනවා, වහින කොට නැවත ගන්නවා" වැනි ක්‍රමයක්. මේ බැංකුවලට යම් කිසි අවදානමක් -risk එකක්- ගන්න පුළුවන් තත්ත්වයක් ඇති වුණේ නැත්නම් අපේ බැංකු ක්‍රමය ඉතාමත් අවදානම් මට්ටමට පත් වනවායි කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි.

සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් ගැන කථා කරනවා නම් එවැනි සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර ලෙස පටන් අරන් අමාරුවෙන් ඇවිල්ලා ඊට වඩා හොඳ මට්ටමක ව්‍යාපාරිකයකු බවට පත් වන්න නම් ඒ අයට අමාරු ගමනක් තිබෙන්නේ. ලෝකයේ කොහේවත් ව්‍යාපාර කරන්න ලෙහෙසි නැහැ. ලංකාවේ බලන කොට ඊටත් වඩා අමාරු තත්ත්වයකුයි තිබෙන්නේ. ඒක කොටස් දෙකක්. ඒ, පිටස්තර ලෝකයෙන් එන බලපෑම් සහ අභ්‍යන්තරයෙන් ඇති කරන ප්‍රශ්න. මෙහේ වේතන වැඩි කළත්, විදුලි බිල වැඩි කරන කොට, බදු වැඩි කරන කොට ඒක දරා ගෙන ඉදිරියට යන්න ඕනෑ. අනෙක් පැත්තෙන් විදේශ විනිමය අනුපාතයෙන් -exchange rate එකෙන්- ඇති වන ප්‍රශ්න දිහා බලා ගෙන ඒක තුළින් ගමන් කරන කොට එතැන තවත් ප්‍රශ්න. මේ දෙ කොටසේම ප්‍රශ්න තුළින් ලෝකය තරණය කරන කොට, අපනයනය කිරීමේදී ප්‍රශ්න ඇති වන කොට බැංකුවලින් ණය ගන්න ගියාම, මේ ආයතනය භාණ්ඩ හදිසියේ අපනයනය කරන කොම්පැනියක් නම් ඩොලර්වලින් ණය ගන්න හැකියාව අද ලෙහෙසි කරලා නැහැ. ඉතාම අමාරු තත්ත්වයකුයි ඇති කරලා තිබෙන්නේ. මම හිතන්නේ ලෝකයේ තරගකාරී තත්ත්වයක් තියෙද්දී රටක ආණ්ඩුවක් මේ ප්‍රතිපත්ති ලිහිල් කරන්න අවශ්‍යයි. අපට තවම තිබෙන්නේ ගතානුගතික නීති පද්ධතියක්; ඒ වාගේම ක්ෂණිකව කටයුතු කරන්න බැරි බැංකු ක්‍රමයක්. හැම එකක්ම මහ බැංකුවෙන් පාලනය කරන බැංකුවක්. මහ බැංකුව පාලනය කරන්නේ දේශපාලන අරමුණකින්ද, නැත්නම් ආර්ථික ව්‍යුහය ප්‍රසාරණය කිරීමේ අරමුණින්ද කියන ප්‍රශ්නය ඇති වෙලා තිබෙනවා. ඉතින් ආණ්ඩුව මේ අවස්ථාව පාවිච්චි කරන්න අවශ්‍යයි. මොකද, ලෝකයේ රටවල් 211ක් තිබෙද්දී අපනයනය ලෙහෙසි කරලා, අපනයනකරුවන්ට ණය දෙන එක යම් විධියකින් ලෙහෙසි කරන්න පුළුවන් නම් ආණ්ඩුවේ ප්‍රශ්න ගණනාවක් අඩු වනවා. අද සාමාන්‍යයෙන් ලංකාවේ blue-chip company එකක් ණය මුදලක් ගන්නා විට අය කරන පොලී ප්‍රමාණය සියයට 12යි, 13යි. ඒ වාගේම සුළු හා මධ්‍ය පරිමාණයේ ව්‍යාපාරිකයෙක් ණයක් ගන්න ගියොත් එයට පොලිය සියයට 20යි, 21යි. ඉතින්, "මේ වාගේ දෙයකින් කොහොමද අපි ව්‍යාපාරයක් කරන්නේ" කියන ප්‍රශ්නය හුඟ දෙනා අහනවා. අද වාණිජ මණ්ඩලවල ඉන්න සභාපතිවරු කථා කරන්නේ ආණ්ඩුවේ සිට director තනතුරක් ගන්න මිසක් ඒ අහිංසක ව්‍යාපාරිකයන් වෙනුවෙන් නොවෙයි. ඉතින් ඒ අය කථා කරන ස්වරූපය පාවිච්චි කරලා මේ රටේ ආර්ථිකය හදන්න ගියොත් ඔන්න ඔතැනින් තමයි කඩා වැටෙන්නේ. කරුණාකරලා සුළු ව්‍යාපාරිකයන් ගැන හිතන්න. මැතිවරණ කාලයේදී පොඩි පොඩි ව්‍යාපාරිකයන් ගැන කථා කරන ආණ්ඩුව, සම්පූර්ණයෙන් වෙනස් ස්වරූපයකින් තමයි පාලනය කරන්න යන කොට කටයුතු කරන්නේ කියන එක මේ අවස්ථාවේදී කනගාටුවෙන් වුණත් ප්‍රකාශ කරන්න ඕනෑ. මට අවශ්‍ය වන්නේ අපනයනකරුවන්ට -අපනයනකරුවන් කිව්වාම, අපේ දේශීය අපනයනකරුවන්. පිට රට ඉඳලා එන blue-chip කොම්පැනි තෝරා ගන්නට ඕනෑ නැහැ.- මේ රටේ සාමාන්‍ය සුළු ව්‍යාපාරිකයකුට ලක්ෂ 10කට වඩා අඩුව ණයක් ගන්නට අවශ්‍ය

[ගරු රවි කරුණානායක මහතා]

නම් කරුණාකර මේක වත්කමක් රහිතව දෙන්නට පුළුවන් වැඩ පිළිවෙළක් ඉදිරිපත් කරන්න කියන්නයි. බැංකුවක portfolio එක බැලුවොත් එහි අනිවාර්යයෙන්ම සියයට හතර පහකටවත් අඩුවෙන් තමයි, මේ අහිංසක කුඩා රටේ ආර්ථිකයේ සියයට 65ක කොටස් ප්‍රමාණයකට සල්ලි වෙන් කරන්නේ කියලා පෙනෙනවා. ඒකට ලෙහෙසියක් කරන්න. මේක දේශපාලන අරමුණක් නොවෙයි. ඒ අයට, තමාගේ එදිනෙදා ජීවිතය ලෙහෙසි කරන්නට පුළුවන් වැඩ පිළිවෙළක් ඇති කරන්න. ඒ වාගේම ඒ ණය දෙන ක්‍රමය බලන්න. ඒ ණය දෙන්න පුළුවන් යම් කිසි විධියක value addition ක්‍රමයකට. හදිසියේ මිල අගයක් එකතු කරන්නට පුළුවන් ව්‍යාපාරයක් ඉදිරිපත් වුණොත් ඒකට දෙන්නට පුළුවන් ණය ප්‍රමාණය සාමාන්‍ය වෙන දා දෙන ණය ප්‍රමාණයට වඩා වෙනස් ආකාරයකට දෙන්නට අවශ්‍යයි. රජයේ බැංකුවලට කථා කර ඒ තුළින් යම් විධියේ වැඩ පිළිවෙළක් ගෙන ගියාට ඒක යම් තැනක හිර වෙලා තිබෙනවාය කියන එක බැංකුවල ඉන්න සභාපතිවරු හා කළමනාකරුවෝ කියනවා. මේ කාරණය මා ඉතාමත් ඕනෑකමින් කියනවා. විපක්ෂයකින් මේ අදහස් ඉදිරිපත් කළාට ආණ්ඩුවෙන් ක්‍රියාත්මක කරන්නට තිබෙන දෙයක්. ඔබතුමන්ලා ඉදිරිපත් වෙලා මේක ලෙහෙසි කිරීම අපේ ජනතාවට කරන යහපතක් කියායි මා හිතන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් නියෝජ්‍ය ඇමතිතුමා මේ ගරු සභාවට මේ අවස්ථාවේ පැමිණ තිබෙන නිසායි මා නැවත මතක් කරන්නේ. අප මේ ඉදිරිපත් කර තිබෙන යෝජනාව -ලක්ෂ පන්සියයකට ඉදිරිපත් කර තිබෙන යෝජනාව- සාධාරණයි. අද තිබෙන ආර්ථික ක්‍රමය බලන විට මේ ලක්ෂ පන්සියය නැත්නම් අපේ මේ සංශෝධනය, වෙනස් කිරීම කිසි සේත්ම ප්‍රායෝගික මට්ටමටකට වැටෙන්නේ නැහැයි කියන එකයි කියන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ ණය සුළු සහ මධ්‍යම පරිමාණයේ ව්‍යාපාරිකයන්ට දෙනවා වාගේම බැංකුවල තිබෙන අධික ලාභය මා කිව්වා වාගේ පාරිභෝගිකයාට හෝ ණය ගන්නා අයට යම් උදව්වක් ඇති කරන්න පාවිච්චි කිරීම අවශ්‍යයි. තමාගේ capital base එක මිලියන 1,200කට තිබෙන බැංකුවක මිලියන 5.9ක ලාභයක් ලබා තිබෙනවා. ඒ වාගේ හැම බැංකුවක්ම ගැනම කියන්න ඕනෑ. මේ සම්බන්ධයෙන් කටයුතු කරන්නට තිබෙන වෙලාවයි දැන් ඇවිත් තිබෙන්නේ. බැංකු ක්ෂේත්‍රය සම්බන්ධයෙන් තිබෙන ප්‍රශ්නය එයයි.

දූරකථන සම්බන්ධයෙන් තිබෙන සංශෝධන - Telecommunication Levy Bill එක- තුළින් අප පාරිභෝගිකයාට නැවත බර පටවන්නට හදනවා. මේකත් අර බැංකු ක්‍රමය වාගෙයි. මොකද, ආණ්ඩුව හිතනවා, ලෙහෙසි කාර්ය භාරය වක්‍ර බදු තුළින් තමාගේ ආදායම එකතු කිරීමයි කියා. ඒක සාමාන්‍යයෙන් ඕනෑම රටක කරන දෙයක්. නමුත් එතකොට බර වැටෙන්නේ පාවිච්චි කරන්නාටයි. එක්සත් ජාතික පක්ෂය ඉදිරිපත් කරපු ජංගම දූරකථන සේවය තුළින් පිටස්තර ප්‍රදේශවල ඉන්න අහිංසක අයට, ලංකාවට ලොකු සේවයක් වෙලා තිබෙනවා. අද ප්‍රශ්නයක් අහලා තිබුණා, penetration rate එක ගැන. දැන් දූරකථන පාවිච්චි කරන ප්‍රමාණය මිලියන 18ක් දක්වා වැඩි වෙලා තිබෙන අවස්ථාවක මේ ආණ්ඩුව සියයට 20ක බද්දක් පනවා තිබෙනවා. මොබිටෙල් කොම්පැනිය වෙන්න පුළුවන්, ඩයලොග් කොම්පැනිය වෙන්න පුළුවන්, එටිසලාට් වෙන්න පුළුවන් මේ හැම එකකම ලාභය සාධාරණ මට්ටමක නේ තිබෙන්නේ? මම කාරුණිකව කියනවා, මෙන්න මේවා තමයි ආණ්ඩුව බලන්න අවශ්‍ය වෙන්නේ කියලා. ආණ්ඩුව මේ ෂැන්ග්‍රි-ලා කොම්පැනිය බදු රහිතව ගෙනෙන්න දෙනවා. යාර දහයේ පහළොවේ කාර් සියයට 5ක බද්දක් යටතේ ගෙන්වන්න හදනවා. නමුත් යාර හතරෙ පහේ මරුටි එකට සියයට 25ක, 30ක බදු පනවනවා. මේ වාගේ අසාධාරණ කරන ආණ්ඩුවෙන් අපි කරුණාවෙන් මේ ඉල්ලීම් කරන්නේ පාරිභෝගිකයා වෙනුවෙනුයි. මොබිටෙල් වෙන්න පුළුවන්, ඩයලොග් වෙන්න පුළුවන් ඒ කොම්පැනිවල ලාබයෙන් මේවා ගන්නවා මිසක් පාරිභෝගිකයාගෙන් ගන්න එපා කියන එකයි අපි කියන්නේ. අද අහිංසකයෙක් reload එකක් දැම්මාම ඒකෙන් සියයට 25ක්ම තිබෙන්නේ බදු. රුපියල් පනහක් දැම්මාම ඒකෙන් රුපියල් 12.50ක්ම යන්නේ බදු සඳහායි. ඉතින් මේ වාගේ දේවල් විතරද කරන්න පුළුවන් වෙන්නේ? ලෙහෙසියෙන් ගන්න පුළුවන් වුණාට ඒක නොවෙයි ආණ්ඩුවේ බදු ප්‍රතිපත්තිය විය යුත්තේ. ආණ්ඩුවේ බදු ප්‍රතිපත්තිය විය යුත්තේ ලාබ ලැබෙන තැනකින් බදු අය කිරීමයි. ඒක තමයි වැදගත් දේ. ඉතින් මෙතැනදි නැවතත් මම ආණ්ඩුවෙන් ඉල්ලනවා, "කරුණාකරලා මේ ගැන සලකා බලා ජන ජීවිතය ලෙහෙසි කරන්න"ය කියා. ජනතාවගේ පඩි වැඩි කරන්නේ නැහැ. බදු වැඩි කරනවා. පාරිභෝගික භාණ්ඩවල මිල වැඩි කරනවා. ජනතාවට උදවු කරන්න පුළුවන් විධියේ වැඩ පිළිවෙළක් නැහැ. ඡන්දෙ කාලයේදී මිනිසුන්ගේ කකුල් ළඟ. ඡන්දෙන් පස්සෙදි මිනිසුන්ගේ බෙල්ල ළඟ. මේ වාගේ ගමන් කරන අවස්ථාවකදී, මෙය සංශෝධන කරන අවස්ථාවේදී කරුණාකර නැවත මේ ගැන හිතා බලන්න. සල්ලි ගන්න පුළුවන් අවස්ථා තිබෙනවා. සේවකයන්ට බාධා වෙන්නේ නැති විධියට, ඒ අය අධෛර්යවත් නොවන ආකාරයට කටයුතු කරන්න පුළුවන්. මම ඉතාමත් ඕනෑකමින් මේ අවස්ථාවේදී මතක් කරනවා, ජංගම දූරකථන සේවා තුළින් වන ඒ අසාධාරණයට සාධාරණයක් ඉෂ්ට කරන්නය කියා. පාරිභෝගිකයා ගෙවනවාය කියන පලියටම ඒකෙන් ගන්න නම් හරි ලෙහෙසියි. අද රුපියල් 50ක reload එකකින් අය කරන රුපියල් 12.50ක බද්ද හෙට රුපියල් 15ක් කළාම බිලියන දෙක, තුනක් එනවා. නමුත් අමාරුවෙන් reload එකක් දමන අහිංසක කෙනෙකුට කොතරම් පීඩනයක් ඇති වෙනවාද? ඒ අයගේ ආදායම් මට්ටම රුපියල් 2,000ක්, 3,000ක් වෙන්න පුළුවන්. ඒකෙන් සියයට 4ක, 5ක බද්දක් කියන්නේ ඉතාමත් අධික ප්‍රමාණයක් ලෙස මේ අවස්ථාවේදී මම මතක් කරනවා. ඒ විතරක් නොවෙයි. මේ කොම්පැනිවල අයිතිය තිබෙන්නේ පිට රටවලට නේ. මේ ආණ්ඩුව හැම වෙලාවේම ජාතිකත්වය ගැන කතා කරනවා. පිට රට කොම්පැනි තමයි මේකේ අයිතිකරුවන් වශයෙන් කටයුතු කරන්නේ. ඉතින් මෙවැනි දේකට ලංකාවේ තිබෙන කොම්පැනිත් එක්ක සංසන්දනය කරන කොට, ඒකෙන් ලොකු ප්‍රශ්නයක් ඇති වෙනවා. බදු නැවත ලෙහෙසි තැනින් ගන්නේ නැතිව මේක ඊට වැඩිය ප්‍රායෝගිකව, ජනතාවට උදවු වෙන්න පුළුවන් විධියකට, තමන්ගේ බදු ප්‍රතිපත්තියට හානි නොවන විධියකට සකස් කරන්න ඕනෑ. මොකද අපි මෙතැන අදහස් යොමු කරලා ආණ්ඩුවේ බදු අඩු කරන එකත් සමහර වෙලාවට ප්‍රශ්න වෙන්න පුළුවන්. දැන් තෙල් ප්‍රශ්නය ගැන ගත්තොත්, ඉතාමත් අසාධාරණ මට්ටමක තිබෙනවා. තෙල්වල මිල ඉතාමත් අධික මට්ටමට ගෙනැත් ලාභයක් ලබලා තමාගේ හෙජින් සූදුවේ තිබෙන පව් ටික ඒකෙන් ගෙවන්න හදනවා. අපි උසාවි ගියාම, රුපියල් 50කින් අඩු කරන්න ගියාම අඩු කරන්න බැහැය කියපු ආණ්ඩුවක් තමයි අද ඉන්නේ. සුප්‍රීම් උසාවිය ඕනෑ දෙයක් තීන්දු කළාට අප ඒක ක්‍රියාත්මක කරන්නේ නැහැය කියන දරදඬු මතයෙන් ඉන්න ආණ්ඩුවක් තමයි අද පාලනය කරන්නේ කියන එක මතක් කරන්න අවශ්‍යයි. නමුත් සාධාරණය ඉෂ්ට කරන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒක තමයි මේ සංශෝධනය ගැන දෙවැනි කාරණය වශයෙන් මම මතක් කරන්නේ.

Then, it comes to the Tax Appeals Commission. This is another area which I think needs a lot of rectification and correction because you are trying to be draconian in nature. You cannot administer through the tax implementation authority in the Department of Inland Revenue but you are trying to bring in legislation. This is like killing a mosquito with a hammer. That is what you

are trying to do. You are trying to bring undue pressure on a certain section so that you bypass the democratic process or the fundamental right process of the taxpayer. There are 21 million people in our country and there are only about 1,000 to 1,500 tax files. But, what you do is, you basically harass the people who pay the tax without going after the people who do not pay it. So, with that, now you are basically trying to create further problems for the taxpayers rather than non-taxpayers.

The other matter is the tax appeals. I am informed that they are trying to modulate on to the South African system on which I am not an expert I must confess, but I am only trying to bring forward certain ideas that have been expressed by the tax consultants. According to them, there is certainly a need for a change but that change must be in line with a realistic situation, which helps to make a proactive change rather than reactive and very draconian in nature. That is the problem that we are faced with at this particular moment. So, I think the Tax Appeals Commission needs to look at it in a completely different way and ensure that there is an assisting process. You do not give assistance to people. Nobody loves to evade taxes. There are enough tax planning systems in the country. So, you must have an interactive process. The Department of Inland Revenue itself should come out with a system which helps the taxpayers. It should not be a dog that goes and bites but a dog that barks to protect others. So, you should basically bring in this type of legislation. At the moment, it appears that the Department of Inland Revenue is harassing the taxpayers and the people. So, ensure that you change it. I think the Commissioner General of the Department of Inland Revenue is trying to do a valiant job. But, I think there must be a more collective process to run through.

I must mention another fact. There are tax components that have been sent out but they do not have supportive evidence. It is not just to say that the Department of Inland Revenue has sent out this charge. You must ensure that there is documentary proof to say, yes, this is the case. It is not enough for the Department of Inland Revenue to send the tax computation on an arbitrary figure. There must be some supportive, corroborative evidence. We know that because it has happened to some people. I am bringing in this example because I am sure that there are many others who are going to face this problem. When they see the Department of Inland Revenue, they shiver in fear thinking that it has ultimate powers and activities which are draconian in nature. So, as a result they tend to avoid such things. But, if you have a consultative process where a person says, "Yes, I have made Rs. 1 million, after tax planning I can save Rs. 700,000", and then if the Department of Inland Revenue also says, "Yes, either you can plan it that way or you can have an assistive service", I am sure that will be very much more productive because ultimately it is the tax compliance which is important. A big tax base and a low tax compliance is not what is expected by you as a Government. It is much better to have a small tax base and a big tax compliance area, which infiltrates big net revenue into the economy of the country. Your revenue, today, as opposed to the GDP, is still in the range of about 14.5 to 15 per cent. But, if you analyse the revenue, you will find that 88 per cent of that is coming from indirect taxation. So, that is not the successfulness of a government because you must be able to correct the indirect taxation as well. I suggest that you reduce it to within 10 to 15 per cent rather than having it at 25 or 30 per cent, so that you will have a much higher compliance rate in this country. The reduction made from 35 to 24 per cent in the Budget was a good step. But, that is not good enough when better is expected and if you have it at 10 to 15 per cent, nobody will bother to waste time to avoid taxation.

The next matter is regarding the BOI. You are trying to have two different tax regimes and you are trying to correct that by saying, "one tax regime". But, that is helpful in one aspect but certainly detrimental from the point of view of the investors.

If there are situations in this country, where there are enough investors to make a full compliance with the employment structure in this country, which is sufficient to ensure that the economic wheels keep turning in the entire country, then it does not matter. But, in a country where you have about 250,000 people coming to the employment market every year and where there is unemployment, even though you profess that you have an 8 to 10 per cent unemployment rate - the actual unemployment is at least about one and a half million - and where there is underemployment, you need to have a full employment structure that is created. So, the Sri Lankan investor *per se* is not sufficient enough to kick-start the economy.

Then, you have to get on to the next one, and that is, bringing foreign investors in. This is a Government that scorns upon the foreigners. But, now you are trying to lure them in. Once a damage is done, it is very hard to undo. When the investors come, they come to make money and they basically create employment. You must understand that. That is the reality. But, when you go to a place like the Board of Investment, and if they say, yes, you have got to apply here and we give the approval; then, go to the Department of Inland Revenue and get the tax structure and after that, go to the Ministry of National Heritage and Cultural Affairs and get the approval and finally, go to the Ministry of Environment, then the investor would shy away. He is competing with countries like Malaysia; he is competing with countries like Thailand; he is competing with the countries like Indonesia and also with the rejuvenated India, which is just above us. They approve investments almost in a month. We approve it in a week's time but now we have pushed it back to almost six months to one year. So, I think we need to rectify that because that is going to be our future revenue earning stream.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Hon. Member, you have only two more minutes.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, certainly, I would conclude my speech within that two minutes. Sir, this is a sincere request that comes from a national perspective because at the end of the day, you need a country that has a strong national economy. When you have a national economy, you must have the fundamentals put in place, and the national economic policy put in place must not be amended or changed at the whims and fancies of the politicians or some pressure groups that come in. You must be able to have a perdurable policy that would be helpful. Then, the investors know that this is the way forward.

I know for a fact that many foreign investors have said that Sri Lanka has changed from direct taxation to indirect taxation and thereby reduced profit from almost 31 to 2 per cent and as a result, they say, "Why the hell should we invest in this country". They go to a country where they can make money out of it. Now, this is not trying to keep the Sri Lankan investors at bay. Let the foreigners create jobs and bring in foreign exchange as well as put Sri Lanka on the map.

I sincerely look at the Recovery of Loans by Banks (Special Provisions) (Amendment) Bill as a change in the right direction. Well and good! Again there is a huge gap; get that lacuna corrected. I expressed my comments on the Telecommunication Levy Bill and took up both the Tax Appeals Commission Bill and the Inland Revenue (Amendment) Bill together as the time is a limiting factor for me. I will look at this particular Bill in a more proactive way. We need taxation for the country. There is no question about that. You require direct taxation and indirect taxation. But, when you come to direct taxation, you require more compliance and non-compliance. That is the problem. You must be able to have laws for the sinners than the saints. I agree wholesale. But, when you are doing that, ensure that that is not draconian in nature. You must feel that the Department of Inland Revenue is the most friendliest place to go to. When you go there, you must be able to get the service that you require, not to have people who are like CID agents; a word that is extracted from you would make your tax file larger than what it was before you went to that place. That is what needs to be changed now. Once again, I compare and contrast that particular Bill with the Shangri-La company, for which land has been bought at US Dollars 75 million. I think the Hon. Lakshman Yapa Abeywardena has given me a reply to the question regarding that deal. ගරු ඇමතිතුමනි, ෂැන්ග්‍රි-ලා කොම්පැනිය යූඑස් ඩොලර් මිලියන 75කට මේක ගත්තාය කියලා ඔබතුමා එදා කිව්වා. පිට රට කොම්පැනියක් ඒක ගත්තා නම් සියයට 100ක බදු පිට රට කොම්පැනිය විසින් ගෙවන්න අවශ්‍යයි. ඒ බදු මුදල් තවම ගෙවලා නැහැ. ඒ බදු මුදල් ගෙවා නැත්තේ මොන පදනමක් මතද කියන එක මා මේ ආණ්ඩුවෙන් කාරුණිකව දැන ගන්නට කැමැතියි. ඒ වාගේම CATIC කොම්පැනිය යූඑස් ඩොලර් මිලියන 125ක් ගෙවන්න තිබෙනවා. මේ සියයට 100ක බදු -

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කාලය අවසානයි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මා තව මිනිත්තු දෙකක් ගන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
කාගේ වේලාවෙන් ද ගන්නේ?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එච්චර වෙලා යන්නේ නැහැ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාගේ -

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ, නැහැ. හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාටත් වෙලාව අවශ්‍යයි. මම හිතන්නේ ඉක්මනින් ඉවර වෙයි.

ඉතින් ගරු ඇමතිතුමනි, යූඑස් ඩොලර් මිලියන 125ක් CATIC කොම්පැනියෙන් ගෙවන්නට තිබෙනවා. මේ සියයට 100ක බදු පිට රට කොම්පැනියෙන් ගෙවලා නැහැ. මේ දෙක එකතු කළාම යූඑස් ඩොලර් මිලියන 200යි. මේක 110න් වැඩි කළොත් රුපියල් කෝටි 2,200යි. රුපියල් කෝටි 2,200කින් මොනවාද කරන්න බැරි වන්නේ? BOI එකෙන් ආයෝජනයට approval එක ලැබිලා නැහැ. එහෙනම් strategic development එක ගන්නවා නම්, ඇයි එහෙම අරගෙන මේක කරලා නැත්තේ?

ෂැන්ග්‍රි-ලා කොම්පැනිය බොහොම හොඳයි. දැන් බලන්න, මම මේක ඊයේත් කිව්වා. ඒක "ඩේලි නිව්ස්" පත්‍රයේත් කියලා තිබෙනවා, ෂැන්ග්‍රි-ලා වාගේ කොම්පැනි ගැන අපි ප්‍රශ්න කරන්නේ නැහැ කියලා. අපි එහෙම නොවෙයි කිව්වේ. අපි කිව්වේ, ෂැන්ග්‍රි-ලා වාගේ කොම්පැනි මේ රටට අවශ්‍යයි කියලා. අපි ඒවා කිව්වාම ඒවා පාවිච්චි කරන්න. අපි විපක්ෂයෙන් කියන්නේ. එදාත් කිව්වා, අදත් කිව්වා, හෙටත් කියනවා. මේ කියන ඒවායේ හරය පාවිච්චි කිරීම අවශ්‍යයි. ඔබතුමන්ලා රුපියල් 50ක රීලෝඩ් එකකින් රුපියල් 12.50ක් කෙළින්ම බදු අය කරනවා. නමුත් සුද්දෝ මේ රටට ආපුවාම ගෙවන්න තිබෙන බදු අය කර ගන්නේ නැති එක තමයි මේ අපරාධය කියන එක නැවත මතක් කරනවා. මේ ගැන තවත් සොයා බලා, අපි ඉදිරිපත් කරන සංශෝධනත් කරුණාකරලා පිළිගන්නය කියා ඉල්ලා සිටිමින් මා නිහඬ වනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා. මී ළඟට ගරු එච්.ආර්. මිත්‍රපාල නියෝජ්‍ය ඇමතිතුමා.

[අ. භා. 2.30]

ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා (පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு எச். ஆர். மித்ரபால - கால்நடைவளர்ப்பு, கிராமிய சனசமூக அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. H.R. Mithrapala - Deputy Minister of Livestock and Rural Community Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මම ඉතාම සතුටු වන දවසක්. මා මේ දේශපාලන ක්ෂේත්‍රයේ දීර්ඝ කාලයක සිට ඉල්ලීමක් කළා, මේ රටේ කිතුල් කර්මාන්තය ගැන. මහින්ද චින්තනය තුළ අද මේ රටේ කිතුල් කර්මාන්තයේ අලුත් පරිච්ඡේදයක් ආරම්භ වනවා. අතිගරු ජනාධිපතිතුමාට, ඒ වාගේම ගරු බැසිල් රාජපක්ෂ අමාත්‍යතුමාට මා ස්තුතිවන්ත වනවා, අද මේ සුරාබදු පනත සංශෝධනය කිරීම ගැන. මෙතෙක් කල් අධිරාජ්‍යවාදීන් විසින් පනවපු විවිධ බාධකවලට හසු වී හිටපු ජනතාවට, අධිරාජ්‍යවාදීන්ගේ යකඩ දම්වැල්වලට, යකඩ සපත්තුවලට පෑගිලා හිටපු ජනතාවට අද හිස ඔසවන්නට අවස්ථාව ඇවිල්ලා තිබෙනවා. මීට පසුව පොලීසියට, ප්‍රාදේශීය ලේකම්වරුන්ට, ග්‍රාම නිලධාරිවරුන්ට කිතුල් කර්මාන්තයේ යෙදී සිටින අයව අත් අඩංගුවට ගන්නට බැහැ. ඒ අයට විශාල පරිමාණයෙන් මේ රටේ හකුරු කර්මාන්තය දියුණු කරන්නට අද පුළුවන්කම ලැබිලා තිබෙනවා. විශේෂයෙන් කඳුකරයේ හැදෙන කිතුල් ගසෙන් කිතුල් පැණි ටිකකුත්, රුහුණේ කිරි ටිකකුත් කන්න මේ රටේ මිනිසුන් හරියට ආසා කරනවා. ඒ සඳහා විශාල බාධාවක් තිබුණා. ඒ බාධාව අද ඉවත් කරලා තිබෙනවා.

මේ රටට සීනි ගෙනෙන්න වර්ෂයකට රුපියල් මිලියන 22,000ක් විතර වියදම් කරනවා. අද සීනි මෙට්‍රික් ටොන් 5,50,000ක් විතර මේ රටට ගෙනෙනවා. බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් මේ රට පාලනය කරන සමයේ අපේ දේශීය කෘෂිකර්මය විනාශ කළා. අපිට නොවුවමනා දේවල් හඳුන්වා දුන්නා. අද අපි මේ ආර්ථික අර්බුදය ගැන කථා කරන කොට මේවා තමයි අපිට බරපතළ ප්‍රශ්න වෙලා තිබෙන්නේ. දැන් සීනි සඳහා රුපියල් කෝටි 2,200ක් වාර්ෂිකව අපි වියදම් කරනවා. කිරි පිටි ගෙන්වන්න රුපියල් කෝටි 3,000ක් වියදම් කරනවා. ඒ මුදල ලේසියෙන්ම මේ රටේ ඉතිරි කර ගන්නට පුළුවන්. ඒ මුදල ඉතිරි කර ගත්තා නම් ඩොලර් එකට තිබෙන ඉල්ලුමත්, ඩොලර් එකේ තිබෙන බලපෑමත් අඩු වෙලා යනවා. මේ දේශීය කර්මාන්තය දියුණු කරන්නට අපට අද හොඳ අවස්ථාවක් ඇවිල්ලා තිබෙනවා.

මේ කිතුල් කර්මාන්තය අපේ පළාතේ විශාල වශයෙන් සිදු වනවා. අපේ නුවර පළාත, කෑගල්ල දිස්ත්‍රික්කය, දැරණියගල වැනි කොට්ඨාසවල ජනතාව විශාල වශයෙන් කිතුල් කර්මාන්තයේ යෙදිලා සිටිනවා. එක සැරයක් මට පැමිණිල්ලක් ආවා. පොලිස් නිලධාරියෙක් ගමට යන ගමන් කිතුල් ගහක් මදින තැනකට ගිහිල්ලා රා දෙන්න කියලා ඉල්ලා තිබෙනවා. රා දෙන්න ඒ මනුෂ්‍යයා රා පෙරන කෙනෙක් නොවෙයි. ඔහු කිතුල් හකුරු හදන මනුෂ්‍යයෙක්. ඒ මනුෂ්‍යයා කිව්වාලු, "මම රා හදන්නේ නැහැ, හකුරු තමයි හදන්නේ" කියලා. "නැහැ, උඹ රා පෙරනවා, අපිට රා දීපන්" කියලා පොලිස් නිලධාරියා කියා තිබෙනවා. ඔහු ළඟ රා තිබිලා නැහැ. පොලිස් නිලධාරියා කිතුල් ගහට නැඟලා අර කිතුල් මල කපා දමා තිබෙනවා. මේ රටේ අහිංසක මිනිසුන්ට ඕනෑ තරම් මේ වාගේ දුෂ්ට ක්‍රියාවන්වලට මුහුණ පාන්නට සිදු වෙලා තිබෙනවා. මා දන්නවා, කිතුල්ගල පළාතේ හකුරු කර්මාන්තයේ යෙදී සිටින අයට නිතර කරදර විඳින්නට සිදු වෙලා තිබෙන බව. ඒ අයව අසත්‍ය චෝදනා කරමින් නිතර අධිකරණයට ඉදිරිපත් කරනවා. මීට පස්සේ කිතුල් ගහකට පිහිය තැබුවාය කියලා යම් කිසි පුද්ගලයකු අධිකරණයට ගෙන යන්න පොලීසියට තිබෙන ඉඩකඩ, පාර්ලිමේන්තුව අද සම්මත කරන සුරාබදු (සංශෝධන) පනත් කෙටුම්පත තුළින් නැති වනවා. එම නිසා අපට ඉතාම වැදගත් පනත් කෙටුම්පතක් මේක. මෙයින් අපට විශාල පිරිසකට රක්ෂා විශාල ප්‍රමාණයක් ජනිත කරන්න පුළුවන්. තරුණ පිරිස මේකට ආකර්ෂණය කරන්න පුළුවන්. සාමාන්‍යයෙන් කිතුල් ගහකින් රුපියල් 10,000ක් විතර උපයන්න පුළුවන්.

අධ්‍යාපනය ලබා ගන්න බැරි අහිංසක පිරිසක් රක්ෂා නැහැයි කියලා ඉන්නවා. අපේ රටේ සාමාන්‍ය පෙළ විභාගය pass වන අය හරියට සියයට 50ක්වත් නැහැ. ඉදිරියේදී ඒ අයට රක්ෂාවන් පිළිබඳ ප්‍රශ්නය ඇති වනවා. මේ ප්‍රශ්නයට හොඳ උත්තරයක් තිබෙනවා. දේශීය වැවිලි කර්මාන්තයට, දේශීය කර්මාන්තවලට, දේශීය කෘෂිකර්මයට වැනි දේශීය දේවල්වලට ජනතාව යොමු කරන එක තමයි මේකට තිබෙන ප්‍රධාන පිළිතුර හැටියට අපට කියන්න පුළුවන්. අද මේ රටේ 28,00,000ක් විතර කිතුල් ගස් තිබෙනවා. නමුත් සැබෑ ලෙසම පරිහරණයට ගන්න පුළුවන් කිතුල් ගස් ලක්ෂ 5ක් විතර තමයි අපට තිබෙන්නේ. මේ පනත් කෙටුම්පත සම්මත කිරීමත් සමඟම ඉදිරි කාලය තුළ මේ කිතුල් ගස් ටික දියුණු කරලා මේ රටේ ජාතික ආර්ථිකයට දැවැන්ත සහයෝගයක් අපට දෙන්න පුළුවන්. මෙතෙක් කල් අපට පුළුවන්කමක් තිබුණේ නැහැ, කිතුල් ගහකට පිහිය තබන්න. මේ පනත් කෙටුම්පතේ තිබෙනවා, "No tree producing toddy, other than the kitul tree and the palmyrah tree, shall be tapped" කියලා. පිහියක් තබන්න බැහැ, කිතුල් මලකට. ඒක තමයි තිබුණු නීතිය. අද ඒ නීතිය ඉවත් වනවා. මේ පාර්ලිමේන්තුව අද ඒ නීතිය ඉවත් කරනවා. මේ රටේ කිතුල් කර්මාන්තය ගැන කථා කරන කොට අද ඓතිහාසික දවසක්. මේ සම්බන්ධයෙන් විවිධ යෝජනා ආවා; විවිධ ව්‍යාපෘති ගෙනාවා. නමුත් ඒවා සාර්ථක වන්නේ නැහැ. ඇයි? පොලීසිය නිතරම මේ කිතුල් ගහ පිටුපස දුවන්න පටන් ගෙන තිබුණා. රා කර්මාන්තය දියුණු කරන්න අපි කථා කරනවා නොවෙයි. රා සම්බන්ධයෙන් රටේ සාමාන්‍ය නීතිය බලපානවා. එතකොට සාමාන්‍ය නීතිය අනුව රා ගැන කටයුතු කරන්න පුළුවන්. ඒකෙන් බාධාවක් ඇති වන්නේ නැහැ. අද ගෙන එන අලුත් සංශෝධනයත් එක්ක කිතුල් කර්මාන්තය දියුණු කර ගෙන යන්න හොඳ අවස්ථාවක් ඇවිත් තිබෙනවා. මේක තමයි මහින්ද චින්තනය. මේක තමයි දේශීය සුවඳ. මේක තමයි ගැමි සුවඳ. මේ රටේ ඉස්මතු කර ගන්න වුවමනා වැළලුණු නිදහස මේ රටේ දේශීය ජනතාවගෙන් මතු කරන්න පුළුවන් වර්තමාන ආණ්ඩුව ගෙන යන වැඩ පිළිවෙළ තුළින්. මෙය, මේ රටේ ජනතාවගේ ප්‍රයෝජනය සඳහා මහින්ද චින්තනය තුළ ලැබුණු අලුත් වැඩසටහනක් හැටියටයි අපි කල්පනා කරන්නේ.

එදා 1970-1977 ආණ්ඩුව කාලයේ පොල් ගස් දෙකක් මදින්න ආචාර්ය එන්.එම්. පෙරේරා මැතිතුමා ඉඩ දුන්නා. ඒ වෙලාවේ ප්‍රවෘත්ති පත්‍රවලින් මොනවාද කිව්වේ? "පෙරෙයි රා" කියලා එතුමාගේ නම විකෘති කළා. "රා පෙරෙයි" කිව්වා. එදා මේ වාගේ බහුබූත කථන්දරවලින් මාධ්‍යයෙන් දිගට හරහට එන්.එම්. පෙරේරා මැතිතුමා විවේචනය කළා. නමුත් එතුමා පොල් ගස් දෙකක් මදින්න ඉඩ දුන්නා. ගෙවල්වල කිතුල් කර්මාන්තයට ඉඩකඩ ලැබුණේ නැහැ. පොල් ගස් දෙකක් මැද ගන්න ඉඩකඩ ලැබුණා, හකුරු හදන්න. එතකොට මේ රටේ සීනිවලට තිබුණු ඉල්ලුම විශාල වශයෙන් අඩු වන්න පටන් ගත්තා. නමුත් ඒවා විනාශ කරලා දැම්මා. ඒකේ පළමුවන චෝදනාව තිබෙන්නේ ජනතා විමුක්ති පෙරමුණටයි. 1970 ආණ්ඩුව බලයට ඇවිල්ලා මාස හයක් ගත වන කොට ආයුධ සන්නද්ධ විධියට ආණ්ඩුවට ගැහුවා. මේ ආපු දේශීය සුවඳ එදා තළලා, පොඩි කරලා දැම්මේ ජනතා විමුක්ති පෙරමුණයි. අද නම් දුර්වල වෙලා ඉන්නවා, මොනවාවත් කරන්න විධියක් නැතුව. එම නිසා අපට කථා කරන්න පුළුවන්. අද

[ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා]

නිදහසේ වැඩ කරන්න පුළුවන්. බාධාවන් සියල්ලම ඉවත් වෙලා ගිහින් තිබෙනවා. දේශීය කර්මාන්තය දියුණු කර ගෙන යන්න මහින්ද චින්තනය තුළින් මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ගත් පියවර, බැසිල් රාජපක්ෂ මැතිතුමා ගත් පියවර, දීර්ඝ කාලයක් තිස්සේ අධිරාජ්‍යවාදීන් මේ රටේ ඇති කරපු ඒ යකඩ දම්වැල අද සුනුවිසුනු කරන එක් අවස්ථාවක් හැටියට මට සඳහන් කරන්න පුළුවන්. එදා මේ ප්‍රශ්නය ඇවිල්ලා තිබියදී බ්‍රිතාන්‍ය ජාතිකයා ගමට යන්න හය වුණා. මල් කපන පිහිය එච්චරම තියුණු බ්ලේඩ් එකක්. නොයෙක් වෙලාවට ආරවුල් ඇති වුණාම මේ පිහියෙන් විදේශිකයන්ට හිරිහැර සිදු වුණා; බෙල්ල කපා දමනවා. සිංහල ජනතාවගේ ඒ ක්‍රියාවලියට විරුද්ධව තමයි එදා බ්‍රිතාන්‍ය ජාතිකයා මේ නීති පනවන්න ලැස්ති වුණේ. නොයෙක් නොයෙක් විධියට ජනතාවට හිරිහැර කරන්න පටන් ගත්තා. මේ රටේ ජනතාව, තළලා, පාගා දමන්න උත්සාහ කළා. එම නිසා මේ රටේ දේශීය කර්මාන්ත වැළලිලා යන්න පටන් ගත්තා.

එදා ගෙදරක කරපිංචා ගහක් තිබුණා; රම්පෙ ගහක් තිබුණා; බටු ගහක් තිබුණා; මිරිස් ගහක් තිබුණා; තක්කාලි ගහක් තිබුණා. මේ ඇති කරපු ආර්ථික වෙනස්කම් නිසා ඒවා සියල්ල නැති වෙලා ගියා; මුදල් පස්සේ දුවන සමාජයක් නිර්මාණය කළා. අද ඒක ආපසු හරවන්න පටන් අරගෙන තිබෙනවා. බැසිල් රාජපක්ෂ ඇමතිතුමා එක් නිවසකට රුපියල් 10,000ක් දෙනවා, ගෙවතු වගාව කරන්න; බටු ගහක් සිටු වන්න; මිරිස් ගහක් සිටු වන්න. අද වියළි මිරිස් ආනයනය කරනවා. දේශීය වශයෙන් අද විශාල ලෙස වියළි මිරිස්වල මිල වැඩි වෙලා තිබෙනවා; අමු මිරිස්වල මිල වැඩි වෙලා තිබෙනවා. ඇයි? ගෙදරක එක මිරිස් ගහක් නැහැ; රම්පෙ ගහක් නැහැ; කරපිංචා ගහක් නැහැ. සියලු දෙනාම පොළට යන්න පුරුදු වෙලා; වෙළෙඳ පොළට යන්න පුරුදු වෙලා. මෙන්න මේ පුරුද්ද අවසන් කරලා, අපේ ඓතිහාසික උරුමය තුළින් මේ රටේ ජන ජීවිතය යථා තත්ත්වයට පත් කරන්න අද හොඳ අවස්ථාවක් අපට උදා වෙලා තිබෙන බව මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ. එම නිසා අද ඉදිරිපත් කර තිබෙන මේ බදු සංශෝධන තුළින් මෙන්ම, අතිගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කරපු අය වැය ලේඛනයෙන් මේ රටේ ඇති කරන ප්‍රතිසංවිධාන කටයුතු තුළින් ජනතාවට සහනයක් තමයි ලැබෙන්නේ. මේ රටේ දේශීය කර්මාන්ත දියුණු කරන ගමන්ම, විදේශවලින් එන අනවශ්‍ය දේවල් වළක්වන අතරේ අපට වුවමනා විධියට මේ රටේ ආර්ථිකය හැඩ ගස්වා ගන්න පුළුවන්කම ලැබෙනවා. ඕස්ට්‍රේලියාවෙන්, නවසීලන්තයෙන් සහ යුරෝපයෙන් කිරි පිටි ගෙනෙන්න අපි වාර්ෂිකව වියදම් කරන මුදල රුපියල් කෝටි 3,000ක් විතර වෙනවා. ඒක ජාතික ආදායමට විශාල බරක්. අපේ ගව කර්මාන්තය දියුණු කර ගන්න පුළුවන් නම්, කිරි හරක් කර්මාන්තය දියුණු කර ගන්න පුළුවන් නම් අපිට රුපියල් කෝටි 3,000ක් විතර ඉතිරි කර ගන්න පුළුවන්. ඒ වාගේම කිතුල් කර්මාන්තය දියුණු කර ගන්න පුළුවන් නම් රුපියල් කෝටි 2,200ක් ඉතිරි කර ගන්න පුළුවන්. නිවැරදි විධියට මේ කර්මාන්ත ස්ථානගත කරලා ඒවා දියුණු කරන්න කටයුතු කෙරුවොත් රුපියල් කෝටි 5,000ක විතර විදේශ විනිමයක් අපට ඉතිරි කර ගන්න පුළුවන්. ඒ තුළින් රක්ෂා ප්‍රශ්නයට විශාල සහයෝගයක් ලැබෙනවා. මේ කිරි හරක් ඇති කිරීම තුළින් මේ රටේ ලක්ෂයකට විතර රස්සාවල් ලබා ගන්න පුළුවන්. අපි අද ඒවා ඔක්කොම අත ඇරලා තිබෙනවා. 1977 ආණ්ඩුව ආවාට පස්සේ විදේශවලින් කිරි පිටි ආනයනය කරන්න පටන් ගත්තා. මේ රටේ සත්තු ටික ඔක්කොම වඳ වෙලා යන්න පටන් ගත්තා. ඇයි? උදේ ඉඳලා මහන්සි වෙලා වැඩ කරන මනුස්සයා සවසට කඩේට ගිහින් රුපියල් 400ක් දීලා කිරි පැකට් එක අරගෙන ගෙදර යන්න පුරුදු වුණා. ඒ රුපියල් 400ම අර ශාන්තිකර සාගරෙන් එහාට පියාඹලා යන්න පටන් ගත්තා. ඒක තමයි ඇති වෙච්ච ප්‍රතිඵලය. ඒ නිසා මේ රටේ කිරි කර්මාන්තය පහළට ඇද ගෙන වැටුණා. කිරි නිෂ්පාදනය නැති වුණා. 1977 දී ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාට රට භාර දෙන කොට රටේ කිරි අවශ්‍යතාවෙන් සියයට 85ක් මේ රටේ නිෂ්පාදනය කෙරුවා. සියයට 15යි ආනයනය කළේ, ඒ ළදරු කිරි පිටි විතරයි. අද සියයට 80ක් අපි ආනයනය කරනවා. සියයට 20යි මේ රටේ නිෂ්පාදනය කරන්නේ. ඒක දියුණු කරන්න අපි වැඩ කටයුතු රාශියක් කර තිබෙනවා. මේ කිතුල් කර්මාන්තය තුළින් අපේ ගම්වල තරුණයන්ට අද අලුත් දොරක් විවෘත වෙනවා. පොලීසියට බය නැතිව කිතුල් ගහට නැඟලා අද කිතුල් මල මදින්න මේ පනත් කෙටුම්පත සම්මත කිරීම තුළින් ඉඩකඩ ලැබෙන බව මම මතක් කරනවා. අධිරාජ්‍යවාදී යදම් බිඳ දමමින් මේ ක්‍රියා මාර්ගය ගත්ත මහින්ද රාජපක්ෂ ආණ්ඩුවට මගේ ගෞරවය හා ස්තුතිය පුද කරමින් මගේ වචන කීපය සමාප්ත කරනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Order, please! The Hon. Deputy Chairman of Committees will now take the Chair.

අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] මූලාසනාරූඪ විය.

அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு முருகேசு சந்திரகுமார்] தலைமை வகித்தார்கள்.

Whereupon MR. DEPUTY SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR*] took the Chair.*

[பி.ப. 2.41]

ගරු එස්. ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, வங்கிகளால் வழங்கப்பட்ட கடன்களை அறவிடுதல் (விசேட ஏற்பாடுகள்) (திருத்தம்) சட்டமூலம் தொடர்பாக இங்கு விவாதம் நடைபெற்றுக்கொண்டிருக்கின்றது. 2009ஆம் ஆண்டில், யுத்தம் முடிவுற்ற காலகட்டத்தில், குறிப்பாக, வன்னியிலே வாழ்ந்த மக்கள் அங்கிருந்து வரவழைக்கப்பட்டு செட்டிக்குளத்திலே அடைத்து வைக்கப்பட்டிருந்து, பின்னர் அவர்கள் தங்களுடைய சொந்த இடங்களுக்குச் சென்று குடியேறி, தங்களுடைய வாழ்க்கையை ஆரம்பிக்கின்ற வேளையில், கிளிநொச்சி, முல்லைத்தீவு மாவட்டங்களிலும் மன்னார்-மாந்தை மேற்கு, வவுனியா வடக்கு போன்ற பகுதிகளிலும் வாழ்கின்ற மக்கள் தங்களுடைய தொழில்களை மேற்கொள்வதற்காக வங்கிகளிலே கடன்களைப் பெற்றிருந்தார்கள். அவர்களில் பலர் வயல் நிலங்களில் பெருமளவில் உற்பத்திகளை மேற்கொண்டிருந்தார்கள். ஆனால், கடந்த ஆண்டு பெய்த கனமழை காரணமாக அவர்களுடைய செய்கைகள் பாதிக்கப்பட்டன. இதனால் அவர்கள் பெற்ற வங்கிக் கடன்களை மீளச் செலுத்த முடியாத நிலைமையில் திணறிக் கொண்டிருப்பதை எங்களால் பார்க்க முடிகின்றது. ஆகவே, வங்கிகளிலே கடன் பெற்று தங்களுடைய வயல்நிலங்களில் வேலைகளை ஆரம்பித்த அந்த மக்களுடைய நிலைமைகளைக் கவனத்திலெடுத்து அவர்களுடைய வங்கிக் கடன்களை இரத்துச் செய்வதற்கு அல்லது அந்த வங்கிக் கடன்களை அறவிடுவதை ஓராண்டு காலத்துக்காவது பின்தள்ளி, அதனை வட்டியின்றி அறவிடுவதற்கு இந்தச் சபையினூடாக நடவடிக்கை மேற்கொள்ளப்பட வேண்டும். ஏனெனில், அவர்கள் யுத்தம் காரணமாகவும் பாரியளவில் பாதிக்கப்பட்டு, தங்களுடைய சொத்துக்களையெல்லாம் முழுமையாக இழந்த நிலையில் மீண்டும் தங்களுடைய சொந்த இடங்களில் குடியேறியவர்கள். பலர் குடியிருப்பதற்குக்கூட வீடில்லாத ஒரு நிலையில், வங்கிகளை

மாத்திரம் நம்பி கடன்களைப் பெற்று தங்களுடைய வாழ்வாதாரச் செயற்பாடுகளை ஆரம்பித்திருந்தார்கள். குறிப்பாக, கிளிநொச்சி மாவட்டத்திலே 40,825 ஏக்கர் நிலப்பரப்பில் அந்த மக்கள் வங்கிகளில் கடன்பெற்றுத் தங்களுடைய நெல் உற்பத்திகளைச் செய்திருந்தார்கள். அதன்பின் பெய்த கனமழை காரணமாக ஏற்பட்ட கொடிய நோயினால் அவர்களுடைய விவசாயச் செய்கைகள் பெருமளவில் பாதிக்கப்பட்டிருந்தன. பின்னர் அந்த உற்பத்திகள் நோயின் தாக்கத்திலிருந்து விடுபட்டிருந்தாலும் அறுவடை காலத்தின்பொழுது முந்தியதைவிட கூடிய கனமழை பெய்ததன் காரணமாக முழுமையான அளவில் அவை பாதிக்கப்பட்டன. கடும்மழை காரணமாக ஏறத்தாழ 80 சதவீதமான செய்கை அழிவுக்குள்ளாகியிருப்பதால் பெருமளவான விவசாயிகள் பாதிப்படைந்திருக்கிறார்கள். பாதிக்கப்பட்ட அந்த விவசாயிக ளுக்கு நஷ்டஈடு வழங்குவதற்கான பச்சைக் கொடியை இந்த அரசாங்கம் இதுவரையில் காட்டவில்லை. ஆகவே, அந்த விவசாயிகளுடைய மன நிலையைக் கருத்திற்கொண்டு, வங்கிகளிலே அவர்கள் பெற்ற கடன்களை இரத்துச் செய்வதற்கோ அல்லது அக்கடன்களை ஓராண்டு காலத்துக்காகவாவது பின்தள்ளி, வட்டியின்றி அதனை அறவிடுவதற்கோ இந்த சபையினூடாக நடவடிக்கை எடுக்க வேண்டுமென்று மீண்டும் கேட்டுக்கொள்வதுடன், இந்தச் சபையிலே இன்றைய விவாதத்தின் ஒரு முக்கிய கருப்பொருளாகவும் நான் அதனை முன்வைக்கின்றேன். மிக முக்கியமாக கிளிநொச்சி மாவட்டத்திலுள்ள வட்டக்கச்சி, இராமநாதபுரம், கல்மடுநகர், தர்மபுரம், கண்டாவளை, முரசுமோட்டை, கலவெட்டித்திடல், புளியம்பொக்கணை, பரந்தன், உருத்திரபுரம், அக்கராயன், ஸ்கந்தபுரம், வன்னேரிக்குளம், பூநகரி ஆகிய இடங்களில் பரந்தளவில் நெற்செய்கையை மேற்கொள்கின்ற விவசாயிகள் இந்த நிலையினால் பெருமளவில் பாதிக்கப்பட்டிருக்கிறார்கள். இவ்விடயம் கிளிநொச்சியிலுள்ள வங்கிகளுக்குத் தெரிவிக்கப் பட்டு, அப்பிரதேசத்திலுள்ள விவசாயிகளுக்குத் தேவையான உதவிகள் வழங்குவதற்கான நடவடிக்கைகள் மேற்கொள்ளப்பட வேண்டும் என்று நான் இதற்கு முன்பும் ஒரு தடவை இச்சபையிலே தெரிவித்திருந்தேன். அப்பிரதேசத்தில் மீண்டும் மீண்டும் பாதிப்புக்குள்ளாகின்ற அந்த விவசாயிகளின் நிலைமையைக் கருத்திற்கொண்டு அவர்களுக்கு உதவுமாறு நான் இந்தச் சபையினூடாக மீண்டும் வேண்டுகோள் விடுக்கின்றேன்.

அதேவேளையில், யாழ்ப்பாண மாவட்டத்திலே உள்ள இலங்கை வங்கியிலே கடந்த எட்டு வருடங்களுக்கு மேலாக 40க்கு மேற்பட்ட பல்தர உதவியாளர்கள் எண்ணாயிரம் ரூபாயை மட்டும் சம்பளமாகப் பெற்று கடமையாற்றி வருகின்றார்கள். அவர்களை நிரந்தரமாக்க வேண்டும் என நான் இந்தச் சபையினூடாகவும் அமைச்சர்களுக்கூடாகவும் பல தடவைகள் கோரிக்கைகள் விடுத்துள்ளபொழுதிலும் இதுவரையில் அவர்களுக்குச் சாதகமான சமிக்ஞை எதுவும் காட்டப்படவில்லை. யாழ்ப்பாண மண்ணிலே பல்தர உதவியாளர்களாகக் கடமையாற்றுகின்றவர்களில் பலர் நாற்பது வயதுக்கு மேற்பட்டவர்களாகவும் மீண்டும் வேறு வேலையைத் தேடிச் செல்ல முடியாதவர்களாகவும் இந்த வேலையையே நம்பி தமது குடும்பத்துடன் வாழ்பவர்களாகவும் காணப்படுகின்றார்கள். ஆகவே, கடந்த எட்டு வருடங்களுக்கு மேலாக, அதிலும் குறிப்பாக யுத்தம் கடுமையாக நடைபெற்ற காலப்பகுதிகளிலும் பணிபுரிந்த அந்த 40க்கு மேற்பட்ட பல்தர உதவியாளர்களுக்கு நிரந்தர நியமனம் வழங்கப்பட வேண்டும். இன்று விவாதிக்கப்பட்டுக்கொண்டிருக்கின்ற வங்கிகளினால் வழங்கப்பட்ட கடன்களை அறவிடுதல் சட்டமூலத்தில் திருத்தங்களை முன்வைக்கின்றவேளையில், இத்தகைய ஊழியர் களின் நிலைமைகளையும் கவனத்தில் எடுத்துக்கொள்ள வேண்டுமென நான் மிகவும் விநயமாகக் கேட்டுக்கொள்கின்றேன்.

அடுத்ததாக, 1970களிலிருந்து வட்டக்கச்சியிலே அரசினர் விவசாயப் பண்ணையும் அரசினர் விவசாயப் பாடசாலையும் மிகவும் சிறப்பாக இயங்கிவந்தன. 1980களில் விவசாயப் பண்ணையிலே படித்த இளைஞர்களையும் எட்டாந் தரத்துக்கு மேல் படித்தவர்களையும் கிளிநொச்சி மண்ணிலே குடியேற்றியதன் காரணமாக கிளிநொச்சி தனி விவசாயக் குடியேற்ற மாவட்ட மெனப் பெயர்பெற்றது. ஆனால், வட்டக்கச்சி அரசினர் விவசாயப் பண்ணை கடந்த இருபது ஆண்டு காலமாக யுத்தத்தைக் காரணங்காட்டி செயற்படுத்தப்படாமல் தட்டிக்கழிக்கப்பட்டு வந்துள்ளது. யுத்தம் முடிவுற்ற பின்னர் அந்த இடத்திலே இராணு வத்தினர் நிலைகொண்டபோதும், இப்பொழுது இராணுவத்தினர் அவ்விடத்திலிருந்து மெல்ல மெல்ல அகன்றுகொண்டிருக்கும் சூழ்நிலையில், கிளிநொச்சி மாவட்டத்தில் மீண்டும் அந்த அரச விவசாயப் பாடசாலையையும் அரச விவசாயப் பண்ணையையும் இயக்க வேண்டிய தேவை ஏற்பட்டிருக்கிறது என்பதை நான் இச்சபையினூடாகத் தெரிவிக்க விரும்புகின்றேன். ஏனெனில், அண்மைய நாட்களில் அவ்விவசாயப் பண்ணைகளில் வேறு திட்டங்களை மேற்கொள்வதற்கான முயற்சிகள் நடைபெறுவதாக நாம் அறிகிறோம். குறிப்பாக, வட மாகாண விவசாய அமைச்சின்கீழ் வருகின்ற அந்த விவசாயப் பண்ணையை மத்திய விவசாய அமைச்சின்கீழ்க் கொண்டுவந்த பின்னர், உணவு உற்பத்திச் சபையினூடாக அதனைக் கையகப்படுத்தி, அங்குள்ள மக்கள் பயமுறுத்தப்பட்ட ஒரு சூழலில், அந்தப் பண்ணை வேறு உற்பத்திகளுக்காகப் பயன்படுத்தப்படலாம் என்ற தகவல்கள் வெளியாகிக்கொண்டிருக்கின்றன. ஏற்கெனவே கொழும்பிலும் மலையகத்திலும் வாழ்ந்த மக்களே, 1958களில் ஏற்பட்ட இன வன்முறையில் பாதிக்கப்பட்டு அந்த விவசாயப் பண்ணையை அண்மித்த பிரதேசத்தில் அமைக்கப்பட்ட பத்து வீட்டுத் திட்டம் என்ற இடத்தில் குடியேறி வாழ்ந்து வருகின்றார்கள். அந்த மக்கள் அரச காணிகளில் 4 பரப்பு - அதாவது 1/4 ஏக்கர் - காணியில் குடியேறி பெரிய வான் பயிர்களையும் நீண்டகாலப் பயிர்களையும் நாட்டி, இன்று அவற்றிலிருந்து சிறு அறுவடையைப் பெற்றுக்கொண்டிருக்கின்றனர். இவ்வேளையில், அப்பிரதேசத்தில் நிலைகொண்டுள்ள இராணுவத்தினர் அவர்களுடைய 4 பரப்புக் காணிகளை இரண்டு பரப்புக்களாகப் பிரித்து அவர்களது வான்பயிர்களையும் அழித்து, அவர்களுக்கு இரண்டு பரப்புக்காணி மட்டும்தான் தரமுடியும் என்று அறிவித்ததுடன், அதற்காகச் சில அரச உத்தியோகத்தர்களை அழைத்துச் சென்று அக்காணிகளை அளந்திருப்பதாகவும் அந்த மக்கள் எங்களுக்கு முறைப்பாடு செய்திருக்கின்றார்கள். 1974ஆம் ஆண்டிலிருந்து கிட்டத்தட்ட 15 ஆண்டுகளுக்கு மேல் ஆயிரத்துக்கு மேற்பட்டவர்கள் அந்த வட்டக்கச்சி விவசாயப் பண்ணையில் வேலை செய்திருக்கின் றார்கள். அங்கு வேலை செய்த பலர் உரிய ஓய்வூதியம் இன்றி தாம் விளைவித்த வான் பயிர்கள், சிறு பயிர்கள் என்பவற்றினால் கிடைக்கும் வருமானத்தை நம்பியே வாழ்ந்து வந்திருக்கிறார்கள். ஆனால் இன்று அவர்கள் மீண்டும் அவ்விடத்திலிருந்து துரத்தப்படுகின்ற நிலைமை காணப் படுகின்றது. அதாவது "நீங்கள் கலைக்கப்படுவீர்கள்" என்று அவர்களுக்கு பயமுறுத்தல் விடுக்கப்படுகின்றது. அந்தப் பிரதேசமானது, பெரிய விவசாயப் பாடசாலையொன்றையும் பெரிய விவசாயப் பண்ணையொன் றையும் உள்ளடக்கியுள்ள, கறுப்பிகுளம் என்னும் குளத்துடன் சேர்ந்த வளம்மிக்க மண்ணைக்கொண்ட மிகப்பெரிய விவசாய நிலப்பரப்பாகும். அது அந்தப் பகுதியிலே வாழ்கின்ற மக்களுக்கான, கிளிநொச்சி மாவட்டத்திலுள்ள மிகப் பெரியதொரு விவசாயப் பண்ணையாகும். மேலும், அப்பண்ணையானது கூடியளவான உற்பத்திகளைச் செய்வதிலும் ஆராய்ச்சிகளை மேற்கொள்வதிலும் புதிய விதைகளை உற்பத்தி செய்வதிலும், கண்டுபிடிப்பதிலும் கூடியளவு செல்வாக்கைச் செலுத்தியிருக் கின்றது. ஆகவே, அந்தப் பண்ணையை மீண்டும் இயக்குவதற்குத் தேவையான நடவடிக்கைகளை உடன் மேற்கொள்ள வேண்டு மென நான் இச்சபையினூடாக வேண்டுகோள் விடுக்கின்றேன். அதேநேரம் இன்று ஒரு வீட்டுத் திட்டத்துக்கு ஆகக்குறைந்தது அரை ஏக்கர் காணி - அதாவது, குறைந்தது எட்டுப் பரப்புக் காணி - இருக்கவேண்டும் என்றதொரு சட்டம் முன்வைக்கப்பட்டிருக்கின்ற இந்தச் சூழலில், அங்குள்ள பத்து வீட்டுத் திட்டத்தில் வாழுகின்ற மக்களுடைய நான்கு பரப்புக் காணிகளை இரண்டு பரப்புக்களாக குறைக்க முனைவது எவ்வளவு வேதனையானது என்பதை அந்த

[ගරු එස්. ශ්‍රීතරන් මහතා]

மக்கள் மிகவும் கவலையோடு என்னிடம் தெரிவித்தார்கள். ஆகவே, அந்த மக்களுடைய நிலையை கவனத்தில் எடுத்து, அவர்களுடைய வாழ்வியல் மாற்றத்துக்கு உதவவேண்டுமென நான் கேட்டுக்கொள்கின்றேன்.

இன்று தொலைத் தொடர்பு அறவீட்டுச் சட்டமூலம் தொடர்பாகவும் இங்கு விவாதிக்கப்படுகின்றது. வடக்கு, கிழக்கு மாகாணங்களில் 90 சதவீதமான மக்கள் 'கேபிள்' முறையிலான தொலைபேசிகள் இல்லாமையால் கைத்தொலைபேசிகளையே பயன்படுத்தி வருகின்றார்கள். கைத்தொலைபேசிகளுக்கான வரி அறவீடுகள் அதிகரிக்கப்படுகின்ற இன்றைய சூழலில், அந்த வரிச் சுமையின் கூடுதலான அளவைச் செலுத்துகின்றவர்களில் வடக்கு, கிழக்குப் பகுதிகளைச் சேர்ந்த மக்களே உள்ளடங்குகின்றார்கள். ஆகவே, யுத்தத்தைக் காரணம் காட்டி வடக்கு, கிழக்கிலே இலங்கை தொலைத் தொடர்பு நிறுவகத்தின் செயற்பாடுகள் சரியான முறையில் மேற்கொள்ளப்படாமல், அச்செயற்பாடுகள் பின்தள்ளப் பட்டிருக்கின்ற இச்சூழலில், அந்த மக்களுக்கு 'கேபிள்' தொலைபேசி இணைப்புக்களைச் சீர்படுத்திக் கொடுக்கும்வரை அவர்களுடைய கையடக்கத் தொலைபேசிக் கட்டணங்கள்மீது விதிக்கப்படுகின்ற வரி முறையில் மாற்றத்தை ஏற்படுத்த வேண்டும். ஏனெனில், நாட்டின் ஏனைய பகுதிகளில் விதிக்கப்படுகின்ற வரியின் அளவையே அந்தப் பகுதிகளிலும் விதிப்பதால், ஏற்கெனவே யுத்தத்தாலும் பல்வேறு வரிச்சுமை களாலும் பாதிக்கப்பட்டிருக்கின்ற வடக்கு, கிழக்கு வாழ் மக்கள் மேலும் கூடுதலாகப் பாதிக்கப்படுகின்றார்கள். ஆகவே, தொலைபேசிக் கட்டணங்களுக்கு விதிக்கின்ற வரியின் அளவை அதிகரிக்கின்றபொழுது, வடக்கு, கிழக்குப் பகுதிகளில் வாழுகின்ற மக்களுடைய நிலைமையையும் கவனத்தில் எடுக்கவேண்டுமென்று கேட்டுக்கொள்ளுகின்றேன்.

அடுத்து, இந்த நாட்டில் யுத்தம் முடிவடைந்து இரண்டு வருடங்களாகியும் தலைமன்னாரில் வாழுகின்ற மீனவர்களுடைய பிரச்சினைகள் தீர்ந்தபாடில்லை. யுத்தம் நடைபெற்ற காலங்களில்கூட அங்குள்ள மீனவர்கள் எதுவித தடைகளுமின்றி மீன்பிடித் தொழிலில் ஈடுபட்டார்கள். ஆனால், இன்று யுத்தம் முடிவடைந்து இரண்டு ஆண்டுகள் பூர்த்தியடையவிருக்கும் இச்சூழலிலும் தலைமன்னாரிலுள்ள மீனவர்கள் மீன்பிடித் தொழிலில் ஈடுபடுவதற்கு அப்பிரதேசத்திலிருக்கின்ற இராணுவத் தினர், கடற்படையினர், பிரதேச செயலாளர், கிராம சேவையாளர் ஆகியோரினது அனுமதிகளைப் பெறவேண்டிய நிலை இருக்கின்றது. இதற்காக அவர்கள் ஒவ்வொருவரும் தமது மூன்று புகைப்படங்களை ஒப்படைக்கவேண்டும். அவ்வாறு அனுமதி பெற்ற பின்னரும் தினமும் ஒரு 'டோக்கன்'ஐப் பெற்ற பின்னரே கடலுக்குச் சென்று மீன்பிடித் தொழிலை மேற்கொள்ள முடியும் என்றதொரு நிலைமை அந்த மண்ணிலே இருக்கின்றது என்றால், வடக்கு, கிழக்குப் பகுதியிலே வாழுகின்ற தமிழ் மீனவர்கள் எவ்வாறான துன்ப துயரங்களுக்கு மத்தியிலே தங்களுடைய தொழிலை மேற்கொள்கின்றார்கள் என்பதை நீங்கள் உணர்ந்து கொள்ள வேண்டும். மேலும், நீர்கொழும்புப் பிரதேசங்களிலிருந்து செல்லுகின்ற பெரும்பான்மை சிங்கள மீனவர்கள் எந்தவிதத் தடைகளுமின்றி அப்பகுதியிலே மீன்பிடித் தொழிலில் ஈடுபடுவதற்கு அனுமதிக்கப்பட்டிருக்கின்றார்கள். அதைவிட குறிப்பாக, இந்திய மீனவர்கள் தலைமன்னார் கரை வரையும் வந்து மீன்பிடிக்கின்றார்கள்; அவர்களைத் தடுப்பதற்கு அங்கு யாரும் இல்லை. ஆனால், தலைமன்னார் கரையோரப் பிரதேசங்களிலே வாழுகின்ற தமிழ், முஸ்லிம் மீனவர்கள் சுதந்திரமாக மீன்பிடிப்பதற்கு தடைவிதிக்கப்பட்டிருக்கின்றது. ஆகவே, இவர்களுக்கு விதிக்கப்பட்டிருக்கின்ற தடைகளை நீக்கி, அவர்களும் அப்பிரதேசத்தில் சுதந்திரமாக கடற்றொழிலில் ஈடுபடுவதற்குரிய வசதிகளை ஏற்படுத்திக் கொடுக்கவேண்டுமென நான் இந்தச் சபையினூடாக மீண்டும் கோரிக்கை விடுக்கின்றேன். [இடையீடு] விளங்கவில்லை.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

இந்திய மீனவர்களுக்கு அந்தப் பிரதேசத்திலே மீன்பிடிப்ப தற்கு சகல சுதந்திரமும் இருக்கின்றது. அப்படியிருக்கையில், ஏன் எங்களுடைய மீனவர்களுக்கு அப்பிரதேசத்தில் மீன்பிடிக்க முடியாது?

ගරු එස්. ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)

அதுதான் ஐயா! அப்பிரதேசத்தில் எங்களுடைய மீனவர்கள் மீன்பிடித் தொழிலில் ஈடுபடவேண்டுமென்றால், இராணுவத்தினர், கடற்படையினர், பிரதேச செயலாளர் மற்றும் கிராம சேவையாளர் ஆகியோரிடம் 03 புகைப்படங்களைக் கொடுத்து, அனுமதிபெற்று, அவர்கள் சொல்கின்ற நேரம்தான் மீன்பிடிக்கச் செல்லலாம்.

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

இந்திய மீனவர்களுக்கு எதிராக உங்களுடைய பிரதேசங் களிலே வாழுகின்ற மீனவர்கள் போராட்டங்களை நடாத்தி வருவதும் உங்களுக்குத் தெரிந்திருக்கும்.

ගරු එස්. ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)

அவர்கள் போராட்டங்களை நடாத்துகின்றார்கள். அவ்வாறு நடைபெற்றபொழுதிலும்கூட, இந்திய மீனவர்கள் வந்து தலைமன்னாரில் சுதந்திரமாக மீன் பிடித்துச் செல்கின்றார்கள். எமது மீனவர்கள் அங்குபோய் அவர்களுக்கு எதிராக எதனையும் செய்யமுடியாத ஒரு சூழல்தான் இன்று அங்கு இருக்கின்றது. ஆகவே, இந்த இடங்களில் வாழுகின்ற தமிழ் மீனவர்கள் மீன்பிடித்தொழிலில் பாரிய பிரச்சினைகளைச் சந்தித்துவருகின் றார்கள் என்பதை நாம் கவனத்தில் கொள்ளவேண்டும்.

அதேநேரம், இன்னுமொரு மிக முக்கியமான விடயம். அதாவது, இரண்டு ஆண்டுகளுக்கு முதல் யாழ்ப்பாணத்தில் தொண்டர் ஆசிரியர்களாகக் கடமையாற்றியவர்களுக்கு ஆசிரிய உதவியாளர் நியமனம் வழங்கப்பட்டது. அந்த நியமனம் வழங்கப்பட்டு அவர்கள் இரண்டு ஆண்டுகளைப் பூர்த்தி செய்திருக் கின்றார்கள். ஆனால், இரண்டு ஆண்டுகள் முடிந்தும் அவர்கள் அந்த மூவாயிரம் ரூபாய் சம்பளத்தோடுதான் யாழ்ப்பாணத் தீவகத்தினுடைய பல பகுதிகளுக்கும் தங்களுடைய பணிக்காகச் சென்று வருகின்றார்கள். கிட்டத்தட்ட நாற்பது வயதுக்கு மேற்பட்டவர்கள்கூட அந்த ஆசிரிய உதவியாளர்களாக இருக்கின்றார்கள். ஆனால், அந்த ஆசிரிய உதவியாளர்கள் இதுவரைக்கும் எந்தவொரு பயிற்சித் திட்டத்துக்குள்ளும் உள்வாங்கப்படவில்லை. அவர்களுடைய ஓய்வூதியக் காலமோ அல்லது சேவைக் காலமோ பாதிக்கப்படக்கூடிய மிகப்பெரிய ஆபத்தினை அவர்கள் எதிர்நோக்கியிருப்பதை நாங்கள் அவதானிக்க முடிகின்றது. மிக முக்கியமாக பலாலி ஆசிரியர் பயிற்சிக் கலாசாலையை மீண்டும் இயக்குவதற்குரிய, ஆசிரிய மாணவர்களைச் சேர்ப்பதற்கான நடவடிக்கைகள் மேற்கொள்ளப் படுகின்ற இந்தச் சூழலில், கௌரவ கல்வி அமைச்சர் அவர்களும் இதைக் கவனத்திலெடுத்து அந்த ஆசிரியர் பயிற்சிக் கலா சாலைக்கு இந்த 400 க்கும் மேற்பட்ட ஆசிரியர்களை உள்வாங்குவதன்மூலம் ஆசிரியர் பயிற்சிக் கலாசாலையும் உயிர்வாழ்கின்ற அதேநேரத்தில் எங்களுடைய அந்த ஆசிரியர் களும் ஒரு நிரந்தர நியமனத்தை விரைவிலே பெற்றுக்கொள்வதற் கான சூழலொன்று அங்கு உருவாக்கப்படும். அதிலும் குறிப்பாக தகுதியான தொண்டர் ஆசிரியர்கள்தான் அங்கு இருக்கின்றார்கள். அவர்கள் க.பொ.த. உயர் தரத்திலே சித்தி பெற்றிருக்கின்றார்கள்

மற்றும் சாதாரண தரத்திலே அதற்குரிய தகுதிகளைப் பூர்த்தி செய்திருக்கின்றார்கள். ஆயினும், தமிழ் ஆசிரியர்கள் என்ற காரணத்தினாலோ என்னவோ, அவர்கள் ஆசிரிய உதவியாளர் களாக நியமனம் செய்யப்பட்டு நீண்ட காலமாக மூவாயிரம் ரூபாய் சம்பளத்துடனேயே தங்களுடைய வாழ்க்கையைப் போக்க வேண்டிய ஒரு சூழல் இருக்கின்றது. அதேநேரம், இவர்களுக்கு நியமனம் வழங்கப்பட்ட அதேகாலப் பகுதியில் - இரண்டு ஆண்டுகளுக்கு முதல் - கிளிநொச்சி, முல்லைத்தீவு மாவட்டங்களில் இருந்த தொண்டர் ஆசிரியர்களுக்கான நியமனங்கள் வழங்கப்பட வில்லை. அதாவது கிளிநொச்சி, முல்லைத்தீவு மாவட்டங்கள், வவுனியா வடக்கு, மன்னார் -மாந்தை மேற்கு ஆகிய பகுதிகளில் இருந்த தொண்டர் ஆசிரியர்களுக்கான நியமனங்கள் இதுவரை வழங்கப்படாமல் இழுத்தடிக்கப்படுகிறது. இது தொடர்பாக நாங்கள் பல தடவைகள் அமைச்சரோடு பேசியிருக்கின்றோம், இந்தச் சபையினூடாகவும் தெரிவித்திருக்கின்றோம். ஆனால் பாதிக்கப்பட்ட ஆசிரியர்களுக்கான நியமனங்கள் இதுவரை கிடைத்தபாடில்லை. ஆகவே, கடந்த யுத்த காலங்களில் பத்து ஆண்டுகளுக்கு மேலாகப் பணிபுரிந்த, தங்களை உருக்கி மிகவும் அர்ப்பணிப்புடன் வேலை செய்கின்ற அந்தத் தொண்டர் ஆசிரியர்களுக்கான நியமனங்கள் வழங்கப்பட்டு அவர்கள் இந்த மண்ணிலே தங்களுடைய பணிக்கான ஒரு வெகுமதியைப் பெற்றுக் கொள்கின்ற ஓர் சூழலை உருவாக்க வேண்டும். ஆகவே, இவர்களுக்கான நிரந்தர நியமனம் விரைவிலே கிடைப்பதற்கு ஆவன செய்யப்பட வேண்டும். அதேநேரம் அவர்கள் காலாகால மாக வன்னியிலே வேலை செய்த காரணத்தால்தான் பாதிக்கப்பட்டிருக்கின்றார்கள். இது சம்பந்தமாக நாங்கள் பல தடவைகள் இந்தச் சபையிலே தெரிவித்திருந்தும்கூட இந்தச் சபையினூடாக அதற்கான நல்ல காரியங்கள் இதுவரை மேற்கொள்ளப்படவில்லை. ஆகவே, இந்தச் சபை கூடிய கவனம் எடுத்து அவர்களுக்கான நிரந்தர நியமனங்களை வழங்குவதற்கான மிக அவசரமான முடிவை மேற்கொள்ள வேண்டும் என்று கேட்டு, இன்றைய நாளிலே இங்கு பேசுவதற்குச் சந்தர்ப்பம் தந்தமைக்கு நன்றி கூறி, எனது உரையை நிறைவு செய்கின்றேன்.

[අ. භා. 2.58]

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම පසු ගිය අය වැය යෝජනාවන් ගණනාවකට අදාළ වන පනත් කෙටුම්පත් විවාදයට ලක් කරන අවස්ථාවේ දී විශේෂයෙන්ම විදුලිසංදේශ බද්ද, ඒ වාගේම වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනතට සහ දේශීය ආදායම් පනතට අදාළ සංශෝධනයන් ගණනාවක් ඉදිරිපත් වෙලා තිබෙනවා. එහි මූලික කාරණා කිහිපයක් පිළිබඳව මේ ගරු සභාවේ අවධානයට ලක් කරන්න මම බලාපොරොත්තු වෙනවා.

ප්‍රධාන වශයෙන්ම විදුලිසංදේශන ගාස්තු හැටියට සියයට 20ක විදුලිසංදේශ බද්දක් පසු ගිය අය වැයෙන් යෝජනා කළා. අද මේ පනත් සංශෝධනය කෙරෙන්නේ විදුලිසංදේශ බදු සඳහා ඒ සියයට 20 අය කරන්නයි. මේ ගරු ඇමතිතුමන්ලා මේ කටයුත්ත කරන කොට දැනටමත් ගැටලු කිහිපයක් නිර්මාණය වෙලා තිබෙනවා. එකක් තමයි අපේ අවබෝධයේ හැටියට මේ බද්ද දැනට පනවලා ක්‍රියාත්මක වෙනවා. එහෙම නම් ගරු ඇමතිතුමා මෙම බදු සංශෝධනය පාර්ලිමේන්තුවට ගේන කොට ජනවාරි මාසයේ පළමුවැනි දින සිට ක්‍රියාත්මක වන මෙම බද්දෙන් මේ මාර්තු මාසයේ 24 වැනි දා වන කොට බැරි නම් අඩු ගණනේ පෙබරවාරි මාසය අවසන් වන තෙක්වත් දැනට මේ බද්ද ක්‍රියාත්මක වෙලා ලබා ගෙන තිබෙන ආදායම කොපමණද කියලා ඉදිරිපත් කළ යුතුව තිබුණා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මොකද මේ බදු පනත් කෙටුම්පතේ කියන ආකාරයට "යම් විදුලිසංදේශන සේවාවක් ග්‍රහණය කරන සෑම තැනැත්තෙකුගෙන්ම එක් එක් මාසය සම්බන්ධයෙන් ක්‍රියාකරු විසින් සපයන ලද විදුලිසංදේශන සේවා සැපයුමේ අගය මත ගණනය කරන ලද මුදලින් සියයට 20ක් වූ විදුලිසංදේශන බද්දක් නමින් වූ බදු වශයෙන් පනවා අය කරනු ලැබේ"ය කියලා තිබෙනවා. හැම මාසයක් අවසානයේම විදුලිසංදේශන සේවාවක් ලබා ගන්නා ලංකාවේ ජීවත් වන ඕනෑම ග්‍රාහකයෙකුගෙන්, ඕනෑම පුරවැසියෙකුගෙන් එම සියයට 20 අය කරනවා. මේක ආණ්ඩුවට ආදායම් බදු අය කරන ක්‍රමයක් හැටියට, වක්‍ර බද්දක් හැටියට, විදුලිසංදේශන ගාස්තුවක් හැටියට, විශේෂයෙන්ම ජංගම දුරකථන විශාල වශයෙන් දැන් සෑම කෙනෙක් අතේ තිබෙන නිසාම මේ බද්දෙන් අමතර වක්‍ර බද්දක් අය කර ගන්න මේක යොදා ගන්නා බව අපි දන්නවා. මේ බද්ද අය කර ගන්නේ විදුලිසංදේශන නියාමන කොමිසමයි. විදුලිසංදේශන නියාමන කොමිසම බද්ද ලැබීමෙන් දින 7ක් ඇතුළත ඒකාබද්ධ අරමුදලට එම මුදල් යවන්න ඕනෑ. අවසාන වශයෙන් ගත්තොත්, විදුලිසංදේශන නියාමන කොමිසම විසින් ජනතාවගෙන් එකතු කරන බදු ඒකාබද්ධ අරමුදලට, භාණ්ඩාගාරයට ලබා දෙන්න ඕනෑකම තිබෙනවා. එතකොට අද රටේ ජනගහනයෙන් දෙකෙන් පංගුවකට ආසන්න ප්‍රමාණයක් දුරකථන ක්‍රියාවලිය හරහා එම බද්දට යටත් වෙනවා. ඇත්තටම ඊට වඩා වැඩියි. ඒ විතරකුත් නොවෙයි, අපි දන්නවා ඉතිහාසයේ තිබුණේ වයර් එක පාවිච්චි කරලා භාවිත කරන දුරකථන. අද එහෙම නොවෙයි, දුරකථන පද්ධතිය හරහා, විදුලිසංදේශන සේවාව කියන පළල් ක්‍රියාවලිය හරහා සේවාවන් ගණනාවක් සැපයෙනවා. විදුලිසංදේශන සේවා ක්‍රියාවලිය තුළ තමයි දැන් අන්තර්ජාලයත් තිබෙන්නේ. අන්තර්ජාල පහසුකම් ලබා ගන්නා අයත් මේ බද්දට යටත් වෙනවාද, නැද්ද? ඒ වාගේම තමයි කේබල් රහිත වෙනත් දුරකථන විතරක් නොවෙයි, මේ වන කොට රූපවාහිනී නාලිකාත් තිබෙනවා. ඒ රූපවාහිනී නාලිකාවලටත් විදුලිසංදේශන සේවාව කියන පුළුල් අර්ථ කථනය තුළින් මේ බද්ද අදාළ වෙනවාද, නැද්ද? ඒ වාගේම ජංගම දුරකථන ක්‍රියාවලිය ඇතුළේ අද වන විට දුරකථන පාවිච්චි වෙන්නේ telephone call එකක් ගන්න විතරක් නොවෙයි. Telephone call එකට එහා ගිහිල්ලා SMS, e-mail, තවත් විශාල පහසුකම්, MMS ආදී වශයෙන් ජංගම දුරකථන ක්‍රියාවලිය ඇතුළේ විවිධ පහසුකම් සහිත සේවාවන් සපයනවා. ඒ සියලු සේවා පහසුකම් මේ විදුලිසංදේශන සේවාව කියන අර්ථ නිරූපණය ඇතුළේ ග්‍රහණය කරන ග්‍රාහකයා කියන පුද්ගලයාගෙන් මේ ආණ්ඩුව අය කරනවාද, නැද්ද කියලා පැහැදිලි වෙන්න ඕනෑ. ඒක නිසා මේ මුළු ක්‍රියාවලිය ගත්තොත්, අද අපේ රටේ ජනගහනයෙන් හතරෙන් තුනක පමණ අති බහුතර ජනතාවකට එම විදුලිසංදේශ බද්ද වක්‍ර බද්දක් හැටියට ඇඟට නොදැනී අය කර ගන්නා සියයට 20ක් හැටියට පනවා තිබෙනවා. නමුත් මේකේ ප්‍රායෝගික තත්ත්වය ගත්තොත් තමන්ගේ සේවාවන් පහසු කර ගන්න, තමන්ගේ කටයුතු පහසු කර ගන්න අද පාරිභෝගික ජනතාව, තරගකාරිව ජීවත් වන මිනිස්සු ජංගම දුරකථන පාවිච්චි කරනවා. හැබැයි ජංගම දුරකථන සම්බන්ධතාව ලබා ගත්තාට ඒ දුරකථනය නඩත්තු කර ගෙන යන්න බැහැ. මාසික බිල්පත් ගෙවන දුරකථනවලට වඩා අද හුඟ දෙනෙක් අතර තිබෙන්නේ reload දුරකථන. ඒවා රුපියල් පණහක, සියයක, දෙසියයක, තුන්සියයක reload දාගෙන කථා කරන මට්ටමේයි තිබෙන්නේ. පසු ගිය දවස්වල මම දැක්කා දුරකථන සේවා සපයන ආයතනයකින් reload ණය දෙන්න ගෙන යන ප්‍රචාරක වැඩ පිළිවෙළක්. එහිදී දැන්වීම දමන්නේ reload එක ගන්න සල්ලි නැත්නම් reload ණයක් දෙනවා කියායි. මොකද, ඒ ක්‍රියාවලිය පවත්වාගෙන යන්න. ඒ අය reload ණය දීලා පවා ඒ ක්‍රියාවලිය පවත්වාගෙන යන මට්ටමට ඇවිල්ලා තිබෙනවා. දැන් ජනතාවට reload දා ගන්නත් බැහැ. ඒ වෙනුවට reload ණය ගන්නා තැනට ඇවිල්ලා තිබෙනවා. එතකොට මේ reload ණය අරගෙන ජීවත් වන පාරිභෝගිකයාට, ජනතාවට තමන්ගේ මාසයේ බිලට මේ සියයට 20ත් එකතු වුණාට පස්සේ ඒක බරපතළයි කියන එකයි අපි කියන්නේ. විශේෂයෙන් පිළිතුරු කථාවන් කරන ගරු ඇමතිතුමන්ලාගෙන් මේ පිළිබඳව පැහැදිලි කර ගන්න අවශ්‍යයි.

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

එතුමන්ලා එය පැහැදිලි කරනවා නම් හොඳයි. මේ බද්ද ක්‍රියාත්මක කළේ පසු ගිය ජනවාරි මාසයේ පළමුවැනි දා ඉඳලා. මේ බද්ද ක්‍රියාත්මක කරලා මේ වන කොට ලබා ගෙන තිබෙන ආදායම් ප්‍රමාණය කොපමණද? ඒ ආදායම ඒකාබද්ධ අරමුදලට ගිහිල්ලාද? ඒකාබද්ධ අරමුදලට ගිහිල්ලා නම් ඒකාබද්ධ අරමුදලෙන් ඒක යොදා ගෙන තිබෙන්නේ මොන ක්‍රියාවලියක් ඇතුළේද කියලා පැහැදිලි කර ගන්න අවශ්‍යයි. ඒ වාගේම මේ බද්ද විදුලි සංදේශ සේවාව කියන පළල් ක්‍රියාවලිය ඇතුළේ කොයි ප්‍රමාණයකටද යොදා ගන්නේ කියන එක පැහැදිලි කර ගන්න අවශ්‍යයි. මේ සියයට 20 reload එකටත් අයිතිද, අන්තර්ජාලයටත් අයිතිද, පියෝ ටීවී එකටත් අයිතිද, එහෙම නැත්නම් ජංගම දුරකථනයක් පාවිච්චි කරන කෙනකු ලබා ගන්නා සියලුම සේවාවන්වලට අයිතිද, මාසික බිලට පමණක්ද අයිති කියන මෙන්න මේ ගැටලු ටික ප්‍රායෝගික ගැටලු හැටියට නිර්මාණය වෙලා තිබෙනවා; මතු වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊ ළඟට දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් අපි සාකච්ඡාවට සූදානම් වෙලා ඉන්න වෙලාවේ කාරක සභා අවස්ථාවේ සංශෝධන සඳහන් පිටු 18ක විතර ප්‍රමාණයක් ලැබුණා. ඒ නිසා මේ සියල්ල සම්බන්ධයෙන් විස්තර කිරීම ප්‍රායෝගිකව සංකීර්ණ වෙනවා. මේකට නිවැරදි අදහස් දැක්වීමක් කර ගන්න බැහැ. නමුත් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා ඔබතුමාගේ අවධානයට යොමු කරනවා 31 වැනි වගන්තිය. ඒ වගන්තියෙන් කරන්නේ රාජ්‍ය සේවයේ සේවා නියුක්තිකයින් ද උපයන විට ගෙවීමේ ක්‍රමයට ඇතුළත් වන ආකාරයට විධිවිධාන සකස් කර ගන්නා එකයි. ඒ කියන්නේ PAYE Tax එකට ඇතුළත් කර ගැනීම. මේක අය වැයේදීත් අපි සාකච්ඡා කළා. රජයේ සේවකයාගේ ආදායම තමයි වැටුප. ඒ වැටුප ගෙවන්නේ මහා භාණ්ඩාගාරයෙන්; ඒකාබද්ධ අරමුලෙන්. ඒකාබද්ධ අරමුදලෙන් ගෙවන මුදල් කියන්නේ ජනතාවගෙන්ම එකතු කරපු බදු මුදල්; අර මා කලින් කියාපු ආකාරයට විදුලි සංදේශ බද්දෙන්, වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බද්දෙන් ආදී වශයෙන් විවිධ බදුවලින් එකතු කරපු මුදල්. එතකොට මහා භාණ්ඩාගාරයෙන් එකතු කරපු බදු මුදල් රජයේ සේවකයාට ගෙවලා නැවත රජයේ සේවකයාගෙන්ම උපයන විට ගෙවීමේ බද්දක් හැටියට අය කර ගන්නවා නම් ඒක හරි විහිළුවක්. බද්ද බදු ගහලා අය කර ගැනීමක් මේ කරන්නේ. රජයේ සේවකයාගේ වැටුප කියලා කියන්නේ බද්ද තමයි. ඒ බද්ද රජයේ සේවකයාට ගෙවලා නැවත අය කර ගැනීමක් මේ කරන්නේ. මීට පෙර රුපියල් 2,500ක් වැඩි වෙනවා කියලා රැවැට්ටුවා. දැන් මේ පාර රුපියල් පන්සිය අසූගණනක් වැඩි වෙනවා කිව්වා. අතුරු දීමනාවක් ලැබෙනවා කිව්වා. මේ මොන ක්‍රමයකින් හෝ රජයේ සේවකයාට මාසය අන්තිමට ලැබෙන පඩි පතින්, වැටුප් වැඩි වෙලා හෝ නැතිව හෝ ලැබෙන පඩි පතින් නැවත PAYE Tax එකට අය කර ගැනීමක් මේ කරන්නේ. උපයන විට ගෙවීමට යටත් කරනවා කියන්නේ මොකක්ද? ගෙවාපු මුදල ඉල්ලා ගන්නවා කියන එකයි; දකුණු අතට දීලා වම් අතින් ගන්නවා කියන එකයි. රජයේ සේවකයාගේ දකුණු අතට දීලා වම් අතින් අරගෙන වැඩක් නැහැ. මහා භාණ්ඩාගාරයේ තිබෙන සල්ලි පරිපාලන කටයුතු අමාත්‍යාංශය හරහා රජයේ සේවකයාට එවලා නැවත අය කර ගන්නවා. ඉතින් එහෙනම් මොකටද ගෙව්වේ? එහෙනම් මහා භාණ්ඩාගාරයෙන් නොගෙවාම තියා ගන්න තිබුණා නේ. මේ 31 වන වගන්තිය සංශෝධනය කරලා PAYE Tax එකට රජයේ සේවකයාත් යටත් කර ගත්තාය කියන්නේ රජයේ සේවකයාට මහා භාණ්ඩාගාරයෙන්ම ගෙවන මුදල් නැවත අය කර ගන්න යොදා ගන්න එකයි. අපි දන්නවා ඒක ඊට වඩා සංකීර්ණ ක්‍රියාවලියක් ඇතුළේ සිද්ධ වන බව. රජයේ සේවකයාට පඩි ගෙව්වාට පස්සේ රජයේ සේවකයා ඒ මුදල් අරගෙන ගිහිල්ලා ජංගම දුරකථන බිල ගෙව්වාම අන්න ඒ ගහන විදුලි සංදේශ බද්ද සියයට 20න් අල්ලා ගන්නවා. එහෙම නැත්නම් වක්‍ර බදුවලින් අල්ලා ගන්නවා. වැට් එකෙන් අල්ලා ගන්නවා. රජයේ සේවකයා පාරිභෝගිකයෙක් වන විට, පාරිභෝගිකයකු හැටියට පාරිභෝජනය කරන කොට බද්ද අය කර ගැනීම වෙනම එකක්. හැබැයි රජයේ සේවකයාට බද්දක් ගහලා -රජයෙන් ගෙවන වැටුපටම බද්දක් ගහලා- PAYE Tax එක හැටියට අය කර ගැනීම අන්තිම අසාධාරණයි. ඒකෙන් කරන්නේ වෙන මොකක්වත් නොවෙයි, ඇස් දෙක බැඳලා දකුණු අතට දෙන දේ වම් අතෙන් ගන්නවා වාගේ වැඩක්. ඒ කටයුත්තත් මේ ක්‍රියාවලිය ඇතුළත සිද්ධ වනවා. මේ පිළිබඳව අප අය වැය විවාදයේදීත් කරුණු දැක්වූවා. විපක්ෂය හැටියට අපි කරුණු කියන එකෙන් වැඩක් වන්නේ නැහැ. ඔබතුමන්ලා තුනෙන් දෙක තියෙනවා කියයි; බලය තිබෙන නිසා මේක සම්මත කර ගන්නවා. නමුත් සම්මත කර ගත්තත් ඇත්ත කියන්න ඕනෑ. [බාධා කිරීමක්] තුනෙන් දෙක හරි. තුනෙන් තුනම තිබුණත්, කීයක් තිබුණත් හිටපු අස්වර් ඇමතිතුමනි, මේක ඇත්ත නේ. රජයේ සේවකයාට වැටුප් ගෙවන්නේ මහා භාණ්ඩාගාරයේ බදු මුදල්වලින්. ඒක නැවතත් PAYE Tax එක හැටියට අය කර ගත්තොත් මොකද වන්නේ? මේක පෞද්ගලික අංශයට සාධාරණ වන්න පුළුවන්. අපි කියන්නේ ඒක පෞද්ගලික ආදායමක්. ඒක පෞද්ගලික අංශයෙන් ලබන දෙයක්. ඒකෙන් රජය ආදායමක් උපයා ගන්නා එකයි, මහා භාණ්ඩාගාරයෙන්ම දෙන දේ නැවත රජයේ සේවකයාගෙන් උදුරා ගන්නා එකයි දෙකක්. කොහොමත් මේ ආණ්ඩුව රජයේ සේවකයන් රවට්ටපු ආණ්ඩුවක්. රජයේ සේවකයන් රවට්ටලා ඒ අයට පඩි වැඩි කරනවාය කියා, රුපියල් 2,500ක් දෙනවාය කියා විවිධ කථා කියලා, දැන් රජයේ සේවකයාත් උපයන විට ගෙවීමේ බද්දට - PAYE Tax එකට - අදාළ කරලා දැන් ඔබතුමන්ලා ආදායම් බදු සංශෝධනය ගෙනෙනවා. අපේ රටේ රජයේ සේවකයෝ තැපැල් ඡන්දයෙනුත් අනුමත කර තිබෙන්නේ, ජයග්‍රහණය කරවා තිබෙන්නේ, දිනවලා තිබෙන්නේ මේවා කරන්න තමයි කියා කියන්න පුළුවන්. ඒක හරි. එහෙම උජාරු කථාවක් කියන්න පුළුවන්. [බාධා කිරීමක්]

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ඒක රටේ යථාර්ථයක් වුණා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඒක කියන්න පුළුවන්. නමුත් -

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
වැඩේ වෙලා තිබෙන්නේ ඔය ගොල්ලන්ව තෝරා ගන්නේ නැහැ.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මේවා තේරුම් ගන්න කොට රජයේ සේවකයා ප්‍රමාද වැඩියි. ඔබතුමන්ලාට බලය තිබෙනවා. ඔබතුමන්ලාට බලය දීලා තිබෙනවා. රජයේ සේවකයාත් දීලා තිබෙනවා. තැපැල් ඡන්දයෙනුත් දීලා තිබෙනවා. එහෙම කියන්න පුළුවන්. එහෙම කියලා රවට්ටපු ජනතාව මේවා තේරුම් ගන්නා දවසට, පාරා වළල්ලක් බවට පත් වන විට දිරවා ගන්න ටිකක් අමාරු වනවා.

ඊ ළඟට මම කියන්න උත්සාහ කරන්නේ වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනත් කෙටුම්පත ගැනයි. වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බද්දත් ඒ වාගේම තමයි. වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනත් කෙටුම්පතේ 3 (1) උප වගන්තියේ සඳහන් වන්නේ මෙසේයි:

"..යම් භාණ්ඩයක පිරිවැය, රක්ෂණය සහ නැව් ගාස්තු සම්බන්ධයෙන් පනවා අය කර ගනු ලැබිය යුතු බද්ද 2011 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භවන කාලසීමාව සඳහා සියයට 5.0ක අනුප්‍රමාණයක වූ බද්දක් ලෙස ගණනය කළ යුතු ය."

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජනවාරි 01 වන දා ඉඳලා ශ්‍රී ලංකාව කියන කොදෙව්ව ඇතුළට, නැව් එන වරායකට - ලංකාවේ තියෙන වරායකට, ඒ කියන්නේ කොළඹ වරාය, ත්‍රිකුණාමල වරාය, ගාල්ල වරාය වෙන්න පුළුවන්. හම්බන්තොට තවම නැහැ නේ. ඒක නැව් නො එන වරායක්.- භාණ්ඩයක් ගෙනාවොත් ඒ ගෙනෙන භාණ්ඩය මොකක් වුණත් ඒ භාණ්ඩයේ පිරිවැයට රක්ෂණ ගාස්තුව, නැව් ගාස්තුව එකතු කරනවා. එකතු කරලා එන අගයට සියයට 5ක වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බද්ද ගහනවා. කල්පනා කර බලන්න. ඒ බද්ද කිරි පිටි පැකට් එකටත් වදිනවා. ඒ බද්ද පිට රටකින් ගෙනෙන ඕනෑම භාණ්ඩයකට වදිනවා, වර්ගීකරණයකින් තොරව. ඔබතුමන්ලා මේ පනතින් සහනයක් සපයා තිබෙන්නේ මොනවාටද? ප්‍රති අපනයනය කිරීමේ කාර්යයට අනුව ගන්නවා නම්, එහෙම නැත්නම් අපනයනය කිරීම සඳහා භාණ්ඩ නිෂ්පාදනය කිරීම සම්බන්ධයෙන් ගෙන්වනවා නම් යම් සහනයක් තිබෙනවා.

හැබැයි ඊට අමතරව අපේ තෙල් මිල ඉහළ යනවාය කියනවා. බලශක්ති ඇමතිතුමා කියනවා, "නැහැ, අපි තෙල් මිල වැඩි කරන්නේ නැහැ"ය කියා. නමුත් තෙල් මිල වැඩි වන එක ක්‍රමයක් තමයි මේක. ඛනිජ තෙල් කියන්නේ භාණ්ඩ නිෂ්පාදනයට යොදවා ගෙන අපනයනය කරන භාණ්ඩයක් නොවෙයි නේ. මෙහෙ යොදවා ගෙන ප්‍රති අපනයනය කරන භාණ්ඩයක් නොවෙයි ඛනිජ තෙල්. ලෝක වෙළෙඳ පොළේ ඛනිජ තෙල් මිල වැඩි වන්නත් කලින් ලෝක වෙළෙඳ පොළේ මිල බැස්සත් වරායෙන් එන කොට වරායෙන් එන මිලට මේ සියයට 5ක බද්ද ගහනවා. අපි අහන්නේ මෙයයි. ඔබතුමන්ලා මෙය පැහැදිලි කළා නම් සාධාරණයි. බලය තිබෙන නිසා ඕනෑ නම් පැහැදිලි නොකර ඉන්නත් පුළුවන්. තුනෙන් දෙකක් තිබෙන නිසා පැහැදිලි නොකර ඉන්නත් පුළුවන්. හැබැයි පැහැදිලි කළා නම් සාධාරණයි. මේක ජනවාරි මාසයේ 01 වන දා ඉඳලා ගහන බද්දක් නිසා මාර්තු මාසයේ 25 වන දා වන විට, වරායෙන් සහ ගුවන් තොටුපලෙන් -වරාය විතරක් නොවෙයි, ගුවන් තොටුපලත් අදාළයි.- එන සෑම භාණ්ඩයකටම ගහපු බද්දෙන් කොපමණ ආදායමක් ලබලා තිබෙනවාද? ඒ ආදායම යොදවා ගෙන තිබෙන්නේ මොකටද? ඒ ආදායම යොදවා ගෙන තිබෙන්නේ මොන සංසිද්ධියටද? මොන සාධාරණ හේතුවකටද? මොන ක්‍රියාවලියකටද? කර දියවර මංගල්‍යය වාගේ සංදර්ශන වැඩකටද? එවැනි උත්සව අවස්ථාවකට විතරක් යොදවා ගත් එකක්ද? එහෙම නැත්නම් වරාය සංවර්ධනයකට හෝ ගුවන් තොටුපොළ සංවර්ධනයකට හෝ වෙනත් මොන ක්‍රියාවලියකට හෝ යොදා ගෙන තිබෙනවා ද කියලා දැන ගන්න කැමැතියි. ඒ ගැන රටේ ජනතාවට කියනවා නම් හොඳයි.

ඊ ළඟට ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තවත් වැදගත් දෙයක් තිබෙනවා. අපි මේ පාර්ලිමේන්තු සතියේම කරන දේ තමයි අය වැයෙන් යෝජනා කරපු, අය වැයෙන් සම්මත කරපු රජයේ ආදායම එකතු කර ගන්නා වූ බදු ආදායම්වලට පනත් සෑදීම, පනත් සංශෝධනය කිරීම. හැබැයි අපේ රටේ ජනතාවත් අමතක කරලා තිබෙනවා, අපිත් අමතක කරලා තිබෙනවා, රටේ ජනතාවට සහන දෙන්න, රටේ ජනතාවට පහසුකම් සපයන්න අය වැයෙන් දෙනවාය කියපු ඒවා. දැන් අය වැයෙන් දෙනවාය කියපු ඒවාට මොකද වෙලා තිබෙන්නේ? මම සරල උදාහරණයක් කියන්නම්. ගරු ජනාධිපතිතුමා මුදල් ඇමතිවරයා හැටියට මේ පාර්ලිමේන්තුවට කිව්වා, සෑම රණ විරු පවුලකටම උපදින තුන්වැනි දරුවා වෙනුවෙන් රුපියල් ලක්ෂයක ආධාරයක් දෙනවා කියලා. එතකොට දැන් මේ ගුවන් තොටුපල සංවර්ධන බද්ද හරි කමක් නැහැ, විදුලිසංදේශ බද්ද හරි ඒකාබද්ධ අරමුදලට ගිහිල්ලා හරි කමක් නැහැ මේ රණ විරු පවුල්වල උපදින තුන්වැනි ළමයාට රුපියල් ලක්ෂයක් දෙන්න ඕනෑ නේ. දැන් නොවැම්බර් මාසයේ ඉදිරිපත් කරපු අය වැයෙන් පස්සේ ජනවාරි මාසයේ පළමුවැනි දා ඉඳලා ලංකාවේ රණ විරු පවුල්වල තුන්වැනි ළමයින් කී දෙනෙක් ඉපදිලා ඉන්නවාද? තුන්වැනි ළමයින් කී දෙනෙකුට මේ ආධාරය ගෙවා තිබෙනවාද? අය වැය යෝජනා අනුව අද අපි බදු ගහනවා. සියයට 20ක බද්දක් ගහනවා, විදුලිසංදේශ බද්ද ලෙස. සියයට 5ක බද්දක් ගහනවා වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බද්ද ලෙස. රණ විරුවන්ගේ තුන්වැනි ළමයින් කී දෙනෙකු ඉපදිලා ඉන්නවාද, එයින් කී දෙනෙකුට රුපියල් ලක්ෂය ගණනේ ගෙවා තිබෙනවාද? පොඩි ප්‍රදර්ශනයක් කරන්න කෝ. ළමයි ටික ගෙනැල්ලා, රණ විරුවෝ ටික ගෙනැල්ලා, පෝලිමට තබලා, ළමයින් වඩා ගෙන එන රණ විරු අම්මලාට රුපියල් ලක්ෂය ගණනේ දුන්නා නම් කොච්චර අගෙයිද? දැන් මාර්තු මාසයත් ඇවිල්ලා. මාස 10ක් ගෙවලා ළමයි හම්බ වන කාලයේ නේ මේ යෝජනාව ගෙනාවේ. ඒ කාලයේ අත්පුඩි ගහලා සම්මත කළාට එක රණ විරුවකුගේ ළමයෙකුටවත් එහෙම දුන්නා කියන ප්‍රවෘත්තියක් නම් අපි අහලා නැහැ. ඒ වෙනුවෙන් මුදල් වෙන් කරලා තිබෙනවාද, ඒ වෙනුවෙන් ප්‍රතිපාදන තිබෙනවාද, ඒ ආධාරය දීපු ළමයින් කී දෙනෙක් ඉන්නවාද කියලා කියන්නේ නැහැ. එතකොට අපි අය වැයෙන් සම්මත කරපු බදු ගහන ඒවා, මිල වැඩි කරන ඒවා, බර පටවන ඒවා වෙනුවෙන් පාර්ලිමේන්තුවට හදිසියේ යෝජනා ගෙනැල්ලා, සතියට 10, 15 ගෙනැල්ලා, බදු වර්ග 5ක් 6ක් එකට සම්මත කරනවා. හැබැයි ජනතාවට දෙන දෙයක් නම් කථා කරන්නේ නැහැ. දෙන දෙයක් නම් කියන්නේ නැහැ. දෙනවාය කියලා පොරොන්දු වුණු දේවල්, අය වැයෙන් පසු දින ආණ්ඩුවේ රූපවාහිනියේ, අයිටීඑන් එකේ "විමසුම" වැඩසටහනේ, ප්‍රවෘත්තිවල, "දිනමිණ" පත්තරයේ පොල් ගෙඩි අකුරෙන් දමපු සහන, ජනතාවට දෙනවාය කියපු සහන, රණ විරු සෑම පවුලකම උපදින තුන්වැනි ළමයාට දෙනවාය කියපු රුපියල් ලක්ෂය කෝ දැන්? දීපු එක ලක්ෂයක් කියන්න. දීපු කෙනෙකුගේ එක ලිපිනයක් -address එකක්- කියන්න කෝ. එහෙම කියපු එකක්වත් නැහැ. අපි හැම දාම කරන්නේ ජනතාවගේ බඩට ගහන, ජනතාවට දැනෙන, රජයේ සේවකයා උපයන විට ගෙවීමේ බද්දට යටත් කරන, සෑම පාරිභෝගිකයාටම දුරකථන බිල ගහන, සෑම ගුවන් තොටුපොළකින්ම එන, වරායකින්ම එන භාණ්ඩයකටම සියයට 5ක් බදු ගහන වැඩේට නම් ඉක්මනට පනත් කෙටුම්පත් හදලා මාර්තු මාසයේ 31 වැනි දාට කලින් පාර්ලිමේන්තුවේ සම්මත කරන එකයි. මේ කරන්නේ ඒක නේ. මුදල් වර්ෂය අවසන් වන මාර්තු මාසයේ 31 වැනි දාට කලින් සම්මත කරනවා. හැබැයි ජනතාවට ලැබිය යුතු දේවල් ගැන, අය වැයෙන් පොරොන්දු වුණු රණ විරු පවුල්වල උපදින තුන්වැනි ළමයාට දෙනවාය කිව්ව රුපියල් ලක්ෂය ගැන කථා කරන්නේ නැහැ. ඉතින් ඒක නිසා ඉතාම පැහැදිලියි මේ ආණ්ඩුව ජනතාව මත බර පටවනවා කියලා.

මේවා ඡන්ද වේදිකාවේ ගිහිල්ලා කියන්නේ නැහැ. ඡන්ද වේදිකාවට ගිහිල්ලා කියන්නේ නැහැ රජයේ සේවකයා උපයන විට ගෙවීමේ බද්දට යටත් කරනවා කියලා. ජංගම දුරකථනය අතේ තබා ගෙන reload එකක් ණයට දමා ගන්න බලා ගෙන ඉන්න කොල්ලට, කෙල්ලට කියන්නේ නැහැ සියයට 20ක් බදු ගහනවා කියලා. රජයේ සේවකයා රවටලා ඡන්දය අරගෙන බදු පනවන එක තමයි කරන්නේ. ඒ බදු පැනවීමේ ක්‍රියාවලිය තමයි මේ කරන්නේ. අය වැයෙන් මේවා සම්මත කර ගෙන ඉවරයි. ඒක අද පාර්ලිමේන්තුවේ නීතිය බවට පත් කර ගන්න තමුන්නාන්සේලාට තුනෙන් දෙකක බලය තිබෙනවා. රටේ ජනතාවට මුකුත් නැහැ. රටේ ජනතාවට මුකුත් නැතුව තමුන්නාන්සේලාට තිබෙන තුනෙන් දෙකේ බලයෙන් මේවා සම්මත කර ගත්තත් රටේ ජනතාවට මේක පීඩාවක් හැටියට, බරක් හැටියට තිබෙන නිසා අපි විපක්ෂය හැටියට අපේ විරෝධතාව මේ වෙනුවෙන් ප්‍රකාශයට පත් කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

[අ. භා. 3.17]

ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා
(மாண்புமிகு மொஹான் பிரியதர்ஷன த சில்வா)
(The Hon. Mohan Priyadarshana De Silva)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2005 අවුරුද්දේ අතිගරු ජනාධිපතිතුමා වැඩි ඡන්ද 1,80,000කින් මේ රටේ ජනාධිපතිවරයා බවට පත් වුණු අවස්ථාවේදී මේ රටේ මිනිසුන් එතුමාගෙන් ඉල්ලුවේ කාලාන්තරයක් තිස්සේ අපේ රටට සාපයක් වෙලා තිබුණු යුද්ධය අවසාන කරන්නය කියලායි. එතුමා අපේ රටේ ජනතාව ඉල්ලපු දේ ඒ ජනතාවට දුන්නා. ඊට පස්සේ 2010 අවුරුද්දේ පැවැති ජනාධිපතිවරණයේදී විපක්ෂය මොන කථා කිව්වත් මේ රටේ බුද්ධිමත් ජනතාව වැඩි ඡන්ද 18,00,000කින් අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ රටේ ජනාධිපති ධුරයට දෙවැනි වතාවටත් පත් කළේ යුද්ධයෙන් පස්සේ අපේ රට ශීඝ්‍ර සංවර්ධනයක් කරා ගෙන යන්නයි. එතුමා සැබෑ නායකයකු හැටියට අද මේ රට ශීඝ්‍ර සංවර්ධනයක් කරා ගෙන යන්නට අවශ්‍ය සියලුම අඩි තාලම් දාලා තිබෙනවාය කියන කාරණය අප කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා මට පෙර මේ ගරු සභාවේ කථා කරපු ආකාරයටම හැම මැතිවරණයකදීම මේ කථා කිව්වා. අපි දැක්කා පසු ගිය සතියේ අවසන් වුණු පළාත් පාලන මැතිවරණයේදීත් මේ උදවිය ගම්වලට ගිහිල්ලා මේ කතන්දර කිව්වා. නමුත් අපේ රටේ ජනතාව මේ විපක්ෂයේ බංකොලොත් දේශපාලන පක්ෂ කියන කථා එකක්වත් පිළිගත්තේ නැහැ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ජනතාව ඉතාම විශිෂ්ට ජයග්‍රහණයක් එක්සත් ජනතා නිදහස් සන්ධානයට ලබා දීලා ඔප්පු කළා, තවමත් අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා ප්‍රමුඛ එක්සත් ජනතා නිදහස් සන්ධාන ආණ්ඩුව කෙරෙහි මහත් විශ්වාසයක් තිබෙනවාය කියන එක. මේ රට ශීඝ්‍ර සංවර්ධනයක් කරා ගෙන යන්න අද මේ රටේ ජනතාව පක්ෂ විපක්ෂ භේදයක් නැතිව අතිගරු ජනාධිපතිතුමා වටා එකතු වෙලා ඉන්නවා.

මේ රට සංවර්ධනය කරා ගෙන යන කොට අපේ රටට බලපාපු බරපතළම ප්‍රශ්නයක් තමයි අපේ රටේ තිබෙන බදු ක්‍රමය. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අප කවුරුත් දන්නා කාරණයක් තමයි මේ වන කොට අපේ රටේ බදු 62කට ආසන්න ප්‍රමාණයක් තිබෙනවාය කියන එක. ඒ බදු 62න් සියයට 60ක් විතර තිබෙන්නේ වක්‍ර බදු. වක්‍ර බදු බහුතරයක් තිබීමෙන් මේ රටේ සාමාන්‍ය ජනතාවට බරපතළ පීඩාවක් ඇති වනවාය කියන කාරණය අතිගරු ජනාධිපතිතුමා මුල ඉඳලාම දැක්කා. ඒ නිසා තමයි එතුමා 2009 අවුරුද්දේ මහාචාර්ය ඩබ්ලිව්.ඩී. ලක්ෂ්මන් මහත්මයාගේ ප්‍රධානත්වයෙන් බදු කොමිසමක් පිහිටුවලා යම් යම් නිර්දේශයන් ලබා ගත්තේ. අද ඒ සියලු කාරණා පදනම් කර ගෙන සරල සහ පැහැදිලි බදු ප්‍රතිපත්තියක් අපේ රටේ ඇති කරන්න අවශ්‍ය කටයුතු යොදා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "මහින්ද චින්තන ඉදිරි දැක්ම" තුළ සඳහන් කරපු කාරණයක් ඔබතුමාගේ අවධානයට යොමු කරන්න මා කැමැතියි. "මහින්ද චින්තන ඉදිරි දැක්ම" තුළ පැහැදිලිව මෙසේ සඳහන් කර තිබෙනවා:

> "අප රටේ බදු ගෙවන්නන් මුහුණ පා සිටින ප්‍රශ්න සහ සංකීර්ණතාවන් හඳුනාගෙන ඒවා නිරාකරණය කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් ඉතා ඉක්මණින් ක්‍රියාත්මක කරමි. ඒ අනුව පවතින බදු ක්‍රමය සරල කර පුද්ගල ආදායම් බදු අනුපාතය මෙන්ම වැට් බදු හා නිෂ්පාදන බදු අනුපාතයන් ද මෙම වසරේ අයවැයේ සිට පහත දැමීමට කටයුතු කරමි."

එතුමා "මහින්ද චින්තන ඉදිරි දැක්ම" තුළ සඳහන් කරපු ආකාරයට ඒ අදහස් අය වැයේදී ඉදිරිපත් කළා. ඒ අය වැය යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා තමයි මේ පනත් කෙටුම්පත් අද මේ ගරු සභාවට ඉදිරිපත් කරන්නේ. ඒ අනුව අද මේ ගරු සභාවට ඉදිරිපත් කරලා තිබෙනවා වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බදු පනත් කෙටුම්පත, ඒ වාගේම බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත, සුරාබදු (සංශෝධන) පනත් කෙටුම්පත, විදුලිසංදේශ බදු පනත් කෙටුම්පත, දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත, බදු අභියාචනා කොමිසම පනත් කෙටුම්පත.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා තවත් කාරණයක් මේ ගරු සභාවේ අවධානයට යොමු කරන්න කැමැතියි. මීට පෙරාතුව අපි දැක්කා රජයේ දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව, ඒ වාගේම පළාත් සභාවල පළාත් ආදායම් දෙපාර්තමේන්තුව සමහර අවස්ථාවලදී බොහොම අත්තනෝමතික ආකාරයට කටයුතු කළ හැටි. බදු ගෙවන්නා තමන්ගේ හතුරකු ආකාරයට සලකපු සමහර අවස්ථා තිබෙනවා. පිට රටවල මිනිසුන් බදු ගෙවීම කීර්තියක් හැටියට සැලකුවත් අපේ රටේ එතැනින් එහා ගිය කාරණයක් තමයි තිබෙන්නේ. අපි දන්නවා සමහර අවස්ථාවලදී පළාත් සභාවේ පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරින් ගිහිල්ලා බලෙන් මිනිසුන්ගෙන් බදු ගැනීමේ කටයුතුවල නියැලුණු ආකාරය. ඉතින් මම හිතනවා මේ බදු අභියාචනා කොමිසම පනත් කෙටුම්පත මේ ගරු සභාවෙන් අද අනුමත කළාට පස්සේ ඒ සියලුම ප්‍රශ්නවලට විසඳුමක් ලැබෙනවාය කියා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද මේ රටේ ජනතාවට විශ්වාසයකින් යුක්තව තමන්ගේ බදු ප්‍රශ්න විසඳා ගැනීමේ කටයුත්ත අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් ඉෂ්ට වෙලා තිබෙනවාය කියන කාරණය මා කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම මා තවත් කාරණයක් ඔබතුමාගේ අවධානයට යොමු කරන්න කැමැතියි. සුරාබදු (සංශෝධන) පනත් කෙටුම්පත ගැන මේ ගරු සභාවේ කථා කළා. සුරාබදු (සංශෝධන) පනත් කෙටුම්පතේ මූලිකම අදහස වෙලා තිබෙන්නේ, (52 වන අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 15 වන වගන්තියේ (ආ) සහ (ඇ) ඡේද ඉවත් කරලා ඒ වෙනුවට අලුත් ඡේද ඇතුළත් කිරීමයි. "රා නිපදවන කිසිම ගසක් තැළීම නොකළ යුතුය." සහ "කිසිම ගසකින් රා නිස්සාරණය කිරීම නොකළ යුතුය" යන ඡේද දෙක වෙනුවට ආදේශ කරලා තිබෙනවා, "කිතුල් ගස් සහ තල් ගස් හැර, රා නිපදවන වෙනත් ගසක් තැළීම නොකළ යුතු ය" සහ "කිතුල් ගස් සහ තල් ගස් හැර, වෙනත් ගස් කිසිවකින් රා නිස්සාරණය කිරීම නොකළ යුතු ය." යන ඡේද දෙක. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කිතුල් ගස් මදින්නත්, තල් ගස් මදින්නත් බලපත්‍ර ගැනීම අවශ්‍ය නැහැ කියන කාරණය තමයි මේ ගරු සභාව මේ සංශෝධන පනත් කෙටුම්පත මඟින් අද නීත්‍යානුකූල කරන්න යන්නේ කියන එක ඔබතුමා පැහැදිලිවම දන්නවා.

පසු ගිය යුද්ධ කාලයේ උතුරු ප්‍රදේශයේ තල් ගස් මිලියන 4.5ක් විනාශ වුණ බව ඔබතුමා දන්නවා. උතුරේ සහ නැගෙනහිර ජනතාව තමන්ගේ එදිනෙදා ජීවනෝපාය කර ගෙන යන්න තල් ගස කොච්චර ළං කර ගත්තාද කියන කාරණයත් අපි දන්නවා. නමුත් අද යුද්ධය අවසාන වෙලා තිබෙනවා. ඒ නිසා මේ නීතිය ක්‍රියාත්මක වනවාත් සමඟම ඒ තුළින් උතුරේ ජනතාවට තමන්ගේ ජීවනෝපාය නිසියාකාරව කර ගෙන යන්න මහඟු පිටිවහලක් ලැබෙනවාය කියන එක අපි කියන්න ඕනෑ. මොකද, අද වන විටත් උතුරේ පවුල් 40,000ක පමණ ප්‍රමාණයක් මේ තල් ගස ආශ්‍රිත කර්මාන්තවලින් ජීවත් වනවා. අපේ නිශාන්ත මුතුහෙට්ටිගම මන්ත්‍රීතුමා කිතුල් ගස් ගැන දන්නවා. ඇත්තටම හොඳ කිතුල් හකුරු කෑල්ලක් කන්න අපි හරි කැමැතියි. හොඳ කිතුල් රා ටිකක් බොන්න අපි කැමැතියි. නමුත් හොඳ කිතුල් හකුරු කෑල්ලක් කන්න, හොඳ කිතුල් රා ටිකක් බොන්න බොහොම මහන්සියක් ගන්න තවමත් අපට සිද්ධ වෙලා තිබෙනවා. නමුත් මේ

සංශෝධනයත් එක්ක අපි ජීවත් වන ප්‍රදේශවල ජනතාවට හොඳ කිතුල් හකුරු කෑල්ලක් කන්න අවස්ථාව ලැබෙනවාය කියන කාරණය මම කියන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම තල්, කිතුල් ඇතුළු දේවලින් අපනයනය තත්ත්වයේ දේශීය නිෂ්පාදන කරන්න 2011 අය වැයෙන් අතිගරු ජනාධිපතිතුමා රුපියල් මිලියන 500ක මුදලක් අපනයන සංවර්ධන මණ්ඩලයට වෙන් කර තිබෙනවා.

ජනතා විමුක්ති පෙරමුණේ ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා අද මෙතැන reload ලෝඩ් ගැන කථා කළා. නමුත් අපි දන්නවා මේ රටේ ජනතාවගේ ප්‍රශ්නය තිබෙන්නේ reload සම්බන්ධයෙන් නොවෙයි කියන එක. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රටේ ජනතාවට කථා කරන්න ඊට වඩා ප්‍රශ්න තිබෙනවා. අපේ ආණ්ඩුවෙන් කරන හොඳ දේවල් ගැන විපක්ෂය කථා කරන්නේ නැහැ. ඒ අයගේ තිබෙන කුහක ප්‍රතිපත්ති නිසාම අද විපක්ෂය ජනතාවගෙන් ඈත් වෙලා තිබෙනවාය කියන කාරණය අපි කියන්න ඕනෑ. ඒ නිසා අපේ රජය ගෙන යන්නා වූ මේ වැඩ පිළිවෙළ විපක්ෂය අනුමත නොකළත් මේ රටේ බහුතර ජනතාව අනුමත කර තිබෙන බව අපි ඔබතුමාට කියනවා. ඒ නිසා අද විනාශයට පත් වෙලා යන පොල් වගාව මේ සුරාබදු සංශෝධන පනත යටතේ ආරක්ෂා කර ගන්න අපට පුළුවන් වනවා. මොකද, තවමත් පොල් ගස මැදීම සඳහා බලපත්‍ර ලබා ගන්න ඕනෑ. ඒ නිසා මේ තුළින් පොල් වගාව ශක්තිමත් කරන්න අපට පුළුවන්කම ලැබෙනවා. ඒ වාගේම තල් සහ කිතුල් නිෂ්පාදන ආශ්‍රය කර ගෙන දේශීය ආර්ථිකය ගොඩ නංවා ගන්නට පුළුවන්. මේ වන විට සීනි ආනයනය කරන්න අතිවිශාල මුදල් ප්‍රමාණයක් අපි වැය කරනවා. ඒ නිසා මේ කර්මාන්ත දෙක ඉතාමත් ශක්තිමත් ආකාරයට මේ රට පුරා ගෙන ගියොත් සීනි වෙනුවට ආදේශකයන් හැටියට තල් සහ කිතුල් නිෂ්පාදන භාවිත කරලා විශාල විදේශ විනිමය ප්‍රමාණයක් ඉතිරි කරන්න අපට පුළුවන් වනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

අද ඉදිරිපත් කරපු අනෙක් පනත් කෙටුම්පත තමයි බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැනට තමන්ගෙන් ණය ගත්ත මිනිසුන්ගේ දේපොළ උසාවිය ඉදිරියට නොගිහිල්ලා රාජසන්තක කරලා වෙන්දේසියේ විකුණන්න බැංකුවලට බලය තිබෙන බව අපි දන්නවා. නමුත් මේ පනත් කෙටුම්පත සම්මත කර ක්‍රියාත්මක වන විට රුපියල් මිලියන 5ට වඩා අඩුවෙන් ණය අර ගෙන තිබෙන මිනිසුන්ගේ ණය අය කර ගැනීමේ ක්‍රියාවලිය නවතිනවා. විශේෂයෙන්ම අද මේ පනත සංශෝධනය වුණාට පස්සේ අපේ රජය මේ රටේ සුළු සහ මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ට, ව්‍යවසායකයන්ට අතිවිශාල සහනයක් ලබා දෙනවාය කියන කාරණය අපි කියන්න ඕනෑ. යම් ව්‍යාපාරයක් ඇති කරන්න ගියාම අපේ ව්‍යවසායකයන්ට සැකයකින් තොරව; තමන්ගේ දේපොළ බැංකු මඟින් අත් පත් කර නොගනීවි කියන විශ්වාසය ඇතිව ව්‍යාපාර කටයුතු කර ගෙන යන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ සියලු කාරණා ගැන අපට කියන්න තිබෙන්නේ අපේ රජය නිරන්තරයෙන්ම ජනතා හිතවාදී වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර ගෙන යන බවයි. අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා එතුමාට බලය ලබා දුන් ජනතාව ගැන පමණක් නොවෙයි, මේ රටේ සමස්ත ජනතාව ගැනම කල්පනා කරලා මේ රට ශීඝ්‍ර සංවර්ධනයක් කරා ගෙන යන්නා වූ ගමනේදී මේ සියලු පනත් කෙටුම්පත් ගරු සභාව විසින් සම්මත කිරීම අත්‍යවශ්‍ය කාරණයක් කියලා මා හිතනවා. මේ පනත් කෙටුම්පත් සම්මත කරනවාය කියන්නේ ජනතා හිතවාදී වැඩ කටයුත්තක් බව ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

[අ. භා. 3.28]

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද අපි සාකච්ඡා කරන බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පතත්, දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පතත් සහ බදු අභියාචනා කොමිසම පනත් කෙටුම්පත ගැනත් වචන ස්වල්පයක් කියන්නට මම කැමැතියි.

බදු අභියාචනා කොමිසම පනත් කෙටුම්පත ගැන තිබෙන යෝජනාව හොඳ යෝජනාවක් කියා කියන්න අවශ්‍යයි. නමුත් මම පොදු කරුණු කිහිපයක් ගැන කථා කරන්නට අවශ්‍යයි. විශේෂයෙන්ම ඊයේ ගරු වාසුදේව නානායක්කාර ඇමතිතුමා එක්සත් ජාතික පක්ෂයේ ආර්ථික ප්‍රතිපත්තිය විවේචනය කළා. මම හිතුවා ඒ සම්බන්ධයෙන් යම් පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍යයි කියලා. ඔහු කිව්වා මිල තීරණය කරන කොට එක්සත් ජාතික පක්ෂයට ප්‍රතිපත්තියක් නැහැ කියලා. අපි මිල තීරණය කරන්නේ ඉල්ලුම හා සැපයුම අනුව බව මතක් කරන්න අවශ්‍යයි. එහෙම නැතිව එක ඇමති කෙනෙකුගේ තීරණය අනුව නොවෙයි. සාධාරණ මිල තීරණය කරන ක්‍රමය ලෙස අපි විශ්වාස කරන්නේ ඒ ක්‍රමයයි. එම ක්‍රමයෙන් තමයි යම් කිසි සේවයකින් හෝ භාණ්ඩයකින් කොපමණ ප්‍රමාණයක් සපයන්න පුළුවන්ද කියලා තීරණය කරන්න පුළුවන් වන්නේ. ඒ වාගේම අවශ්‍ය භාණ්ඩ ප්‍රමාණයත්, භාණ්ඩයේ හෝ සේවයේ ප්‍රමිතියත් තීරණය කරන්න පුළුවන් හොඳම ක්‍රමයත් ඒකයි. ඊට අමතරව ඒ භාණ්ඩය සැපයීමේදී හෝ සේවය සැපයීමේදී එයට අවශ්‍ය ආයෝජනය තීරණය වන්නේත් ඒ ආකාරයටමයි. දැන් අපි සියලු දෙනාම දන්නවා රාජ්‍ය ආර්ථික සැලසුම් ක්‍රමය - central planning mechanism - යුරෝපයේ රටවල්, විශේෂයෙන් නැඟෙනහිර යුරෝපයේ රටවල් එක්දහස් නවසිය අසූ ගණන්වලදී සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කළා කියලා. මම හිතන්නේ අද රජයට යම් කිසි පටලැවිල්ලක් තිබෙනවා ඇත්තටම මේ ආර්ථිකය කොයි ආකාරයටද ගෙන යා යුත්තේ කියලා. ඒ වාගේම එක්සත් ජාතික පක්ෂය දන්නවා, ඉල්ලුම වාර්තා කරන්නට බැරි ජනතා කොටසකුත් අපේ රටේ සිටින බව. ඒ, අඩු ආදායම්ලාභීන්ගේ කොටස. අපේ ආර්ථික ප්‍රතිපත්තිය අනුව ඔවුන්ගේ සියලුම අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවාවන් අපි ලබා දෙනවා. ඒක අපි කරන්නේ ඉල්ලුම හා සැපයුමෙන් මිල තීරණය වීමෙන් පසු ඒක එහා මෙහා කිරීමෙන් නොවෙයි; ඔවුන්ට අවශ්‍ය භාණ්ඩ හා සේවාවන් සෘජුවම ඔවුන්ට සපයා දීමෙනුයි.

රජය අය වැය සාකච්ඡාව තුළදී සඳහන් කළා, අපේ රටේ ජනතාවගේ සියයට15ක්ව තිබුණ දරිද්‍රතාව සියයට 7.5 දක්වා අඩු වුණා කියලා. දැන් ඒ දත්තය අපි සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරනවා. අපි ඒක ප්‍රතික්ෂේප කරමින් සඳහන් කළා, දරිද්‍රතාව මනින කොට කෙනෙකුගේ වියදම පමණක් නොවෙයි, ආදායමත් සලකන්න අවශ්‍යයි කියලා. මොකද අපි දන්නවා, මේ රටේ ජනතාවගෙන් හුඟක් අය පිට රටවල වැඩ කරනවා; ඒ වැඩ කරලා එයින් ලැබෙන ආදායමෙන්, නැත්නම් ඒ අයගේ නෑදෑයන්, හිත මිතුරන් එවන ආදායමෙන් තමයි ඔවුන් ජීවත් වන්නේ කියන එක. අපි ඒ තර්කය අය වැය සාකච්ඡාව තුළදී ඉදිරිපත් කළා. ඒක කරලා තවම මාස තුනක්වත් ගිහිල්ලා නැහැ. දැන් අපට පැහැදිලි වෙලා තිබෙනවා, මැද පෙරදිග ඇති වෙලා තිබෙන අර්බුදය පිළිබඳව. මේ වාගේ අර්බුදයක් තිබෙන නිසා රැකී රක්ෂා ලක්ෂ ගණන් අහිමි වෙනවා. ඒ නිසා මේ අය අතර ඒ දරිද්‍රතාවේ කොටසට අයිති වන කොටසක් ඉන්නවා. මොකද ඒ ආදායමින් යැපෙන කොටසක් මේ රටේත් ජීවත් වන නිසා. ඉතින් දුප්පත් අඩු ආදායම්ලාභීන්ට, නැති බැරි අයට ආදායමක්, අධ්‍යාපනයක්, සෞඛ්‍ය සේවාවක් ලබා දීමේ

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

ඒ ප්‍රතිපත්තියට එක්සත් ජාතික පක්ෂය බැඳී සිටිනවා. අපි ඒක කරන්නේ මිල දර්ශකය හිතු හිතු ආකාරයෙන් තීරණය කිරීමෙන් නොවෙයි. අපි ඒක කරන්නේ අඩු ආදායම්ලාභීන්ට සෘජුවම ඒ භාණ්ඩ හා සේවා දීමෙන් හා ඊට සරිලන අවස්ථා ආර්ථිකය තුළින් සලසා දීමෙන්. එය දුප්පත්කම නැති කරන ආර්ථික ප්‍රතිපත්තියක් වන අතර, ශීඝ්‍ර වර්ධනයකට අඩිතාලමක් තිබෙන ආර්ථිකයක්. නගරයේ ජීවත් වන අඩු ආදායම්ලාභීන් අපි කරදරයක් හැටියට සලකන්නේ නැහැ. ඒ අය ආර්ථික සම්පතක් ලෙස තමයි අප සලකන්නේ. ඉතින් මා හිතුවා ඒ පැහැදිලි කිරීම කරන්න අවශ්‍යයි කියලා.

අද අපි සාකච්ඡා කරන්නේ මේ බදු කොහොමද සරල කරන්නේ කියන එක ගැන. අය වැය ලේඛනය තුළ තිබුණු යෝජනා ක්‍රියාත්මක කිරීමේ පනත් කෙටුම්පත් තමයි අද ඉදිරිපත් කරලා තිබෙන්නේ. නමුත් මම මොහොතක් කථා කරන්න කැමැතියි බදු ලබා ගැනීම පිළිබඳව වාගේම බදු සහන දීම පිළිබඳවත්. බදු ලබා ගැනීමේදී ඒ ක්‍රමය සරල කිරීම බොහොම හොඳ දෙයක්. විශේෂයෙන්ම අපි පත්තරවලින් හුහක් කියවලා තිබෙනවා BOI එක ප්‍රතිසංස්කරණය කර ගෙන යනවා කියලා. ඒක පරිපාලනය පිළිබඳ ප්‍රතිසංස්කරණයක්. ඒක one-stop shop එකක් කරන්නයි හදන්නේ. නමුත් මම කථා කරන්නේ ඒ ප්‍රතිසංස්කරණය පිළිබඳව නොවෙයි. අපි දන්නවා IMF එකට නැත්නම් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට මේ රජය යම් කිසි පොරොන්දු වගයක් දුන්නා කියලා. 2010 සැප්තැම්බර් මාසයේ 14 වැනි දා ගරු සරත් අමුණුගම ඇමතිතුමාත්, මහ බැංකුවේ අධිපතිතුමාත් අත්සන් කරපු ලියමනේ සඳහන් කරනවා මේ BOI එකෙන් දෙන සහන අඩු කරන්න අවශ්‍යයි කියලා. ඒක අඩු කරන්න පොරොන්දු වුණා. ඒ වාගේම විශාල ආයෝජකයන්ට පමණක් සහන දීමටත් පොරොන්දු වෙලා තිබෙනවා. ඒ කියන්නේ පොඩි ආයෝජකයන්ට ඒ සහන නොලැබෙන විධියක් තමයි ඒ ලියමනේ සඳහන් වෙලා තිබෙන්නේ. බදු අඩු කරන එකයි, ඒ ක්‍රමය සරල කරන එකයි බොහොම වැදගත්. නමුත් අපට තිබෙන ප්‍රශ්නය මේකයි. BOI එකෙන් මේ දෙන බදු සහන, ඊට පස්සේ එක් එක් ඇමතිවරුන්ගේ තීරණය අනුව දෙන එක -ඔවුන් හිතු හිතු පරිද්දෙන් දෙන එක- මා හිතන්නේ බොහොම විනිවිදභාවයෙන් අඩු ක්‍රමයක් කියලායි. දවස් කීපයකට ප්‍රථමයෙන් ආචාර්ය හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාත් ප්‍රශ්න කළා, ෂැන්ග්‍රි-ලා හෝටලයට කොළඹ බොහොම වටිනා අක්කර 6ක ඉඩමක් විකුණුවා කියලා. ඇත්තටම ඒක විකුණපු අවස්ථාවේදී සියයට 100ක බද්දක් අය කරන්න අවශ්‍යයි. ඇත්තටම ඒ බද්ද අය කළාද, නැද්ද කියන ප්‍රශ්නය තමයි ඇහුවේ. ඒ මිල එක එක විධියට තීරණය කරන්න පුළුවන්. නමුත් මේ ගරු පාර්ලිමේන්තුව හැම තිස්සේම දැන ගන්න අවශ්‍යයි රජයකට බද්දක් ලැබෙන්න තිබෙනවා නම් ඒ බද්ද ලැබුණාද, නැද්ද කියන එක. ඒක ලැබුණේ නැත්නම් ඒ නොලැබුණේ ඇයි කියන එක අපි දැන ගන්නට කැමැතියි. මේක පෞද්ගලීකරණයක් විතරක් නොවෙයි.

ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
ගරු මන්ත්‍රීතුමනි, මට ප්‍රශ්නයක් අහන්න ඉඩ දෙනවාද?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
මේක පෞද්ගලීකරණයක් විතරක් නොවෙයි. -

ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
ආයෝජනය මණ්ඩලය යටතේ තිබෙන සමාගමක් සියයට 100ක බද්දක් ගෙවන්න අවශ්‍ය නැහැ.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
මේක පෞද්ගලීකරණයක් විතරක් නොවෙයි විදේශ -

ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
ඇයි මේ සභාව නොමඟ යවන්නේ? යම් කිසි ආයතනයක් ආයෝජන මණ්ඩලය යටතේ තිබෙනවා නම් සියයට 100ක බද්දක් ගෙවන්න අවශ්‍ය නැහැ. ඒක තමුන්නාන්සේ දන්නවා.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
එදා අහපු ප්‍රශ්නයට පිළිතුරක් දුන්නා නම් ප්‍රශ්නයක් නැහැ. [බාධා කිරීමක්] මේක පෞද්ගලීකරණයක් විතරක් නොවෙයි විදේශිකයන්ට විකිණීමක් වෙලා තිබෙනවා. දැන් මම මෙතැන කථා කරන්නේ සහනාධාර දීමේදී -නීත්‍යානුකූලව දීමේදී- ඒක BOI එකෙන් දුන්නොත් කිසි ප්‍රශ්නයක් නැහැ කියන එක. නමුත් ඒ සහන වෙනත් ක්‍රමවලින් දෙනවා නම්, ඒකේ විනිවිදභාවයක්, ප්‍රතිපත්තියක් තිබෙන්න ඕනෑ. ඒක පැහැදිලි වන්නට අවශ්‍යයි කියන එක තමයි මම සඳහන් කරන්නේ. [බාධා කිරීමක්] ඒ වාගේම අපට පැහැදිලි වන්න අවශ්‍යයි.

ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! There is a point of Order being raised.

ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)
Mr. Deputy Chairman of Committees, the Hon. Member is misleading the House. He is inferring that the Government has given it on a certain basis. What is that basis? Please tell this House.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
That is not a point of Order. You carry on, Hon. Member.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
If there are incentives and concessions being given, then there should be limits of authority. Even subsequent to those concessions being given within a specified period of time, it will be good if the Parliament is informed of those concessions.- [*Interruption*.] There are very many situations around the world of good governance, which could be followed.

ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)

It is under the Strategic Development Projects Act. You can refer to it. It is within that ambit that it is done.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

That is fine. I am asking you to make a disclosure within a specific period of time. - [*Interruption*.]

මම කථා කරන්න කැමැති තව කරුණක් තිබෙනවා. ඒ රජය කරන ආයෝජන පිළිබඳවයි. I want to make a few points on the investments that the Government is making. These investments are being made on the Stock Market, in the purchase of good companies as well as banks. As regards the purchase of banks, the Government entities have been buying more than 10 per cent of commercial banks. We know that there is a laid down rule that there can only be a 10 per cent purchase. Otherwise, with the permission of the monetary authority, there could be a maximum of a 15 per cent purchase. So, what I want to know is whether this rule is applicable only to the Government or is it applicable to everyone. If it is applicable only to the Government, then the Government should say so. If it does apply, then the Government is in violation of the rule. We know that more than Rs. 60 billion has been invested in the control of certain banks. What is the logic behind it and what is the necessity of this investment? That is not clear. We know that the Bank of Ceylon has Rs. 715 billion in assets, the People's Bank has about Rs. 550 billion and the NSB has about Rs. 400 billion. When you total all these assets, it is more than 50 per cent of the banking assets of the country. So, what is the necessity actually to purchase and take control of some of these private banks? What is the logic behind this? It is not just the EPF that is involved in these takeovers. The ETF, the Bank of Ceylon, the Sri Lanka Insurance Corporation and the National Savings Bank are involved in it. We know that the Government entities collectively own more than 14 per cent of the Commercial Bank, more than 23 per cent of the HNB, 30 per cent of the Seylan Bank, 33 per cent of the DFCC and 33 per cent of the NDB. What is the intention of this? The EPF is only one of the purchasers. It owns about 5 per cent of the Commercial Bank, about 7.6 per cent of Government portion of the HNB, about 6 per cent of the Seylan Bank portion, 9 per cent of NDB and about 8.25 per cent of the Sampath Bank. So, what is the reason for this? What is the true intention? One argument is that it is to give better returns to the EPF members. That is good if the EPF members are given better returns. But, the question is much wider. The EPF portion of those investments is actually about 25 per cent. But, the problem is, the other institutions are also being involved. You cannot have it both ways. You cannot have a situation where the Government directly owns more than 50 per cent of all the banking assets and the Government indirectly trying to own the assets of other banks by taking control of them. What is the intention of it? Certainly, it is not to give returns to the members of the Employees' Provident Fund.

Some people might think that investors could be fooled. A question is being asked : "Still, why is there a stagnation in Foreign Direct Investments coming into the country?" That is because the signals are mixed. The signals are certainly mixed here because people are coming to the conclusion that there is a creeping nationalization. There is also a conflict of interest here. When Government entities are taking over very well-run, profitable private institutions and private banks, when Government institutions to get control over them are nominating directors for those boards and are sending those names to the regulatory authority for approval, so that the authority will go into whether the individuals are fit and proper, it must be said that the process is certainly not fit and proper. The process must be fit and proper if they are to continue with what they are doing. We know that directors are being replaced by new directors. It is a creeping nationalization. Certainly, there is a negative signal to investors who would want to invest in these areas. So, that is a concern.

ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)

Can you give an example of such institution?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

There are many such institutions. I have named them : the HNB, of which they have control over 23 per cent of shares, the Seylan Bank, the shares over which they have control for obvious reasons because the bank is in trouble and we can keep that aside, the DFCC, of which they have control over 33 per cent of shares, the NDB, of which they have control over 33 per cent of shares and now, the Commercial Bank, of which the control over shares is rising and it is at over 14 per cent. The point I am making is, -

ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)

Those are strategic investments the Government is making.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

Wait, wait.

ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)

Now, take for example Temasek.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

Yes, you can make strategic investments, but you need to be clear. If you are making long-term strategic investments for returns and those returns are going to benefit the ordinary people of this country, we would not oppose it. - [*Interruption.*] But, these are not only for returns. Investments are being made and control of those institutions is being taken over. That is the problem. - [*Interruption.*] You cannot have it both ways. - [*Interruption.*] Hon. Member, you cannot have it both ways. If you want to make long-term investments and get returns, we are not opposing it. But, if you are investing, appointing directors and also regulating those, you are certainly giving the wrong signal. Please take note of that. - [*Interruption.*] You cannot attract foreign investments that way.

ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)

The point is well taken. But, are you saying that the Government should make strategic investments for the benefit of the people of this country and then refrain from appointing directors to ensure those are taken care of?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

May I say this, Hon. Member. We are in the Opposition and not in the Government. - [*Interruption.*] But, if the Government wants our advice, we will certainly give it. There are models globally, in which Governments can invest and you used Temasek as an example. But, there are ways in which it could be done; there has to be rules on transparency. - [*Interruption.*] There has to be rules on conflict of interests that comes between Government operations and Government regulations. Those need to be put into place and observed. Then, people will have confidence.

ගරු සජින් ද වාස් ගුණවර්ධන මහතා
(மாண்புமிகு சஜின் த வாஸ் குணவர்தன)
(The Hon. Sajin De Vass Gunawardena)

Hon. Member, you were the CEO of the National Development Bank, of which the Government has proposed to take over 15 to 18 per cent. - [*Interruption.*]

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

Hon. Member, let me be clear and I will say it again. We are not opposing the Government buying shares in the Stock Market; we are not opposing the ordinary people of this country getting benefit from investing in the Stock Market because it is they who must benefit out of it. What we are saying is that, you cannot have it both ways. If you take control of the commanding heights of the economy, the private sector, by appointing directors and having conflict of interests in the system, people are going to lose confidence. - [*Interruption.*] That is the reason why investment is slow. - [*Interruption.*] There are many contradictions and we say this in good faith, Hon. Members. There are many contradictions and we are asking you to iron those contradictions out. You cannot be disparaging of foreign investors and also welcome them. You cannot alienate the community and then do just one or two deals secretly. You need to have a consistent policy; you need to have a policy framework that works, that everybody understands and has everybody behind it. You want economic growth and prosperity, but you cannot constantly interfere with the market mechanism, depending on the judgment of the central bureaucrats. They used to be called "central planners". It cannot be done. You cannot undermine private distribution of goods and services and increase Government distribution. These are just a few examples of the mixed signals that are being given out.

Finally, I would like to thank you, Sir, for the courtesy extended.

[අ. භා. 3.52]

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය (පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමිය)
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன - பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena - Minister of Parliamentary Affairs)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම සුරාබදු (සංශෝධන) පනත් කෙටුම්පත, ඒ වාගේම බදු අභියාචනා කොමිසම පනත් කෙටුම්පත ආදී පනත් කෙටුම්පත් කීපයක් දෙවන වර කියැවීම සඳහා ඉදිරිපත් කර තිබෙන මේ අවස්ථාවේදී රටේ අද පවතින තත්ත්වය පිළිබඳවත්, ජනතාවගේ ආකල්ප සහ ජනතාව වෙනුවෙන් රජය මොන විධියේ වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කරලා තිබෙනවාද කියන එක පිළිබඳවත් වචන කීපයක් කථා කිරීමට මා විශේෂයෙන් බලාපොරොත්තු වනවා.

ඇත්තෙන්ම අද එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරුන් හැම කෙනාම කථා කළේත්, ඒ වාගේම මේ දවස් ටිකේම මේ පනත් සංශෝධන ඉදිරිපත් කළ අවස්ථාවේදී විපක්ෂයේ අනෙකුත් මන්ත්‍රීවරුන් කථා කළේත් "රටේ ජනතාවට විශාල බරක් පැටවෙලා තිබෙනවා. ජනතාවට ජීවත් වන්න අපහසුයි. පඩි වැඩි කළේ නැහැ. දුන්න පොරොන්දු රජය ඉෂ්ට කළේ නැහැ" කියලායි.විරුද්ධ පක්ෂය හැටියට මේ හැම කෙනාම විශේෂයෙන්ම කථා කළේ රජයට නොයෙක් විධියේ චෝදනා එල්ල කරමිනුයි.

සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා, විශේෂයෙන්ම අපේ අතිගරු ජනාධිපතිතුමා අය වැය ඉදිරිපත් කිරීමේදී හමුදා පවුල්වලට විශේෂ සහන යෝජනා කරලා තිබුණා, ඒවා ලබා දෙනවා කියලා පොරොන්දු වුණා කියලා. දශක තුනක කාලයක් තිස්සේ අපේ රටට වද දුන්, ජනතාවම පීඩාවට පත් කළ ඒ යුද්ධය නිමා කළ රණ විරුවන් වෙනුවෙන් රජය හැටියට එතුමා විශාල කැප වීමක් කරමින් හමුදා පවුල්වල සුභසාධන කටයුතු පසු ගිය කාලය තුළම විශාල වශයෙන් ඉටු කළා. මේ යුද්ධය නිමා කළාට පසුව පමණක් නොවෙයි, ඊට ප්‍රථමයෙනුත් හමුදා පවුල්වල සුභසාධනය වෙනුවෙන් විශාල කැප වීමක් කරමින් එතුමා කටයුතු කරලා තිබෙනවා. සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා,

"හමුදා පවුල්වල තුන්වන දරුවා ලැබෙන කොට ලක්ෂයක මුදලක් ලබා දෙනවා කිව්වා. ඒක ලබා දුන්නේ නැහැ." කියලා. මම එතුමාට මතක් කරන්න කැමැතියි, සමහර විට ඒ අය වැයෙන් පසුව තවම ඒ හමුදා පවුල්වල තුන්වැනි දරුවා හම්බ වෙලා නැතුවත් ඇති කියලා. එහෙම අවස්ථාවලදී එම ආධාරය ලබා ගැනීමට පුළුවන් වන්නේ නැහැ.

කෙසේ වෙතත් මම දන්නවා, විශේෂයෙන්ම රණ විරු පවුල්වලට පසු ගිය කාල වකවානු තුළම නිවාස ඉදි කිරීම් සඳහා හමුදාවට ඉඩම් ලබා දීලා, නිවාස ඉදි කිරීම සඳහා ලක්ෂ දෙකක පමණ මුදලක් වැය කරමින් සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකටම වරින් වර නිවාස 10ක් පමණ ඉදි කරන්නට මුදල් අනුමත කරලා දීලා තිබෙනවාය කියලා. විශේෂයෙන්ම අපිත් මොනරාගල වැනි පළාත්වල රණ විරුවන් වෙනුවෙන් නිවාස සඳහා මුල්ගල් තබලා ඒ කටයුතු ආරම්භ කළා. ඒ නිවාස දැන් ඉදි වෙලා රණ විරුවන්ගේ පවුල් ඒවායේ පදිංචි වෙලා ඉන්නවා. ඉතින් ඒ ආකාරයට රණ විරුවන් වෙනුවෙන් ඒ ගොල්ලන්ගේ වැටුප් ආදී සියලුම දේවල් ලබා දෙනවා වාගේම, රටේ අනිකුත් මහ ජනතාව වෙනුවෙනුත් මේ වන කොටත් සුවිශේෂී කාර්ය භාරයක් මේ රජය ඉටු කරනවා. ඒ අයගේ සුභසාධන කටයුතු සහ අනෙකුත් කටයුතු වෙනුවෙන් ඒ අයට ජීවත් වන්නට අවශ්‍ය සියලුම පහසුකම් සලස්වමින් කටයුතු කරනවා.

මම දන්නවා, පාරිභෝගික සුභසාධනය පිළිබඳ අමාත්‍යාංශය මඟින් මහ ජනතාවට විශේෂයෙන් සහන ක්‍රමවලට මේ පාරිභෝගික භාණ්ඩ බෙදා හැරීම සඳහා මේ වන කොට Co-op City නමින් සමුපකාර වැඩිදියුණු කරලා තිබෙනවාය කියලා. ඒ වාගේම අද ගම්වලට සතොස ව්‍යාප්ත කරමින් විශාල වෙළෙඳ මධ්‍යස්ථාන ගණනාවක් මේ වන කොට පිහිටුවා ජනතාවට සහන ක්‍රමයට පාරිභෝගික භාණ්ඩ ලබා දෙන්නට කටයුතු කරලා තිබෙනවා. මේවා ඇත්තටම සියැසින් බලා ගන්න පුළුවන්, දැක ගන්න පුළුවන් දේවල්.

අද මං මාවත් බැලුවාම විශාල වශයෙන් වැඩිදියුණු වෙලා තිබෙනවා. එදා මොනරාගලට යන්න අපට පැය හයක්, හයහමාරක්, හතක් පමණ යන ගමන අද අපට පැය හතරෙන්, හතරහමාරෙන් යා හැකි වන පරිදි පාරවල් පුළුල් කරලා අධිවේගී මාර්ග බවට ඒ පාරවල් පත් කරලා තිබෙනවා. මොනරාගල පමණක් නොවෙයි, දිවයින පුරාම ප්‍රධාන මාර්ග ටික සංවර්ධනය වන කොට ග්‍රාමීය මට්ටමෙන්, විශේෂයෙන්ම සෑම ග්‍රාම නිලධාරි වසමකටම කොන්ක්‍රීට් යෙදූ පාරවල්, ඒ වාගේම පානීය ජල පහසුකම්, ගමනාගමන පහසුකම්, ඒ වාගේම සෞඛ්‍ය සහ අධ්‍යාපන කටයුතු වෙනුවෙන් ඒ කළ යුතු ඒ සියලුම දේවල් මේ රජය ඉටු කරමින් පවතිනවා. මේ වන කොට ජාතික පාසල්වල තිබෙන තදබදය නැති කිරීම සඳහා අද පාසල් 1,000ක් ඒ ආකාරයෙන්ම සුපිරි පෙළේ පාසල් මට්ටමට වැඩිදියුණු කරන ඒ වැඩ පිළිවෙළට සෑම දිස්ත්‍රික්කයකින්ම පාසල් තෝරා ගෙන ඒවා දැන් සංවර්ධනය කර ගෙන යන වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක වනවා.

පසු ගිය මාස කීපයකට ප්‍රථමයෙන් අපේ රට පමණක් නොවෙයි, මුළු ලෝකයේම පැවතුණු තත්ත්වයන් උඩ බලාපොරොත්තු නොවුණු ආකාරයට ආපදාවන් රාශියක් ඇති වුණා. ඒ නිසා අපි බලාපොරොත්තු නොවුණු ආකාරයේ විශාල මුදලක් ඒ ආපදාවන් පිළිසකර කරන්නට, ආපදාවන් වෙනුවෙන් අනාථ වූ අයට ගෙවීම සඳහා, ඒ වාගේම ඔවුන්ට අවශ්‍ය කෑම බීම ලබා දීම සඳහා යොද වන්නට සිද්ධ වුණා. එයින් පාරිභෝගික කටයුතුවලට, වී ගොවිතැනට, අපේ රටේ ආර්ථිකයට ලොකු පහරක් එල්ල වුණා. හාල් මිල, එළවලු මිල ඉහළ යාමක් සිදු වුණා. මේවා කවුරුත් දකිනා, දන්නා දේවල්. මේවා විවේචනය කර වැඩක් නැහැ. ඒවාට අප පෙර සූදානම් වීමක් තමයි අවශ්‍ය වන්නේ.

ඒ වාගේම අතිගරු ජනාධිපතිතුමා පසු ගිය දිනවල "දිවි නැඟුම" යනුවෙන් වැඩ පිළිවෙළක් ගෙනාවා. එය ගෘහ ආර්ථිකය නඟා සිටුවීමේ වැඩ පිළිවෙළක්. ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගේ මෙහෙයවීමෙන් දැන් දිවයින පුරාම ගෙවතු වගා දසලක්ෂයේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වනවා. ඒ සම්බන්ධයෙන් විශේෂයෙන් කාන්තාවෝ බොහොම උනන්දුයි. අපේ ප්‍රදේශවලත් බොහොම උනන්දුවෙන් මේ කටයුත්ත කර ගෙන යනවා. එක්සත් ජාතික පක්ෂය හැම වෙලාවේම අහන්නේ, "පවුලකට රුපියල් දහදාහක් දෙනවාය කිව්වා, කෝ සල්ලි?" කියායි. සල්ලිවලින් රුපියල් දහදාහක් දී වැඩක් නැහැ. සල්ලිවලින් රුපියල් දහදාහක් දුන්නොත් කෑම බීම සඳහා බඩු ටිකක් අරගෙන ඒ වෙලාවට කාලා ඒක ඉවර කර ගනියි. එහෙම නොවෙයි. එය ඒ අයගේ පවුලේ ආර්ථිකය නඟා සිටුවීම සඳහා ගෙවතු වගා දසලක්ෂයේ වැඩසටහනට ඉතාමත් වැදගත් විධියට යොමු කරන ආකාරයට යොදවන්නට කටයුතු කර තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය උපකරණ, පොහොර වර්ග, බීජ වර්ග ලබා දෙමින්, ඒ අයට තාක්ෂණික දැනුම ලබා දෙමින් සමෘද්ධි සංවර්ධන නිලධාරින්, කෘෂි පර්යේෂණ නිලධාරින්, ග්‍රාම නිලධාරින් එකතු වෙලා ගෙවතු වගා වැඩසටහන ක්‍රමවත්ව ජනතාව අතරට ගෙන ගිහින් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසු ගිය දවස්වල අමු මිරිස් කිලෝවක මිල රුපියල් හය-හත්සීය දක්වා ඉහළ ගියා. අද වන විට ගොවීන්, හැම කෙනාම වගා බිම්වල, ගෙවතු වගාවල මිරිස් විතරක් නොවෙයි, අනෙක් සියලුම වගාවන් කර ගෙන යනවා. මේ වාගේ භාණ්ඩ හිඟයක් ඇති වන කොට අනිවාර්යයෙන්ම මිල ඉහළ යාම සාධාරණයි. මිල ඉහළ යාම අනිවාර්යයෙන්ම සිදු වන දෙයක්. පසුව ඒවායේ නිෂ්පාදනය වැඩි වුණාම මිල සම මට්ටමකට පවත්වා ගෙන යන්නට පුළුවන්කම තිබෙනවා.

අද පුද්ගලයන් ගෙවන බදු, වැට් බදු ආදිය බොහෝ දුරට පහත දැමීමක් සිදු කරන්නට මේ පනත් තුළින් අතිගරු ජනාධිපතිතුමා කටයුතු කර තිබෙනවා. වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බදු පනත් කෙටුම්පත, සුරාබදු (සංශෝධන) පනත් කෙටුම්පත, දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත යන මේ පනත් කෙටුම්පත් තුළින්, ඒවාට සංශෝධන එකතු කරමින් බදු සරල කිරීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නට කටයුතු කර තිබෙනවා.

විශේෂයෙන් බදු අභියාචනා කොමිසම පනත් කෙටුම්පත මඟින් බදු අභියාචනා කොමිසමක් පත් කරන්න යෝජනා කර තිබෙනවා. තමන් ගෙවන බදු ප්‍රමාණය වැඩි නම්, ඉහළ මට්ටමක තිබෙනවා නම්, ඒ බදු අභියාචනා කොමිසමට තමන්ගේ අභියාචනා, ඉල්ලීම් ඉදිරිපත් කරමින් බදු සහන තවත් ලබා ගන්නට හැකි වන ආකාරයේ බදු අභියාචනා කොමිසමකුත් ක්‍රියාත්මක කරන්නට අතිගරු ජනාධිපතිතුමා බදු අභියාචනා කොමිසම පනත මඟින් කටයුතු කර තිබෙනවා.

සුරාබදු (සංශෝධන) පනත් කෙටුම්පත ඉතාමත් වැදගත් පනත් කෙටුම්පතක්. සුරාබදු පනත යටතේ විශේෂ මත්පැන්වලට බලපත්‍ර ලබා දීම් සිදු කරනවා. තල්, කිතුල් වැනි ගස්වලින් රා නිෂ්පාදනය සහ විශේෂයෙන් ඉතාම උසස් වර්ගයේ පැණි හකුරු නිෂ්පාදනය කරන්න හැකියාව තිබෙනවා. බලපෑමක් නැතුව දැන් ඒවා කරන්නට හැකියාව ලැබෙනවා. වෙන දාට මේ සඳහා අනිවාර්යයෙන්ම බලපත්‍රයක් ලබා ගැනීම අවශ්‍යව තිබුණා. බොහෝ තැන්වල බලපත්‍ර ලබා නොගෙන මේවා කරන නිසා පොලීසියට ඒ අය අත් අඩංගුවට ගැනීමේ හැකියාව තිබුණා. එලෙස ජනතාවට හිරිහැරයක් වන ආකාරයට එදා ඒ කටයුතු සිදු කෙරුණත් අද බලපත්‍ර නොමැතිව මෙම කටයුත්ත කරන්නට, විශේෂයෙන්ම හොඳ නිෂ්පාදන ඇති කරන්නට පුළුවන්කම ලබා දී තිබෙනවා. දේශීය නිෂ්පාදකයාට, සුළු කර්මාන්තකරුවාට මේ තුළින් විශාල සහනයක් ලැබෙනවා. මේවාට විශේෂයෙන්ම බදු පනවා නැහැ. ඒ නිසා මේ තුළින් ඒ අයගේ ආර්ථිකයට ලොකු ශක්තියක් ලැබෙනවා.

[ගරු සුමේධා ජී. ජයසේන මහතා]

අද අපි කථා කරන අවස්ථාවේ බැලුවොත් අපේ රටට වෙන දාට වඩා නොයෙකුත් බාධක පැමිණියත්, නාය යෑම්, ගංවතුර, සුළි සුළං ආදී නොයෙක් දේවල්වලින් අපි පීඩා වින්දත්, විශේෂයෙන්ම අපේ ආර්ථිකය හැසිර වීමේදී අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා, ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ අමාත්‍යතුමා ඇතුළු අපේ රජය කටයුතු කරන ආකාරය බැලුවාම අද ජනතාවට ඒ තරම් බරක් පටවා තිබෙන බවක් පෙනෙන්නේ නැහැ. ගමක් වශයෙන් ගත්තත්, නගරයක් වශයෙන් ගත්තත් අද වෙන දාට වැඩිය සාමාන්‍ය ජනතාවත් ආර්ථික වශයෙන් ශක්තිමත් වී තිබෙනවා. අද හැම කෙනකු ළඟම වාගේ ජංගම දුරකථන තිබෙනවා. ඒ වාගේම අපේ පළාත්වල කෘෂි ආර්ථිකය, ගමේ ආර්ථිකය ගොඩක් ඉහළ මට්ටමකට ඇවිල්ලා තිබෙනවා. විශේෂයෙන්ම පසු ගිය කාලයේ වී වගාවට විශාල ලෙස හානි සිදු වුණත්, වර්ෂාව අධික වීම නිසා යම් කිසි මට්ටමකට බඩ ඉරිඟු වගාවේ ඵලදාව අඩු වුණත්, ඒ වගාවන්වල යෙදෙන අය අද විශාල මුදලක් ඒ තුළින් උපයා ගෙන හොඳ මට්ටමක ජීවත් වනවා. අපි දන්නවා, ඈත එපිට පිටිසර ගම්මානවල ජනතාව, එදා එල්ටීටීඊ ත්‍රස්තවාදීන්ගෙන් බැට කෑ ප්‍රදේශවල ජනතාව, මොණරාගල, සියඹලාණ්ඩුව, කහම්බාන, ඇතිමලේ, කොටියාගල වැනි ප්‍රදේශවල ජනතාව බඩ ඉරිඟු වගාව තුළින් හොඳ ආදායමක් ලබා ගෙන තිබෙන බව. කීප දෙනෙක් මා සමඟ කථා කරලා තිබෙනවා. එක පුද්ගලයෙක් මේ වර්ෂයට රුපියල් ලක්ෂ හතරක පහක පමණ ආදායමක් ලබා ගෙන තිබෙනවා. එවැනි තත්ත්වයකට අද පත් වෙලා තිබෙනවා. ඒ වගාව සඳහා ගත වන්නේ මාස තුනයි, උපරිමයෙන් මාස හතරයි. ඒ ප්‍රදේශවල සෑම නිවසකම වාගේ ට්‍රැක්ටර් එකක්, අත් ට්‍රැක්ටරයක්, ලොරියක් තිබෙනවා. ඉතින් මේ වාගේ වන කොට කියන්න බැහැ රටේ ජනතාව දුප්පත්කමෙන් ඇද වැටිලා ඉන්නවායි කියලා. ඇත්තෙන්ම රටේ ජනතාව යම් කිසි සංවර්ධනයක් කරා ගෙනිහිල්ලා තිබෙන එක පිළිබඳව අපට සන්තෝෂ වන්නට පුළුවන්. ඒ අයගේ ආර්ථිකය ශක්තිමත් වෙලා තිබෙනවා. ආර්ථිකය ශක්තිමත් කරන්න රජයෙන් පුළුවන් තරම් දිරි දීම් මේ අයට ලබා දීලා තිබෙනවා. සහන ක්‍රමයට පොහොර ලබා දීලා තිබෙනවා. දැන් වසර හය හතක කාලයක සිට පොහොර සහානාධාරය ලබා දෙනවා. පොහොර සහනාධාරය මුලින්ම ලබා දෙන කොට විරුද්ධ පාර්ශ්වය -එක්සත් ජාතික පක්ෂය සහ විරුද්ධ කණ්ඩායම්- සඳහන් කළේ, "මේක කී දවසක් දෙයිද දන්නේ නැහැ" කියලායි. නමුත් අතිගරු ජනාධිපතිතුමා බලයට පත් වෙලා මේ වන කොට වසර හතකට ආසන්න කාලයක් වනවා. එතුමා දෙවන වතාවටත් එම ධුරයට පත්ව සිටිනවා. පොහොර සහනාධාරය තවමත් සතයකින්වත් අඩු කළේ නැහැ. ඊටත් වැඩියෙන් එළවලු වගාවට සහ පොල් වගාවටත් පොහොර සහනාධාරය ලබා දීමට කටයුතු කරනවා. පසු ගිය දවස්වල පොල් නිෂ්පාදනය අඩු වෙලා ඒ ආර්ථිකය කඩා වැටෙන මට්ටමකට පත් වුණා. ඒ නිසා පොල් වගාව ශක්තිමත් කරන්න තරාතිරම නොබලා, දුප්පත් පොහොසත් කියලා බලන්නේ නැතුව ඒ අයටත් සහන ක්‍රමයකට, රුපියල් 1,000ක් වැනි මුදලකට පොහොර සහනාධාරය ලබා දෙන්නත් දැනට කටයුතු කරලා තිබෙනවා. මේවා තමයි දිරි දීම්. එහෙම නැතිව වැටුප රුපියල් දෙදාහකින් වැඩි කිරීම හෝ නැත්නම් තවත් රුපියල් දහදාහක් ලබා දීම හෝ නොවෙයි. මෙලෙස ජනතාවට සහන ලබා දීම තුළින් ඒ අය සන්නද්ධ කළොත්, වැඩිදියුණු කළොත් තමයි ඔවුන් ශක්තිමත් කරන්න පුළුවන්කම ලැබෙන්නේ; ආර්ථිකයෙන් ශක්තිමත්ව ඒ අය ඉදිරියට ගෙන යන්න පුළුවන්කම ලැබෙන්නේ; රටක් සංවර්ධනය කරන්න පුළුවන්කම ලැබෙන්නේ.

ඒ වාගේම අද ඉදිරිපත් කරලා තිබෙන පනත් කෙටුම්පත් හා සංශෝධන පනත් කෙටුම්පත් තුළින් සාමාන්‍ය ජනතාවට ඒ තරම් රිදෙන්නේ නැති වන විධියට, ඒ ජනතාව තැළෙන්නේ නැති වන විධියට සහන ක්‍රම ඇති කර තිබීම පිළිබඳවත් අපි ඇත්තටම සන්තෝෂ වනවා. ඒ තුළින් ජනතාවට විශාල සේවාවක් සිදු වන බවත් අප දන්නවා.

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Thank you. The next speaker is the Hon. (Dr.) Harsha de Silva. Before his speech, will an Hon. Member propose the Hon. Alhaj A.H.M. Azwerr to take the Chair?

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena)

I propose the Hon. Alhaj A.H.M. Azwer do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. ALHAJ A.H.M. AZWER *took the Chair.*

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Hon. (Dr.) Harsha de Silva, you may commence your speech now.

[අ. භා. 4.07]

ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

Hon. Presiding Member, today it is going to be a fairly boring presentation. But, I want to make some technical points on one of the supplements presented today on the Telecommunication Levy Bill. First of all, I must commend the Government for reducing the tax burden on mobile phones from 30 to 20 per cent. In fact, the tax was more than 30 per cent because there was a tax on tax, which was something like 31.3 per cent. So, now, that has come down to 20 per cent, which is a good thing. What has actually happened is that the distortionary Mobile Subscriber Levy, the Environmental Conservation Levy, NBT and all those other taxes that got added to the VAT has now been removed. So, there is a straightforward 20 per cent tax now. But, the catch is that, that 20 per cent is VAT exempt. Therefore, I am planning to present here some points that perhaps might be good to reconsider next time when this is proposed.

There are always two sides to a story. Earlier when there was the VAT on telecommunication services, the operators were able to claim the input VAT. Now, the significant change is that you cannot claim the VAT paid on inputs. Of course, you can claim only on the

telecommunication-related hardware which anyway was exempted in the previous scenario. Now, what has happened is, on all expenditure made by the telecommunication operators, whether it be on any kind of service, research or marketing and so on, you cannot claim the VAT. The impact of this, Hon. Presiding Member, has been estimated by the industry to be something like Rs. 6 billion. Now, according to the Treasury, it is something like Rs. 15.5 billion. So, I believe the impact will be somewhere in the middle. One could ask “Why, what is the problem? Telecommunication companies are making money. Everybody has a mobile phone; those are ideal to be taxed”. So, it is becoming like the tax on liquor and cigarettes. The telecommunication companies have now become easy targets for revenue collection for the State. So, the question is “What is the problem?” The problem, Sir, is the ability to invest for these companies. If you have to pay more to the Government in terms of taxes, what it really means is that there is less leftover to invest.

Now, let us analyse the situation. The industry is already very competitive; prices have fallen significantly. In fact, Sir, Sri Lanka has one of the lowest mobile tariffs in the world. But, such fierce competition has also created problems in the industry and if you take the industry as a whole, you would not disagree with me that there has been a lot of bleeding going on. To give you an example, there is a particular telecommunication company right now - I will not name the company - which is selling SIM cards for Rs. 25 and with that Rs. 25 SIM card, you get Rs. 75 of free telephone calls. Look at the desperation of this company. So, you get Rs. 75 free for Rs. 25 that you pay. Obviously, any right-thinking person will say “Well, this is not sustainable” and it is not sustainable. But, the desperation is such that to grab market share, you will do anything you can in this fiercely competitive environment.

So, there are two sides to this story. I will not disagree that telecommunications must be made affordable; we have made telecommunications affordable to a great extent. Like I said, I commend the work that has been done thus far. But, the other side of the coin is that, at what cost do we do this? So, here, I think there is a fine balance where the regulations become very important: regulation on market entry, regulation on the allocation on things like spectrum, frequencies, regulation on tariffs, regulation on unfair competition and so on.

So, the point is by an arbitrary change in the tax treatment for the industry, the repercussions are going to be enormous and I am very serious about this. The repercussions are not going to be felt only by the telecommunication industry but by the economy at large. The reason is that the telecommunication industry has today become a driver for the entire economy and people depend on their mobile phones.

Mobile phones have made transaction costs fall; mobile phones have made the economic functioning more efficient. Telecommunications have made production more productive. So, if you create problems in the telecommunication industry, then the domino effect will be felt by the entire country. So, what we need to consider is the principles of taxation. Those must be adhered to at all times. One of the key points is, tax policies must not be arbitrarily changed. We all know that the Tax Commission consisted of some brilliant people in this country headed by Professor W.D. Lakshman. They have done a pretty good job. But, I must be critical of this fact. The arbitrary change of the treatment of taxation to the telecommunication industry will have negative impacts. When an investor comes, he is told, “This is the tax treatment that you will have to face in the industry". Several months or years down the road, suddenly this tax treatment is changed. Then, what happens? That is where the problem is. Investors must be able to have a sense of certainty. You have to be able to invest your money, not just to make profits tomorrow like in the stock exchange, but over a period of time. Therefore, they have to have a sense of stability and a sense of fairness in the way they are treated by the government with reference to taxation. What we see here is not that. As I said, I believe that this arbitrary change in tax will have a negative impact not just on the industry but beyond that.

Let us look at the fact of the matter. According to the Telecommunications Regulatory Commission, there are about 17 million subscribers as of today. But, I think it would be more appropriate to say that 17 million SIMs are in use. As you know, people now use more than one mobile phone. They have more than one SIM. So, it does not mean that 17 million people have mobile phones, but there are 17 million SIMs in use. It is a great achievement. We have 20 million people out of which 17 million SIMs are in use.

While that is true, what we need to look at is beyond voice telephony. That is broadband. It is becoming an essential utility like gas, water or electricity. Sir, in the developed world, we see what is called "Fixed Broadband". You have a cable to the home. You have television, internet and telephone, all coming through in one big tube to homes. But, that is not what we see in the developing world. What we see in the developing world, particularly in this part of the world, is mobile broadband. A thinktank that I have been associating for a long time - LIRNEasia - has been working on this area for a long period of time. I want to share with you, Hon. Presiding Member, a blog entry made by a young researcher by the name of Ayesha Zainudeen yesterday. She says, I quote:

> “Are Asia’s poor on the Internet without even knowing it?”

What she says is, if you ask poor people in this part of the world, “Do you use internet?” they would say, “Not really”.

[ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා]

According to that research done about two years ago, only 9 per cent of the people whom she interviewed, what she calls the "Bottom of the Pyramid", said that they use the internet. But, the interesting par of that finding is, 78 per cent of that same sample use functions of the internet via the mobile. So, what matters is not that you use the internet, but you in fact use the services you have got to get through the internet. She further goes on to say, I quote:

"For the last three years, LIRNEasia has been arguing the case that many people in developing markets will have …. their first 'Internet experience' through a mobile. Most of our 2008-2010 research program was based on this premise.

It seems that the general discourse in the mobile research field is converging on this point, as evidence of growing mobile Internet use in these markets emerges."

So, you can see, Hon. Presiding Member, that this is very important. If we are to create greater efficiencies in the economy, there must be greater investments in services more than just mobile voice. Now, everybody has access to voice, as I said. Even the previous speaker said that even in the village, everybody pretty much has a mobile phone. But, Sir, we have to go to the next level. That is what is important. She further says, I quote:

"…LIRNEasia's argument (which in fact CEO & Chair Rohan Samarajiva has been making from as early as 1999….) goes one step further. We don't mean that people in these markets will be opening up their mobile Web browser, typing in urls and surfing the mobile Internet."

Sir, this is a very important point. You do not expect poor people to go to their mobile web browser and type in URLs, because that will not necessarily work. Furthermore, she says, I quote:

"We argue that that the 'Internet' should be considered as a meta-medium, which allows users to perform various functions that we usually consider to make up the 'conventional' Internet experience. In the most simplistic form, these functions include:..."

Then, she goes on to suggest communication in multiple forms, information retrieval including search, publication, transactions and so on.

Now, very interestingly, there is a chart here, which shows that out of the people who use meta-medium Internet, 71 per cent use mobile phones for transactions and 20 per cent of them use it for remote computing. You think about transactions and remote computing made use of by a large number of poor people.

We want to develop this country. So, usually, I will talk about macroeconomic policy, taxes and all that but today, I am speaking of a micro issue as to how to improve the efficiency of people's work and how to reduce the cost of transactions. That is important. So, here, what do we mean by transactions? It is interestingly theuse of electronic reloading of prepaid balances and things like that. So, you do not have to walk to the grocery store to get a reload on your phone. You can do it electronically now. That is done through the internet. Then, what is remote computing? It states that it is driven by prepaid balance checking. So, all these need large investments by the operators in order to provide these services.

Then, there is another very interesting study. This was presented at a special forum organized by the Sri Lanka Institute of Marketing a couple of weeks ago on the "New Mod-tradi Consumer". Mod-tradi Consumer is the Modern Traditional Consumer, a new breed of consumer that we see today in our society and that was presented by "The Nielsen Research Agency". According to that, 14 per cent of people in the age group of 15 to 16 use the internet. But, if you look at people in the age group of 15 to 25, 26 per cent of them use the internet regularly. So, across this country young people are using the internet, logging on to Facebook, downloading news, interacting with their friends, creating networks, making life fun and also in the process of - if they are entrepreneurial - making money also. That is helping this economy grow. Why I am passionately arguing for the removal, if at all possible at least the next time, of this arbitrary change in tax policy is because it is going to be difficult for the operators to continue to make investments that are necessary to graduate from just simple plain vanilla-type voice telephony to what we want to get to - applications, broadband, mobile internet, that kind of services.

Sir, large amounts of Foreign Direct Investments have come into this telecommunication sector. I will read out the figures related to telecommunications investment in Foreign Direct Investments, which I got yesterday from the BOI. Then, you will realize, Sir, how skewed investments have been in this country in the telecommunications field. In 2005, we had US Dollars 287 million of Foreign Direct Investments and of that, US Dollars 112 million or 39 per cent came into the telecommunications sector. In 2006, it was 44 per cent. In 2007, it was 55 per cent. In 2008, when we had the highest Foreign Direct Investments of US Dollars 889 million, US Dollars 553 million or 62 per cent came to the telecommunications sector. In 2009, it was 49 per cent and even when we had dropped to an estimated US Dollars 516 million of Foreign Direct Investment in 2010, 38 per cent or US Dollars 205 million of the entirety of our Foreign Direct Investment came to the telecommunications sector. So, I think I have been able to convince you that the bulk of the Foreign Direct Investments that have come to this country have come to this particular sector.

Now, the issue is, what will happen in fact to the actual volume of Foreign Direct Investments coming to the sector because of the laws you are going to pass today? That is the question. You are not giving the certainty that is expected by the investors by passing

this amendment to the Bill today. You speak to anybody in the industry and they will say, "We are going to think about investing in this sector in the future". Even people who have got approvals for investments are now saying, “No, we are not going to make investments because this is a ridiculous state of affairs". Today we are being told one, tomorrow we will be told another. That is not what investors require. So, if that happens, how are we going to get the required investment into the sector? How are we going to increase the availability and the penetration of broadband? How are we going to increase the access and the speed of mobile internet? How are we going to make all these dreams come true? More than anything else, how are we going to meet the objective in the "Mahinda Chintana Idiri Dekma" about creating a knowledge-hub in Sri Lanka? In order to do that you have to have a proper, well-regulated tax regime and a regulatory regime for the telecommunications industry.

Now, I want to make a few references to some relevant points.

There was a tender recently to build a National Backbone Network. That is to expand the footprint of fibre optic cables in Sri Lanka. But, there was a Cabinet decision on the 9th February, 2011, by which, suddenly the procurement process was cancelled. I have that draft Cabinet Decision with me and I would table* it to be included in Hansard.

Not only was the procurement process cancelled in the midst but also, the Cabinet recommended that the Telecommunication Regulatory Commission negotiate with Sri Lanka Telecom PLC and offer them the project. So, this kind of treatment is actually bad for investor-confidence; people want confidence, people want certainty. If a tender has been called and so much of money has been spent on preparing and bidding for it, you need not cancel it half way. That is not good governance. In fact, I would venture to say that it is bad governance. There is an irony behind it, Sir. It happened a couple of weeks ago, in February, 2011. When we heard the story that the Government was going to borrow money and build this broadband network, I wrote an article somewhere in October, 2007, more than three and a half years ago, and said, do not waste public money on telecommunication infrastructure, and proposed that what you actually need to do is to regulate shared access of available fibre optic network of Sri Lanka Telecom PLC. So, since 2007, Sri Lanka Telecom PLC has been increasing their fibre optic network even to Jaffna, Trincomale and Batticaloa from what I understand. After all this is done, the Cabinet says, “Go back to the original proposal made by the Hon. (Dr.) Harsha De Silva in 2007”. So, we do not have to go through this whole rigmarole, come back and say, look, why do you not do what has been proposed three and a half years ago?

*** කථාව අවසානයේ පළ කර ඇත.**
** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of speech.*

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Hon. Member, I am sorry to disturb you. Your speech is quite interesting, but your time is up now.

ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

I am coming to the end. There are multiple examples of this kind of cancelling tenders and so on and that is not positively viewed by the investors.

Finally, I want to take one case. I have many but because of lack of time I cannot take them up. Take the case of the purchasing of the American GE Locomotives. In 2009, the Cabinet appointed a Tender Board. The Tender Board recommended that the locomotives from a company called Electro-Motive Diesel, Incorporation be purchased. That was in 2009 and in February 2010, the Cabinet effectively cancelled it. In July 2010, the Secretary to the Ministry of Finance and Planning, Dr. P.B. Jayasundera, wrote to the US Ambassador saying that there was no intention of purchasing those US locomotives. In fact, I have that letter written by the Secretary to the Ministry of Finance and Planning to the US Ambassador here with me and I would like it to be included* in Hansard.

The funny thing, Hon. Presiding Member, is that a politically-appointed Ambassador had said that he was bringing in a group of investors from the United States. That made them get that tender. It was made possible for those new investors selling the same equipment, which, just a few months ago, had been said there was no need for, to actually get that contract.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Your time is up.

ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

Sir, I am going to wind up my speech now.

My point is that there is no consistency in this. The Government must take a particular stand and the investors must be given confidence so that they can make long-term decisions.

To sum up, Sir, I must say that taxes must be fair and equitable and the basic principles of governance must be adhered to. So, I urge the Government to reconsider the arbitrary change in the tax treatment of the telecommunication sector so that the industry can continue to make further investments.

Thank you.

*** කථාව අවසානයේ පළ කර ඇත.**
** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of speech.*

සභාමේසය මත තබන ලද ලියවිලි:
சபாபீடத்தில் வைக்கப்பட்ட ஆவணங்கள்:
Documents tabled:

අමාත්‍ය මණ්ඩල කාර්යාලය
அமைச்சரவை அலுவலகம்
OFFICE OF THE CABINET OF MINISTERS

Republic Square, Sir Baron Jayathilaka Mawatha, Colombo 01.

11/0261/501/002

11 FEB 2011

Mr. Lalith Weeratunga
Secretary to the President
Fax: 2472100

DRAFT CABINET DECISION

Given below is an extract of Item (06) of the Minutes of the Cabinet Meeting held on 09.02.2011. These Minutes are to be confirmed at the next Cabinet Meeting.

Item (06)

Cabinet Paper No.11/0261/501/002, a Memorandum dated 02.02.2011 by the President on "National Backbone Network" - (Cabinet decision dated 17.06.2009 on CP No.09/0940/301/019 refers) the above Memorandum was considered along with the observations of the Minister of Finance and Planning and the letter No. SB/5/1/ICTA/NBP dated 08.02.2011 by the Secretary to the President and subject to these observations and inclusion of the recommendation indicated in the said letter, approval was granted to authorize the Telecommunication Regulatory Commission of Sri Lanka (TRCSL) to negotiate with Sri Lanka Telecom PLC to provide broadband connectivity facility to other users on equitable terms and at affordable prices.

Approval was also granted to authorize TRCSL to discontinue the on going procurement process to build a National Backbone Network.

It was further decided that TRCSL and Sri Lanka Telecom should discuss with relevant authorities of the Ceylon Electricity Board (CEB) to explore the possibility of harnessing their infrastructure facilities for the purpose indicated in the Memorandum.

Action by: Secretary to the President - observations of the Minister of Finance and Planning annexed.

Copied to: My/Finance and Planning
My/Telecommunication and Information Technology - copy of Memorandum, above observations and copy of letter of the Secretary to the President annexed.
My/Power and Energy - copy of Memorandum, above observations and copy of letter of the Secretary to the President annexed.

S. Abeysinghe
Secretary to the Cabinet of Ministers
11th February 2011

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் அமைச்சு
MINISTRY OF FINANCE AND PLANNING

The Secretariat, Colombo 01
Sri Lanka

Fax (94)- 11 - 24
Website www.treasury.gov.lk

PFD/DM/104-31-12 Your No. Date 05.07.2010

13 JUL 2010

07 JUL 2010

Ms. Patricia A. Butenis,
HE the Ambassador of the United States of America
Colombo, Sri Lanka.

Dear Madam,

I refer to your letter of 2010 June 15th on the supply of Diesel Electronic Locomotives for Sri Lanka Railways.

I regret to inform you that in the present circumstances there is no intention to go ahead with the purchase of 15 locomotives as current supply appears to be adequate. Should the need arise in future, we would certainly look for the US assistance if our requirement could be met.

In the mean time if there is any possibility of arranging finance form US EX/IM Bank to support procurement for the maintenance of available locomotives, we would certainly like to arrange a discussion with the Ministry of Transport.

Thank you,
Yours Sincerely,

P.B. Jayasundera
Secretary
Ministry of Finance and Planning

CC: Secretary, Ministry of Transport.

[අ. භා. 4.35]

ගරු තිලංග සුමතිපාල මහතා
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)
නමෝ බුද්ධාය!

අද දින මෙම විවාදයට සම්බන්ධ වෙලා යම් කිසි අදහසක් ඉදිරිපත් කරන්නට මට අවස්ථාව ලබා දීම ගැන මා ප්‍රථමයෙන්ම ස්තුති වන්ත වෙනවා. මීට කලින් විපක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් දෙදෙනෙක් කථා කළා. ඒ කථාවල දී සඳහන් කරපු කරුණු කිහිපයක් මතක් කළ යුතුයි. එකක් තමයි අපේ EPF එක, ETF එක ආයෝජනය කිරීම.

ඒ ගැන විශාල වශයෙන් කථා කළා. මා එයට සවන් දුන්නාට පස්සේ මට කල්පනා වුණා, එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරන එම මන්ත්‍රීතුමා මොකක්ද කියන්න බලාපොරොත්තු වුණේ කියලා. මොකද, විශේෂයෙන්ම පසු ගිය අවුරුදු පහ ගැන බැලුවොත් අර්ථ සාධක අරමුදල -EPF එක- කරන ලද කොටස් මිලදී ගැනීම, එහෙම නැත්නම් කරන ලද ආයෝජනය මේ වන කල් කිසි සේත් අසාර්ථක වෙලා නැති බව පෙනෙනවා. සියලුම ආයෝජනවලින් විශාල ආදායමක් ලැබිලා තිබෙනවා. ඒ වාගේම එම ආයෝජනය කරන ලද මුදල් සඳහා පොලී අනුපාතය ගණනය කර බැලුවත්, හරියටම ඒ පොලී මුදල සාධාරණව ලැබිලා තිබෙන බව පෙනෙනවා. එහෙම ආයෝජනයක් කළාම -තමන්ගේ ප්‍රතිශතය සියයට 10ක් වන්නට පුළුවන්. ලංකාවේ කිසිම ආයතනයක EPF එකේ කොටස් ප්‍රතිශතය සියයට 15 ඉක්මවා නැහැ. සියයට 10ක් වන්නට පුළුවන්.- ඒ තමන්ගේ ආයෝජනය සුරක්ෂිත කර ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජනය කිරීම සාමාන්‍ය සම්ප්‍රදායක්. ලෝකයේ ඕනෑම තැනක ආයෝජකයා තමන්ගේ කොටස් නියෝජනය කිරීම සාමාන්‍ය දෙයක්.

රටේ ආර්ථිකය පැත්තෙන් බැලුවොත් අපි trade deficit එක ගැන කථා කරනවා. අය වැයේ වෙනස ගැන, අය වැය පරතරය ගැන කථා කරනවා. අපි මේ මුදල් කොටස් වෙළෙඳ පොළ තුළින් ආයෝජනය කළේ නැත්නම්, මේ මුදල් කොහේ ගිහිල්ලාද මේ රජය ආයෝජනය කරන්නේ? අද ලෝකයේ රටවල් ගණනාවක් අපට උදාහරණ වශයෙන් දක්වන්නට පුළුවන්, මේ මුදල් තම රට තුළ ආයෝජනය කර ගන්නට බැරිව ඒ මුදල් වෙනත් රටවල රජයේ කොටස් වෙළෙඳ පොළවල් තුළ ආයෝජනය කරන බවට. ඒ නිසා වර්තමානයේ ඉතා බුද්ධිමත්ව, ඉතාම අවස්ථානුකූලව කරපු ආයෝජනයක් හැටියට තමයි අපි මෙය දකින්නේ. බැංකු පද්ධතිය තුළ හිටපු කෙනෙකු හැටියට හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා ඒ ගැන අමු අමුවේ විවේචනය කිරීමේ වුවමනාවෙන්, කිසිම සාධාරණ නැති විවේචනයක් කිරීම ගැන අපි කනගාටු වනවා.

ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා telecommunication sector එක ගැන, broadband ගැන කථා කළා. මා කියන්න කැමැතියි, එක්සත් ජාතික පක්ෂ රජය කාලයේ මා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ සභාපති හැටියට සිටින කොට අපි EPF එකට ගිහිල්ලා කිව්වා, කරුණාකරලා කොටස් ගන්න කියලා. මොකද, එදා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය කොටස් වෙළෙඳ පොළට යන කොට EPF එක මුදල් ආයෝජනය කළේ නැත්නම්, ටෙලිකොම් ආයතනයේ කීර්ති නාමය කොටස් වෙළෙඳ පොළේ වර්ධනය කර ගන්නට බැරි වනවා; ඒ පිළිබඳව අපට හොඳ පණිවුඩයක් දීගන්න බැරි වනවා. මොකද, EPF එකටත්, ETF එකටත් අපේ ආයතනය තුළ ආයෝජනය කරන්නට බැරි නම් - invest කරන්නේ නැත්නම්- අපට ඒ වෙලාවේ කොටස් සියයට 12 අලෙවි කර ගැනීමේ ප්‍රශ්නයක් වෙනවා. මම එහෙම කියන්නේ ටෙලිකොම් ආයතනය රජයේ ආයතනයක් වෙලාත්, එක්සත්

ජාතික පක්ෂ රජය කාලයේත් EPF එකෙන් ඉල්ලීමක් කළා, - රජයෙන්- කරුණාකර කොටස් වෙළෙඳ පොළට ඇවිත් කොටස් ලබා ගන්න කියලා. ඒක නිසා කාලයෙන් කාලයට වෙනස් වන ප්‍රතිපත්තිවලට යන්න එපා. මීට පැය ගණනකට ඉස්සර කථා කරපු රවි කරුණානායක මන්ත්‍රීතුමා කිව්වා, telecommunication බදු සියයට 20ක් කිරීම වැඩියි කියලා. හැබැයි හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා අවංකව කිව්වා, සියයට 30කට වඩා, සියයට 31ක් පමණ තිබුණු බද්ද අඩු වෙලා තමයි සියයට 20ක් වෙන්නේ කියලා. නමුත් එතුමා අර්ථ කථනය කරන්නට ගියේ තාක්ෂණය පැත්තෙන් මේ broadband කියන එක පුළුල්ව ආයෝජනය කළේ නැත්නම් අනාගතයේ දී අපට බලපාන දේ ගැනයි. එතුමා සිතන දේ ගැන අපි සන්තෝෂ වනවා. නමුත් ආයෝජකයෙක් ලංකාවට එන්නේ, ඒ අය මුදල් වැය කරන්නේ ඇයි? එතුමාම කිව්වා 2006, 2007, 2008, 2009 ගත්තාම ඇමෙරිකන් ඩොලර් මිලියන 200කට වැඩි ප්‍රමාණයක් විදේශිකයන් ආයෝජනය කරලා තිබෙනවා කියලා අපේ මේ telecom sector එකට. ඒ පෞද්ගලික අංශයේ සියලුම අය එන්නේ ඇයි? ඒ අය මුදල් වැය කරන්නේ කොහොමද? ඒ අය market research එකක් කරලා, feasibility study එකක් කරලා බලනවා, මේ සඳහා ආයෝජනය කරන මුදල ගන්න පුළුවන්ද කියලා. මේවා රජයේ මුදල් නොවෙයි. විශේෂඥ දැනුම තිබෙන අය පෞද්ගලික අංශවල ඉන්නවා, මේවාට අවශ්‍ය තොරතුරු ලබා දෙන්න. ඒ අය එහෙම ආයෝජනය කරන්නේ ඒ අයට ලාභයක් ලබා ගන්න පුළුවන් නිසායි. Broadband කිව්වාම, ඉස්සර තිබුණා GPRS කියලා එකක්. ඊට පස්සේ ජංගම දුරකථනවලට - mobile phonesවලට - EDGE කියන technology එක ආවා. ඊට පස්සේ 3G ආවා. දැන් 4G ඇවිල්ලා තිබෙනවා. 3G කියන්නේ තුන්වන පරම්පරාවයි. 4G කියන්නේ Fourth Generation එකටයි. මේ අලුත් තාක්ෂණය තුළ විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවෙන් -TRC එකෙන්- ටෙන්ඩර් කැඳෙව්වාම 3G එකට licence එක ගන්න ආවේ තුන් දෙනායි. ඒක විවෘත ටෙන්ඩර් පටිපාටියක්. ඒ අයට අවශ්‍ය spectrum එක ලබා දුන්නාම ඒ අය ඒකෙන් ආයෝජනය කළා. 3Gවලින් පස්සේ 4G ආවා. මුදල් තිබෙනවා නම්, හැකියාව තිබෙනවා නම් ඒ අයට පුළුවන් වන්න ඕනෑ, broadband එකට ආයෝජනය කරන්න. ආයෝජනය කරන කොට ඒ අය බලන්න ඕනෑ, මොන ක්ෂේත්‍රයකටද යන්නේ කියලා. අද මේ ප්‍රශ්නය තිබෙන්නේ ලංකාවේ විතරක් නොවෙයි. අපේ රටේ මිලියන 20කට කිට්ටු ජනගහනයක් ඉන්නවා. ලංකාවේ මිලියන 17ක් ජංගම දුරකථන තිබෙනවා. ඒක සාමාන්‍ය දෙයක්. හොංකොංවල ජනගහනයට වඩා සියයට 25ක් ජංගම දුරකථන තිබෙනවා. සමහර රටවල ජනගහනයට වඩා වැඩියෙන් ජංගම දුරකථන තිබෙනවා. එවැනි රටවල් පොඩියි, නමුත් ජනගහනය වැඩියි. මුදල් ආයෝජනය කරන කොට හැම දෙනාම බලන්නේ කෙටි කාලීන ආයෝජනයන් කරලා ඉක්මනට මුදල් සොයන්නයි. දැන් මෙහිදී සියයට 30ක් වශයෙන් තිබෙන බද්ද සියයට 20 දක්වා අඩු කළා කිව්වාම, ඒක බදු වැඩි වීමක් කියලා අනුකථනය කරනවා නම් ඒක වැරැදියි. දක්ෂතාව තිබෙන, තාක්ෂණය ගැන අවබෝධයක් තිබෙන ආයෝජකයින්ට නිවැරැදි මාර්ගයක යන එක මේකෙන් සුරක්ෂිත වනවා.

Fixed line කියන එක ගැන අපි කල්පනා කරලා බැලුවොත්, ඉස්සර desktop තිබුණා. ඊ ළඟට laptop ආවා. දැන් බහුතරයක් යන්නේ tablet market එකටයි. දැන් මේ tablet කියන එකේ තිබෙන්නේ iPad, එහෙම නැත්නම් ඊට සමාන්තර පුළුල් වැඩ කරන්න පුළුවන්, desktop එකේත් නොවන, laptop එකේත් නොවන, ඒ අතර යන එකක්. ඉතින් මේකට ජංගම - mobile - දුරකථන සමාගම් දැන් විශේෂ අවධානයක් යොමු කරලා තිබෙනවා. මොකද, දැන් විශාල වශයෙන් මිලියන ගණනාවක් iPad වාගේ දේවල් නිෂ්පාදනය කරන නිසා ඒකට විශාල ඉල්ලුමක් තිබෙනවා. ජංගම දුරකථන හෝ ස්ථිර දුරකථන - fixed lines - සමාගම් මේ ගැන හිතුවේ නැහැ. එම නිසා ඒ අය දැන් තමන්ගේ ආයෝජනය වෙනස් අතකටයි ගෙන යන්නේ. මේක තාක්ෂණය පිළිබඳ ප්‍රශ්නයක්. අලුත් තාක්ෂණයත් එක්ක ඉල්ලුමට සාපේක්ෂව සැපයුම කරන එකයි ඒ අයට මුහුණ දෙන්න තිබෙන ගැටලුව.

රජයක් හැටියට වග කීමක් ඇතිව, සැලැස්මක් ඇතිව ගිය ගමනක් තමයි ලංකාවේ තිබෙන්නේ. අපි ඒ ගැන සන්තෝෂ වන්න ඕනෑ. අද ඒක කොහොම විග්‍රහ කරන්න බැලුවත්, අපේ හැම පාසල් දරුවකුටම පරිගණකයක් ලබා දෙන්න අපි බලාපොරොත්තු වනවා. ඒ පරිගණකයෙන් අන්තර්ජාලයට සම්බන්ධ වන්න පුළුවන් backbone එකක්, ජාලයක් - network එකක් - අවශ්‍ය වනවා. ඒ ජාලයේ මූලික අවශ්‍යතාව වශයෙන් රජය ඒ පහසුකම් ලබා දීලා විවෘත කරලා තිබෙනවා. මුලින් ලංකාවේ ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට විතරයි, backbone එක තිබුණේ. දැන් ඒක පෞද්ගලික අංශයටත් විවෘත කරලා ඒ අයටත් අවස්ථාව ලබා දීලා තිබෙනවා. එම නිසා මා හිතන හැටියට තාක්ෂණය පැත්තෙන් හිතුවත්, ඊ ළඟ පරම්පරා අවශ්‍යතා ගැන බැලුවත් රජයක් හැටියට ඉතාම පැහැදිලි වැඩසටහනකයි අද අපි ඉන්නේ. එම නිසා මා කනගාටු වනවා, සමහර මන්ත්‍රීවරුන් තාක්ෂණය ගැන අවබෝධයකින් තොරව කථා කිරීම ගැන. මා පෞද්ගලිකව විශ්වාස කරනවා, අපේ දුරකථන, ජංගම දුරකථන යන මාර්ගය නිවැරැදියි කියලා.

ඒ විතරක් නොවෙයි. අපේ රූපවාහිනිය - television - වැනි සියලු දේ digital ක්‍රමයට වෙනස් වෙමින් පවතින්න ඕනෑ. ඒ තුළිනුත් අපට අවස්ථාවක් ලැබෙනවා, interactive television මඟින් ගෙවල්වල ඉඳ ගෙන ආමන්ත්‍රණය කරන්න, කථා කරන්න, අනික් අයත් එක්ක සංවාදශීලී වන්න, හැම අයත් එක්කම සම්බන්ධ වන්න. ඉතින් මේක ජංගම දුරකථනයේවත්, ස්ථිර දුරකථනයේවත් දෙයක් නොවෙයි. ඒ අතර මැද අලුත් ගමන් මඟක් ලැබෙන අවස්ථාවක්. රජයක් හැටියට අපි මේකටත් සැලසුම් කරලා, අවශ්‍ය spectrum එක, එහෙම නැත්නම් ඒ අවශ්‍ය ජාලය පිළිබඳව වෙනමම වැඩසටහනක් සකස් කර තිබෙන යුගයකයි අද අපි ඉන්නේ. ඒ නිසා පැහැදිලි වැඩසටහනක් එක්ක යන රජයක් හැටියට අපි ඒ ගැන සන්තෝෂ වෙනවා.

ඒ වාගේම අද මේ විවාදයට ලක් වෙන හැම කරුණක්ම දැනට මාස කිහිපයකට කලින් අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා මුදල් ඇමතිතුමා හැටියට මේ ගරු සභාවට ඉදිරිපත් කරපු ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කොටස්. මෙය ඒ කොටස්වල ක්‍රමක්‍රමයෙන් මේ රට අවුරුදු පහක මධ්‍යම සහ දීර්ඝ කාලීන වැඩසටහනක, ඒ වාගේම කෙටි කාලීන වැඩසටහනක කොටස් හැටියට අවුරුදු දෙකේ තුනේ ඉදිරියට යන වැඩසටහනක්. අය වැයකින් කරන්නේ මොකක්ද? එය පස් අවුරුදු සැලැස්මේ, දස අවුරුදු සැලැස්මේ mirror එකක්ය කිව්වොත් නිවැරදියි. අවුරුද්දකට වරක් අය වැයකින් ඉදිරිපත් කරන්නේ ඒ අවුරුද්දේ අපේ මුදල් ගනුදෙනුව නොවෙයි. මේ රටේ අධ්‍යාපන පද්ධතිය වෙන්න පුළුවන්, තාක්ෂණය වෙන්න පුළුවන්, එහෙම නැත්නම් අපේ වරාය පද්ධතිය හෝ අද මේ කතා කරන විෂය වෙන්න පුළුවන් අපේ මේ ගමන් මගේ අවුරුදු දහයක් අපි යන ගමන නම් ඒකේ අවුරුද්දෙන් අවුරුද්ද යන කොටස් තමයි අපි මේ ඉදිරිපත් කරන්නේ. ඒ නිසා අද මේ සංවාදයට ලක් කරන, විවාදයට ලක් කරන සියලුම කරුණු ප්‍රගතිශීලී රජයක් හැටියට, දීර්ඝ කාලීනව යන ගමනේ කොටස්. ඒ නිසා අද විපක්ෂය අපොහොසත් වෙලා තිබෙනවා. මොකටද? මෙම කරුණු ගැන අවංකව ඒ අය දන්නවා. මේවා හරිය කියා ඒ අය දන්නවා. ඒ අය කනගාටු වෙනවා, මෙවැනි ක්‍රියාත්මක වැඩසටහනක් ඒ අයට ඉදිරිපත් කරන්න බැරි වෙච්ච එක ගැන. ඒ නිසා කිසිම සාධාරණයකින් තොරව මේවා විවේචනය කරනවා, ඒවා සාධාරණීකරණයක් කරන්න බැරිව. අද උදේ ඉඳලා විපක්ෂය උත්සාහ ගත්තු දේවල් ගැන බැලුවොත් මේ කරුණු ගැන අවංකවම එකඟතාවකින් ඉන්න ගමන් තමයි මේවාට පිළිතුරු දෙන්නේ කියලා පෙනෙනවා. අද

[ගරු තිලංග සුමතිපාල මහතා]

Ports and Airports Development Levy Bill එක සභාවේ අනුමතිය සඳහා ඉදිරිපත් කර තිබෙනවා. ඒ වාගේම Recovery of Loans by Banks (Special Provisions) (Amendment) Bill එක ගැන බලන්න. අපි *parate* execution ගැන ගිය වතාවේදී කිව්වා. ඒකෙදි අපි දැක්ක දේ තමයි ලක්ෂ 50ට අඩු ණයක් ගත්තු කෙනෙකුට බැංකුවෙන් තමන්ගේ දේපළ අයකර ගන්නේ නැතුව ඒ ණය ලබා දෙන්නේ කොහොමද කියන එක. මේක අපට පැහැදිලිවම අවශ්‍යතාවක් තිබුණ දෙයක්. ඒ, මිනිසුන්ගේ පෞද්ගලික දේපළවලට අත ගහන්නේ නැතුව කටයුතු කිරීම. ව්‍යාපාරයක් ආරම්භ කරන කොට බැංකුවකින් ණය දෙන්නේ ලාබයක් ගන්න බලා ගෙනයි. ඒ අය නිකම්ම ණය දෙන්නේ නැහැ. ඉතින් බැංකුවෙන් ඒ ණය දීලා පොලියක් අය කර ගෙන යම් කිසි විධියකට ව්‍යාපාරිකයාට ඒවා ගෙවා ගන්න බැරි වුණොත් පෞද්ගලික දේපොළ ඒ අය විකුණලා -මිලියනයක් එකහමාරක් වාගේ ණය මුදලක් වුණත් ගන්න ගියාම මිලියන 6, 7, 10, 15 තරම් වටිනා පෞද්ගලික දේපළ අඩු මුදලට විකුණලා- එතැන ව්‍යාපාරයක් බවට පත් කර ගන්නවා. ඒ නිසා අපි සන්තෝෂ වෙනවා, ප්‍රතිපත්තිමය වශයෙන් අප ගත් ඒ කාරණය ගැන. එක්සත් ජාතික පක්ෂය කැමැතියි *parate* execution එක මිලියන 50 දක්වා යනවා නම්. අපි ඒක මිලියන 5කින් පටන් අරගෙන මේ යන්ත්‍රණය ආරම්භ කරලා, කාලයක් ඒක මිනිසුන් අතරට යන්න ඇරලා ඊට පසුව ඕනෑ, ඒක වැඩි කරන තැනකට යන්න. නමුත් එහෙම වැඩි කරන්නේ නැහැ කියා රජය කියන්නේ නැහැ. ඉස්සෙල්ලා ලක්ෂ 50කින් පටන් අරගෙන අපි ඉදිරියට යන්න ඕනෑ. මේ අවස්ථාවේදී පැහැදිලිව කියන්න ඕනෑ, මෙය ආරම්භ කරන වෙලාවේ රජයේ බැංකුවලට විතරක් ණය දෙන්න - *parate* execution කියන එක රජයේ බැංකුවලට විතරක් දෙන්න- කියා තීන්දු කළා. නමුත් එවකට හිටපු එක්සත් ජාතික පක්ෂය තීන්දු කළා, පෞද්ගලික අංශයේ බැංකුවලට පවා ඒ අවස්ථාව ලබා දෙන්න. ඒක එහෙම නොවුණා නම් අපට අද *parate* execution එක අනික් -පෞද්ගලික අංශයේ- අයගේ තිබෙන monopoly එකට යන්න දෙන්නේ නැහැ. ඒ නිසා මේ අවස්ථාව ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා. ඒ වාගේම අපි විපක්ෂයෙන් ඉල්ලා සිටිනවා, මේ පනත් කෙටුම්පත් අනුමත කර ගන්න අවංකවම සහයෝගය දෙන්නය කියා.

[අ. භා. 4.49]

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - நீர்ப்பாசன, நீர்வள முகாமைத்துவ அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)

(The Hon. Nimal Siripala de Silva - Minister of Irrigation and Water Resources Management and Leader of the House of Parliament)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනත් කෙටුම්පත, බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන)(සංශෝධන) පනත් කෙටුම්පත, සුරාබදු (සංශෝධන) පනත් කෙටුම්පත, විදුලිසංදේශ බදු පනත් කෙටුම්පත, දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත සහ බදු අභියාචනා කොමිසම පනත් කෙටුම්පත සම්බන්ධයෙන් වූ නීති සම්පාදනයට අදාළව පවත්වන ලද විවාදයේදී ඒ සම්බන්ධයෙන් වැදගත් අදහස් ඉදිරිපත් කරන ලද ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ මැති ඇමතිතුමන්ලාට ආණ්ඩු පක්ෂය වෙනුවෙන් මා ස්තුතිය පුද කරන්න කැමැතියි.

ඇත්ත වශයෙන්ම මෙම කාරණා සියල්ලම අතිගරු ජනාධිපතිතුමා විසින් පසු ගිය අය වැය යෝජනා ඉදිරිපත් කරන ලද අවස්ථාවේදී ඒ යෝජනාවන්වල අන්තර්ගත කරන ලද කරුණුයි. ඇත්තෙන්ම ඒ අය වැය යෝජනාව මේ පාර්ලිමේන්තුවේ සම්මත වෙලා තිබෙනවා. එම අය වැය යෝජනාවන් ක්‍රියාත්මක කිරීම සඳහා -ඒ බදු අය කර ගැනීම සඳහා- මේ පනත් මේ ආකාරයෙන් සංශෝධනය කිරීම අවශ්‍ය වෙලා තිබෙනවා. නමුත් ප්‍රතිපත්තිමය වශයෙන් මේ යෝජනා සියල්ල අය වැය පිළිබඳව ඡන්දය විමසන අවස්ථාවේදී මේ ගරු සභාව විසින් අනුමත කරලා තිබෙනවා. ඒ නිසා මේ පිළිබඳව දීර්ඝ විවාදයක් කිරීම අනවශ්‍යයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බද්ද පිළිබඳව කථා කිරීමේදී මේ රටට අවශ්‍ය වරායන් හා ගුවන් තොටුපොළවල් නිර්මාණය කිරීමේ වගකීම මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ රජය විසින් භාර ගෙන තිබෙන බව මම කියන්න ඕනෑ. එදා රනිල් වික්‍රමසිංහ මැතිතුමාට කරන්න බැරි වුණු බොහෝ දෑ මහින්ද රාජපක්ෂ මැතිතුමා සහ එම රජය විසින් කරලා තිබෙනවා. රනිල් වික්‍රමසිංහ මහතාට සහ එතුමාගේ රජයට බැරි වුණා මේ රටේ ඒකීයභාවය ආරක්ෂා කරමින් මේ රටට සාමය අරගෙන එන්න. එතුමාගේ රජයට බැරි වුණා ප්‍රභාකරන්ව පරාජය කරන්න. ඒ කරුණු සියල්ල අපි කළා. එතුමාගේ ආණ්ඩු කාලයේත් දැන් ඔය විවේචනයට ලක් කරන හම්බන්තොට වරාය නිර්මාණය කිරීම සඳහා පිඹුරු පත් සකස් කරලා තිබුණා. නමුත් අර නොහැකියාවක තරම කෙසේද කියනවා නම් ඒ වරාය හදා ගන්න එතුමන්ලාට බැරි වුණා. ඔලුවිල්වල වරාය හදා ගන්න බැරි වුණා. කන්කසන්තුරේ වරාය හරියට හදා ගන්න බැරි වුණා. ඉතින් එක්සත් ජාතික පක්ෂ රජයට මේ රටේ ජනතාවට දායාද කරන්නට බැරි වුණු දේ තමයි අපේ ආණ්ඩුවෙන් දැන් ඉතාම නිර්මාණශීලී ලෙස මේ දායාද කරලා කටයුතු කරන්නේ.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා

(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)

(The Presiding Member)

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

අනතුරුව ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. ALHAJ A.H.M. AZWER *left the Chair, and* MR. DEPUTY SPEAKER *took the Chair.*

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)

(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා කියමින් සිටියේ එක්සත් ජාතික පක්ෂ පාලන සමයේදී ඔවුන්ට කරන්නට බැරි වුණු මේ රටේ සංවර්ධන වැඩ කටයුතු රාශියකට අපේ රජය අත ගහලා තිබෙන බවයි. ඉතින් මේ වැඩ කටයුතු කිරීමේදී වරාය සහ ගුවන් තොටුපොළවල් සංවර්ධනය කිරීම සඳහා විශේෂයෙන් අපට අරමුදලක් සකස් කර ගැනීමේ අභිප්‍රායෙන් තමයි මේ වරාය සහ ගුවන් තොටුපොළවල් සංවර්ධන බද්දක් අපි අය කරගෙන යන්නේ. රටක යටිතල පහසුකම් දියුණු කිරීම සඳහා ලබා ගන්නා බද්ද ඒ රටේ ආයෝජනය සඳහා අපි ලබා ගන්නා බද්දක්. මෙය අපි පරිභෝජනය සඳහා ලබා ගන්නා බද්දක් නොවෙයි. මේ තුළින් මේ රටේ යටිතල පහසුකම්වල දැවැන්ත ආයෝජනයක් අපි ඇති කරනවා. ඒ ආයෝජනය තුළින් විශාල වශයෙන් රැකී රක්ෂා අවස්ථාවන් ලැබෙනවා. විශේෂයෙන් ඔබතුමා කල්පනා කරන්න ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මත්තල දෙවැනි ජාත්‍යන්තර ගුවන් තොටුපළ ගැන. අද ලංකාවට පියාසර කරන සෑම ගුවන්

යානයකම අතිරික්ත තෙල් විශාල තොගයක් ගේන්න ඕනෑ, යම් හදිසි අවස්ථාවකදී අපේ කටුනායක ගුවන් තොටුපොළ පාවිච්චි කරන්න නොහැකි වුණොත් නැවත මදුරාසියට යාම සඳහා. එහෙම නැත්නම් අපේ රටින් බැහැර වුණු වෙනත් ගුවන් තොටුපළකට යාම සඳහා. ඒ නිසා අද එවැනි ගුවන් යානයක ගෙන යා හැකි cargo ප්‍රමාණය, මඟීන් ප්‍රමාණය යම් ආකාරයක ceiling එකක්, අඩු වීමක් තිබෙනවා. ඉතින් ඒ ගුවන් ගමන් වඩා ලාභදායී වන්නට ඇත්ත වශයෙන්ම තවත් දෙවැනි ගුවන් තොටුපොළක් ශ්‍රී ලංකාව තුළ තිබීමේ එක අදහසක් තමයි, මේ ගුවන් යානා ගමනාගමනය සඳහා වඩා හොඳ මධ්‍යස්ථානයක් බවට ශ්‍රී ලංකාව පත් කර ගැනීම. ඒ නිසා අපට මේ දැන් තිබෙන තත්ත්වය අනුව, ලෝක ගෝලයේ අපිට ලැබී තිබෙන සුවිශේෂ ස්ථානය අනුව, ඒ වාගේම දියුණු වන සංචාරක ව්‍යාපාරය අනුව අපට අනිවාර්යයෙන් දෙවැනි ජාත්‍යන්තර ගුවන් තොටුපොළක් අත්‍යවශ්‍යයි. ඒ අවශ්‍යතාව තමයි අපි මේ සපුරාලීමට කටයුතු කරන්නේ. ඒ නිසා අපි ඒකට පොඩි බද්දක් අය කළාට ඒක අපතේ යන දෙයක් නොවෙයි. ඒක මේ රටේ අත්‍යවශ්‍ය ආයෝජනයක් වෙනුවෙන් කරනු ලබන ක්‍රියාවලියක් බව මම මතක් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාගේ කථාව අහගෙන හිටියා. ජනතා විමුක්ති පෙරමුණ හැම දාම කියන්නේ මේ හැම දෙයක්ම නිකම් දෙන්න ඕනෑ කියලායි. ඇයි, මේ රටේ ඔක්කොම ඉන්නේ හිඟන්නෝ. එතුමන්ලා කියන්නේ මේ රටේ ඔක්කොම ඉන්නේ හිඟන්නෝ කියලායි. ඒ අය කියනවා අද mobile phoneවලින් ටෙලිෆෝන් කරන්න මේ රටේ මිනිසුන්ට සල්ලි නැහැ ලු. ඒක නිසා ණයට reload කරගෙන ලු මෙහේ mobile phoneවලින් කථා කරන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ ජනතාව ස්ව ශක්තියෙන් නැඟී සිටීම සඳහා කටයුතු කරන මොහොතක එතුමා ඒ ජනතාවට කරන ලද්දේ බලවත් අගෞරවයක්. දේශීය ආර්ථිකයේ දියුණුවත් සමඟම ශ්‍රී ලංකාවේ ඇති වෙලා තිබෙන මේ පරිවර්තනය තුළ අද වන විට අපේ ඒක පුද්ගල ආදායම ඇමෙරිකන් ඩොලර් 1,200 සිට 2,400 දක්වා වැඩි වෙලා තියෙද්දි අද විපක්ෂ නායකතුමා කියන්නේ මොකක්ද? පෙට්‍රල් ගණන් වැඩියි කියනවා. එදා රුපියල් 5ට විකුණා ගන්න බැරි වූ පතෝල අද රුපියල් 60ට 70ට විකුණලා ගොවියාගේ අත මිට සරු වන විට ඒ අය mobile phone එකට reload දමන එක ඇත්ත. ඒ අයට වියදම් කරන්න සල්ලි තිබෙනවා. අද පුංචි market එකක් ගත්තොත් ඒ market එකේ එළවලු විකුණන වට්ටි අම්මාටත් mobile phone එකක් තිබෙනවා. ඒ විධියට mobile phone ප්‍රමාණය වැඩි වීමෙන් සංකේතවත් වන්නේ මොකක්ද? මේ රටේ ඇති වෙලා තිබෙන දැවැන්ත ආර්ථික සංවර්ධනය මනින තවත් barometer එකක් තමයි mobile phones ප්‍රමාණය වැඩි වීම කියන්නේ. අද කවුරුත් mobile phonesවලින් කථා කරනවා. කවුරුත් ඒ bill ගෙවන්න බැහැ කියලා කියන්නේ නැහැ. ඒ bill ගෙව්වේ නැත්නම් mobile phone connection එක කැපෙනවා. නමුත් හැම දෙනාම mobile phones පාවිච්චි කරනවා. සුනිල් හඳුන්නෙත්ති මහත්මයා කියන විධියට මේ ජනතාවට mobile phone පාවිච්චි නොකර ඉන්න තරම් මේ රටේ අගේනියක් ඇති වෙලා නැහැ. සමහර විට හැතැප්ම 100ක් ගිහිල්ලා කර ගන්න ඕනෑ වැඩය mobile phone එකෙන් කථා කරලා ඉතා සුළු වේලාවකින්, සුළු මුදලකින් කර ගන්න පුළුවන්. ඒ වාගේම ව්‍යාපාරික අවස්ථාවන් රාශියක් ඇති කර ගැනීමේ ක්‍රියාවලියක් අපිට ඇති කර ගන්න පුළුවන්. ඒ නිසා ඒ තර්කය පිළිබඳව අපි ඉතාම කනගාටු වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බදු අභියාචනා කොමිසම ගැන වචන ස්වල්පයක් කථා කිරීම ඉතාමත් වටිනවා. බදු තක්සේරු කිරීමේදී යම් කෙනෙකුට අසාධාරණයක් වුණා නම් - අපි දන්නවා සමහර තක්සේරු නිලධාරීන් බදු තක්සේරු කිරීමේදී ඉතාම අසාධාරණ විධියට කටයුතු කරන බව- ඒ සම්බන්ධයෙන් සාධාරණත්වය සොයා යන ගමනේදී තමන්ගේ අභියාචනය ඉදිරිපත් කිරීම සඳහා ඉතාම අපක්ෂපාතී මණ්ඩලයක් අවශ්‍යයි. ඒ සඳහා තමයි මේ Tax Appeals Commission එක තිබෙන්නේ. මේ පනත් කෙටුම්පතේ 2(1) වගන්තියේ සඳහන් වන්නේ මෙහෙමයි:

"There shall be established a Commission to be called and known as the Tax Appeals Commission .... which shall be charged with the responsibility of hearing all appeals in respect of matters relating to imposition of any tax, levy or duty."

යම් කෙනෙකු වෙත බදු මුදලක් සම්බන්ධයෙන් පනවන ලද නියෝගයකට එරෙහිව මේ කොමිසමට අභියාචනා කිරීමේ අයිතිය අපි ලබා දීලා තිබෙනවා. මේ කොමිසමේ සාමාජිකයෝ සාමාන්‍යයෙන් ගතානුගතික වශයෙන් ඉන්න Tax නිලධාරින් නොවෙයි. ඒ ගැන මෙම පනත් කෙටුම්පතේ 2(2) යටතේ විස්තර කර ඇත්තේ මේ විධියටයි:

"Commission shall comprise not more than three members who shall be appointed from amongst retired Judges of the Supreme Court and the Court of Appeal, persons who have wide knowledge of, and have gained eminence in the fields of Taxation, Finance and law, by the Minister to whom subject of Finance is assigned. One of the members shall be appointed as the Chairman of the Tribunal by the Minister."

ඒ නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නීති ක්ෂේත්‍රයේ ඉහළම තත්ත්වයේ සිටින ශ්‍රේෂ්ඨාධිකරණයේ -Supreme Court එකේ- සහ අභියාචනාධිකරණයේ සේවය කරන ලද විශ්‍රාම ලත් විනිශ්චයකරුවන්ගෙන් තමයි අපි Tax Appeals Commission එකට සාමාජිකයන් පත් කරන්නේ. ඉතා ස්වාධීනතාවකින් යුතු බදු අභියාචනා කොමිසමක් - Tax Appeals Commission එකක් - ස්ථාපිත කිරීමට ලැබීම ගැන අපි ඉතාම සතුටු වනවා. මෙය මේ රටේ ආදායම් බදු ගෙවන ජනතාව ඉතාම තෘප්තියට පත් වන නීති පද්ධතියක් වන බවට කිසිම සැකයක් නැහැ. එවැනි තත්ත්වයක් බදු ගෙවන්නන් වෙත ලබා දීමට හැකි වීම පිළිබඳව අපි ඉතාම සතුටු වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව අද ටිකක් වැඩියෙන් විවාදයට භාජනය වුණා. මේ පිළිබඳව අපේ මන්ත්‍රීතුමන්ලා රාශියක් කරුණු දැක්වූවා. මේ පිළිබඳව අපි කල්පනා කරන්නට ඕනෑ කරුණක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අද බැංකුවලින් නිවාස ණය හෝ වෙනත් ණය සඳහා ලබා දෙන්නේ ආණ්ඩුවේ මුදල් නොවෙයි. ඒ ලබා දෙන්නේ මේ රටේ ජනතාවගේ මුදල්. ඒ නිසා ඒ ජනතාවගේ මුදල් අපි සුරක්ෂිත ලෙස ආයෝජනය කළ යුතුයි. දැන් අපේ කරු ජයසූරිය මහත්මයා ඉල්ලනවා මිලියන 50 දක්වා -ලක්ෂ 500 ක් දක්වා- ණය ගත්ත අයගෙන් මේ මුදල් අය කර ගැනීමට parate execution ක්‍රමය ක්‍රියාත්මක කරන්න එපා කියලා. එතකොට මොකක්ද සිදු වන්නේ? වැඩියෙන්ම පොලු තියන අයට අපි සහනය දෙනවා නේ. කාගේ සල්ලිවලින්ද ඒ සහනය දෙන්නේ? බැංකුවේ සල්ලි කියන්නේ කාගේ සල්ලිද? ඒ, එක්කෝ pension ගිය කෙනෙක් කරන fixed deposit එක. මේ විධියට මේ රටේ සාමාන්‍ය ජනතාව බැංකුවේ ආයෝජනය කරන මුදල්වලින් තමයි ණය දෙන්නේ. අපි දන්නවා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු කාලයේදී බැංකුවලින් මුදල් කෝටි ගණනක් කපලා දැම්මාය කියන එක. යශෝධා සමූහ ව්‍යාපාරයට කෝටි නොවෙයි බිලියන ගණනක් දුන්නා. ඒක තවමත් අය කර ගන්න බැහැ. එහෙම දීලා එදා විජේතුංග ජනාධිපතිතුමා කිව්වා බැංකු දෙකම -මහජන බැංකුවයි, ලංකා බැංකුවයි- බංකොලොත් කියලා. මේ විධියට තමන්ගේ දේශපාලන හිතවත්කම් මත ණය දීලා ඒවා කපා හැරලා

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

මේ රටේ පොදු ජනතාවගේ සල්ලි ඒ විධියට ගසා කෑවා. අදත් ඒ ස්වරූපය එක්සත් ජාතික පක්ෂයෙන් අයින් වෙලා නැහැ. ඒ අය කියනවා ලක්ෂ 500 දක්වා දෙන ණය මුදල්වලට *parate* execution එපා කියලා. එතකොට මොකද වෙන්නේ? අවුරුදු ගණනාවක් මේවා ලබා ගැනීමට කල් යන කොට මේ බැංකුවලට එන්න තිබෙන ආදායම නැති වෙනවා. එතකොට මොකද වන්නේ? ඒ තැන්පත්කරුවන්ට පොලිය දෙන්න පුළුවන්ද? බැහැ. එතකොට ව්‍යංගයෙන් කියන්නේ මොකක්ද? මේ බැංකු බංකොලොත් කරන්න ඕනෑය කියන එකයි. ඒ නිසා අපි බැංකුවල ආයෝජනය කරන ජනතාවගේ මුදල්වල සුරක්ෂිතභාවය ගැනත් කල්පනා කරන්න ඕනෑ. අපි දානපතීන් වෙලා, ණය ගත්ත අයට *parate* execution නැතුව, අපට ඒ විධියට මුදල් පිල්ලි ගහන්න ඉඩ දෙන්න පුළුවන්කමක් නැහැ. අන්න ඒ කියන ප්‍රතිපත්තිය නිසා මේ බැංකුවල ආයෝජනය කරන -ඉතිරි කර fixed deposit දමන- සුළු ආයෝජකයාගේ, විශ්‍රාමිකයාගේ, ගොවියාගේ, කම්කරුවාගේ ඒ මුදල් රැක ගැනීම සඳහා තමයි අපි එවැනි සංශෝධනයකට විරුද්ධ වන්නේ. කරුණුමය වශයෙන් විරුද්ධ වන්නේ ඒ නිසායි. නීතිමය වශයෙන් විරුද්ධ වන වෙන කාරණා තිබෙනවා. ඒ ගැන මා කියන්නම් Committee Stage එකේදී. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ආර්ථික ක්ෂේත්‍රයේ ගෙන ආපු තිරසාර ආර්ථික ප්‍රතිපත්තිය යටතේ ශ්‍රී ලංකාව ඉදිරියට යමින් සිටිනවා. ඒ පිළිබඳ විවිධ අය විවිධ සිහින දකිනවා. විපක්ෂය දකින්නේ හැම වෙලාවේම බොහොම අවදානම් සිහින.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා (ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතාව අමාත්‍යතුමා)

(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம - சர்வதேச நிதிய கூட்டிணைப்பு அமைச்சர்)

(The Hon. (Dr.) Sarath Amunugama - Minister of International Monetary Co-operation)

නපුරු සිහින.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)

(The Hon. Nimal Siripala de Silva)

ඔව්. නපුරු සිහින. අපි දකින්නේ ඉතා සුබ දායක සිහින. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා පළමුවැනි අය වැය ලේඛනය ඉදිරිපත් කරපු දින සිටම දිගටම ඔවුන් කිව්වේ එන සැරේ වන කොට මේ ආණ්ඩුව කඩා වැටෙනවා; දැන් රට ණය වෙලා ඉවරයි; මේ ආර්ථිකය කඩා වැටෙනවා කියාලයි. හැබැයි එල්ලී එල්ලී කඩා වැටෙනවාය කියාලා මේක පස්සෙන් ගිය අය වැටෙන පාටක් දැක්කේ නැහැ. හැබැයි විපක්ෂය කඩා වැටුණා. ඒ නිසා අපට ඒ පිළිබඳව ප්‍රශ්නයක් නැහැ ගරු නියෝජ්‍ය කථානායකතුමනි. සාර්ථක පියවරවල් අරගෙන මේ රජය ඉදිරියට ගිහිල්ලා තිබෙනවා. අපේ සිහින බොඳ වෙලා නැහැ. අපේ සිහින සැම විටම යථාර්ථයක් බවට අපි පත් කර ගෙන තිබෙනවා. හම්බන්තොට වරාය ගැන බැලුවත් එහෙමයි. මෙතෙක් කල් රනිල් වික්‍රමසිංහ මහත්තයා ඒක හදන්න පිඹුරු පත් සැකසුවා. එතුමාට හදා ගන්න බැරි වුණා. දැන් අපි හැදුවාම කියනවා, නැව් එන කල් බලා ඉන්නවා කියලා. පොඩ්ඩක් ඉන්න. එදිරියට නැව් එයි. නැව් එන්නේ නැහැ කියලා දැන් උපකල්පනය කරනවා. අපි නැව් ගෙනැල්ලා පෙන්වන්නම්. නියම වෙලාවට නැව් එයි. නැව් ගේන්න හදිසි වෙන්න එපා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා අප ඇති කර ගෙන යන මේ ආර්ථික සංවර්ධනය දෙස දේශපාලන දෘෂ්ටි කෝණයකින් නොව මීට වඩා යථාර්ථවාදී දෘෂ්ටි කෝණයකින් බලන්නය කියා විශේෂයෙන්ම අපි විපක්ෂයෙන් ඉල්ලා සිටිමින්, විවාදයට සහභාගි වුණු සියලු දෙනාටම ස්තුතිය ප්‍රකාශ කරන අතර අපි ගෙන යන ආර්ථික වැඩ පිළිවෙළ පසු ගිය පළාත් පාලන මැතිවරණයේදීත් ජනතාව තව දුරටත් තහවුරු කරලා, ශක්තිමත් කරලා තිබෙන බවත්, ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්යය කරා යන ගමනට මේ රටේ බහුතර ජනතාව කැමැත්ත පළ කර ඇති බවත් ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ. භා. 5.07]

ගරු ගීතාංජන ගුණවර්ධන මහතා (මුදල් හා ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன - நிதி, திட்டமிடல் பிரதி அமைச்சர்)

(The Hon. Gitanjana Gunawardena - Deputy Minister of Finance and Planning)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අතිගරු ජනාධිපතිතුමා විසින් අය වැයෙන් කරන ලද යෝජනාවලට අදාළව මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය යටතේ ඊයේත්, පෙරේදාත් ඉදිරිපත් කරන ලද පනත් සංශෝධන හා නියමයන් පිළිබඳව අප දෙපාර්ශ්වය අතර දවස් තුනක් පැවැති විවාදයට සම්බන්ධ වීමට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට නැවත වරක් අපේ ස්තුතිය පුද කරන්නට කැමැතියි. විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමා මේ අවස්ථාවට සම්බන්ධ වෙලා විවාදයට එකතු කළ ඒ පණිවුඩයත් සමඟ සුරාබදු (සංශෝධන) පනත් කෙටුම්පත, නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත, වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු පනත් කෙටුම්පත, බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත, විදුලිසංදේශ බදු පනත් කෙටුම්පත, දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත, බදු අභියාචනා කොමිසම පනත් කෙටුම්පත, ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත් කෙටුම්පත, එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත ආදී වශයෙන් පනත් කෙටුම්පත් සහ නියමයන් 20කට වැඩි ප්‍රමාණයක් මේ ගරු සභාව වෙත ඉදිරිපත් කරලා අවසාන දවසේ අදට නියමිත පනත් 5 සම්මත කර ගන්නා අවස්ථාවයි මේ.

විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂය මේ දරන උත්සාහයෙන් පෙනෙන්නේ එක්සත් ජාතික පක්ෂය තුළ ඇති වී තිබෙන මහා ව්‍යසනය සහ අර්බුදය වසා ගැනීම සඳහා රජයේ ආර්ථික සහ මූල්‍ය ප්‍රතිපත්තියට එල්ලය බලා ගහලා මේ රටට එන ආයෝජකයන්ට ඒ සඳහා අලුත් පණිවුඩයක් දෙන්න හදනවා කියන එකයි. අපි ඒකත් මතක් කරන්නට ඕනෑ. මේ රට තුළ ඇති වී තිබෙන තත්ත්වයන් තුළ ආයෝජනයන් සඳහා සුදුසු නැහැයි කියන පණිවුඩය දෙන්නට හදන උත්සාහයක් තමයි ඒක. නමුත් ඔබතුමාත් දන්නවා, අපිත් දන්නවා, එක්සත් ජාතික පක්ෂයේ ඒ වහසි බස්, කේළාම් සහ විෂ අවලාදවලට ආයෝජකයන් ගොදුරු නොවූ බව. පසු ගිය අවුරුදු 6 තුළ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ මහින්ද චින්තන ප්‍රතිපත්තිය යටතේත්, මහින්ද චින්තන ඉදිරි දැක්ම යටතේත් ලංකාව ලබපු ජයග්‍රහණයන් පිළිබඳව මම දිගින් දිගටම කියන්නට අවශ්‍ය නැහැ. තමුන්නාන්සේලා කොතෙක් කොහොම අර්ථ නිරූපණය කරන්නට හැදුවත් අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් යුත් මේ රජයට මේ රටේ ජනතාව නැවත වරක් විශාල ජන වරමක් පසු ගිය පළාත් පාලන මැතිවරණය තුළදී ලබා දුන්නාය කියන පණිවුඩය අද ලෝකයාට ගොසින් හමාරයි. මේ රටේ ජනතාව එක්සත් ජනතා නිදහස් සන්ධාන රජයට පළාත් සභා මැතිවරණවලදී ඒ පළාත් සභා සියල්ලේම බලයත් ලබා දුන්නා. ඒ වාගේම අතිගරු ජනාධිපතිතුමා එදා අපේ රණ විරුවන්ට නායකත්වය දීලා මාවිල් ආරුවෙන් ආරම්භ කරපු මහා සටන තුළින් එල්ටීටීඊ නායක ප්‍රභාකරන් ඇතුළු එල්ටීටීඊ සංවිධානයේ අවුරුදු 30ක ව්‍යසනය, 2009 මැයි 18 වැනි දා නන්දිකඩාල් කළපුවේදී අවසන් කරන්නට සහ ඒ තුළින් ශ්‍රී ලංකාවේ වෙසෙන සිංහල, දෙමළ, මුස්ලිම් කියන සියලු ජන කොටස්වලට ඒ කුරිරු ත්‍රස්තවාදයෙන් මිදිලා සාමය බුක්ති විඳින්නට පුළුවන් අවස්ථාවක්

ඇති කළා. අද වන කොට මේ රටේ ඇති වී තිබෙන සාමය නිසා විදේශ ආයෝජකයන්ට මේ රටට ඇවිල්ලා මේ රටේ සංවර්ධන ක්‍රියාවලියට සම්බන්ධ වෙන්නට පුළුවන් හොඳම අවස්ථාව උදා වී තිබෙන බව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව ආදී ජාත්‍යන්තර ණය දෙන ආයතන ඇතුළු ඒ ප්‍රධාන මූල්‍ය ආයතන සියල්ලම ප්‍රකාශ කරලා හමාරයි. ඒ නිසා එක්සත් ජාතික පක්ෂය කියන පණිවුඩය ජාත්‍යන්තර මූල්‍ය ආයතනය අද පිළිගන්නේ නැති තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. මහින්ද චින්තන ඉදිරි දැක්ම පිළිබඳ විශ්වාස කිරීම සහ එය ලංකාවේ අනාගත සංවර්ධන ක්‍රියාවලියට ඇති හොඳම වැඩ පිළිවෙළයි කියලා ලෝක බැංකුවේ කළමනාකාර අධ්‍යක්ෂවරිය වන ආචාර්ය එන්ජෝසි ඔකොන්ජො අයිවෙලා මැතිනිය කියන කොට එක්සත් ජාතික පක්ෂය කුමක් කියන්නද කියන එක අපි අහන්නට ඕනෑ. ඒ නිසා මම ඒ පිළිබඳව නැවත නැවතත් කියන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. ඒ පිළිබඳ කරුණු කාරණා රාශියක් මේ අවස්ථාවේ ඉදිරිපත් කළා.

මේ ඉදිරිපත් කර තිබෙන අණ පනත් සහ සංශෝධන ගෙන ඒමට අප අමාත්‍යාංශයේ ලේකම්තුමා වන ආචාර්ය පී.බී. ජයසුන්දර මැතිතුමා, අධ්‍යක්ෂ ජනරාල්වරුන්, ඒ ආයතන ප්‍රධානීන් ඇතුළු අනෙකුත් සියලුම නිලධාරින් ලබා දුන්නු සහයෝගය, ඒ වාගේම අපේ නීතිපති දෙපාර්තමේන්තුවත්, නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවත් අපට ලබා දුන්නු සහයෝගය, පාර්ලිමේන්තුවේ ඒ සියලු අංශ ලබා දුන්නු සහයෝගය පිළිබඳව ස්තුතිය පුද කරන අතර, ඉතාම කෙටි කාලයක් තුළ -මාර්තු 31 වැනි දාට පෙර- අය වැය හා සම්බන්ධ වූ සියලු සංශෝධන අද දවස තුළදී හමාර කරන්නට ලැබීම විශාල ජයග්‍රහණයක්ය කියන ටික අපි මතක් කරන්නට ඕනෑ. ඒ ලබා දුන්නු සහයෝගයට ඒ සියලු දෙනාටම අපේ ස්තුතිය අමාත්‍යාංශය වෙනුවෙන් පුද කරන්නට කැමැතියි.

ඒ වාගේම අද දින සාකච්ඡා වුණු කාරණාවලට අමතරව අපේ ගරු නිමල් සිරිපාල ද සිල්වා අමාත්‍යතුමා විසින් පැහැදිලි කළා, බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පතට ගෙන ආ සංශෝධන පිළිබඳව. ඉතා පැහැදිලිව එම සංශෝධනය පසු ගිය වතාවේ සම්මත කර ගෙන තිබෙනවා. මිලියන පහක උපරිමයකට යටත්ව කියන සංශෝධනය ඇතිව එය සම්මත කර ගන්නට මේ ගරු සභාවේ අනුමතිය ලබා දීලා අද වන කොට ඒ පනත් කෙටුම්පත අපේ ගරු කථානායකතුමාගේ අත්සනින් යුතුව ක්‍රියාත්මක වෙලා තිබෙනවා. ඒ මුදල පිළිබඳ පැහැදිලි කිරීමේ වගන්තිය පමණයි අද ඉදිරිපත් කර තිබෙන කෙටුම්පත තුළින් ඔබ වෙත ඉදිරිපත් කරලා තිබෙන්නේ කියන ටික අපි මතක් කරන්න ඕනෑ. ඒ නිසා මෙය, ක්‍රියාත්මක පනතක වගන්තියක් පැහැදිලි කිරීමේ පනත් කෙටුම්පතක් හැටියටයි අද මේ ගරු සභාව වෙත ඉදිරිපත් කරලා තිබෙන්නේ කියන එක ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නීති ක්ෂේත්‍රයේ අත් දැකීම් ලත් කෙනකු හැටියට, බැංකු ක්ෂේත්‍රයේ අත් දැකීම් ලත් කෙනකු හැටියට ඔබතුමා දන්නවා. මේ සංශෝධනය තුළින් බැංකු ක්ෂේත්‍රයට මෙම කාරණය ඉටු කිරීම සඳහා වූ තවත් ශක්තියක් ලබා දෙනවා වාගේම ඒ තුළින් ඒ ණයකරුවන්ට ආවරණයක් ලබා දීමයි කෙරෙන්නේ. රුපියල් මිලියන පහේ මූලික ණය පිළිබඳව පමණයි අපි කථා කරන්නේ. එයට ඇතුළත් වන පොලී සහ අනෙක් ගාස්තු ද ඇතුළත් සීමාව ඉක්මවලා යන ණයක් ගැන නොවෙයි අපි මේ කථා කරන්නේ කියන ටික ඉතාම ඕනෑකමින් මතක් කරන්න ඕනෑ. ඒ නිසා ඒ සහනය ඒ කුඩා ණයකරුවන්ටයි ලැබෙන්නේ කියන ටික ඉතාම ඕනෑකමින් අපි මතක් කරන්න ඕනෑ. මම දීර්ඝව ඒ ගැන කථා කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ.

එක්සත් ජාතික පක්ෂයේ ප්‍රධාන කථික මහත්වරු වන ආචාර්ය හර්ෂ ද සිල්වා මැතිතුමා සහ ගරු රවි කරුණානායක මැතිතුමා ඇතුළු තවත් මන්ත්‍රීවරුන් විටින් විට කිහිප වතාවක්ම චෝදනා එල්ල කළේ සේවක අර්ථසාධක අරමුදල පිළිබඳවයි; එහි ආයෝජනයන් පිළිබඳවයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපට පුදුම හිතෙනවා එක්සත් ජාතික පක්ෂය අද සේවක අර්ථසාධක අරමුදල ගැන කිඹුල් කඳුළු හෙළීම ගැන. සේවක අර්ථසාධක අරමුදල විනාශ කරන්න කටයුතු කළේ එක්සත් ජාතික පක්ෂයයි. එහි පාලනය පිළිබඳ නරකම වාර්තාව තිබෙන්නේ එක්සත් ජාතික පක්ෂ පාලන කාලයටයි.

1989 දී අපි පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වශයෙන් අපි මේ පිළිබඳව විටින් විට නඟපු චෝදනා තුළ තිබුණ එක් කාරණයක් මට මතකයි. මේ පනතේ වගන්ති උල්ලංඝනය කරමින් ලංගමය ජනතාකරණය කරන වෙලාවේ මෙන්ම එදා ජනතාකරණය කළ වෙනත් සමාගම්වලට අයත් සේවකයන්ගේ රුපියල් මිලියන 1,500ක අර්ථ සාධක අරමුදල් එක්සත් ජාතික පක්ෂ පාලනය යටතේ ගෙවලා තිබුණේ නැහැ. එක්සත් ජාතික පක්ෂ පාලනය යටතේ රුපියල් බිලියන එකහමාරක්, -රුපියල් මිලියන 1,500ක්- අර්ථ සාධක අරමුදලට නොගෙවා තිබුණු කාලයක තමයි අපි විපක්ෂයේ මන්ත්‍රීවරුන් හැටියට වෘත්තීය සමිති සමඟ සාකච්ඡා කරලා, මේ පාර්ලිමේන්තුව තුළ දැවැන්ත උද්ඝෝෂණයක් කරලා එම මුදල තැන්පත් කිරීම සඳහා වූ කාර්ය භාරයට මුදල් අමාත්‍යාංශයට ඉතා පැහැදිලි නියෝගයක් ලබා දෙන්නට උපදේශක කාරක සභාව හරහා කටයුතු කළේ කියන එක ඉතාම ඕනෑකමින් මතක් කරන්නට ඕනෑ. ඒ නිසා අද තමුන්නාන්සේලා මේ කියන්නේ කා ගැනද කියන ටික අපි අහන්නට ඕනෑ. අර්ථ සාධක අරමුදල පිළිබඳ වගකීම සහ ඒ පිළිබඳ බැඳීම එක්සත් ජනතා නිදහස් සන්ධානයේ අපට තිබෙනවා.

මේ පනත, ටී.බී.ඉලංගරත්න මැතිතුමන් 1956 රජයේ කම්කරු, නිවාස හා සමාජ සුබසාධන අමාත්‍යවරයා හැටියට ලංකාවේ සමස්ත කම්කරු සේවකයන්ගේ විශ්‍රාම දිවියේ ආරක්ෂාව සඳහා ගෙනාපු පනතයි. එය ආරක්ෂා කිරීමට බැඳී සිටින්නේ අපියි. ඉතා පැහැදිලිව ඒ පනතේ සියලු වගන්තිවලට ගරු කරන රජයක් හැටියටයි එම පනත ඉදිරියට ගෙන යන්නේ කියන ටික ඉතාම ඕනෑකමින්, 1956 දරුවන් හැටියට අපි තමුන්නාන්සේලාට මතක් කරන්නට ඕනෑ. මේ අරමුදල විනාශ කරන්නට දරපු උත්සාහයන් පිළිබඳව තවදුරටත් කියමින් මම එක්සත් ජාතික පක්ෂයෙන් කළ ඒ කථා සියල්ලට උත්තර දෙන්නට අවශ්‍ය නැහැ. නමුත් මම එක කාරණයක් කියන්න ඕනෑ. ඊයේ “Daily Mirror” පත්තරයේ තිබෙනවා, "Harsha takes on EPF again" කියලා. ඉතාම කනගාටුයි. මෙවැනි ප්‍රකාශයක් ආචාර්ය පදවියක්, උපාධියක් දරන මෙවැනි මන්ත්‍රීවරයකු විසින් කිරීම පිළිබඳව ඉතාම කනගාටුයි. එතුමා මෙතැන හිටියත් මම ඒක කියනවා; නැති වුණත් කියනවා. ඒ වාර්තාව තිබෙනවා. එහි පැහැදිලිව කියනවා,

I quote:

“UNP national list MP Harsha de Silva in Parliament yesterday, charged that the Employment Provident Fund (EPF) had once again violated investment guidelines, appointing former Central Bank Assistant Governor, Presidential Advisor Ranee Jayamaha as Chairman of Hatton National Bank (HNB).”

මේ, රජය කරන ලද පත් වීමක් නොවෙයි. මේක වෙනත් බැංකුවක කටයුත්තක්. අනෙක් එක, රාණි ජයමහ මහත්මිය විශ්‍රාම ගිය මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිතුමිය. ඒ නිසා විශ්‍රාම ගිය කෙනෙකු ගැන මේ ගරු සභාව තුළ මෙලෙස කථා කිරීම -ඇය විශ්‍රාම යන තුරු සිට කථා කිරීම- සදාචාරාත්මක නැහැ. මේ ගරු සභාවේ නිලධාරින්ගේ කුටියට එන නිලධාරින් ගැන අපට කථා කරන්නට පුළුවන්. නමුත් අවුරුදු 37ක් මහ බැංකුවේ සේවය කර කිසිදු චෝදනාවක් නැතුව විශ්‍රාම ගිහිල්ලා ඒ තුළින් ජනාධිපති උපදේශක වශයෙන් කටයුතු කළ කෙනෙකු ගැන මෙවැනි ප්‍රකාශ කිරීම පිළිබඳව අපේ කනගාටුව අපි ඉතාම පැහැදිලිව මේ

[ගරු ගීතාංජන ගුණවර්ධන මහතා]

අවස්ථාවේ ප්‍රකාශ කරන්නේ නවක මන්ත්‍රීවරයෙකු හැටියට එතුමාට මේ පාර්ලිමේන්තුවේ සම්ප්‍රදාය අනුව මීට වඩා වැදගත්ව සම්බන්ධ වන්න කියන ඉල්ලීමත් කරමිනුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම අපි මහ බැංකුව ගැන කථා කළොත්, මහ බැංකුවේ තැන්පත් කර ඇති මුදලින් සියයට 93.54ක්ම තිබෙන්නේ රජයේ සුරැකුම්වල; රජයේ භාණ්ඩාගාර බිල්පත්වල. එහි ඉතිරි කොටස පමණයි අනෙකුත් බැංකු සහ ඒ ආයෝජනයන් සඳහා කොටස් වෙළෙඳ පොළ වෙත නිකුත් කර තිබෙන්නේ. ඒ සියල්ල පිළිබඳව සේවක අර්ථසාධක අරමුදල් පනතේ 5.(1) (e) වගන්තිය යටතේ සඳහන් කර තිබෙනවා.

I quote:

"5. (1) The Monetary Board - ....

(e) may invest such of the moneys of the Fund as are not immediately required for the purposes of this Act in such securities as the Board may consider fit and may sell such securities; "

මෙය ආරම්භයේ සිටම කරපු කටයුත්තක්. මේ තුළ ඇති වන ලාභ ඒ සාමාජිකයන් සංඛ්‍යාව සඳහා බෙදා දීමට -අද වන කොට මෙහි මුදල් ට්‍රිලියනයක්.- කටයුතු කරලා තිබෙනවා. පසු ගිය වසරේ සියයට 12.5ක ප්‍රතිලාභ ඒ දායකයන් වෙනුවෙන් ගෙවීමට කටයුතු කරලා තිබෙනවා. ඒ නිසා සියයට දහයට අඩුව තිබෙන වෙළෙඳ පොළේ පොලියත් සමඟ මෙය සාපේක්ෂව බැලුවාම අපේ සමස්ත සේවක සාමාජිකත්වය වෙනුවෙන් දැවැන්ත මෙහෙවරක් මේ බැංකුවේ මූල්‍ය කළමනාකරණය යටතේ සේවක අර්ථසාධක අරමුදලෙන් සිදු වනවාය කියන ටික අපි මතක් කරන්නට ඕනෑ.

ඒ වාගේම කොටස් වෙළෙඳ පොළේ මැදිහත් වීම තුළත් එලෙසම ශක්තිමත්ව කටයුතු කරන්නට පුළුවන්. එහි විශ්වාසය ඇති කිරීම තුළ -මැදිහත් වීමේ විශ්වාසය ඇති කිරීම තුළ- කොටස් වෙළෙඳ පොළෙත් එහි මිල ඉහළ යෑම සඳහා වූ ආයෝජකයන්ට එයට ආරාධනය කරන්නට පුළුවන් පරිසරය ඒ තුළ ගොඩ නැඟිලා තිබෙනවාය කියන ටික අපි මතක් කරන්නට ඕනෑ. නමුත් අද මෙතුමන්ලාගේ උත්සාහය, ඒ තුළිනුත් අවිශ්වාසය ගොඩ නඟලා මේ රටට එන විදේශ ආයෝජකයන් තුළ තවත් කුතුහලයක් ඇති කරන්නට සහ අපේ සේවක සාමාජිකත්ව තුළ තවත් කුතුහලයක් ඇති කරන්නට දරන උත්සාහයක්.

ඊයේ රවි කරුණානායක මන්ත්‍රීතුමා ETF එක හෙවත් සේවා නියුක්තයින්ගේ භාරකාර අරමුදල ගැන ප්‍රශ්න කළා. එහිත් සියයට 90කට වැඩිය ආයෝජනය කරලා තිබෙන්නේ රජයේ සුරැකුම්වලයි. අතිගරු ජනාධිපතිතුමා එදා කම්කරු අමාත්‍යවරයා හැටියට මැදිහත් වෙලා, සේවා නියුක්තයින්ගේ භාරකාර අරමුදලේ මුදල් යොදලා එදා පෞද්ගලික අංශයට යන්න ගිය ලුණු සංස්ථාව බේරා ගත්තා. අතිගරු ජනාධිපතිතුමා එදා කම්කරු අමාත්‍යවරයා හැටියට කළ ඒ දේ නිසා ලුණු සමාගම අද වන තෙක් ලාභ ලබන ආයතනයක තත්ත්වයට ගමන් කරලා තිබෙනවාය කියන ටික අප මතක් කරලා දෙන්නට ඕනෑ. නැත්නම් ලුණු කැටයක්වත් අපිට නිපද වන්නට බැරි රටක් බවට තමයි අපේ රට පත් වන්නේ. ඒ නිසා එක්සත් ජාතික පක්ෂ පාලන කාලය හා අද සන්සන්දනය කරන කොට සේවා නියුක්තයින්ගේ භාරකාර අරමුදලත්, සේවක අර්ථසාධක අරමුදලත් සම්බන්ධයෙන් රජයේ වගකීම් භාරය, රජයේ බැඳීම අබ මල් රේණුවක අඩු වීමක් නොව වැඩි වීමක් තමයි දකින්නට තිබෙන්නේ කියන ටික අපි මතක් කර දෙනවා. ඒ වාගේම සේවක අර්ථසාධක අරමුදල සම්බන්ධයෙන් හර්ෂ ද සිල්වා මැතිතුමා ප්‍රකාශයක් කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, the alleged violation of the investment guidelines by appointing former Central Bank Deputy Governor is baseless and there is no relationship කියන එක තමයි එතුමාගේ ප්‍රකාශයට අපේ උත්තරය.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එක්සත් ජාතික පක්ෂයේ නියෝජ්‍ය නායකතුමා -නියෝජ්‍ය නායක 1- මෙතැන ඉන්න අවස්ථාවේ අප තවත් කාරණයක් මතක් කරලා දෙන්නට ඕනෑ. මූල්‍ය ක්ෂේත්‍රය තුළ සදාචාරය ගැන කථා කරන අයගෙන් අප අහන්නට ඕනෑ, එක්සත් ජාතික පක්ෂයේ හිටපු සභාපති චරිත රත්වත්තේ මුදල් අමාත්‍යාංශයේ ලේකම් බවට පත් කළේ කවුද කියලා. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව තමයි ඒක කළේ. රෙද්දක්, බැනියමක්, කලිසමක්, ෂර්ට් එකක් ඇඳ ගෙන මෙවැනි කථාවක් කියන්නට පුළුවන්ද, මෙවැනි චෝදනාවක් නඟන්නට පුළුවන්ද, මේ රජයට? තමුන් කරපු දේ අමතක වෙලා එක්සත් ජාතික පක්ෂයට. දේශපාලන පක්ෂයක සක්‍රියව සභාපති ධුරය දරපු කෙනා පළමුවැනි වරට මුදල් අමාත්‍යාංශයේ භාණ්ඩාගාරයේ ලේකම් බවට පත් කළේ රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාගේ කාලයේ; කරු ජයසූරිය මන්ත්‍රීතුමා එදා ඒ අමාත්‍ය මණ්ඩලයේ හිටපු කාලයේදීය කියන ටික මතක් කරලා දෙන්නට ඕනෑ. ඒවා අමතක වෙලාද අද ඇවිල්ලා මේවා කියන්නේ කියන ටික අප අහන්නට ඕනෑ. එවැනි කටයුත්තකට මේ රජය නොගිය නිසා තමයි, මූල්‍ය ක්ෂේත්‍රයේ පාලනය එම ක්ෂේත්‍රයේ වෘත්තීයමය වශයෙන් ඉහළින්ම සිටින අයට ලබා දීලා ඒ සඳහා වූ මඟ පෙන්වීම මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වන අතිගරු ජනාධිපතිතුමා ලබා දුන් නිසා තමයි ලෝකයේ ආර්ථික අවපාතයන් මධ්‍යයේ ජාත්‍යන්තර වශයෙන් බැංකු කඩා වැටෙන කොටත්, ඇමෙරිකාවේ සිට යුරෝපය හරහා ඒ මහා කුණාටුව හමන කොටත් මේ රටේ බැංකු ක්ෂේත්‍රය සාර්ථකව පාලනය කරන්නට පුළුවන් තත්ත්වයකට ගෙනෙන්න පුළුවන් වුණේ කියන ටික අප මතක් කරන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගෝල්ඩන් කී" එක පිටුපස සිටියේ කවුද කියන ටික අප කියන්නට ඕනෑ නැහැ. "ගෝල්ඩන් කී" එක පිටුපස හිටපු සගයන් කවුද කියලා අප කියන්නට ඕනෑ නැහැ. ඒ මහා මුක්කුව පිටුපස හිටියේ කවුද කියලා අප කියන්නට ඕනෑ නැහැ. ඒවාත් කඩා වැටෙන කොට, පෞද්ගලික බැංකුත් කඩා වැටෙන කොට රජය, මහ බැංකුව සහ මුදල් අමාත්‍යාංශය මැදිහත් වෙලා තමයි මේ රටේ පෞද්ගලික බැංකු අංශය කඩා වැටීමක් ඇති වන්නට ඉඩ නුදුන්නේ කියන ටිකත් අප පැහැදිලි කර දෙන්නට ඕනෑ. මූල්‍ය පාලනය පිළිබඳව සහ ආර්ථික සංවර්ධන ක්‍රියා දාමය පිළිබඳව මේ රජය ගෙන ඇති ක්‍රියාවන් සම්බන්ධයෙන් වාර්තාවෙන් කොටසක් අර ගෙන, වචන තුනක් පැහැදිලි කරලා මුළු දේ නොකියන අය පිළිබඳව මා හිතන්නේ අපට උත්තර දෙන්නට අමාරුයි කියායි. ඒක හරියට බීරි අලින්ට වෙණ ගායනා කරනවා වාගෙයි. අය වැය ලේඛනයේ සඳහන් දේ ඉඳලා හැම දාම කියපු දේ ඇවිල්ලා කිව්වත් ඒක සිරිකොතට ඇහෙන්නේ නැහැ. ඊයේත් පෙන්නුවා අලියා පෙරළන හැටි.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කාඩ්බෝඩ් අලි.

ගරු ගීතාංජන ගුණවර්ධන මහතා
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
කාඩ්බෝඩ් අලි. ඉතින් ඇහෙන්නේ නැහැ නේ. මේ උත්සාහය රජය අස්ථාවරභාවයකට පත් කිරීම නොව මේ රට අස්ථාවරභාවයකට පත් කිරීමටයි. ඒ තුළින් ඇති වන විපාකය පැහැදිලිවම සමස්ත ජනතාවටම ඇති වන විපාකයක්ය කියන ටික අපි මතක් කරනවා. අප එයට ඉඩ දෙන්නේ නැහැ කියන ටිකත් ඉතාම පැහැදිලිව කියන්නට ඕනෑ. බලන්න, ඒක තමයි ඒ ප්‍රකාශ කළ ඡන්ද ප්‍රතිශතය ගත්තත් තිබෙන්නේ.

ඔබ සහ අපි පසු ගිය ජනාධිපතිවරණය දැක්කා. වර්ග සැතපුම් 25,000ක භූමියක වෙසෙන 60 ලක්ෂයක ජනතාවක් දෙවැනි වරටත් අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට දහසය ලක්ෂයක වැඩි ඡන්ද සංඛ්‍යාවක් තුළින් ඒ ජන වරම ලබා දෙන්නට කටයුතු කළා. ඉන් අනතුරුව 225ක් වූ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් සංඛ්‍යාවට සියයට 60කට වැඩි බලයක් ලබා දෙමින් එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් මන්ත්‍රීවරුන් 144 දෙනෙක් පත් කර එවීමට මේ රටේ ජනතාවට පුළුවන් වුණා. එක්සත් ජාතික පක්ෂයේ මේ චෝදනාව ප්‍රතික්ෂේප කළා. ඊට පස්සේ අද 234ක් වූ ප්‍රාදේශීය සභාවලින්, 205ක් එක්සත් ජනතා නිදහස් සන්ධානය ජයග්‍රහණය කරමින් ප්‍රාදේශීය සභා සියයට 87ක් හිමි කර ගත්තා. අපේ ගොඩේ ඉන්න ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය සහ ස්වාධීන කණ්ඩායම් සියල්ල එකතු කළාම සියයට 90 ඉක්මවා යන දැවැන්ත ජන වරමක් තමයි මේ රටේ ජනතාව අපට ලබා දීලා තිබෙන්නේ කියන ටික අපි මතක් කරන්නට ඕනෑ. ප්‍රතිශතය ක්‍රියාත්මක වන්නේ, බලපාන්නේ කුමක් සඳහාද කියලා අර්ථ නිරූපණය කළ යුතුයි. තමුන්ට ඕනෑ විධියට එය අර්ථ නිරූපණය කරන්නට බැහැ. ජනාධිපතිතුමාට දුන්නේ සමස්ත ජනතාවගේ එක ඡන්දයක්. පාර්ලිමේන්තුවේ දුන්නේ දිස්ත්‍රික්ක මට්ටමෙන් එක ඡන්දයක්. මේ දුන්නේ ප්‍රාදේශීය සභාවෙන් සභාවට වූ ඡන්දයක්. ප්‍රාදේශීය සභා 234කින් 205ක් අපි ජයග්‍රහණය කළා. ඒ කියන්නේ සියයට 87ක් එක්සත් ජනතා නිදහස් සන්ධානයට ජනතාව ලබා දුන්නේ තමුන්නාන්සේලාගේ කුමන්ත්‍රණය පරාජය කළ යුතු නිසායි. නැවත වරක් මේ රටේ සාමය කඩ කරලා එල්ටීටීඊයට කත් අදින, එල්ටීටීඊයට උඩ ගෙඩි දෙන, ඩයස්පෝරාවට උඩ ගෙඩි දෙන මේ මහා ජාත්‍යන්තර කුමන්ත්‍රණයට ඉඩ දෙන්නට බැහැයි කියන පණිවුඩයයි ජනතාව දුන්නේ. ජනතාවට අමාරුකම් තිබෙනවා. ජනතාවට බඩු මිලේ අමාරුකම් සහ තවත් අමාරුකම් තිබෙනවා. නමුත් ඔවුන් ඉතා පැහැදිලිව පිළිගන්නා පණිවුඩය තමයි එක්සත් ජනතා නිදහස් සන්ධානය පොහොර සහනාධාරයේ ඉඳලා අත්‍යවශ්‍ය ආහාර සඳහා දෙන සහනාධාරය දක්වා පාසල් ළමුන්ට, සෞඛ්‍යයට, රෝගීන්ට දෙන සහනාධාර ආදී දැවැන්ත සහනාධාරයන් එක්සත් ජාතික පක්ෂ පාලනයකින් ලැබෙන්නේ නැහැ කියන එක. ඒක තමයි මේ ඡන්ද පිටුපස තිබෙන පණිවුඩය. යූඑන්පී නායකත්වය ඔළුවෙන් හිට ගෙන කිව්වත් ජනතාව දන්නවා, එක්සත් ජාතික පක්ෂ රජයක් සෞඛ්‍ය වියදම් කපනවා, අධ්‍යාපන වියදම් කපනවා, ප්‍රවාහන වියදම් කපනවා, පොහොර සහනාධාර කපනවා කියලා. ඒක තමයි මේ උත්සාහය පිටුපස තිබෙන කුමන්ත්‍රණය කියන ටික ජනතාව දන්නවා. ඒ නිසා රජය කෙරෙහි, අතිගරු ජනාධිපතිතුමා කෙරෙහි දක්වපු විශ්වාසය තුළයි මේ රටේ ප්‍රාදේශීය සභාවලින් සියයට 87ක් රජයට ලබා දීමේ දැවැන්ත පණිවුඩයක් රටට සහ ජාත්‍යන්තරයට ජනතාව දීලා තිබෙන්නේ. මේ කේළාම්කාරයන්ට රැවටෙන්න එපා කියන පණිවුඩය තමයි ජනතාව දීලා තිබෙන්නේ කියන ටික අපි මතක් කරලා දෙන්න ඕනෑ.

මා දීර්ඝව කථා කිරීමට බලාපොරොත්තු වන්නේ නැහැ. කථිකයන් රාශියක්, අපේ අමාත්‍යවරු රාශියක් මේ පිළිබඳව තමුන්නාන්සේලාට කිව්වා. අවසාන වශයෙන් මම එක දෙයක් පිළිබඳව කියන්නට ඕනෑ. ෂැන්ග්‍රි-ලා හෝටලය පිළිබඳව මා කියනවා. ෂැන්ග්‍රි-ලා හෝටලය පිළිබඳව කියන කොට අපට මතක් වන්නේ තමුන්නාන්සේලා මොකක්ද කළේ කියලායි. තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්තිය ගැන කියලා ෂැන්ග්‍රි-ලා ගැන කිව්වොත් හොඳයි නේද? එකක් විතරක් කියන්නේ ඇයි? ෂැන්ග්‍රි-ලා හෝටලය ඇතුළු මේ රටේ සංචාරක ක්ෂේත්‍රයට ආයෝජකයන් ගෙන්වා ගැනීම සඳහා ලබා දෙන දිරි දීමනා ඇතුළු ලබා දෙන අවස්ථාව බලන්න. ගිය අවුරුද්දේ සංචාරකයන් දෙලක්ෂයක්, මේ අවුරුද්දේ හාරලක්ෂයක් මේ රටට ගෙන එන ආදායම, මේ රටට ගෙන එන විදේශ විනිමය සහ ඒ තුළින් මේ රටේ ඇති කරන රැකියා ව්‍යාපාර සහ අතුරු ව්‍යාපාර තුළින් සංචාරක ව්‍යාපාරයට ලැබෙන මහා ශක්තිය කුමක්ද කියන ටික ඔබ තක්සේරු කරන්නේ නැහැ; ඔබ අර්ථ නිරූපණය කරන්නේ නැහැ; ඒ තුළින් පණිවුඩයක් දෙන්නේ නැහැ. මේ රටේ සංචාරක කර්මාන්තය තුළ ආයෝජකයන්ට සුදුසු වාතාවරණයක් ඇති කිරීමට තමයි, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් ඉතා පැහැදිලි ප්‍රතිපත්තියක් තුළ ගමන් කරමින් ඒ ආයෝජකයන්ට ලංකාවට එන්නට පුළුවන් අවස්ථාව සහ පරිසරය ගොඩ නඟන්නේ. එය මේ රටේ සියල්ල විකුණන් කන ප්‍රතිපත්තියක් නොවෙයි. [බාධා කිරීමක්] රවි කරුණානායක මන්ත්‍රීතුමා කථා කරන වෙලාවේ මා - [බාධා කිරීමක්] ගරු නියෝජ්‍ය කථානායකතුමනි, I am not giving way. එම නිසා මා පැහැදිලි කරන්නට ඕනෑ මෙන්න මේ කාරණය. මේ තුළින් ඇති කරන්නට හදන්නේ මේකේ බදු ගත්තේ නැහැයි කියලායි. බදු ගන්න තිබෙන කාලය අප ගන්නවා. මේ කර්මාන්ත ඇති වන කොට තමයි බදු ගෙවන්නේ. මේ බදු තුළින් තමයි අනාගත බදු ආදායම වැඩි කරන්නට පුළුවන් වන්නේ; රාජ්‍ය ආදායම වැඩි කරන්නට පුළුවන් අවස්ථාව, රටේ රැකියා වැඩි කරන්නට පුළුවන් අවස්ථාව, රටේ කර්මාන්ත සහ සුළු කර්මාන්ත, අතුරු කර්මාන්ත, වෙළෙඳ ව්‍යාපාර වැඩි කරන්නට පුළුවන් අවස්ථාව ඇති වන්නේ. ඒවායි එහි ප්‍රතිලාභ. අද පෙනෙන්නේ නැතිවාට දුර පෙනෙන කණ්ණාඩියක් දාන්නය කියන ටික තමයි අප තමුන්නාන්සේලාට කියන්නේ.

අද හම්බන්තොට වරාය ගැන කියනවා. 1505 වර්ෂයට පස්සේ 1956 වර්ෂයේ පැවැති අපේ ආණ්ඩුව විසිනුයි කොළඹ වරාය ජනසතු කළේ. අවුරුදු 450ක් විදේශිකයන් සතුව තිබුණේ. ඒ වරාය, ඒ වාගේ තුන් ගුණයක් විශාල වරායක් බවට අද සංවර්ධනය වනවා. මේ රටට ආයෝජකයන් ගෙන එන්නට, නාවික කේන්ද්‍රීය ආර්ථික මධ්‍යස්ථානයක්, වෙළෙඳ මධ්‍යස්ථානයක් සහ වාණිජ මධ්‍යස්ථානයක් බවට මෙය පත් කිරීමේ ආර්ථික සහ යටිතල පහසුකම්වල අවශ්‍යම ඒ පහසුකම් ටිකයි මේ තුළ සිදු කෙරෙන්නේ කියන ටික ප්‍රකාශ කරන්න ඕනෑ. චීන රජයේ ආධාර ඇතිව ඊයේ විවෘත කළ ඒ ගල් අඟුරු බලාගාරය සම්බන්ධව එදා කිව්වා, "චීන රජයේ ආධාර ගන්නට එපා. චීන රජයට පොලිය ගෙවන්නට වෙනවා. චීනයේ කම්කරුවන් එනවා. ඉංජිනේරුවන් ඇවිත් මේවා කරන්නේ" කියා. මේ රජය විසින් මේ මහා තාප බලාගාරය විවෘත කළා. එදා ඇහුවා, "ඇයි අප atomic energy ගෙනල්ලා හදන්නේ නැත්තේ, ඇයි තාප බලාගාර හදන්නේ?" කියා. හෙට ඇවිත් අසාවි, "ඇයි ඒක කළේ නැත්තේ?" කියා. රජය ඉතා පැහැදිලි බලශක්ති ප්‍රතිපත්තියක ගමන් කරමින් විකල්ප බල ශක්ති සහ මේ රටේ ජල විදුලි බලාගාර පද්ධතිය ප්‍රසාරණය කරන, ව්‍යාප්ත කරන උපරිම ආයෝජනයක් සඳහායි ගමන් කරන්නේ කියන ටික ඉතාම පැහැදිලිව මතක් කරන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තමුන්නාන්සේ මේ දුන් අවස්ථාව තුළ මගේ කථාව අවසන් කිරීමටයි බලාපොරොත්තු වන්නේ. ඒ තුළ - [බාධා කිරීම]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please! There is a point of Order being raised.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Misleading the House is a great offence and the question that was posed was that Shangri-La has not paid

duty. -[*Interruption.*] Please answer that because it relates to the investment. - [*Interruption.*] You, as the Deputy Minister - [*Interruption.*] you are bound to answer that question that was asked. - [*Interruption.*] Misleading the Parliament is very dangerous.- [*Interruption.*]

ගරු ගීතාංජන ගුණවර්ධන මහතා
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)

I stated the facts. He is the one who misleads the House. He attempted to mislead the House - [*Interruption.*]

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

If there is anything which is contrary to the Standing Orders, that will be expunged. [*Interruption.*]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

No, Sir. It is not - [*Interruption.*]

ගරු ගීතාංජන ගුණවර්ධන මහතා
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)

You or the other members of the UNP will not be allowed to mislead the House and discourage investors from coming in. - [*Interruption.*] We have encouraged the investors to come and invest in an industry that suits us and that is important to us.- [*Interruption.*]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

I am saying he is misleading Parliament. - [*Interruption.*]

ගරු ගීතාංජන ගුණවර්ධන මහතා
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)

I am not misleading Parliament. You are the one who has misled Parliament. [*Interruption.*]

ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

You have misled Sirikotha. [*Interruption.*]

ගරු ගීතාංජන ගුණවර්ධන මහතා
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)

I am not in a UNP courthouse. I am in Parliament. This is not your UNP Sirikotha courthouse. You must understand.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාගේ මූලසුනට කරන ගෞරවයක් තුළ මට මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට නැවත වරක් ස්තුති කරමින් මෙම පනත් කෙටුම්පත් සම්මත කිරීමට ඔබ සියලු දෙනාගේම සහයෝගය ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය. පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது. அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.

Question put, and agreed to. Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය:
"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." -[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

தீர்மானிக்கப்பட்டது.
"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப் படுமாக" [மாண்புமிகு நிமல் சிறிபால த சில்வா]

Resolved:
"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Nimal Siripala de Silva]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.
[නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]

குழுவில் ஆராயப்பட்டது.
[பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]

Considered in Committee.
[MR. DEPUTY SPEAKER *in the Chair.*]

1 සිට 17 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

1ஆம் வாசகத்திலிருந்து 17ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clauses 1 to 17 ordered to stand part of the Bill.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
පනත් කෙටුම්පත, සංශෝධන රහිතව වාර්තා කරන ලදී.

சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
சட்டமூலம் திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டது.

Enacting Clause and Title ordered to stand part of the Bill.
Bill reported without Amendments.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් තුන්වන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන්වන වර කියවා සම්මත කරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் மூன்றாம் முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.

Question put, and agreed to.
Bill accordingly read the Third time, and passed.

බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත
வங்கிகளால் வழங்கப்பட்ட கடன்களை அறவிடுதல் (விசேட ஏற்பாடுகள்) (திருத்தம்) சட்டமூலம்
RECOVERY OF LOANS BY BANKS (SPECIAL PROVISIONS) (AMENDMENT) BILL

දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.

இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.

Order for Second Reading read.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)

(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය. පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது. அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.

Question put, and agreed to. Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය:
"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." -[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

தீர்மானிக்கப்பட்டது.

"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப் படுமாக" [மாண்புமிகு நிமல் சிறிபால த சில்வா]

Resolved:

"That the Bill be referred to a Committee of the whole Parliament." -[The Hon. Nimal Siripala de Silva]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.
[නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]

குழுவில் ஆராயப்பட்டது.
[பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]

Considered in Committee.
[MR. DEPUTY SPEAKER in the Chair.]

1 වන වගන්තිය.- (ලුහුඬු නාමය)
வாசகம் 1.- (சுருக்கப் பெயர்)
CLAUSE 1.- *(Short title)*

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)

(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"1 වන පිටුවේ, 3 සිට 5 දක්වා පේළි (එම පේළි දෙකද ඇතුළුව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය — 1. මේ පනත 2011 අංක දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, 2011 ජනවාරි මස 28 වන දින සිට ක්‍රියාත්මක වන ලෙස සලකනු ලැබිය යුතුය.' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendment put, and agreed to.

1 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

1ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 1, as amended, ordered to stand part of the Bill.

2 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

2ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 2 ordered to stand part of the Bill.

ගරු කරු ජයසූරිය මහතා

(மாண்புமிகு கரு ஜயசூரிய)

(The Hon. Karu Jayasuriya)

ගරු සභාපතිතුමනි, මම පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"යෝජිත පනත් කෙටුම්පතේ 3 වන වගන්තිය වශයෙන් පහත දැක්වෙන වගන්තිය ඇතුළත් කළ යුතුය:

'3. 'රුපියල් මිලියන 5' යන වචන වෙනුවට පනත් කෙටුම්පතේ එම වචන සඳහන් වන සෑම තැනෙකදීම 'රුපියල් මිලියන 50' යන වචන ආදේශ කිරීමෙන් 5(අ)(1) වගන්තිය සංශෝධනය කරනු ලැබිය යුතු ය.' "

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)

(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, මේ සංශෝධිත පනත් කෙටුම්පතේ තුන්වන වගන්තියේ තිබෙන්නේ මෙහෙමයි:

"In the event of an inconsistency between the Sinhala and Tamil texts of this Act, the Sinhala text to prevail".

This is what is contained in Clause 3 of this amended Bill. So, now, Hon. Karu Jayasuriya wanted to insert something to this particular Clause, which is quite out of order because now you cannot amend Clause 3.

How can you amend this Clause by amending the words "Rs. five million" to "Rs. fifty million"? I think somebody has given him a dead rope. This is out of context and out of order because Clause 1 was passed and Clause 2 was passed. Then, when we came to Clause 3, you moved the amendment to Clause 3, which was very clear. You said that Clause 3 must be amended in this manner. - [*Interruption.*]

ගරු රවි කරුණානායක මහතා

(மாண்புமிகு ரவி கருணாநாயக்க)

(The Hon. Ravi Karunanayake)

But, you have to amend Clause 3. [*Interruption.*]

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

No, no. Mr. Chairman, you put Clause 1 to the House and it was passed. Then, you put Clause 2 to the House and that was also passed.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

Either he cannot read English or something is wrong.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

I think you have been confused. I think you have not been properly briefed on this. Honourable third Deputy Leader of the UNP, you have not been properly briefed on this.[*Interruption.*]

ගරු කරු ජයසූරිය මහතා
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)

Hon. Minister, you should know what to talk. I am indeed sorry that the Hon. Sarath Amunugama talked like this.

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

But, the fact is that you have not referred to the proper Section. [*Interruption.*]

ගරු කරු ජයසූරිය මහතා
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)

That is right. But, how dare you say about my English?

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

You must refer to the proper Clause.

ගරු කරු ජයසූරිය මහතා
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)

Yes, that is what I am trying to do. - [*Interruption.*]

ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා
(மாண்புமிகு கலாநிதி சரத் அமுனுகம)
(The Hon. (Dr.) Sarath Amunugama)

That is the procedure in this House. - [*Interruption.*]

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

No, no. Now, there is nothing to amend. Hon. Chairman, Clause 1 has been amended in the way the Government proposed and that was affirmed. Then, there was no amendment to Clause 2 and that was also affirmed. When we came to Clause 3 only, you wanted Clause 3 to be amended in that way, which is not in order. [*Interruption.*]

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

That is a mistake.

සභාපතිතුමා
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

Hon. Member, anyway, by this Amendment it is not possible to -

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

No, no. That is another issue, Hon. Chairman. Now he has not moved the -

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

But, what is the procedure of this House?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

In any case, this Amendment will amend only the principal Act.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

When he got up, you were talking about Clause 1. In any case, we have said that -

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

If he has to say anything, let him say as a courtesy to -

ගරු ගීතාංජන ගුණවර්ධන මහතා
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)

You must get the advice from your Leader before you move such things.

ගරු කරු ජයසූරිය මහතා
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)

I have reason to say so.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

So, that is why I allow you to speak.

ගරු කරු ජයසූරිය මහතා
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)

I am speaking on behalf of the small and medium traders. So, at least, if I cannot talk about them in this House, what is the use? Do not talk about the technicality.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

No, no, technicalities are also needed.

සභාපතිතුමා
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

Hon. Karu Jayasuriya, you may conclude.

ගරු කරු ජයසූරිය මහතා
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)

I hereby give notice that I shall, at the appropriate stage, move the following Amendments to the Recovery of Loans by Banks (Special Provisions) (Amendment) Bill:

"1. Insert the following as Clause (3) of the proposed Bill:

> Amend 5A (1) by substituting the words Rs. fifty million for the words Rs. five million whenever such words appear in the Bill.

2. And adding another proviso at the end of the proviso in Section 5A of the amendment to read as follows:

> "Provided also that these provisions shall apply to all pending and or proposed actions by any Bank."

3. By renumbering Clause (3) as presently appearing in the proposed Bill as Clause (4)."

ඔබතුමන්ලාට මේක කරන්න බැරි නම් "ඒක කරන්න බැහැ" යි කියන්න. අපි සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් වෙනුවෙනුයි මේ කථා කළේ. ඉතින් මේක මෙතරම් මහා ඝෝෂාවක් කරලා, අර පැත්තෙන් නියෝජ්‍ය මුදල් අමාත්‍යතුමා සද්ද කරලා—[බාධා කිරීමක්]

සභාපතිතුමා
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

Order, please! ගරු සභානායකතුමා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, කරුණු දෙකක් තිබෙනවා. පළමුවන කාරණය මේකයි. ගරු සභාපතිතුමනි, මෙවැනි සංශෝධනයක් ගෙන ඒමට පුළුවන්කමක් නැහැ.

ගරු කරු ජයසූරිය මහතා
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)

එහෙනම් බැහැයි කියන්න.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ඉන්න, ඉන්න, අපි හේතුව කියන්නම්. සංශෝධනය ගෙන ඒමට බැරි හේතුව මේකයි. [බාධා කිරීමක්]

සභාපතිතුමා
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

Order, please!

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

එතුමාගේ සංශෝධනයෙන් සංශෝධනය කිරීමට බලාපොරොත්තු වන්නේ original Act එකේ තිබෙන 5 (a) වගන්තිය. දැන් අප ඉදිරියේ තිබෙන සංශෝධන පනත් කෙටුම්පතේ තිබෙන්නේ "amount" කියන වචනය වෙනුවට "principal amount borrowed" කියන වචන දමන එක විතරයි. Amendment එකක් ගෙනෙනවා නම්, ඒ පිළිබඳව amendment එකක් ගෙන ඒමට පමණයි පුළුවන් වන්නේ. මේ සංශෝධනයක් ගෙනැවිත් තිබෙන වෙලාවේ මුල් පනතක් amend කරන්න පුළුවන්කමක් නැහැ. That is my legal submission.

The second point is, in any case the Government is not accepting that amendment. - [*Interruption.*] For this reason - ගරු සභාපතිතුමනි, එතුමා කියනවා, මධ්‍යම පන්තියේ ව්‍යවසායකයන් වෙනුවෙන් මේක කරනවාය කියා. අපි මේක කරන්නේ මේ රටේ සාමාන්‍ය ජනතාව වෙනුවෙනුයි. අපේ රටේ ගොවීන්, කම්කරුවන්, ගුරුවරුන්, රාජ්‍ය සේවකයන් ආදී මේ අය බැංකුවල මුදල් ආයෝජනය කර තිබෙනවා. ඒ ආයෝජනය කරන ලද මුදල් බැංකුවලින් පොලියට දීලා නැවත ඒවා recover කර ගන්න ඕනෑ, ඔවුන්ගේ ආයෝජන ශක්තිමත් කර ගැනීම සඳහා. ඒ නිසා මේ ආකාරයෙන් අපි මේකට ඉඩ දුන්නොත් මේක කරන්න හම්බ වෙන්නේ නැහැ. එහෙම වුණොත් මේක ජනතා හිතවාදී amendment එකක් වෙන්නේ නැහැ.- [*Interruption.*]

සභාපතිතුමා
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

Order, please! Hon. Ravi Karunanayake, the Government is not accepting that amendment. So, we will move on to the other one.

3 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

3ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 3 ordered to stand part of the Bill.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

சட்டமூலம் திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டது.

Enacting Clause and Title ordered to stand part of the Bill.

Bill reported with Amendments.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන්, දැන් තුන්වන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் மூன்றாம் முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.
Question put, and agreed to.
Bill, as amended, accordingly read the Third time, and passed.

සුරාබදු (සංශෝධන) පනත් කෙටුම්පත
மதுவரி (திருத்தம்) சட்டமூலம்
EXCISE (AMENDMENT) BILL

දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.
வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.
Question put, and agreed to.
Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය:
"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." - [ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

தீர்மானிக்கப்பட்டது.
"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப் படுமாக" [மாண்புமிகு நிமல் சிறிபால த சில்வா]
Resolved:
"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Nimal Siripala de Silva]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.
[නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]
குழுவில் ஆராயப்பட்டது.
[பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]
Considered in Committee.
[MR. DEPUTY SPEAKER in the Chair.]

1 සිට 3 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.
1ஆம் வாசகத்திலிருந்து 3ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses 1 to 3 ordered to stand part of the Bill.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
පනත් කෙටුම්පත, සංශෝධන රහිතව වාර්තා කරන ලදී.
சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
சட்டமூலம் திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டது.
Enacting Clause and Title ordered to stand part of the Bill.
Bill reported without Amendments.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් තුන්වන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන්වන වර කියවා සම්මත කරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் மூன்றாம் முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.

Question put, and agreed to.
Bill accordingly read the Third time, and passed.

විදුලිසංදේශ බදු පනත් කෙටුම්පත
தொலைத்தொடர்பு அறவீட்டுச் சட்டமூலம்
TELECOMMUNICATION LEVY BILL

දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.

Question put, and agreed to.
Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය:
"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." - [ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

தீர்மானிக்கப்பட்டது.
"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப் படுமாக" [மாண்புமிகு நிமல் சிறிபால த சில்வா]
Resolved:
"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Nimal Siripala de Silva]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.
[නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]

குழுவில் ஆராயப்பட்டது.
[பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]

Considered in Committee.
[MR. DEPUTY SPEAKER in the Chair.]

1 සිට 12 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

1ஆம் வாசகத்திலிருந்து 12ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses 1 to 12 ordered to stand part of the Bill.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
පනත් කෙටුම්පත, සංශෝධන රහිතව වාර්තා කරන ලදී.
சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
சட்டமூலம் திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டது.
Enacting Clause and Title ordered to stand part of the Bill.
Bill reported without Amendments.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් තුන්වන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන්වන වර කියවා සම්මත කරන ලදී.
வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் மூன்றாம் முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.
Question put, and agreed to.
Bill, accordingly read the Third time, and passed.

දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත
உண்ணாட்டரசிறை (திருத்தம்) சட்டமூலம்
INLAND REVENUE (AMENDMENT) BILL

දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කිය විය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.
வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.
Question put, and agreed to.
Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය:
"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." - [ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]
தீர்மானிக்கப்பட்டது.
"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப் படுமாக" [மாண்புமிகு நிமல் சிறிபால த சில்வா]
Resolved:
"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Nimal Siripala de Silva]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.
[නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]
குழுவில் ஆராயப்பட்டது.
[பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]
Considered in Committee.
[MR. DEPUTY SPEAKER in the Chair.]

1 සහ 2 වන වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.
1ஆம், 2ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses 1 and 2 ordered to stand part of the Bill.

3 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම)
வாசகம் 3.- (முதன்மைச் சட்டவாக்கத்தின் 7ஆம் பிரிவைத் திருத்துதல்.)
CLAUSE 3.- *(Amendment of section 7 of the principal enactment.)*

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "1 වන පිටුවේ, 26 වන පේළියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ඇතුළත් කරන්න:

'(1) ඒ වගන්තියේ (ආ) ඡේදයෙහි (Ix) වන අනුඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් අනුඡේදය එකතු කිරීම මඟින්;

(Ixi) 2000 අංක 43 දරන ශ්‍රී ලංකා රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ලාභ සහ ආදායම්;' "

(2) "2 වන පිටුවේ, 11 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'සමූපකාර සමිතියක ලාභ සහ ආදායම් සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද ලක් සතොස සමාගමේ ලාභ සහ ආදායම්;' "

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendments put, and agreed to.

3 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
3ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 3, as amended, ordered to stand part of the Bill.

4 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම)
வாசகம் 4.- (முதன்மைச் சட்டவாக்கத்தின் 8ஆம் பிரிவைத் திருத்துதல்.)
CLAUSE 4.- *(Amendment of section 8 of the principal enactment.)*

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"4 වන පිටුවේ, 21 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'උද්ගත වන නිල පඩි නඩි;

(ප) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන සහ ශ්‍රී ලංකාවේ වාසික නොවන යම් පුද්ගලයෙකුට ශ්‍රී ලංකාවෙහි උද්ගත වන නිල පඩි නඩිවලින් රුපියල් ලක්ෂ එකක් නොඉක්මවන යම් කොටසක්;' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendment put, and agreed to.

4 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

4ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 4, as amended, ordered to stand part of the Bill.

5 සිට 12 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

5ஆம் வாசகத்திலிருந்து 12ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clauses 5 to 12 ordered to stand part of the Bill.

13 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය සංශෝධනය කිරීම)

வாசகம் 13.- (முதன்மைச் சட்டவாக்கத்தின் 23ஆம் பிரிவைத் திருத்துதல்.)

CLAUSE 13.- *(Amendment of section 23 of the principal enactment.)*

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)

(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"12 වන පිටුවේ, 6 වන පේළියේ සිට 9 වන පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙකද ඇතුළුව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න.

'23 වන වගන්තියේ (1) වන උපවගන්තියේ තවදුරටත් වූ අතුරු විධානයේ 'අවුරුදු තුනක් විය යුතු ය' යන වචන වෙනුවට පහත දැක්වෙන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ;

'අවුරුදු තුනක් විය යුතු ය.' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendment put, and agreed to.

13 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

13ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 13, as amended, ordered to stand part of the Bill.

14 සිට 16 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

14ஆம் வாசகத்திலிருந்து 16ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clauses 14 to 16 ordered to stand part of the Bill.

17 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය සංශෝධනය කිරීම)

வாசகம் 17.- (முதன்மைச் சட்டவாக்கத்தின் 33ஆம் பிரிவைத் திருத்துதல்.)

CLAUSE 17.- *(Amendment of Section 33 of the principal enactment.)*

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)

(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "17 වන පිටුවේ, 29 වන පේළියේ සිට 31 වන පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙකද ඇතුළුව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න.

'අඩු කිරීමට ඔහුට හිමිකම් නොලැබිය යුතු ය:

එසේ වුව ද, තවදුරටත් 2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව ආරම්භවන්නා වූ යම් තක්සේරු වර්ෂයක් සඳහා -

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන යම් පුද්ගලයකු ඒ පුද්ගලයා ශ්‍රී ලංකාවේ වාසිකයෙකු වූයේ ද, නොවූයේ ද, (අ) ඡේදයේ සඳහන් දීමනාවට හිමිකමක් ලබයි;

(ii) තක්සේරු කළ හැකි ආදායමට ඇතුළත් කර ඇති යම් සේවා නියුක්ත ආදායමකින්, 34 වන වගන්තිය යටතේ යම් දීමනාවක කොටසක් අඩු කිරීම සඳහා යම් පුද්ගලයකුට හිමිකමක් නොතිබිය යුතු ය.' "

(2) "18 වන පිටුවේ, 1 වන පේළියේ සිට 3 වන පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙකද ඇතුළුව) ඉවත් කරන්න."

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendments put, and agreed to.

17 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

17ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 17, as amended, ordered to stand part of the Bill.

18 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය සංශෝධනය කිරීම)

வாசகம் 18.- (முதன்மைச் சட்டவாக்கத்தின் 34ஆம் பிரிவைத் திருத்துதல்.)

CLAUSE 18.- *(Amendment of Section 34 of the principal enactment.)*

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)

(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"18 වන පිටුවේ, 14 වන පේළියේ සිට 20 වැනි පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙකද ඇතුළුව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න.

'මුදල් වශයෙන් යම් පුද්ගලයකු විසින් 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙර ගෙවනු ලැබූ' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ඇ) (ඉ) ඡේදයේ 'පුද්ගලයකු විසින් ගෙවන ලද යම් දායක මුදල්' යන වචන වෙනුවට 'පුද්ගලයකු විසින් 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙර ගෙවන ලද යම් දායක මුදල්' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendment put, and agreed to.

18 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

18ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 18, as amended, ordered to stand part of the Bill.

19 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තිය සංශෝධනය කිරීම)
வாசகம் 19.- (முதன்மைச் சட்டவாக்கத்தின் 42ஆம் பிரிவைத் திருத்துதல்.)
CLAUSE 19.- *(Amendment of section 42 of the principal enactment.)*

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)

(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"19 වන පිටුවේ, 21 වන පේළියේ සිට 25 වන පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙකද ඇතුළුව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න.

'ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තිය සංශෝධනය කිරීම	19. 2007 අංක 10 දරන පනතින් ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තියේ (2) වන උපවගන්තියේ 'ශ්‍රී ලංකාවේ දී උපචිත වන ලාභ සහ ආදායම්' යන වචන වෙනුවට '2011 අප්‍රේල් මස 1 වන දිනට පෙර ශ්‍රී ලංකාවේදී උද්ගත වන ලාභ සහ ආදායම්' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendment put, and agreed to.

19 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

19ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 19, as amended, ordered to stand part of the Bill.

20 සිට 22 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

20ஆம் வாசகத்திலிருந்து 22ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clauses 20 to 22 ordered to stand part of the Bill.

23 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියට 59අ සහ 59ආ යන වගන්ති ඇතුලත් කිරීම)
வாசகம் 23.- (முதன்மைச் சட்டவாக்கத்தின் 59அ மற்றும் 59ஆ என்னும் புதிய பிரிவுகளைத் திருத்துதல்.)
CLAUSE 23.- *(Insertion of new section 59A and 59B in the principal enactment.)*

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)

(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "20 වන පිටුවේ, 20 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'59අ. 2011 අප්‍රේල් මස 1 වන දිනෙන් හෝ ඉන්;' "

(2) "20 වන පිටුවේ, 28 වන පේළියේ සිට 31 වන පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙකද ඇතුළුව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'මේ පනතේ වෙනත් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, පස්වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උචිත අනුප්‍රමාණයෙන් ආදායම් බද්දට යටත් කළ යුතු ය;' "

(3) "21 වන පිටුවේ, 4 වන පේළියේ සිට 6 වන පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙකද ඇතුළුව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'යම් තැනැත්තකු විසින් ලබන ලාභ සහ ආදායම, මේ පනතේ වෙනත් විධිවිධානයක පටහැනිව කුමක්;' "

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendments put, and agreed to.

23 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

23ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 23, as amended, ordered to stand part of the Bill.

24 සිට 26 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

24ஆம் வாசகத்திலிருந்து 26ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clauses 24 to 26 ordered to stand part of the Bill.

27 වන වගන්තිය. - (ප්‍රධාන ප්‍රඥප්තියේ XI ඡේදයට නව ශීර්ෂ සහ 205අ නව වගන්තිය ඇතුලත් කිරීම)
வாசகம் 27.-(முதன்மைச்ச ட்டவாக்கத்தின் அத்தியாயம் XIஇல் புதிய தலைப்பையும் 205அ என்னும் பிரிவையும் உட்புகுத்துதல்)
CLAUSE 27.- *(Insertion of new heading and new Section 205A in Chapter XI of the principal enactment.)*

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)

(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"24 වන පිටුවේ, 10 වන පේළියේ සිට 24 වන පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙකද ඇතුළුව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(3) දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින්, යම් නිශ්චිත ඉස්ලාමීය මූල්‍ය ගණුදෙනුවකින් පැන නඟින සැපයුම් අගය බද්දට යටත් විය යුත්තේ කවර ප්‍රමාණයකට ද යන්න තීරණය කිරීම සඳහා -

(අ) ඉස්ලාමීය මූල්‍ය ගණුදෙනුවකට තුඩු දෙන්නා වූ අවස්ථානුගත කරුණු හඳුනා ගැනීමේ කාර්ය සඳහා; සහ

(ආ) යම් ඉස්ලාමීය මූල්‍ය ගණුදෙනුවකින් පැන නඟින සැපයුම් අගය සොයා දැනගැනීම සඳහා, අවශ්‍ය විය හැකි පරිදි, කලින් කල, රීති සහ මාර්ගෝපදේශ නිකුත් කළ යුතු ය.' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendment put, and agreed to.

27 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

27ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 27, as amended, ordered to stand part of the Bill.

28 සිට 38 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

28ஆம் வாசகத்திலிருந்து 38ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clauses 28 to 38 ordered to stand part of the Bill.

39 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 163 වන වගන්තිය සංශෝධනය කිරීම.)

வாசகம் 39.-(முதன்மைச் சட்டவாக்கத்தின் 163ஆம் பிரிவைத் திருத்துதல்)

CLAUSE 39.- *(Amendment of section 163 of the principal enactment)*

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)

(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"30 වන පිටුවේ, 20 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(2)(ආ) ඡේදයේ 'ඒ තක්සේරු වර්ෂයේ අවසානයේ සිට' ;"

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendment put, and agreed to.

39 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

39ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 39, as amended, ordered to stand part of the Bill.

40 සිට 50 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

40ஆம் வாசகத்திலிருந்து 50ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clauses 40 to 50 ordered to stand part of the Bill.

51 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ පස්වන උපලේඛණය සංශෝධනය කිරීම.)

வாசகம் 51.- (முதன்மைச் சட்டவாக்கத்தின் ஐந்தாம் அட்டவணையைத் திருத்துதல்)

CLAUSE 51.- *(Amendment of the Fifth Schedule to the principal enactment.)*

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)

(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "37 වන පිටුවේ, 9 වන පේළියේ සිට 34 වන පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙකද ඇතුළුව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'ප්‍රධාන ප්‍රඥප්තියේ පස්වන උපලේඛනය සංශෝධනය කිරීම	51. 2008 අංක 9 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ පස්වන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

(i) එම උපලේඛනයේ 5 වන අයිතමය වෙනුවට පහත සඳහන් අයිතමය ද ආදේශ කිරීමෙන්:

'5. යම් විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකකයක විදේශ ව්‍යවහාර මුදලින් සිදු කෙරෙන අක්වෙරළ ගනුදෙනුවකින් උද්ගතවන ලාභ සහ ආදායම් සම්බන්ධයෙන් ආදායම් බද්දේ අනුප්‍රමාණය -

(අ)	2011 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භවන යම් තක්සේරු වර්ෂයක් සඳහා	සියයට 20
(ආ)	2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා	දෙවන උපලේඛනය ප්‍රකාරව අදාළ අනුප්‍රමාණය.'

(41 වන වගන්තිය)"

(2) "එම උපලේඛනයේ 6 වන අයිතමයේ 'ප්‍රතිලාභියකු උපදින ලාභ සහ ආදායම' යන වචන වෙනුවට 'ප්‍රතිලාභියෙකුට 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව උද්ගත වන ලාභ සහ ආදායම' යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්;"

(3) "එම උපලේඛනයේ 8 වන අයිතමයේ 'කොටස් බලපත්‍ර බැහැර කිරීම සම්බන්ධයෙන් වූ ලාභ හෝ ලැබීම්' යන වචන වෙනුවට 'කොටස් බලපත්‍ර 2007 මාර්තු මස 31 වන දින හෝ ඊට පෙරාතුව බැහැර කිරීම සම්බන්ධයෙන් වූ ලාභ හෝ ලැබීම්' යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්:"

(4) "ඒ උපලේඛනයේ 9 වන අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:

'9. සමාගමක් නොවන තැනැත්තෙකු විසින් පවත්වාගෙන යනු ලබන්නා වූ ද, 45 වන වගන්තියේ හෝ 217 වන වගන්තියේ අර්ථ නිරූපනය කර ඇති පරිදි වන්නාවූ ද,

(අ)	කෘෂිකර්මය, සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය හෝ ඉදිකිරීම් වැඩ සඳහා වූ ව්‍යවසායකින් 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ලාභ මත ආදායම් බදු අනුප්‍රමාණය	පළමුවන උපලේඛනය ප්‍රකාරව, සියයට 15 ක උපරිමයකට යටත්ව

(ආ) කෘෂිකර්මය, සත්ව ආහාර නිෂ්පාදනය, සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය හෝ ඉදිකිරීම් වැඩ සඳහා වූ ව්‍යවසායකින් 2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ලාභ සහ ආදායම් බදු අනුප්‍රමාණය	පළමුවන උපලේඛනය ප්‍රකාරව, සියයට 12ක උපරිමයකට යටත්ව':

(45 වන වගන්තිය)"

(5) "ඒ උපලේඛනයේ 10 වන අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:

'10 සමාගමක් විසින් පවත්වාගෙන යනු ලබන්නා වූ ද 46 වන වගන්තියේ හෝ 217 වන වගන්තියේ අර්ථ නිරූපනය කර ඇති පරිදි වන්නාවූද,

(අ) කෘෂිකර්මය, සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය හෝ ඉදිකිරීම් වැඩ සඳහා වූ ව්‍යවසායකින් 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ලාභ මත ආදායම් බදු අනුප්‍රමාණය	සියයට 15
(ආ) කෘෂිකර්මය, සත්ව ආහාර නිෂ්පාදනය, සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය හෝ ඉදිකිරීම් වැඩ සඳහා වූ ව්‍යවසායකින් 2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ලාභ මත ආදායම් බදු අනුප්‍රමාණය'	සියයට 12

(46 වන වගන්තිය)"

(6) "එම උපලේඛනයේ 11 වන අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:

'11. විශේෂිත නිවාස බැංකුවලට අදාළ -

(අ) 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා අනුප්‍රමාණය	සියයට 20
(ආ) 2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා අනුප්‍රමාණය	දෙවන උපලේඛනය යටතේ උචිත අනුප්‍රමාණයම.';

(47 වන වගන්තිය)"

(7) "එම උපලේඛනයේ 14 වන අයිතමයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් අයිතමය ඇතුළත් කිරීමෙන්:

'14අ 2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා 16 වන වගන්තියේ සඳහන් යම් ව්‍යවසායක ලාභ සහ ආදායම සම්බන්ධයෙන්	පළමුවන උපලේඛනය ප්‍රකාරව පුද්ගලයෙකු සම්බන්ධයෙන් සියයට 10ක උපරිමයකට යටත්ව සහ සමාගමක් සම්බන්ධයෙන් සියයට 10.':

(48අ වන වගන්තිය)"

(8) "එම උපලේඛනයේ 16 වන අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:

'16. 2014 අප්‍රේල් මස 1 වන දිනට පෙර නිශ්චිත ව්‍යවසායක් කරගෙන යාම ආරම්භ කරන සමාගමක් නොවන තැනැත්තෙකුගේ -

(අ) 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සුදුසුකම් ලැබූ අපනයන ලාභ සහ ආදායම් සම්බන්ධයෙන් අනුප්‍රමාණය	පළමුවන උපලේඛනය ප්‍රකාරව සියයට 15ක උපරිමයකට යටත්ව
(ආ) 2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සුදුසුකම් ලැබූ අපනයන ලාභ සහ ආදායම් සම්බන්ධයෙන් අනුප්‍රමාණය	පළමුවන උපලේඛනයට ප්‍රකාරව සියයට 12ක උපරිමයකට යටත්ව'

(50 වන වගන්තිය)"

(9) "එම උපලේඛනයේ 17 වන අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්;

'17. 2014 අප්‍රේල් මස 1 වන දිනට පෙර නිශ්චිත ව්‍යවසායක් කරගෙන යාම ආරම්භ කරන සමාගමක -

(අ) 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සුදුසුකම් ලැබූ අපනයන ලාභ සහ ආදායම් සම්බන්ධයෙන් අනුප්‍රමාණය	සියයට 15
(ආ) 2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සුදුසුකම් ලැබූ අපනයන ලාභ සහ ආදායම් සම්බන්ධයෙන්	සියයට 12';

(51 වන වගන්තිය)"

(10) "එම උපලේඛනයේ 18 වන අයිතිමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්;

'18. 2015 අප්‍රේල් මස 1 වන දිනට පෙර නිශ්චිත ව්‍යවසායක් කරගෙන යාම ආරම්භ කරන සමාගමක -

(අ) 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙර ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සුදුසුකම් ලැබූ අපනයන ලාභ සහ ආදායම් සම්බන්ධයෙන් අනුප්‍රමාණය	සියයට 15
(ආ) 2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සුදුසුකම් ලැබූ අපනයන ලාභ සහ ආදායම් සම්බන්ධයෙන් අනුප්‍රමාණය.	සියයට 12';

(52 වන වගන්තිය)"

(11) "එම උපලේඛනයේ 20 වන අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:

'20. යම් තැනැත්තෙකුගේ හෝ හවුල් ව්‍යාපාරයක -

(අ) 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සැලකුණු අපනයනවලින් ලැබූ ලාභ සහ ආදායම් සම්බන්ධයෙන් අනුප්‍රමාණය	පළමුවන උපලේඛන ප්‍රකාරව, පුද්ගලයෙකු සම්බන්ධයෙන් සියයට 15 උපරිමයට යටත්ව සහ සමාගමක් සඳහා සියයට 15
(ආ) 2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සැලකුණු අපනයනවලින් ලැබූ ලාභ සහ ආදායම් සම්බන්ධයෙන් අනුප්‍රමාණය.	පළමුවන උපලේඛනය ප්‍රකාරව, පුද්ගලයෙකු සම්බන්ධයෙන් සියයට 12 උපරිමයට යටත්ව සහ සමාගමක් සඳහා සියයට 12':

(56 වන වගන්තිය)"

(12) "එම උපලේඛනයේ 24 වන අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:

'24. කිසියම් හවුල් ව්‍යාපාරයක, යම් තක්සේරු කිරීමක් මත හැර, -

(අ) 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා බෙදිය හැකි ලාභ සහ වෙනත් ආදායම් මත බදු අනුප්‍රමාණය	සියයට 10
(ආ) 2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා බෙදිය හැකි ලාභ සහ වෙනත් ආදායම් මත බදු අනුප්‍රමාණය	සියයට 8':

(78 වන වගන්තිය)"

(13) "එම උපලේඛනයේ 25 වන අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:

'25. විනෝදාස්වාදය සපයන්නෙකුගේ හෝ ශිල්පියකුගේ වෘත්තිය හෝ රැකියාව කරගෙන යනු ලබන ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු නොවන තැනැත්තෙකුට අදාළව ආදායම් බදු අනුප්‍රමාණය -

(අ) 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා	සියයට 15
(ආ) 2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා	සියයට 12';

(96 වන වගන්තිය)"

(14) "එම උපලේඛනයේ 26 වන අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:

'26. 105 වන වගන්තියේ සඳහන් පරිදි ඛනිජ තෙල් කැනීමෙන් යම් තැනැත්තෙකු හෝ හවුල් ව්‍යාපාරයක හවුල්කරුවෙකු ලබා ගත් කිසියම් ලාභාංශයකට සහ ආදායමකට අදාළව.

(අ) 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බදු අනුප්‍රමාණය	සියයට 15
(ආ) 2011 අප්‍රේල් 1 දින හෝ ඊට පසුව ආරම්භ වන තක්සේරු වර්ෂයක් සඳහා ලැබූ ලාභ සහ ආදායම සම්බන්ධයෙන් අනුප්‍රමාණය	සියයට 12';

(105 වන වගන්තිය)"

(15) "එම උපලේඛනයේ 27 වැනි අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:

'27. රාජ්‍ය නොවන සංවිධානයක් විසින් පිහිටුවන ලද අරමුදලකට ලැබුණ හෝ අරමුදල් ලැබීම මත වූ ලාභවලට අදාළව -

(අ) 2011 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බදු අනුප්‍රමාණය	සියයට 30
(ආ) 2011 අප්‍රේල් මස 1 වන දින හෝ ඊට පසුව ආරම්භ වන තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බදු අනුප්‍රමාණය	සියයට 28';

(102 වන වගන්තිය)"

(16) "එම උපලේඛනයේ 28 වන අයිතමයට ඉක්බිතිවම, පහත දැක්වෙන අයිතමයන් එකතු කිරීමෙන්:

'29. යම් පුද්ගලයකු හෝ හවුල් ව්‍යාපාරයක් 2011 අප්‍රේල් මස 1 වන දිනෙන් ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා මද්‍යසාර හෝ දුම්කොළ නිෂ්පාදිතයන්, නිෂ්පාදනයෙන් හා විකිණීමෙන් හෝ ආනයනය හා විකිණීමෙන් ලැබෙන ලාභ හෝ ආදායම සංයුක්ත වන එම පුද්ගලයාගේ හෝ හවුල් ව්‍යාපාරයේ බදු අය කළ හැකි ආදායමේ, අදාළ ආදායම් බදු අනුප්‍රමාණය	සියයට 40
30. 59අ වගන්තියේ සඳහන් යම් ව්‍යවසායකින් යම් පුද්ගලයකු ලබන්නා වූ ලාභ කොටස මත අදාළ කළ හැකි ආදායම් බදු අනුප්‍රමාණය	පළමුවන උපලේඛනය ප්‍රකාරව, එහෙත් පුද්ගලයකු සම්බන්ධයෙන් සියයට 10 උපරිමයකට සහ සමාගමක් සම්බන්ධයෙන් සියයට 10
31. ගබඩා කිරීමේ, මෘදුකාංග සංවර්ධනය කිරීමේ හෝ කම්කරුවන් සැපයීමේ පහසුකම් ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යෑම සඳහා ශ්‍රී ලංකාවේ දී පවත්වාගෙන යනු ලබන යම් ආයතනයක ලාභ සහ ආදායමට අදාළව ආදායම් බදු අනුප්‍රමාණය	පළමුවන උපලේඛනය ප්‍රකාරව, එහෙත් පුද්ගලයකු සම්බන්ධයෙන් සියයට 10 උපරිමයකට සහ සමාගමක් සම්බන්ධයෙන් සියයට 10
32. අධ්‍යාපනික සේවාවන් මඟින් උද්ගත වන ලාභ සහ ආදායම් මත ආදායම් බදු අනුප්‍රමාණය	පළමුවන උපලේඛනය ප්‍රකාරව, එහෙත් පුද්ගලයකු සම්බන්ධයෙන් සියයට 10 උපරිමයකට සහ සමාගමක් සම්බන්ධයෙන් සියයට 10
33. මිලට ගෙන විකිණීමේ කටයුත්තක් නොවන වාර්ෂික පිරිවැය මිලියන තුන්සිය නොඉක්මවන යම් ව්‍යවසායකට අදාළ ආදායම් බදු අනුප්‍රමාණය	සියයට 10'.

'208අ අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

52. ප්‍රධාන ප්‍රඥප්තියේ 208 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි 208අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය:

පනත්වල විධිවිධාන අර්ථ නිරූපනය කිරීම සඳහා කමිටුවට අවසර දීම.

208අ. කොමසාරිස් ජනරාල්වරයා විසින්, දේශීය ආදායම්දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධරයන්ගෙන් සමන්විත කමිටුවක්, ඔහු විසින් පරිපාලනය කරනු ලබන සියලු පනත්හි විධිවිධාන, එකී පනත්වල පටහැනිව කුමක් සඳහන් වුවද, අර්ථ නිරූපනය කිරීම සඳහා අවසරය සහිතව පත් කරනු ලැබිය යුතු ය. එකී අර්ථ නිරූපනය සම්බන්ධයෙන් ඒකාකාරී බවක් පවත්වාගෙන යාම සහතික කරනු වස් එම කමිටුව විසින් එම අවසරයට අදාළව අවශ්‍ය සියලු මාර්ගෝපදේශ සහ උපදෙස් නිකුත් කළ යුතු ය.

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් විසින් ගෙවිය යුතු ආදායම් බද්ද නිදහස් කිරීම.

53. 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත යටතේ ආදායම් බදු ගෙවීමට යටත් වන, රුපියල් මිලියන සියයක් නොඉක්මවන වාර්ෂික පිරිවැටුමක් පවත්නා යම් ව්‍යවසායක් කරගෙන යනු ලබන යම් පුද්ගලයකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින්, 2010 මාර්තු මස 31 වන දිනට පෙරාතුව අවසන් වන යම් තක්සේරු වර්ෂයක් සඳහා එකී පනත යටතේ ආදායම් බදු ගෙවීම, ගැටුම්කාරී වාතාවරණයක් පැවතීම හෝ මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් පැහැර හැර ඇත්නම්, එම පුද්ගලයා හෝ හවුල් ව්‍යාපාරය බදු ගෙවීමෙන් නිදහස් කරනු ලැබිය යුතු ය:

එසේම, තත්කාර්ය සඳහා කරන ලද ඉල්ලීමකට අනුව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් ගෙවීම පැහැර හැර ඇති බදු සම්බන්ධයෙන් නිදහස් කිරීමේ සහතිකයක් එකී තැනැත්තා වෙත හෝ හවුල් ව්‍යාපාරය වෙත නිකුත් කරනු ලැබිය යුතු ය:

එසේම තවදුරටත්, නිදහස් කිරීමේ සහතිකය නිකුත් කර ඇත්තේ යම් පුද්ගලයකු හෝ හවුල් ව්‍යාපාරයක් වෙතද, එම පුද්ගලයා හෝ හවුල් ව්‍යාපාරය විසින්, 2010 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් එකී පනත යටතේ තමා විසින් ගෙවිය යුතු වන සියලු මුදල් ගෙවීම සඳහා එම පුද්ගලයා හෝ හවුල් ව්‍යාපාරය වග කියනු ලබන බවට වූ ලිඛිත සහතිකයක් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඒ සමගම ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

අතීතයට බලපෑම.

54. මේ පනතේ විධිවිධාන මඟින් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධන සියලු කාර්ය සඳහා 2011 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වන ලෙස සලකනු ලැබිය යුතු ය.

එසේ වුවද:-

(අ) මේ පනතේ 3 වන වගන්තියේ (2) වන උපවගන්තිය මඟින් 7 වන වගන්තියට කරන ලද සංශෝධන සියලු කාර්ය සඳහා 2008 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මකභාවයට පැමිණ ඇති බවට සලකනු ලැබිය යුතු ය.

(ආ) මේ පනතේ පිළිවෙළින් 10 වන, 11 වන සහ 12 වන වගන්ති මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 20, 21 සහ 21අ වගන්තිවලට කරන ලද සංශෝධන සියලු කාර්ය සඳහා 2009 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මකභාවයට පැමිණ ඇති බවට සලකනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

55. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.'"

(17) "38 වන පිටුවේ, 1 වන පේළියේ සිට 35 වන පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙකද ඇතුළුව) ඉවත් කරන්න."

(18) "39 වන පිටුවේ, 1 වන පේළියේ සිට 35 වන පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙකද ඇතුළුව) ඉවත් කරන්න."

(19) "40 වන පිටුවේ, 1 වන පේළියේ සිට 34 වන පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙකද ඇතුළුව) ඉවත් කරන්න."

(20) "41 වන පිටුවේ, 1 වන පේළියේ සිට 19 වන පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙකද ඇතුළුව) ඉවත් කරන්න."

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendments put, and agreed to.

51 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

51ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 51, as amended, ordered to stand part of the Bill.

52 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියට 208අ නව වගන්තිය ඇතුළත් කිරීම)

வாசகம் 52.-(முதன்மைச் சட்டவாக்கத்தில் 208அ என்னும் புதிய பிரிவை உட்புகுத்துதல்)

CLAUSE 52.- *(Insertion of new section 208A in the principal enactment.)*

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)

(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"41 වන පිටුවේ, 20 වන පේළියේ සිට 29 වන පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙකද ඇතුළුව) ඉවත් කරන්න."

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendment put, and agreed to.

52 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

52ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 52, as amended, ordered to stand part of the Bill.

53 වන වගන්තිය.- (සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන් විසින් ගෙවිය යුතු ආදායම් බද්ද නිදහස් කිරීම.)

வாசகம் 53.-(குறித்த சில சிறிய மற்றும் நடுத்தரத் தொழில் முயற்சிகளால் செலுத்தப்படற்பாலதான வரியிலிருந்து விலக்களிப்பு)

CLAUSE 53. - *(Exemption of income tax payable by certain Small and Medium Enterprises.)*

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)

(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "41 වන පිටුවේ, 30 වන පේළියේ සිට 36 පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙකද ඇතුළුව) ඉවත් කරන්න"

(2) "42 වන පිටුවේ, 1 වන පේළියේ සිට 3 වන පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙකද ඇතුළුව) ඉවත් කරන්න"

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendments put, and agreed to.

53 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
53ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 53, as amended, ordered to stand part of the Bill.

54 වන වගන්තිය.- (අතීතයට බලපෑම)
வாசகம் 54.-(கடந்த காலத்தை உள்ளடக்கும் பயன்)
CLAUSE 54.- *(Retrospective effect)*

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"42 වන පිටුවේ, 4 වන පේළියේ සිට 15 වන පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙකද ඇතුළුව) ඉවත් කරන්න."

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

54 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
54ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 54, as amended, ordered to stand part of the Bill.

55 වන වගන්තිය.- (අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව)
வாசகம் 55.-(ஒவ்வாமை ஏற்படும் பட்சத்தில் சிங்கள உரை மேலோங்கி நிற்றல்)
CLAUSE. - 55 (*Sinhala to prevail in case of inconsistency)*

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"42 වන පිටුවේ, 16 වන පේළියේ සිට 18 වන පේළිය දක්වා වූ පේළි (ඒ පේළි දෙක ඇතුළුව) ඉවත් කරන්න."

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

55 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
55ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 55, as amended, ordered to stand part of the Bill.

21 වන අලුත් වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය සංශෝධනය කිරීම)
புதிய வாசகம் 21.-(முதன்மைச் சட்டவாக்கத்தின் 46 ஆம் பிரிவைத் திருத்துதல்)
NEW CLAUSE 21.- (*Amendment of section 46 of the principal enactment.)*

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
I move,

"In page 18, immediately after line 6, add:

'Amendment of section 46 of the principal enactment	21. Section 46 of the principal enactment as amended by Act, No. 9 of 2008 is hereby further amended in subsection (1) thereof, by the insertion immediately after paragraph (a), of the following new paragraph:-

(aa) undertaking for the manufacture of animal feed;' "

ඉදිරිපත් කරන ලදින්, පළමුවන වර කියවන ලදී.
கொண்டுவரப்பட்டு முதன்முறை மதிப்பிடப்பட்டது.
Brought up, and read the First time.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
I move,

"That the new Clause be read a Second time."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වගන්තිය පනත් කෙටුම්පතට එකතු කළ යුතුය, යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.
21 වන අලුත් වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.
வாசகம் சட்டமூலத்திற் சேர்க்கப்பட வேண்டுமென வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
புதிய வாசகம் 21, சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Question put, and agreed to.
Question, that the Clause be added to the Bill, put and agreed.
New Clause 21, ordered to stand part of the Bill.

31 වන අලුත් වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 118 වන වගන්තිය සංශෝධනය කිරීම)
புதிய வாசகம் 31.-(முதன்மைச் சட்டவாக்கத்தின் 118ஆம் பிரிவைத் திருத்துதல்)
NEW CLAUSE 31.- *(Amendment of section 118 of the principal enactment.)*

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
I move,

"In page 25, immediately after line 21, add:

'Amendment of section 118of the principal enactment.	31. Section 118 of the principal enactment is hereby amended in subsection (1) of that section by the substitution for all the words from 'if the amount of income tax payable by him for any year of assessment' to principal 'in excess of the amount that should have been deducted', of the words and figures 'if such remuneration, in full or part, is exempt from income tax, for any year of assessment under any provisions of this Act,' "

ඉදිරිපත් කරන ලදින්, පළමුවන වර කියවන ලදී.
கொண்டுவரப்பட்டு முதன்முறை மதிப்பிடப்பட்டது.
Brought up, and read the First time.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
I move,

"That the new Clause be read a Second time."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වගන්තිය පනත් කෙටුම්පතට එකතු කළ යුතුය, යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.
31 වන අලුත් වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.
வாசகம் சட்டமூலத்திற் சேர்க்கப்பட வேண்டுமென வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
புதிய வாசகம் 31, சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டு மெனக் கட்டளையிடப்பட்டது.
Question put, and agreed to.
Question, that the Clause be added to the Bill, put and agreed.
New Clause 31, ordered to stand part of the Bill.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.
சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.
Enacting Clause and Title ordered to stand part of the Bill.
Bill reported with Amendments.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල මුද්‍රණ දෝෂ, අංක දෝෂ හෝ ඒ හා සමාන දෝෂ නිවැරදි කර ගැනීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක වෙත අවසර දෙන ලෙස ඉල්ලා සිටිමි.

ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියවිය යුතු ය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන් තුන්වන වර කියවා සම්මත කරන ලදී.
வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம் முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.
Question put, and agreed to.
Bill, as amended, accordingly read the Third time, and passed.

බදු අභියාචනා කොමිසම පනත් කෙටුම්පත
வரி மேன்முறையீட்டு ஆணைக்குழுச் சட்டமூலம்
TAX APPEALS COMMISSION BILL

දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.
வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.
Question put, and agreed to.
Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය.:
"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය." [ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]
தீர்மானிக்கப்பட்டது.
"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப் படுமாக" [மாண்புமிகு நிமல் சிறிபால த சில்வா]
Resolved:
"That the Bill be referred to a Committee of the whole Parliament." [The Hon. Nimal Siripala de Silva]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.
[නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]
குழுவில் ஆராயப்பட்டது.
[பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]
Considered in Committee.
[MR. DEPUTY SPEAKER *in the Chair.]*

1 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
1ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 1 ordered to stand part of the Bill.

2 වන වගන්තිය.- (බදු අභියාචනා කොමිසම පිහිටුවීම සහ එහි සංයුතිය)
வாசகம் 2.-(வரிமேன்முறையீட்டு ஆணைக்குழுவைத் தாபித்தலும் அதன் அமைப்பும்)
CLAUSE 2.- (*Establishment of the Tax Appeals Commission and its composition.*)

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"1 වන පිටුවේ, 7 වන පේළිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'කාරණා සම්බන්ධයෙන් වන සියලු අභියාචනා විභාග කිරීමේ වගකීම පවරා ඇති බදු අභියාචනා කොමිෂන් සභාව' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendment put, and agreed to.

2 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

2ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 2, as amended, ordered to stand part of the Bill.

3 සිට 6 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

3ஆம் வாசகத்திலிருந்து 6ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clauses 3 to 6 ordered to stand part of the Bill.

7 වන වගන්තිය.- (උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති යම් නීතියක් යටතේ ලබා දෙන ලද තීරණයකට එරෙහිව කොමිෂන් සභාව අභියාචනා කිරීමේ අයිතිය.)
வாசகம் 7.- (அட்டவணையில் குறித்துரைக்கப்பட்ட ஏதேனும் சட்டத்தின்கீழ் கொடுக்கப்பட்ட முடிபுக்கெதிராக ஆணைக்குழுவுக்கு மேன்முறையீடு செய்வதற்கான உரிமை)
CLAUSE 7.- (*Right to appeal to the Commission against the decision given under any law specified in the Schedule.*)

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)

(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "2 වන පිටුවේ, 22 සහ 23 පේළි ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

> 'අවස්ථාවේ දී එකී ප්‍රඥප්තිය යටතේ එම තැනැත්තා විසින් ගෙවිය යුතු බවට දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින්' "

(2) "27 වන පේළිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

> 'විශේෂ ගිණුමකට ගෙවන ලෙස හෝ ඒ හා සමාන මුදල් ප්‍රමාණයක බැංකු ඇපකරයක් තබන ලෙස නියම කරනු ලැබිය යුතු ය.' "

(3) "3 වන පිටුවේ, 7 වන පේළිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

> 'තීරණයට හේතු එම දැන්වීම ලැබීමෙන් පසු දින තිහක් ඇතුළත' "

සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தங்கள்விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendments put, and agreed to.

7 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

7ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 7, as amended, ordered to stand part of the Bill.

8 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

8ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 8, ordered to stand part of the Bill.

9 වන වගන්තිය.- (අභියාචන විභාග කිරීම.)
வாசகம் 9.- (மேன்முறையீட்டை விசாரித்தல்)
CLAUSE 9.- (*The hearing of the appeal.*)

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)

(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"3 වන පිටුවේ, 27 සිට 31 දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

> 'දැන්වීමක් ලැබුණු විට, මේ පනතේ උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති අදාළ ප්‍රඥප්තිවල විධිවිධානවල උද්ධෘත සහ එම ප්‍රඥප්ති යටතේ පවත්වාගෙන යනු ලබන සාක්ෂි පිළිබඳ වාර්තාවේ පිටපතක් ද කොමිෂන් සභාව වෙත යැවිය යුතු ය.' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendment put, and agreed to.

9 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

9ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 9, as amended, ordered to stand part of the Bill.

10 වන වගන්තිය.- (කොමිෂන් සභාව විසින් අභියාචනා පිළිබඳ තීරණය කිරීම.)
வாசகம் 10.- (மேன்முறையீடுகள் ஆணைக்குழுவால் தீர்மானிக்கப்படல்)
CLAUSE 10.- (*Determination of appeals by the Commission.*)

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා

(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)

(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"5 වන පිටුවේ, 21 සිට 28 දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

> 'අභියාචනා, මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට කොමිෂන් සභාව වෙත පවරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, කොමිෂන් සභාව විසින්, එම අභියාචනා එසේ කොමිෂන් සභාව වෙත පවරනු ලැබූ දින සිට දින එකසිය අසූවක් ඇතුළත දී ඒ සම්බන්ධයෙන් තීරණයක් ලබා දිය යුතු ය.' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendment put, and agreed to.

10 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

10ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 10, as amended, ordered to stand part of the Bill.

11 වන වගන්තිය.- (කොමිෂන් සභාව විසින් තක්සේරුව අඩුකිරීම හෝ අවලංගු කිරීම සිදු නොකරන විට තක්සේරුව සමග ගාස්තු අයකරගත යුතු බව.)

வாசகம் 11.- (ஆணைக்குழு வரிமதிப்பீட்டைக் குறைக்காவிடில் அல்லது இல்லாதொழிக்காவிடில் செலவுகள் வரிமதிப்பீட்டுடன் அறவிடப்படுதல்)

CLAUSE 11.- (*Costs to be recovered with assessment if Commission does not reduce or annul the assessment.*)

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"5 වන පිටුවේ, 33 වන පේළිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

> 'කරන ලද මුදලට අමතරව, තක්සේරුව මඟින් පනවනු ලැබූ සහ ඒ සමඟ අයකර ගනු ලබන බදු මුදලට එකතු විය යුතු රුපියල් පන්දහසක් නොඉක්මවන' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendment put, and agreed to.

11 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

11ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க

வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 11, as amended, ordered to stand part of the Bill.

12 සිට 14 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

12ஆம் வாசகத்திலிருந்து 14ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clauses 12 to 14 ordered to stand part of the Bill.

උපලේඛනය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

அட்டவணை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Schedule, ordered to stand part of the Bill.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.

Enacting Clause and Title ordered to stand part of the Bill.

Bill reported with Amendments.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල මුද්‍රණ දෝෂ, අංක දෝෂ හෝ ඒ හා සමාන දෝෂ නිවැරදි කර ගැනීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක වෙත අවසර දෙන ලෙස ඉල්ලා සිටිමි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියවිය යුතු ය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන් තුන්වන වර කියවා සම්මත කරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக் கொள்ளப்பட்டது.

அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம் முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.

Question put, and agreed to.

Bill, as amended, accordingly read the Third time, and passed.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

வினா எடுத்தியம்பப்பெற்றது.

Question proposed.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

Sir, we had the Party Leaders' Meeting to discuss the programme for the first week of April. Unfortunately, I forgot to mention that the Debate on the Local Authorities (Special Provisions) Bill has not been concluded.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

So, we can discuss that tomorrow. We can have a fresh Party Leaders' Meeting.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

Can we have a meeting tomorrow?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

Yes, of course.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
Okay. Can we have it tomorrow morning?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
We will have it early afternoon.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
Yes, early afternoon.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
We can call for a Party Leaders' Meeting and decide on that.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
Yes. Sir, you can chair the meeting.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු කරු ජයසූරිය මන්ත්‍රීතුමා. Order, please! Before that, will an Hon. Member propose the Hon. Alhaj A.H.M. Azwer to take the Chair?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Sir, I propose that the Hon. Alhaj A.H.M. Azwer do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.
அதன் பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon MR. DEPUTY SPEAKER left the Chair, and THE HON. ALHAJ A.H.M. AZWER took the Chair.

පළාත් පාලන මැතිවරණය පැවැති දින සහ ඊට පෙර රාජ්‍ය සම්පත් අනිසි භාවිතය
உள்ளூராட்சித் தேர்தல் தினத்திலும் அதற்கு முன்னரும் அரச வளங்களின் துஷ்பிரயோகம்
MISUSE OF STATE RESOURCES PRIOR TO AND ON DAY OF LOCAL GOVERNMENT ELECTION

ගරු කරු ජයසූරිය මහතා
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාව කල් තබන අවස්ථාවේදී මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2011.03.17 වන දින නිමාවට පත් වූ පළාත් පාලන ආයතන 234ක් සඳහා වූ මැතිවරණය පිළිබඳව 2011.03.18 වන දින මැතිවරණ කොමසාරිස් දයානන්ද දිශානායක මහතා විසින් නිකුත් කළ පුවත් පත් නිවේදනය කෙරෙහි මෙම ගරු සභාවේ අවධානය යොමු කිරීමට කැමැත්තෙමි. එහි 3 වන ඡේදයේ අවසාන වාක්‍යයේ මැතිවරණයට පෙර සහ මැතිවරණ දින මැතිවරණය ක්‍රියාත්මක වූ ආකාරය පිළිබඳව ඔහු මෙසේ සඳහන් කර ඇත.

"...එහෙත් සමහර දේශපාලන පක්ෂ සහ කණ්ඩායම් මැතිවරණ දිනට පෙර සහ මැතිවරණ දින ක්‍රියා කළ ආකාරය සහ රාජ්‍ය සම්පත් සහ රාජ්‍ය මාධ්‍ය පාවිච්චි කළ ආකාරය ඉතා කනගාටුදායකය."

මෙය ඔහු ඉංග්‍රීසි භාෂාවෙන් නිකුත් කළ නිවේදනයේ මෙසේ සඳහන් කර ඇත.

"But the manner in which some political parties and groups conducted themselves both before the date of poll and on the day of poll and also the misuse of State resources and State owned media is regrettable."

මැතිවරණ කොමසාරිස්ගේ මෙම පුවත් පත් නිවේදනය සුපරික්ෂාකාරීව විශ්ලේෂණය කර බලන විට 2011.03.17 වන දින නිමාවට පත් වූ පළාත් පාලන මැතිවරණය සාධාරණ සහ මැතිවරණ නීති රීතිවලට අනුකූලව සිදු වූ නිදහස් සහ සාධාරණ මැතිවරණයක් වශයෙන් පිළිගත නොහැකි බැවින් ද, මැතිවරණ දිනට පෙර සහ මැතිවරණ දින රාජ්‍ය සම්පත් නීති විරෝධි අන්දමින් යොදා ගනිමින් මැතිවරණය සිදු වූ ආකාරය ඉතාම ජුගුප්සාජනක බැවින්ද, මැතිවරණ කොමසාරිස්තුමා ප්‍රකාශ කළ ආකාරයට සමහර දේශපාලන පක්ෂ සහ කණ්ඩායම් ක්‍රියා කළ ආකාරය කෙසේද යන්න සුපරික්ෂාකාරීව සොයා බලා එවැනි තත්ත්වයන් අනාගත මැතිවරණවලදී ඇති වීම වැළැක්වීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගත යුතු බවටත් මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය මැතිවරණයේදී ජනතාව දුන් තීන්දුවට අපි හිස නමනවා. ලෝකයේ විශේෂයෙන්ම මැද පෙරදිග ජනතාව කතිරය ඉල්ලා සිය ලේ හා ජීවිත පූජා කරන විට අපට සර්වජන ඡන්දයේ වටිනාකම තේරෙනවා. යම් කිසිවකු මගෙන් අපේ රටේ සර්වජන ඡන්ද බලය අපට නිදහසේ, ස්වාධීනව, අපක්ෂපාතිව, විනිවිද පෙනෙන අයුරින් යොදා ගත හැකිදැයි ඇසුවොත් මට කනගාටුවෙන් කියන්නට සිදු වන්නේ එසේ නොවන බවයි. එක්සත් ජාතික පක්ෂ රජයන් පාලනය කරන විට ද යම් අක්‍රමිකතා සිදු වුවායයි කිව්වත් අතීතයේ වූ වැරදි වසන්නට මම කිසිම උත්සාහයක් දරන්නේ නැහැ. ඒ වාගේම මා ඉල්ලා සිටිනවා, අතීතයේ සිදු වූ වැරදි උදාහරණයට ගන්න එපාය කියා. 20 වන ශත වර්ෂයේ සිතුම් පැතුම් 21 වන ශත වර්ෂයට වඩා වෙනස්. අද මිනිස් අයිතිවාසිකම්, මාධ්‍ය නිදහස, ප්‍රජාතන්ත්‍රවාදය, විනිවිදභාවය, ශීලාචාර දියුණු ලෝකයේ අනිවාර්ය ප්‍රජා අයිතියක්. මේ ගැන කථා කරන විට සමහර අය බටහිර ගැත්තන් හා NGOකාරයන් ගැන සඳහන් කරනවා. මැතිවරණයේදී ප්‍රතිඵලවලට එදින පැවතෙන සිද්ධීන් නොව, නාම යෝජනා දුන් දින සිටම ඇති වන සිද්ධීන් බල පැවැත්වෙනවා. මෙය ඉතා වැදගත් කරුණක්. පසු ගිය මැතිවරණයේදී සිදු වූ විවිධ ක්‍රියාදාමයන් පිළිබඳව මැතිවරණ කොමසාරිස්තුමාගේ පුවත් පත් නිවේදනයේ සඳහන් වී තිබෙනවා. මැරකම්, යකඩ පොලු ප්‍රහාර, ගිනි තැබීම් ආදිය ගැන සඳහන් කළ හැකි වුවත්, ඊට වඩා කනගාටුදායක කරුණ වනුයේ මැතිවරණ කොමසාරිස්තුමාගේ වාර්තාවෙන් පැන නැඟෙන ඉහත සඳහන් නිවේදනයයි.

මැතිවරණයට පෙර මැතිවරණ කොමසාරිස්තුමා විසින්, රාජ්‍ය දේපළ මැතිවරණ කාල සීමාව තුළ භාවිත කිරීම පිළිබඳව අදාළ අංශ දැනුවත් කරනවා. මේ අනුව පළාත් පාලන මැතිවරණය වෙනුවෙන් 2011.01.13 දිනැති එම නිර්දේශය මා **සභාගත*** කරනවා.

මුළු රාජ්‍ය සංයුතියම ආවරණය වන පරිදි, ජනාධිපති ලේකම්, අමාත්‍ය මණ්ඩල ලේකම්, අග්‍රාමාත්‍ය ලේකම්, සියලුම අමාත්‍යාංශ

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ලේකම්වරුන්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්, සියලුම පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්, සියලුම පළාත් ආණ්ඩුකාර ලේකම්වරුන්, සියලුම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරුන් යන නිලධාරින්ට එම නිර්දේශය නිකුත් වනවා. මෙම නියෝගයෙන් ආවරණය වන අංශ කිහිපයක් සඳහන් කරන්න කැමැතියි. රජය සතු මෝටර් රථ, ජීප් රථ, ගුවන් යානා, හෙලිකොප්ටර්. ඒ වාගේම රජයේ කාර්යාල, ගොඩනැඟිලි, පාසල්, සංචාරක නිවාස, තානායම්, නිවාඩු නිකේතන, රාජ්‍ය ගොඩනැඟිලි අයත් භූමි. ඒ වාගේම ඡන්ද විමසීම් කාලය තුළ රජයේ මුදල් වැය කරමින් පැවැත්වෙන විවිධ ආකාරයේ ජංගම සේවාවන්; ප්‍රදර්ශන විවෘත කිරීම ආදිය. රාජ්‍ය නිලධාරින් ස්ථාන මාරු කිරීම මැතිවරණ කාල සීමාව තුළ සිදු නොවිය යුතු බව. ඒ වාගේම රාජ්‍ය මාධ්‍යයේ හැසිරීම හා මාධ්‍ය ස්වාධීනත්වය මැතිවරණ සමයේදී ඉතා අවශ්‍ය බව අමුතුවෙන් සඳහන් කළ යුතු නොවේ.

ඉහත නිර්දේශ පසු ගිය මැතිවරණවලදී අනුගමනය කර ඇත්දැයි පසුවට අත තබා සිතන ලෙසට රජයේ බලධාරින්ට මම කියනවා. 2004 දී පැවැත් වූ පාර්ලිමේන්තු මැතිවරණය නිදහස් හා සාධාරණ බව මැතිවරණ කොමසාරිස්වරයා මෙන්ම අපි සියලු දෙනාම පිළිගන්නා අතර, ඉන් පසු පැවැත්වූ සෑම මැතිවරණයකදීම මැතිවරණ නීති රීති උල්ලංඝනය වූ බවට විවිධ නිරීක්ෂණ වාර්තාවල සඳහන් වනවා. ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල්, පැෆරල්, කැෆේ, CMEV යන පිළිගත් මැතිවරණ නිරීක්ෂණ ආයතන වාර්තා මෙම අවස්ථා විස්තරාත්මකව සඳහන් කර තිබෙනවා.

මැතිවරණ කොමසාරිස්වරයාගේ නිර්දේශ අපි එකින් එක සොයා බැලුවොත් රාජ්‍ය යානවාහන, හෙලිකොප්ටර් ආදිය පාවිච්චි කළ ආකාරය ගැන අප සඳහන් කළ යුතුයි. පාරවල්වලත්, ගුවනේත් රාජ්‍ය යානවාහන, හෙලිකොප්ටර් පාවිච්චි කළ ආකාරය අප දුටුවා. මැතිවරණ පෙළපාළි ගියේත් රාජ්‍ය වාහනවලින්. විරුද්ධ පාක්ෂිකයන්ට හිරිහැර කිරීමට පැමිණියේත් රාජ්‍ය වාහනවලින්. පෙබරවාරි 04 වැනි දා සවස බොරැල්ලේදී ශීලාචාර සමාජයට නින්දා කරමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට යකඩ පොලුවලින් පහර දීමට පැමිණියේත් රාජ්‍ය වාහනවලින්. අපට ලැබී ඇති තොරතුරු අනුව මැතිවරණ සමයේ යානවාහන, හෙලිකොප්ටර් පාවිච්චිය සඳහා මුදල් ගෙවීමක් සිදු වෙලා නැහැ. නීති ඇසින් බලන කොටත්, සදාචාරාත්මකව බලන විටත් මෙය මැතිවරණ අක්‍රමිකතාවක්.

රජයේ කාර්යාල, ගොඩනැඟිලි, සංචාරක නිවාස ආදිය සමහර ප්‍රදේශවල පක්ෂ කාර්යාල බවට පත් වුණා. රාජ්‍ය උත්සව හා ප්‍රතිපාදන ලබා දීම ගැන ද කිව යුත්තේ මෙම නිර්දේශයද අමු අමුවේ උල්ලංඝනය කළ බවයි. විවිධ ප්‍රදානයන් සඳහා රාජ්‍ය උත්සව පැවැත්වූවා. මේවා යොදා ගත්තේ සම්පූර්ණයෙන් මැතිවරණ ප්‍රචාරයක් ලෙස. ජනතාවට සහන දීම ගැන අපි සතුටු වනවා. නමුත් එම සහන මැතිවරණ අල්ලස් ලෙස යොදා ගැනීම නීති විරෝධියි. ඒ වාගේම සදාචාර විරෝධියි. රාජ්‍ය නිලධාරින් මාරු කිරීමේදී මැතිවරණ කොමසාරිස්වරයාට ඉදිරිපත් වීමට හැකි වුණා. නමුත් රාජ්‍ය මාධ්‍ය ක්‍රියා කළ ආකාරය අපට කිසි සේත් අනුමත කරන්නට බැහැ. එහි හැසිරීම ලජ්ජා සහගත බව සඳහන් කරන්නේ දැඩි කනගාටුවෙන්. රාජ්‍ය ගුවන් විදුලිය, රූපවාහිනිය, අයිටීඑන් එක, ලේක් හවුස් පුවත් පත් ආදිය සන්ධානයේ ප්‍රචාරක අංශ බවට පත් වුණා. මැතිවරණ ප්‍රචාරක කටයුතු නිල වශයෙන් නිම වුණාට පස්සේ රාජ්‍ය මාධ්‍ය, මැතිවරණ නීති රීති උල්ලංඝනය කරමින් වැඩසටහන් ප්‍රචාරය කළා. මැතිවරණ දිනයේදීත් මෙවන් ආකාරයට හැසිරීම ගැන අපි කනගාටු වනවා.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ජාතිය ඇමතීම ගැන අපේ කිසිම විරුද්ධත්වයක් නැහැ. නමුත් එතුමා

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

වශයෙන් සියලුම නාලිකා හරහා මැතිවරණ ප්‍රචාරක කටයුතුවල යෙදීම අපි දකින විධියට නීති විරෝධි බව සඳහන් කළ යුතුයි. ප්‍රචණ්ඩත්වය මුළු රටේම සිදු නොවුවත්, මැර සංස්කෘතිය ක්‍රියාත්මක වන ප්‍රදේශවල මෙය තදින්ම සිදු වුණා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, I think you are referring to the conduct of His Excellency the President.

ගරු කරු ජයසූරිය මහතා
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)
Yes.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
So, that must be expunged.

ගරු කරු ජයසූරිය මහතා
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)
මේ සිද්ධීන් සඳහා මුල් වූයේ - එහෙනම් දාන්න පුළුවන් නේ සන්ධානයේ නායකයා කියා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
But, the inference is there because you have already mentioned it .

ගරු කරු ජයසූරිය මහතා
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)
Oh, I see. ප්‍රචණ්ඩත්වය මුළු රටේම සිදු නොවුවත් මැර සංස්කෘතිය ක්‍රියාත්මක වන ප්‍රදේශවල මෙය තදින්ම සිදු වුවා. මේ සිද්ධීන් සඳහා මුල් වූයේ බලගතු දේශපාලනඥයින්, එසේත් නැත්නම් ඒ අයගේ ආශීර්වාදය හා අනුග්‍රහය ලත් බලවතුන්. බේරුවල නගර සභා සීමාව පුංචි වෙව්නියාවක් වුණා.

බේරුවල හිටපු නගරාධිපති, උප නගරාධිපති සහ අනෙක් අපේක්ෂකයින් ඒ මැරයින්ගේ උදහසට ලක් වුණා; ආරෝග්‍ය ශාලා ගත වීමට සිදු වුණා. ඒ සියලු දේටම මූලිකව ක්‍රියා කළ පුද්ගලයා අත් අඩංගුවට ගැනීමට හෝ පාලනය කිරීමට පොලීසියට හැකි වුණේ නැහැ. පොලීසියේ ඉහළ නිලධාරින් අපට කිව්වේ දේශපාලන බලපෑම් මත තමන් අසරණ බවයි. දඹුල්ල, කැලණිය, නිකවැරටිය යන ආසනවල ද ප්‍රචණ්ඩත්වය තදින්ම ක්‍රියාත්මක වුණා. එම විස්තර මම **සභාගත*** කරනවා.

**** ලියවිල්ල ඉදිරිපත් නොකරන ලදී.***
ஆவணம் சமர்ப்பிக்கப்படவில்லை.
Document not tendered.

බණ්ඩාරවෙල නගර සභාවට යෝජිත නව සභාපති චමින්ද විජේසිරි මන්ත්‍රීවරයා දඩයම් කිරීමේ උත්සාහයක් තිබෙනවා. එක්සත් ජනතා නිදහස් සන්ධානයෙන් පැමිණ ඔහු ජයග්‍රහණය කළා. බොරු චෝදනා මත මොහු අත් අඩංගුවට ගැනීමට දැන් සැලැස්මක් තිබෙනවා. මා මෙය සඳහන් කරන්නේ වග කීමෙන් යුතුවයි. පොලීසියේ අපක්ෂපාත නිලධාරින් සිටිනවා. නමුත් දේශපාලන බැළ මෙහෙවරකම් කරන නිලධාරින් නිසා පොලිස් සේවයට මෙන්ම නිල ඇඳුමටත් අපකීර්තියක් ලැබෙනවා. එක්සත් ජනතා නිදහස් සන්ධානයේ පෙළපාළිවල යන, විපක්ෂයේ පැමිණිලි භාර නොගන්නා පොලිස් ස්ථානාධිපතිවරුන් කිහිප දෙනෙක් සිටිනවා. දහහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ ඝාතනය හා දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ උපතින් පසු රාජ්‍ය සේවයේ හා පොලීසියේ ස්වාධීනත්වයට විශාල හානි සිදු වුණා. කොතරම් පුරසාරම් දෙඩුවත් රාජ්‍ය සේවා කොමිසම, පොලිස් කොමිසම, මැතිවරණ කොමිසම, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම, අධිකරණ සේවා කොමිසම තවමත් ක්‍රියාත්මක වෙලා නැහැ. ඒවායේ සාමාජිකයන් වශයෙන් ස්වාධීන, නිර්භීත පුද්ගලයන් පත් වෙයි කියා අපි බලාපොරොත්තු වෙනවා. ඒක තමයි අපේ අවසාන බලාපොරොත්තුව.

කොළඹ නගර සභාව ඇතුළුව ඉතිරි පළාත් පාලන ආයතන සඳහා මැතිවරණ එක් දිනෙක හැකි ඉක්මනින් පවත්වන ලෙසත් අපි රජයෙන් ඉල්ලා සිටිනවා. ඒ වාගේම එම ඉල්ලීම අපි මැතිවරණ කොමසාරිස්තුමාටත් යොමු කරනවා. තට්ටු මාරු ක්‍රමයට ඡන්ද පැවැත්වීමට අදහස් කරන්නේ නම් අපට ඒ සඳහා එකඟ වෙන්නට අමාරුයි. එමෙන්ම, ඊ ළඟ මැතිවරණය අප සඳහන් කළ පරිදි අක්‍රමිකතාවෙන් තොරව නිදහස්ව හා ස්වාධීනව පවත්වන ලෙස රජයට කියනවා. මැතිවරණ කොමිසම, පොලිස් කොමිසම, රාජ්‍ය සේවා කොමිසම හා මධ්‍යස්ථ මාධ්‍යයකින් තොරව මැතිවරණ පැවැත්වීම විහිළුවක් ලෙසිනුයි අපි දකින්නේ. පසු ගිය ජනාධිපති මැතිවරණයේ දී නිල ඡන්ද පත්‍රිකා 63ක් රත්නපුර ප්‍රදේශයේ කානුවක තිබී හමු වුණා. අපි ඒ ඡන්ද පත්‍රිකා මැතිවරණ කොමසාරිස්තුමාට භාර දුන්නා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, එම පාර්ලිමේන්තු කාරක සභාවේ සාමාජිකයකු වශයෙන් මා තමුන්නාන්සේට දැනුම් දෙන්නට ඕනෑ, ඒ කොමිෂන් සභාව පත් කිරීමේ අවස්ථාවල දී ගරු විරුද්ධ පක්ෂයේ නායකතුමා සහ ගරු ස්වාමිනාදන් මැතිතුමා තුන් වාතාවක් ඒකට සහභාගි වුණේ නැති බව.

ගරු කරු ජයසූරිය මහතා
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් පත්වීම් කර ගෙන යන්න පුළුවන්.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔවුන් ආවේ නැහැ. ඒ වාගේ කොමිෂන් සභා පත් කරන කොට, ව්‍යවස්ථානුකූලව නේ ඒවා පත් කරන්නේ. I just wanted to bring it to your notice that they absented themselves; that they defaulted. That is all.

ගරු කරු ජයසූරිය මහතා
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යම් කිසි හේතුවක් ඇතිව, ප්‍රතිපත්තිමය තීරණයක් මත අපි එයට සහභාගි නොවූවත් රජයට එය කර ගෙන යන්න පුළුවන්. දැන් මැතිවරණ කොමසාරිස්තුමා පත් කර තිබෙනවා. ඒක නිසා ඔබතුමා ඔතැන ඉඳ ගෙන කියන එක වැරැදියි කියායි මම හිතන්නේ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order. You, from the Chair need not be mentioning things like that.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
You need not dictate terms to the Chair. Sit down. Order, please! - [*Interruption.*] You can continue your speech. - [*Interruption.*] I will throw you out. You have no power to dictate terms to the Chair. - [*Interruption.*]

ගරු කරු ජයසූරිය මහතා
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)
Please be patient.- [*Interruption.*]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
You do not need to be mentioning things like that because - [*Interruption.]*

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
I have the right to point out and he accepted that. I must say, I am a Member of that Committee - [*Interruption.*] I have all the right. - [*Interruption.*] Order, please! -[*Interruption.*] Even in this latter part of the day you will be thrown out.- [*Interruption.*] Yes, Hon. Karu Jayasuriya, continue with your speech.

ගරු කරු ජයසූරිය මහතා
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)
Yes, but, let him express his opinion. This is a free and a democratic country, Mr. Presiding Member - [*Interruption.]*

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
He is threatening the Chair.

ගරු කරු ජයසූරිය මහතා
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)
He is not threatening. You are threatening. - [*Interruption.*]

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
You are the Deputy Leader of your Party now.

ගරු කරු ජයසූරිය මහතා
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)

I know that. You are threatening a Member. Do not threaten him. Let him express his opinion because this is a free and democratic country. [*Interruption.*]

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

No. Do not argue with the Chair. You have no right. - [*Interruption.*]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

From the Chair, you need not be intimidating like this.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

You will be thrown out!

ගරු කරු ජයසූරිය මහතා
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)

No. You cannot throw him out.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

You carry on Hon. Member.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

I am on a point of Order.

ගරු කරු ජයසූරිය මහතා
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)

Yes. What is this arrogance? Do not do that.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

No, no. I am only - You have accepted what I said. He has no right to dictate terms to the Chair. It is against the Standing Orders. You have to follow the Standing Orders.

ගරු කරු ජයසූරිය මහතා
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)

But, he has the right to express his opinion.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

You have no right to mention that. That is what I am saying.

ගරු කරු ජයසූරිය මහතා
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)

I am sorry that from the Chair you behave like this.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

I am very sorry, Hon. Member, you had better continue with your speech.   That is what I am saying.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

He has to continue after an interruption.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

It is not an interruption. It is the clearance of a fact. You must understand the English language.

ගරු කරු ජයසූරිය මහතා
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)

The Chair has to set an example. - [*Interruption.*]

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

You may continue, Hon. Karu Jayasuriya.

ගරු කරු ජයසූරිය මහතා
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)

ජනාධිපති මැතිවරණයේ දී නිල ඡන්ද පත්‍රිකා 63ක් රත්නපුර ප්‍රදේශයේ කාණුවක තිබී හමු වුණා. මේ ගැන සොයා බලන ලෙස කිහිප විටක් මැතිවරණ කොමසාරිස්තුමාගෙන් ඉල්ලා ඇතත්- [බාධා කිරීමක්] ඒක තමයි අපි විස්තරයක් ඉල්ලුවේ. [බාධා කිරීමක්] මැතිවරණ කොමසාරිස්තුමා වග කියන්න ඕනෑ. නිල ඡන්ද පත්‍රිකා කානුවක තිබෙන කොට කවුරු හරි උත්තර දෙන්න එපායැ ගරු ඇමතිතුමනි. ඒකයි. [බාධා කිරීමක්] ඔබතුමා කලබල වෙන්න එපා. මේක සත්භාවයෙනුයි කිව්වේ. කොයි කවුරු කළා වුණත් වැරදියි.

ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා (පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார - தெங்கு அபிவிருத்தி, மக்கள் தோட்ட அபிவிருத்தி அமைச்சர்)
(The Hon. A.P. Jagath Pushpakumara - Minister of Coconut Development and Janata Estate Development)

කවුරු කළත් වැරදියි.

ගරු කරු ජයසූරිය මහතා
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)

ඒක තමයි. මැතිවරණ කොමසාරිස්තුමා ගිහිල්ලා ඕවා දමන්නේ නැහැ. කවුරු හරි දාන්න ඇති. යම් කෙනකුගේ උපදෙස් පිට දමන්න ඇති. අපිට දැන ගන්න අයිතියක් තිබෙනවා මේ ඡන්ද පත්‍රිකා 63ට මොකද වුණේ කියලා. මා ගාව තිබෙනවා ඒ කොළ ටික ඔක්කෝම. ඡන්දය දාපුවාත් තිබෙනවා. කොහොමද ගියේ කියලා කවුරුවත් දන්නේ නැහැ. අපි මුලදී මේක ගත්තාම අපට

හිනා වුණා. මේවා ආදර්ශ ඒවා කිව්වා. ඊට පස්සේ "නැහැ" කියලා කිව්වා. ඉදිරිපත් කළාට පස්සේ දැන් කියනවා, "මේවා ඇත්ත ඡන්ද පත්‍රිකා"ය කියලා. ඉතින් මේක වැරදි පූර්වාදර්ශයක්. පසු ගිය මැතිවරණයේදී වාර්තා වූ සමහර ඡන්ද ප්‍රතිඵල අපට පිළිගන්න බැහැ. උදාහරණයක් වශයෙන් මඩකලපුව දිස්ත්‍රික්කයේ කාත්තන්කුඩි ප්‍රදේශයේ ඡන්ද මධ්‍යස්ථාන කිහිපයක සියයට අසූපහේ සිට අනූහත දක්වා ඡන්ද ප්‍රතිශතයක් තිබෙනවා. මෙය පිළිගත හැකිද? මේ ප්‍රශ්නය මා ගරු සභාවට යොමු කරනවා. අපි මැතිවරණ හා පොලිස් දෙපාර්තමේන්තුවේ නිලධාරින්ට දොස් පවරන්නේ නැහැ. ඔවුන් සේවය කරන්නේ විශාල බලපෑම් මත. එම නිසා ඉතිරි පළාත් පාලන මැතිවරණ කිහිපය ලෝකයා හමුවේ ගෞරවාන්විතව හා ආදර්ශවත්ව පැවැත්වීමට කටයුතු කරන ලෙස මම රජයෙන් ඉල්ලා සිටිනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා. ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා විසින් යෝජනාව ස්ථිර කිරීම.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළමුවෙන්ම මා ඔබතුමාට කියන්න ඕනෑ මේ ගරු සභාවේ කටයුතු කිරීමේදී ඔබතුමා ඉවසිලිවන්තව කටයුතු කරන්න ඕනෑ බව.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Do not make references to the Chair. I know the Standing Orders.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
No, I have to make this comment.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
You are a senior Member. You continue with your speech.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
You cannot say that you are going to throw him out. That is wrong. I must say that. Do not do that.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
You cannot give references to the Chair, whatever it is. You are wrong. Continue with your speech.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
I leave it to you. You are the best judge of what you say.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ප්‍රශ්නයේදී අපේ ගරු කරු ජයසූරිය මැතිතුමා බොහොම පැහැදිලිව සිද්ධීන් රාශියක් සඳහන් කළා. දැන් මැතිවරණ කොමසාරිස්තුමා කියනවා සාධාරණ, අපක්ෂපාත මැතිවරණයක් සිද්ධ වුණේ නැහැයි කියලා. එතැනින් ඉවරයි ඒක. There is a statement. He read out that statement.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒක එහෙම කියලා නැහැ.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
එහෙම තමයි කියලා තිබෙන්නේ. මේ තිබෙන්නේ එතුමා කියාපු එක. කියලා තිබෙනවා නේ. පත්තරේ පළ වෙලා තිබුණා. දැන් මම කියන්නේ මේකයි. හැම මැතිවරණයක්ම ඉවර වුණාම ලොකු සැකයක් මේ රට තුළ තිබෙනවා මේ මැතිවරණය සාධාරණව, අපක්ෂපාතව සිද්ධ වුණාද කියලා. හැම දා ම මේ ප්‍රශ්නය තිබෙනවා. මොකද, සිද්ධීන් රාශියක් ඇති වෙනවා. දැන් මේකට විසඳුම තමයි අපේ ආණ්ඩුව තිබුණු කාලයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව තුළින් අපි ස්වාධීන පොලිස් කොමිසමක් දාලා ස්වාධීන මැතිවරණ කොමිසමකුත් ගෙනෙන්න සූදානම් කරලා තිබුණු වැඩ පිළිවෙළ. නමුත් අපි කොච්චර දුරට ඉල්ලුවත් අද මේක ක්‍රියාත්මක වෙලා නැහැ. මොනවා හෝ කමක් නැහැ, එය සාධාරණව අපක්ෂපාතව සිදු වනවා නම්. ඒ කොමිසම පත් වෙන්නේ නැති වුණත් අඩු තරමින් කොමිසමක්වත් තිබුණා නම් මේ ප්‍රශ්නය සාධාරණීකරණය වනවා කියන එක පිළිබඳ අපේ විශ්වාසයක් තිබෙනවා. දැන් බලන්න මේ මැතිවරණ කොමසාරිස්වරයාට මොන තරම් ගිහිල්ලා පැමිණිලි කෙරුවත් අපි මේ මැතිවරණයට ඉස්සෙල්ලාත් ගිහිල්ලා පැමිණිලි කිහිපයක් කෙරුවා, මාධ්‍ය මෙහෙමයි, රාජ්‍ය දේපොළ පාවිච්චි කරන හැටි මෙහෙමයි, මේ විධියේ සිද්ධීන් වෙනවා කියලා. ඒ කිව්වත්- ඒවා නවත්වා ගන්න පුළුවන් ශක්තියක් ඔහුට නැහැ. ඒවා ඔහුගේ වචනයට, ප්‍රකාශයට පමණයි සීමා වෙන්නේ. මොකක්ද මේ මැතිවරණ නීතිය? මොකක්ද මැතිවරණ නීතිය පැවැත්වීමේ අවශ්‍යතාව? ඒ නිසා අපි රජයෙන් ඉල්ලන්නේ මේ මැතිවරණ කොමිසම හැකි ඉක්මනින්ම ස්ථාපිත කරන්නය කියායි. මැතිවරණ කොමසාරිස්ම කියනවා, "මට විශ්‍රාම යන්න ඕනෑ. මට මෙතැන ඉන්න බැහැ. කරුණාකර, මේ කොමිසම පත් කරලා මේ කාර්යය භාර ගන්න" කියලා. [බාධා කිරීම්] ඒක කිව්වා. නැහැ කියන්න ඕනෑ නැහැ. ඉතින් මේ ප්‍රශ්නය එකක්.

ඊ ළඟට දෙවැනි කාරණය. දැන් බලන්න ඉන්දියාව කියන්නේ විශාල රටක්. ඉන්දියාවේ හැම අස්සක් මුල්ලක් නැරම අද විද්‍යුත් ක්‍රමයටයි ඡන්දය පාවිච්චි කරන්නේ. එහි තිබෙන්නේ electronic voting. Now, see the advancement. Such a vast country, India, is having an electronic voting system even in the remotest village. මොන චෝදනාවක්වත් නැහැ නේ. ඇයි අපේ අය - [බාධා කිරීම්] තමුන්නාන්සේ - [බාධා කිරීම්]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේලා ඒ ඔක්කෝටම එකඟ වෙලා පනතට විරුද්ධ වෙන්න පටන් ගත්තා.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
කොහේද විරුද්ධ වුණේ?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒකයි ඒ වෙනස කරන්න බැරි වුණේ.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
නැහැ, නැහැ. ඕවාට අපි විරුද්ධ වුණේ නැහැ. එහෙම කියන්න එපා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
නැත්තේ මොකද? තමුන්නාන්සේගේ නායකතුමා මේ පනතේ වගන්තිවලට විරුද්ධ වෙන්න පටන් ගත්තා. ඒ නිසායි පනත ගෙනෙන්න බැරි වුණේ. ඒක තේ ඇත්ත. මම හය වතාවක් ගියා විපක්ෂ නායකතුමාගේ කාර්යාලයට. විපක්ෂ නායකතුමා බොරු කළා.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මේ වතාවේ අපි විරුද්ධ වුණේ නැහැ නේ?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
තමුන්නාන්සේ නිකම් කථා කරන්න එපා, ඒ සියලු දේට තමුන්නාන්සේලාගේ සහයෝගය දෙන්නේ නැතිව.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
පාර්ලිමේන්තුවේදී විවාදය තිබුණු වෙලාවේ අපි එකඟ වුණා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
කවුද මැතිවරණ කොමසාරිස්ට ගෙදර යන්න බැරි පනත හැදුවේ? තමුන්නාන්සේලා.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
නැහැ, නැහැ. එහෙම කියන්න බැහැ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒකේ වගන්තියක් තිබෙනවා. ඒ වගන්තිය හැදුවේ කවුද? තමුන්නාන්සේලා.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
නැහැ, නැහැ. කරුණාකරලා තමුන්නාන්සේලා වැරදි කරලා දැන් වැරදි වහ ගන්න හදන්න එපා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
නැහැ කියන්නේ කොහොමද? ඡන්දයක් තිබ්බාම ඡන්දය හොඳ නැහැ කියනවා නිකම් බොරුවට නැඟිටලා. මම කථා කරන්න නොවෙයි හිටියේ. නමුත් තමුන්නාන්සේ කියන බොරු නිසායි -

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
I cannot hear him, Sir. [*Interruption.*] මගේ වෙලාව. You can reply later.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Sit down, Hon. Minister. Why did you give way? Hon. Amaratunga, you may continue.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉන්දියාවේ වාගේ ලංකාවේත් විද්‍යුත් ක්‍රමයට ඡන්දය පාවිච්චි කරන්න බැරි ඇයි? ඉන්දියාව ලැහැස්තියි අපට ආධාර දෙන්න. ඒක තමුන්නාන්සේම කිව්වා. ඉන්දියාව ලැහැස්තියි මේ ක්‍රමය ආරම්භ කරන්න අපට ආධාර දෙන්න. නමුත් ආණ්ඩුව ඒකට කැමැති නැහැ. අද මැතිවරණ කොමිසම පත් කරන්නේ නැහැ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, there is a point of Order being raised by the Hon. Dinesh Gunawardena.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Sir, I want to make a correction on behalf of the Government. - [*Interruption.*] Give me just a minute. මූලාසනයේ සිටින ගරු මන්ත්‍රීතුමනි, - [බාධා කිරීමක්] නැහැ, නැහැ. පොඩ්ඩක් ඉන්න.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
He is on a point of Order.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මේ රටේ කලින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හැඳුනුම් පත අනිවාර්ය කළ යුතුය කියලා වගන්තියක් තිබුණා. මේ අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හැදුවේ අපි නොවෙයි, මේ ගොල්ලන්. අර වගන්තිය අයින් කළා. එහෙම කරලා හොර ඡන්ද ලියා පදිංචි කළා. හොර ඡන්ද ලියා පදිංචි කළා. කවුද කළේ? කවුද ඒවා කළේ? තමුන්නාන්සේලා කළේ. අපි පනතක් ගෙනාවා හැඳුනුම්පත අනිවාර්ය කරන්න කියලා. එහිදී කොළඹින් පමණක් 40,000ක් හොර ඡන්ද අයින් වුණා. තමුන්නාන්සේලාගේ බෙල්ලෙන් අල්ල ගත්තා අපේ ආණ්ඩුව. [බාධා කිරීම්]

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
All right. Let the debate continue.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අපේ ආණ්ඩුව අල්ල ගත්තා යූඑන්පී එක කරපු හොරකම්. [බාධා කිරීමක්] හොර ඡන්ද ලියා පදිංචි කරලා මෙච්චර කල් දිනුවේ. හොර ඡන්ද ටික අයින් කළාම පරදිනවා හැම තැනම. හැම දාම පරදිනවා හොර ඡන්ද නැති නිසා. [බාධා කිරීමක්]

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Minister, there is no point of Order. Let the Hon. John Amaratunga continue.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ රජයට කියන්න කැමැතියි, ප්‍රජාතන්ත්‍රවාදය හෑල්ලු කෙරුවොත්, ප්‍රජාතන්ත්‍රවාදය පාගා දමන්න හැදුවොත් මැද පෙරදිග වෙච්ච දේ තමයි ශ්‍රී ලංකාවේත් වන්නේ කියලා. [බාධා කිරීම්] ඒකයි මෙතැන තිබෙන තත්ත්වය. අපි කියන්නේ තමුන්නාන්සේලාගේ හොඳට. [බාධා කිරීම්] අපි කියන්නේ මේ රටේ යහපතට. [බාධා කිරීමක්] කරුණාකරලා ඒක වැරදියට ගන්න එපා. මේ ප්‍රශ්නය හැල්ලුවට ගන්න එපා. මේවා මෙහෙම කරන්න එපා කියලා කියන්නේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්නයි. ප්‍රජාතන්ත්‍රවාදය නැති වෙච්ච තැන්වල තමයි මිනිස්සු නැඟී සිටලා, කෝලාහල කරලා, රාජ්‍ය නායකයෝ එළවලා ආණ්ඩු බිඳ දමන්න හදන්නේ. එවැනි තත්ත්වයක් මේ රටේ ඇති වන්න දෙන්න එපා. ඒකට අපි කැමැති නැහැ. අපිටත් ඕනෑ ප්‍රජාතන්ත්‍රවාදය. අද ජන මතය අනුව රාජ්‍ය නායකයෝ පත් කිරීම, පාර්ලිමේන්තුව පත් කිරීම, පළාත් පාලන ආයතනවලට නියෝජිතයෝ පත් කිරීම කෙරෙන්න ඕනෑ. ඒක සාධාරණව, අපක්ෂපාතව කරන්න තමයි කියන්නේ. [බාධා කිරීමක්]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
කවුද මේ නීතිය හැදුවේ?

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
කවුරු හැදුවත් කමක් නැහැ. වැරදි වුණා නම් වැරදි හදන්න ඕනෑ. [බාධා කිරීමක්] ඒ වැරැද්ද ආයෙත් කරන්න ඕනෑ නැහැ. [බාධා කිරීමක්] තමුන්නාන්සේ මහන්සි වෙච්ච බව අපි දන්නවා. තමුන්නාන්සේලාගේ ආණ්ඩුවෙන්ම නේ ඒක නැවැත්වූවේ. ඒ මැතිවරණ ක්‍රමය ගෙන යන්න දුන්නේ නැතිව දැන් කෑ ගැහුවාට හරි යන්නේ නැහැ. අදත් තමුන්නාන්සේගේ යෝජනාවට රජයේ අනුමැතිය ලැබිලා නැහැ නේ. මොකටද මේ අපට ඇඟිල්ල දික් කරන්නේ?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අපි පනත ගෙනත් තිබෙනවා. අපි පනත සම්මත කරනවා.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඒ ක්‍රමයට ඡන්දය තිබ්බේ නැහැ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
විවාදයක් ඕනෑ නම්, විවාදයක් දෙන්නම්.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
විවාදයක් ඕනෑ.

ගරු කරු ජයසූරිය මහතා
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)
විවාදයක් ඕනෑ. අපි දවස් දෙකක් -

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
විවාදයක් ඕනෑ. ඒකට එකඟයි. We will have a Party Leaders' Meeting tomorrow and discuss that.

ගරු කරු ජයසූරිය මහතා
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)
අපේ ආණ්ඩුව තිබෙන කාලයේ ඒ කමිටුවේ සභාපති පදවිය විපක්ෂයේ සිටි ඔබතුමාට දුන්නා. [බාධා කිරීමක්]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
වැඩ කොටසක් කළා. නමුත් විපක්ෂ නායකතුමා එකඟ වුණේ නැහැ. විපක්ෂ නායකතුමා හැම දාම වැඩේ කල් දැම්මා. හැම දාම කල් දැම්මා. අවුරුදු පහක් කල් දැම්මා.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කියා ගෙන ආවේ ප්‍රජාතන්ත්‍රවාදය සුරැකීම අප සියලු දෙනාගේම අවශ්‍යතාව බවයි. නමුත් ඒක පාගා දමන්න හදනවා නම්, ඒක හෑල්ලු කරන්න හදනවා නම් මේවා කොහෙන් කෙළවර වෙයිද කියලා අපි දන්නේ නැහැ. ඒකයි මම කියන්නේ. ඒ නිසා මැතිවරණ කොමිසම ඉක්මනින් පත් කරන්න. විද්‍යුත් ඡන්ද ක්‍රමය මේ රටේ ස්ථාපිත කරන්න. ඉන්දියාවෙත් ඒ ක්‍රමය තිබෙනවා. බංග්ලාදේශය වැනි රටවලත් ඒක කරන්න පුළුවන් නම් ශ්‍රී ලංකාව ඊට වඩා දියුණු රටක් හැටියට ඇයි අපට බැරි කියා මම අහනවා. ඊ ළඟ මැතිවරණයේදීත් මේ සිද්ධීන්ම වෙනවා නම් මේ ඡන්ද ක්‍රමය යටතේ ඡන්දයට ඉදිරිපත් වෙනවාට වැඩිය හොඳයි අපි ඒකෙන් ඈත් වෙලා වාඩි වෙලා කර බාගෙන ඉන්න එක.

ගරු දි.මු. ජයරත්න මහතා (අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு டீ.எம்.ஜயரத்ன - பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சரும்)
(The Hon. D.M. Jayaratne - Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යෝජනාව ඉදිරිපත් කළ මන්ත්‍රීතුමා මැතිවරණ කොමසාරිස්තුමා මාධ්‍ය වෙත නිකුත් කළ

නිවේදනයේ 3 වැනි ඡේදයෙන් පොඩි කොටසක් පමණයි කිව්වේ. ඒ නිසා මම එම ඡේදය සම්පූර්ණයෙන් කියවන්න ඕනෑ. 2011.03.17 වැනි දින පවත්වන ලද පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව මැතිවරණ කොමසාරිස්වරයාගේ නිවේදනය වශයෙන් මාධ්‍ය වෙත නිකුත් කළ නිවේදනයේ 3 වැනි ඡේදය සම්පූර්ණයෙන් මෙසේයි:

"නාම යෝජනා කාල පරිච්ඡේදයෙන් ආරම්භව ඡන්ද විමසීම දක්වා කාල පරිච්ඡේදය තුළ දිවයිනේ ඇතැම් ප්‍රදේශවල යම් යම් මැර ක්‍රියා සිදු වූ බවක් වාර්තා වූ අතර, විශේෂයෙන් මනාප රැස් කිරීමේ තරගය නිසා එකම පක්ෂයේ අපේක්ෂකයන් අතර ඇති වූ මනාප පොරය කැපී පෙනෙන ලක්ෂණයක් විය. එහෙත් මීට පෙර පැවැති පළාත් පාලන ආයතන ඡන්ද විමසීම්වලට සාපේක්ෂව යහපත් වාතාවරණයක් යටතේ ඡන්ද විමසීම පැවැත්විය හැකි විය..."

"යහපත් වාතාවරණයක් යටතේ ඡන්ද විමසීමට හැකි විය" කියලා සඳහන් වෙනවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

ගරු දි.මු. ජයරත්න මහතා
(மாண்புமிகு டீ.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
මේ මම කියවන්නේ මැතිවරණ කොමසාරිස්වරයාගේ ප්‍රකාශයයි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
I have been signified to speak but I have not been given the opportunity.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Your name has not been given to the Chair.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
It has been given.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
It has not been given to the Chair. Hon. Prime Minister, you can continue with your speech.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
I am on a point of Order. It cannot be - [*Interruption.*]

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Your point of Order is out of Order.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
My name has been given. The Hon. Prime Minister, please excuse me.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
You are always trying to intimidate the Chair. I warn you.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Do you want me to go? I am on a point of Order.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Even at late hours, I can ask you to withdraw from the Chamber according to the Standing Orders. Hon. Prime Minister, you can continue with your speech.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
I am on a point of Order.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
It has been declared that your point of Order is out of Order. - [*Interruption.*] I have overruled you.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
සමා වෙන්න අගමැතිතුමා - [බාධා කිරීමක්]

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
Sir, can you allow him to speak after the Hon. Prime Minister?

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
No, the Hon. Prime Minister is replying on behalf of the Government. Unless of course, the Hon. Prime Minister agrees - [*Interruption.*] His name should have been given to the Chair. - [*Interruption.*] Your name has not been given to the Chair.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I am on a point of Order.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
I have overruled you. The Hon. Prime Minister is on his feet now. - [*Interruption.*] Hon. Prime Minister, you can continue with your speech.

ගරු දි.මු. ජයරත්න මහතා
(மாண்புமிகு டீ.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
එම නිවේදනයේ තවදුරටත් මෙසේ සඳහන් වෙනවා:

"....එහෙත් ඇතැම් දේශපාලන පක්ෂ සහ කණ්ඩායම් ඡන්ද විමසීමට පෙර මෙන්ම, ඡන්ද විමසීම් දිනයෙහි හැසිරුණු ආකාරය සහ රාජ්‍ය මාධ්‍ය සහ රාජ්‍ය දේපළ පරිහරණය කළ ආකාරය කනගාටුදායකය."

මන්ත්‍රීතුමා කියපු ඒ පොඩි කොටස තමයි ඒ. එතුමා ඒක විතරයි කියෙව්වේ. අනෙක් එක, ඒ ප්‍රකාශයේ තිබෙන මේ හොඳ කොටස් ගරු මන්ත්‍රීතුමා කිව්වේ නැහැ.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
පොඩි කෑල්ල තමයි වටින්නේ.

ගරු දි.මු. ජයරත්න මහතා
(மாண்புமிகு டீ.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
එම නිවේදනයේ 3 වන ඡේදය සම්බන්ධයෙන් මැතිවරණ කොමසාරිස්වරයා කරුණු පැහැදිලි කර තිබෙනවා.

ඡන්ද විමසීමේ නීතිය හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව ඡන්ද විමසීම් කාල සීමාව තුළ පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් විසින් ක්‍රියා කළ යුතු ආකාරය, රාජ්‍ය මාධ්‍ය ඇතුළු සියලුම මාධ්‍ය විසින් පිළිපැදිය යුතු උපමාන හා රාජ්‍ය සම්පත් පරිහරණයේදී අනුගමනය කළ යුතු ආකාරය සම්බන්ධයෙන් මැතිවරණ කොමසාරිස්වරයා විසින් එක් එක් අවස්ථාවලදී නිකුත් කරන ලද උපදෙස් ඇතැම් පක්ෂ හා කණ්ඩායම් විසින් උල්ලංඝනය කර ඇති ආකාරය පිළිබඳව පක්ෂ ලේකම්වරුන් සමඟ පැවැති උපදේශක කමිටු රැස්වීම්වලදී ඉදිරිපත් වූ කරුණු සහ ඡන්ද විමසීමට පෙර හා ඡන්ද විමසීම් දින ක්‍රියාත්මක වූ පැමිණිලි භාර ගැනීමේ අංශයට ලැබුණු පැමිණිලිවලින් හෙළි කර ගත හැකි වී තිබෙනවා. එතකොට සෑම පක්ෂයක්ම වැරදි කරලා තිබෙන බව මේකෙන් පෙනෙනවා.

ඊට අමතරව ඇතැම් පොලිස් නිලධාරින්, ප්‍රාදේශීය බලවතුන්ගේ බලපෑම්වලට නතු වුණු ආකාරයද ඇතැම් සිද්ධිවලින් හෙළි වී තිබෙනවා. එසේම 1987 අංක 24 දරන පනතින් හඳුන්වා දුන් සමානුපාතික ඡන්ද ක්‍රමය මත මැතිවරණ සංස්කෘතිය සම්පූර්ණයෙන් විනාශ වූ බවත්, කෙසේ වෙතත් මෙම තත්ත්වයන් ඇති වීම ඉදිරි ඡන්ද විමසීම්වලදී වළකා ගැනීම සඳහා ඡන්ද විමසීම් ක්‍රමය සංශෝධනය කිරීමේ අවශ්‍යතාවක් තිබෙන බවත් මැතිවරණ කොමසාරිස්වරයා විසින් පෙන්වා දී තිබෙනවා.

ඔබතුමන්ලා තමයි මේ ක්‍රමය හැදුවේ. ඒ හැදුව ක්‍රමයේ විපාක තමයි ඔබතුමන්ලාටයි, අපටයි විඳින්න සිද්ධ වෙලා තිබෙන්නේ. [බාධා කිරීම්] ඉස්සර මීට වඩා හොඳ මැතිවරණ ක්‍රමයක් තිබුණා. ඔබතුමන්ලාගේ පක්ෂයට පක්ෂ දෙකක් එකතු වෙලා තිබෙනවා. එක පක්ෂයක් වැරදි 39ක් කරලා තිබෙනවා. මේ මැතිවරණයේදී අපරාධ 39ක් කරලා තිබෙනවා තමුන්නාන්සේලාගේ පක්ෂය පමණක්. එතකොට බලන්න මේ මැතිවරණයේදී කරපු ඔක්කොම වැරදි ප්‍රමාණය 221යි. ඒකෙන් තමුන්නාන්සේලාගේ පක්ෂත් ඒ විධියට වැරදි සිද්ධීන් කරලා තිබෙනවා. ආණ්ඩු පාර්ශ්වයේ පක්ෂ 38ක් තිබිලා තිබෙනවා. එක පක්ෂයක් වැරදි දෙකයි කරලා තිබෙන්නේ.

ගරු කරු ජයසූරිය මහතා
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)
ඔක්කෝම එක්කහු කරලා බලන්න.

ගරු දි.මු. ජයරත්න මහතා
(மாண்புமிகு டீ.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
තමුන්නාන්සේලාගේ පක්ෂය වැරදි 19යි. අපේ එක පක්ෂයක් වැරදි 2යි කරලා තිබෙන්නේ. ඉතින් බලන්න කෝ. ඒ වාගේ තත්ත්වයක් ඇති වෙලා තිබෙන්නේ. මම මේ ගණන් තව දුරටත් කියන්නම්.

ගරු කරු ජයසූරිය මහතා
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)
යකඩ පොලු ගේන්න එහෙම අපි උදවු කරලා නැහැ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අපි යකඩ පොලු ගෙනැල්ලා නැහැ.

ගරු දි.මු. ජයරත්න මහතා
(மாண்புமிகு டீ.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
මේ ඩිංගත් මම කියලා ඉන්නම්.

"ඒ අනුව සමානුපාතික ඡන්ද ක්‍රමය කේවල ඡන්ද කොට්ඨාස සමග වූ මිශ්‍ර නියෝජන ක්‍රමයක් දක්වා වෙනස් විය යුතු බවත්,..." යනුවෙන් එහි සඳහන් වනවා. මේ විධියට එතුමා ඒ යෝජනාව සකස් කරලා ඉදිරිපත් කරලා තිබෙනවා. ඒක ඉදිරියේදී ක්‍රියාත්මක කරන්න අපි බලාපොරොත්තු වනවා. එහි තව දුරටත් මෙසේ සඳහන් වනවා. "රාජ්‍ය හා පෞද්ගලික සියලුම මාධ්‍ය සහ සියලුම රාජ්‍ය දේපළ පරිහරණය පිළිබඳව නීති පැනවිය යුතු බවත් දන්වා ඇත. එම නීති බලාත්මක කිරීම සඳහා සහ අධීක්ෂණය කිරීම සඳහා ස්වාධීන වූත් අපක්ෂපාතී වූත් පූර්ණ බල ඇති ස්ථාවර විනිශ්චය සභාවක් පත් කළ යුතු බව ද, අදාළ පසුකටයුතු ඉටු කිරීම එම විනිශ්චය සභාව වෙත පැවරිය යුතු බව ද යෝජනා කර ඇත." ඒ, මැතිවරණ කොමසාරිස්වරයා කරන යෝජනා. එහි මෙසේද සඳහන් වනවා. "දැනට පවත්නා නීතිමය තත්ත්වයන් යටතේ මැතිවරණ කොමසාරිස්වරයාට මේ සම්බන්ධව යම් යම් උපමාන නිකුත් කිරීමක් පමණක් කළ හැකි බව පවසා ඇත. කෙසේ වුව ද මෙම ඡන්ද විමසීමේ දී, ඡන්ද විමසීම් හා ගණන් කිරීමේ කටයුතු නිදහස් හා සාමකාමී පසු බිමක් යටතේ ඉටු කළ හැකි වූ බව ද දන්වා ඇත. එබැවින්, මීට පෙර පැවති පළාත් පාලන ආයතන ඡන්ද විමසීම්වලට සාපේක්ෂව යහපත් වාතාවරණයක් යටතේ මෙම ඡන්ද විමසීම පැවැත්වීමට හැකි වූ බව ද මැතිවරණ කොමසාරිස්වරයාගේ නිවේදනයේ තවදුරටත් සඳහන් කර ඇත."

ඔන්න බලන්න. තමුන්නාන්සේලා අර විධියට කිව්වාට මොකද මැතිවරණ කොමසාරිස්වරයා ඒ විධියට ප්‍රකාශ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් බලමු, පසු ගිය මැතිවරණවලදී සිදු වෙලා තිබෙන වැරැදි ගැන. 2004 General Election එකේදී වැරැදි සිදු වෙලා තිබෙනවා 2,222ක්. 2005 දී 1,198යි. 2010 දී 1,089යි. 2010 අතිගරු ජනාධිපතිතුමා ආවාට පස්සේ 347යි. මේ මැතිවරණයේදී සිදුවීම් 221යි. බලන්න, 2,222 ප්‍රමාණය මේ වතාවේ 221ට එන කල් බැහැලා තිබෙනවා. ඒ ඇති වෙච්ච වැරැදි තත්ත්වයන් හරියට ගණන් අර ගත්තාම ඒ විධියේ තත්ත්වයක් තමයි තිබෙන්නේ.

ගරු කරු ජයසූරිය මහතා
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)
ගරු අගමැතිතුමනි, අපි බලාපොරොත්තු වනවා මැතිවරණ සමයේ රාජ්‍ය මාධ්‍යවල හැසිරීම සම්බන්ධයෙන් ඔබතුමාගෙන් පිළිතුරක්. අපි වැඩියෙන්ම කථා කරන්නේ රාජ්‍ය සම්පත් පාවිච්චි කිරීම ගැන. ඔබතුමා කිව්වේ පොඩි පොඩි සිදුවීම් ගැන. ඒවා ගණන් ගන්න එපා. රාජ්‍ය මාධ්‍ය ඡන්දය දවසේ පක්ෂග්‍රාහීව කටයුතු කළාය කියලා මැතිවරණ කොමසාරිස්තුමා සඳහන් කරලා තිබෙනවා.

ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)
මොනවාද කරලා තිබෙන්නේ?

ගරු දි.මු. ජයරත්න මහතා
(மாண்புமிகு டீ.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
මා කියපු සංඛ්‍යාවලින් පෙනෙන්නේ ඒ සිද්ධීන් බොහෝ දුරට අඩු වෙලා ගිහිල්ලා තිබෙනවාය කියන එකයි. බලන්න, තමුන්නාන්සේලාගේ එක්සත් ජාතික පක්ෂය -United National Party එක- සමඟ පක්ෂ දෙකක් වැඩ කරලා තිබෙනවා. වැරැදි 37ක් සිද්ධ වෙලා තිබෙනවා. එක්සත් ජනතා නිදහස් සන්ධානයට පක්ෂ 38ක් සහයෝගය දීලා තිබෙනවා. එක පක්ෂයකින් වැරැදි දෙකයි සිද්ධ වෙලා තිබෙන්නේ. තමුන්නාන්සේලාගේ අතින් වැරැදි 19ක් සිද්ධ වෙලා තිබෙනවා. ජනතා විමුක්ති පෙරමුණ කියන්නේ එක පක්ෂයයි. වැරැදි 31ක් සිද්ධ කරලා තිබෙනවා. අප දෙ ගොල්ලන්ටම වඩා වැඩියෙන් වැරැදි කරලා තිබෙනවා ජනතා විමුක්ති පෙරමුණ. මේ විධියට මේ ගණන් හිලවු අනුව බැලුවාම කොච්චර වැරැදි සිද්ධ වෙලා තිබෙනවාද?

ගරු කරු ජයසූරිය මහතා
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)
ගරු අගමැතිතුමනි, මම පොඩි කාරණයක් කියන්නම්.

ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)
ගරු අගමැතිතුමාට කථා කරන්න දෙන්න. [බාධා කිරීමක්]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු අගමැතිතුමාට කථා කරන්න දෙන්න කරුණාකර. [බාධා කිරීමක්]

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඡන්ද කාලයේදී සිමෙන්ති බෙදනවා; තහඩු බෙදනවා. ඒවා තමයි වැරැදි කියන්නේ. [බාධා කිරීමක්]

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! Let the Hon. Prime Minister continue with his speech.

ගරු දි.මු. ජයරත්න මහතා
(மாண்புமிகு டீ.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
මැතිවරණය වෙනුවෙන් ඒවා කළාය කියා තමුන්නාන්සේලා කියනවා නම් ඒවා අසත්‍ය ප්‍රකාශ. රජයේ වාහන පාවිච්චි කළාය, ගොඩනැඟිලි පාවිච්චි කළාය කියන කථාවල් එකක්වත් අපට පිළිගන්න බැහැ. එහෙම දෙයක් සිද්ධ වෙලා නැහැ. ඒවා අසත්‍ය ප්‍රකාශ හැටියටයි අපට ප්‍රකාශ කරන්න තිබෙන්නේ. මැතිවරණයෙන් පරදින්න ඉස්සර නම් එක දෙයක් කිව්වා. තමුන්නාන්සේලාත් කිව්වා, අපේ කරු ජයසූරිය මැතිතුමාත් කිව්වා, "අපි තමයි ජයග්‍රහණය කරන්නේ. අපි ඉතාම ඉහළින් ජයග්‍රහණය කරනවා. ආණ්ඩුව පරදිනවා." කියාලා.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
එහෙම තමයි තිබුණේ.

ගරු දි.මු. ජයරත්න මහතා
(மாண்புமிகு டீ.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
"අපි ලබන අවුරුද්දේ මහ මැතිවරණයේදී මේ ආණ්ඩුවේ පාර්ලිමේන්තු බලයත් අවසාන කරනවා. රාජ්‍ය බලය අල්ලනවා." කියලා කිව්වා. මේ ආදි වශයෙන් ඔබතුමන්ලා කිව්වා. රටේ ජනතාවට ඔය විධියට කියා ගෙන කියා ගෙන ගියා. එහෙම කියා ගෙන ගියේ වෙන මොකවත් හින්දා නොවෙයි. තමන්ගේ පක්ෂයයි, තත්ත්වයයි ආරක්ෂා කර ගන්නයි.

ඊට පස්සේ කියනවා පරදින බව දන්නවා කියලා. තමුන්නාන්සේලා දන්නවා ස්ථිර වශයෙන්ම පරදිනවා කියලා. පක්ෂය දෙකට කැඩිලා. තමුන්නාන්සේලාගේ ඔය පක්ෂයේ ඉන්න අසූ ගණනක් දෙකට බෙදා ගෙන හරිහැටි පාලකයෙක් -නායකයෙක්- හදා ගන්න බැරි පක්ෂය එක් කෝටි අනූහත් ලක්ෂයක් පාලනය කරන්නේ කොහොමද කියලා ජනතාව කල්පනා කරනවා. ඒ නිසා "අපි නම් මේ සැරේ පරදිනවා, ස්ථිර වශයෙන්ම පරදිනවා, සජිත් ප්‍රේමදාස මහත්තයාත් පරදිනවා, ඒ වාගේම රනිල් වික්‍රමසිංහ මහත්තයා ඉදිරිපත් වන්නේ නැති නිසා එහෙමම ඉන්නවා" කියන ඒවා ඔක්කොම තමුන්නාන්සේලා දන්නවා. එහෙම දැන ගෙන තමයි "අපි දිනනවා, අපි දිනනවා, අපි තමයි ඉහළින්ම එන්නේ" කියලා කියන්නේ. එහෙම කියන්නේ වෙන මොකක්වත් නිසා නොවෙයි, පරදින බව දැන ගෙනයි. පැරදුණාට පස්සේ කියනවා, "ඒ පැරදුණේ මොකද, ආණ්ඩුවේ වැරදි වැඩ පිළිවෙළ නිසා නේ. ආණ්ඩුව එහෙම කරපු හින්දා නේ පැරදුණේ. අරගොල්ලන් නිසා පැරදුණා, ඉස්කෝලවල මේක කළා, මෙහෙම තිබ්බා, ජනාධිපතිතුමා කථා කළා" කියනවා. ඒවා කියන බව දැන් මිනිස්සු දන්නවා. දිනනවා කිව්වේ ඇයි කියලා මිනිස්සු දන්නවා. ඊට පස්සේ කියන්න යන්නේ මොකක්ද කියලා මිනිස්සු දන්නවා. ජේවීපී එකත් එහෙමයි. ජේවීපී එක කිව්වා "අපි ඔක්කොම දිනනවා" කියලා. කෝ, එකක්වත් හම්බ වුණේ නැහැ. ඒ විධියට කියන්නේ වෙනත් දෙයක් නිසා නොවෙයි. පැරදුණු එකෙන් තමන් රැකෙන්න එපායැ. රටේ ඉන්න සාමාන්‍ය ජනතාවගෙන් රැකෙන්න ඕනෑ. ඇයි, මේ ගොල්ලන් පැරදුණා, පක්ෂය නැති වුණා කියන නිසා. "නැහැ, නැහැ මේ ආණ්ඩුවේ වැරැදි නිසා තමයි අපි පැරදුණේ. නැත්නම් පරදින්නේ නැහැ" කිව්වාම මිනිස්සු එහෙම පිළිගනීවි කියා මේ ගොල්ලෝ හිතනවා. දැන් ලංකාවේ මිනිස්සු එහෙම හිතන්නේ නැහැ. සියයට 94ක් උගත්තු ඉන්නේ. ඒ ගොල්ලෝ දන්නවා, මේ ගොල්ලන්ගේ පරෙස්සමට මේ වැඩ පිළිවෙළ ගෙන යනවා කියලා. නායකයාගේ ඉඳලා ඔක්කොම ඒක කියනවා. අපි දන්නවා එහෙම කියන බව. මම නම් කිව්වා "මැතිවරණවලදී එක්සත් ජාතික පක්ෂය නොවරදවාම පැරදුණාට පස්සේ ඒ ගොල්ලන් කියන්නේ මොනවාද කියලා තමුන්නාන්සේලා බලන්න" කියලා. "මේ වැරදි තත්ත්වයන් තුළ තමයි මේක වුණේ, මේ ආණ්ඩුව කරපු වරැද්ද" කියලා කියනවා. තමුන්නාන්සේලා නේ මේ ක්‍රමය හැදුවේ. දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා කියන්නා වාගේ තමුන්නාන්සේලා මේ ක්‍රමය හැදුවා. ඒ වාගේම කොමිෂන් එක පත් කරන්න අවුරුදු කීයක් උත්සාහ කළාද? විපක්ෂයෙන් දෙදෙනෙක් පත් කරන්න තිබුණා. එක සැරයකවත් පත් කරන්න පුළුවන් වුණාද? බැරි වුණ නිසා නේද අපට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කරලා මෙවැනි තත්ත්වයක් ඇති කරන්න සිද්ධ වුණේ. ඔබතුමන්ලාට කල්පනා කරන්න තිබුණා. එහෙම කරන්නේ නැතිව කියනවා, "ප්‍රජාතන්ත්‍රවාදය නැහැ, මේක වැරදිය, ඒක වැරදියි" කියලා. ඒ නිසා ඔබතුමන්ලා තමයි පළමුවැනි වැරදිකාරයෝ. අපේ අඩු පාඩුවක් තිබෙනවා නම්, අපි දෙවැනි තැනටයි ගණන් ගන්න තිබෙන්නේ. ඒ නිසා හරි මැතිවරණයක් කර ගෙන යාම අවශ්‍යයි.

[ගරු දි.මු. ජයරත්න මහතා]

සාමාන්‍ය කලබලයක්, සාමාන්‍ය තත්ත්වයන් ඇති වීම ලෙහෙසියෙන් වළක්වන්න පුළුවන්කමක් නැහැ. මිනිස්සු සෝවාන් වෙලා, සකෘදාගාමී වෙලා ඉන්නවා නොවෙයි. සාමාන්‍ය තත්ත්වයන් යටතේ කලබලකාරී තත්ත්වයන් ඇති වනවා. ලෝකයේ හැම තැනකම ඒවා ඇති වනවා. අද ලෝකයේ එහෙම නැති සමාජයක් ඇති වන්නේ නැහැ. නමුත් අපි ඒ ක්‍රම සකස් කරලා පිළියෙල කර ගත්තොත් ඒවා අවම කර ගන්න පුළුවන්. ඔබතුමන්ලා හදාපු ක්‍රමය. සදාකාලිකවම එක්සත් ජාතික පක්ෂයට බලයේ ඉන්න වුවමනා කළ නිසා ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා මේ වාගේ ක්‍රමයක් හැදුවා. එතුමාගේ කාලය බැලුවාම ලංකාවේ මැතිවරණවලදී එක්සත් ජාතික පක්ෂයට ලැබුණ ඡන්ද ප්‍රමාණය වැඩියි. එතුමා කල්පනා කළා මේ විධියේ තත්ත්වයක් තුළ සදාකාලිකව එක්සත් ජාතික පක්ෂයට බලයේ ඉන්න පුළුවන් වෙයි කියලා. නමුත් ඒක අනෙක් පැත්තට හැරිලා විනාශයට පත් වෙලා තිබෙනවා. ඒ නිසා අපි මේවා කල්පනා කර බලා තිබෙනවා. මැතිවරණයකින් පස්සේ අර වාගේ දේවල් කියන එක වැරදියි කියන්න බැහැ. තමන් බේරෙන්නත් එපායැ. ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමනි, ඔබතුමා ගමට යන්නේ කොහොමද? ගමට ගියාම අහනවා නේ "පැරදුණා නේද" කියලා. "පැරදුණා තමයි. මේ ආණ්ඩුවේ වැරැද්ද නිසා නේ. ආණ්ඩුව කරපු දේ හින්දා නේ පැරදුණේ" කියලා ඔබතුමා බේරෙන්න ඕනෑ. ගරු කරු ජයසූරිය මන්ත්‍රීතුමාත් බේරෙන්න ඕනෑ. [බාධා කිරීම්] තමුන්නාන්සේලාගේ ඇඟ බේරා ගන්න මේ වාගේ දේවල් කියන්න ඕනෑ. එහෙම නැත්නම් බැහැ නේ. කොහොම හරි බේරෙන්න ඕනෑ. ඒක අපි දන්නවා නේ. අහන කොට එහෙම කියනවා. "මෙහෙම වුණේ නැත්නම් අපි දිනනවා" කියනවා. දිනන්න තිබුණේ. ඇයි අපි කිව්වේ electionsවල. ඒක මතකද, දිනන්න තිබුණා. දැනුත් එහෙම කිව්වාම ඒක හැන්සාඩ් වාර්තාවට යනවා; හෙට පත්තරයට යනවා. එතකොට, "අපේ මන්ත්‍රීතුමන්ලා පාර්ලිමේන්තුවේ දී හොඳට කිව්වා, අපි පැරදිලා තිබෙන්නේ ආණ්ඩුව නිසා තමයි" කියලා මිනිස්සු හිතා ගන්නවා. ඒ සඳහා තමයි ඔහොම කියන්නේ. එහෙම නැතිව ඔබතුමන්ලා නොදැන කියනවා නොවෙයි. මේ වෙච්ච වැඩේ මොකක්ද කියලා කරු ජයසූරිය මැතිතුමා හොඳට දන්නවා. ඉතින් බේරෙන්නත් එපායැ. ඒවාට දොස් කියන්න බැහැ. මොනවා හරි කියලා ඇඟ බේරා ගන්න ඕනෑ. ඒක හොඳයි. එහෙම බේරෙන එක හොඳයි. එහෙම බේරෙන්න ඕනෑ කියලා මම දන්නවා. නමුත් හිතට ගන්න ඕනෑ අතීතයේදී කරලා තිබෙන වැරදි කිහිපයක් නිසා මේ වාගේ තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා කියලා. ඒ කමිටුවේ වැඩ පිළිවෙළ මෙතුමා දැන් යෝජනා කළා. ඒක ක්‍රියාත්මක කරලා මැතිවරණ තියන්න ඕනෑ කියලා ඇත්තටම අපි තීරණය කළා.

එසේ තීරණය කළත් ඒකට දීර්ඝ කාලයක් ගත වෙනවා. ඒ තත්ත්වය හොඳ නැහැ කියන එක උඩයි හදිසියේ මැතිවරණය තියන්න තීරණය කළේ. ඉදිරියේදී ඒ වැඩ පිළිවෙළ තමුන්නාන්සේලාත් එක්ක එකතු වෙලා ක්‍රියාත්මක කරන්න පුළුවන් වෙනවා.

ගරු ජෝන් අමරතුංග මහතා
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඉතිරි පළාත් පාලන ආයතන මැතිවරණ කීපය ඔය අලුත් ක්‍රමය අනුව තියනවාද කියලා මම අහන්න කැමැතියි.

ගරු දි.මු. ජයරත්න මහතා
(மாண்புமிகு டி.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)
මැතිවරණ කොමසාරිස්තුමා කියලා තිබෙන්නේ, මේ මැතිවරණය බොහොම සාධාරණව තියලා තිබෙනවා කියලායි. පසු ගිය කාලවල තිබුණු මැතිවරණවලට වඩා ඉතාම හොඳින් මේක ක්‍රියාත්මක වුණා. පොඩි පොඩි අඩු පාඩුකම් තිබෙනවා කියලා එතුමා කියනවා. ඒක හැබෑව. මේ ක්‍රමය තුළ තිබෙන වැරදි හදා ගෙන ඉදිරියට හොඳ ක්‍රමයක් ඇති කර ගන්න ඕනෑ කියලා ප්‍රකාශ කරන එකේ හැබෑවක් තිබෙන බවත් අපි පිළිගන්නවා. ඒ නිසා මීට පස්සේ අපි ඔක්කොම එකතු වෙලා ඒ මැතිවරණ ක්‍රමය හදා ගෙන නියම තත්ත්වයක වැඩ පිළිවෙළක් සකස් කර ගනිමු කියලා ප්‍රකාශ කරනවා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Thank you, Hon. Prime Minister.

Order, please! Since it was the reply by the Hon. Prime Minister I am not able to set a new precedent. But, does the House agree for two more speakers?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Then, the next speaker is the Hon. Ravi Karunanayake.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
First of all, I must state that the Assistant Secretary-General should have mentioned that my name was listed. These are matters of a customary nature. We need not beg anybody to get time allotted to us. In a circus you have clowns, stuntmen, acrobats and children. This is what happens when a

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

takes the Chair.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
You had better confine yourself to the speech, please. You cannot make remarks on the Secretariat. You continue your speech, otherwise I will stop you. You are a senior Member. By now you must know the rules of the House.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
This is a part of the speech.

අගමැතිතුමා ඉතාම ඕනෑකමින් පෙන්වුවා, මේක සාධාරණ ඡන්දයක් කියන එක. මම හිතන විධියට අගමැතිතුමා ඇත්ත වශයෙන්ම දන්නවා, මේක කොතරම් සාධාරණ ඡන්දයක්ද කියලා. ප්‍රචණ්ඩ ක්‍රියා ඇති වෙනවා කියලා රාවයක් තිබුණු නිසා ඔබතුමා නියෝජනය කරන ගම්පොල ප්‍රශ්නයක් තිබෙනවා කියලා මට කථා කරලා කිව්වා. නමුත් මගේ ආසනයේ මම ඒ වාගේ

ප්‍රචණ්ඩ ක්‍රියා වෙන්න ඉඩ දෙන්නේ නැහැ, ඒ නිසා කරුණාකරලා සිය දෙනෙක් වුණත් එවන්න කියලා ඔබතුමා කිව්වා. ඒ ගැන මම අද අගමැතිතුමාට ස්තුති කරනවා.

ගරු දි.මු. ජයරත්න මහතා
(மாண்புமிகு டீ.எம். ஜயரத்ன)
(The Hon. D.M. Jayaratne)

මොනවා හරි වැරැද්දක් තිබෙනවා නම් බලන්න ඔබතුමන්ලාගේ මන්ත්‍රිවරු එවන්න. මම ඒ අයට නවාතැන්, කෑම බීම ඔක්කොම දෙනවා. ඒ ගොල්ලන්ට බලා ගන්න කියන්න. ඕනෑ වැරැද්දක් තිබෙනවා නම්, ඇවිල්ලා මට ප්‍රකාශ කරන්න කියලා මම ඔබතුමාටම කිව්වා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මම ඒක අගය කරනවා. මම ඒක ප්‍රසිද්ධ කළේ ඒකයි. ඒ වාගේම ගම්පොල නගරාධිපති එදා වැඩ බලන නගරාධිපති වශයෙන් සිටියා. දැන් නගරාධිපති වශයෙන් පත් වෙලා තිබෙනවා. ඒ නිසා ඉතාම සාමකාමී ඡන්දයක් ඒ ප්‍රදේශයේ තිබුණා කියන එක මම පිළිගන්නවා. ප්‍රතිඵලය අනුව එක්සත් ජාතික පක්ෂය දිනුවා. ඔබතුමාගේ ඕනෑකමින් ඒ විධියට ඒ ඡන්දය තිබුණු නිසා ඒ සැබෑ තත්ත්වය පෙනෙනවා. ඔබතුමාගේ ඒ ආදර්ශවත් ගමන් පිළිවෙළ අපි අගය කරනවා. ඕක රටටම ගෙන යන්න පුළුවන් නම්, අන්න ඒ වාගේ වැඩ පිළිවෙළක් තමයි අපට අවශ්‍ය වන්නේ. අගමැතිතුමනි, ඔබතුමාට ස්තුතියි.

ඒ සම්බන්ධයෙන් තවත් දෙයක් මම කියන්න අවශ්‍යයි. දැන් මේ අවස්ථාවේදීත් අපේ නියෝජ්‍ය නායක, කරු ජයසූරිය මැතිතුමා මතක් කළා වාගේ අපේ මැතිවරණ කොමසාරිස් 17 වෙනි දා කිව්වා, "එහෙත් සමහර දේශපාලන පක්ෂ සහ කණ්ඩායම් මැතිවරණ දිනට පෙර සහ මැතිවරණ දින ක්‍රියා කළ ආකාරය සහ රාජ්‍ය සම්පත් සහ රාජ්‍ය මාධ්‍ය පාවිච්චි කළ ආකාරය ඉතා කනගාටුදායකය." කියලා. මෙය ඉංග්‍රීසියෙන් කිව්වොත් මෙහෙමයි: "But the manner in which some political parties and groups conducted themselves both before the date of poll and on the day of poll and also the misuse of State Resources and State-owned media is regrettable".

අගමැතිතුමනි, මේක තමයි ප්‍රකාශ කළේ. අද එතුමා ඉවත් කරලා තිබෙනවා. මේ කරපු ප්‍රකාශය නිසාද එතුමාව ඉවත් කරලා තිබෙන්නේ? අද මහින්ද දේශප්‍රිය මහතා ඒ තනතුරට පත් කරලා තිබෙනවා කියලා රාවයක් ගිහිල්ලා තිබෙනවා. ඒ පත් කිරීම කරලා තිබෙන එක අගමැතිතුමා දන්නවාද මම දන්නේ නැහැ. වැරදි රාවයක් අපට ලැබී තිබෙනවාද කියලාත් මම දන්නේ නැහැ. නමුත් අපි දන්නා විධියට ඒක ඇත්ත නේද, අගමැතිතුමනි? මැතිවරණ කොමසාරිස් වෙනස් කරලා තිබෙනවා. ඒ මේ ප්‍රකාශය කරපු නිසාද දන්නේ නැහැ. මැතිවරණ කොමසාරිස් කිසිම බලපෑමක් නැතිව ප්‍රකාශ කරලා තිබෙන දේකට මෙවැනි දෙයක් ඇති වෙලා තිබෙනවා නම්? ඒ තනතුර එහෙම මාරු වෙලා නැත්නම් මම මෙහෙම ප්‍රකාශ කිරීම ගැන මට කනගාටුයි. මේ වාගේ වෙනස්කමක් කරලා තිබෙනවා කියලා පාර්ලිමේන්තුවේදී මම හතරහමාරට පමණ දැනුවත් වුණා. ඇත්ත වශයෙන්ම මෙතැන ඉන්න නිලධාරි මඟින් මම කථා කරලා බලන්න හැදුවා මැතිවරණ කොමසාරිස්ගේ තනතුරේ වෙනසක් වෙලා තිබෙනවාද කියන එක. එතුමා telephone එක answer කරලා නැහැ. ඉතින් මම දන්නා විධියටයි මේ ගැන කියන්නේ. එහෙම නොවේ නම් අගමැතිතුමනි කරුණාකරලා මම කියපු දේ සංශෝධනය කරන්න.

හැබැයි ඒක නොවෙයි ප්‍රශ්නය. මෙතැන ප්‍රකාශයක් කළා, දයානන්ද දිශානායක මැතිතුමා වග කීමකින් වැඩ කරන පුද්ගලයෙක් කියලා. එතුමාට වෙනත් මත තිබෙන්න පුළුවන්. නමුත් මෙහෙම නිකුත් කරන ප්‍රකාශවල මොනවාද අන්තර්ගත වෙන්නේ අගමැතිතුමනි? ඔබතුමා බොහොම දක්ෂ ලෙස අදක්ෂ ආණ්ඩුවක් ආරක්ෂා කළා. ඒක ඔබතුමාගේ කාර්ය භාරය. නමුත් ඔබතුමා ඒ දේ කරන ගමන්ම ඇත්ත වශයෙන්ම වුට්ටක් පපුවට තට්ටු කරලා බැලුවාද මේ වාගේ ප්‍රචණ්ඩ ක්‍රියා, මේ වාගේ රාජ්‍ය මාධ්‍ය පාවිච්චි කිරීම ගැන? මම හිතන්නේ ඒ වාගේ දේවල් කරන්න අනවශ්‍යයි. ඔය කියන ශක්තිය තිබෙනවා නම් ඕවා කරන්න ඕනෑ නැහැ. අන්තිම පැයේත් රූපවාහිනිය දැම්මාම, ITN එක දැම්මාම පෙනෙන ඒවා තුළින්ම යම් ප්‍රශ්නයක් ඇති වනවා.

ඒ විතරක් නොවෙයි. ගරු අගමැතිතුමනි, ප්‍රාදේශීය සභා හාරසිය ගණනක් තිබෙනවා. මේ ප්‍රාදේශීය සභා ඡන්ද ඔක්කොම එකට පවත්වන්නට බැරි වන්නේ ඇයි? ඒ ඔක්කොම එකට පැවැත්වූවා නම් ප්‍රශ්නයක් නැහැ නේ අගමැතිතුමනි. කොළඹ මහ නගර සභාව, දෙහිවල-ගල්කිස්ස නගර සභාව ආදී මේ ඔක්කොම සභාවල ඡන්ද එකට පැවැත්වූවා නම් මේ ප්‍රශ්නය නැහැ. එහෙම එකට පවත්වන්නේ නැති එකෙන් ප්‍රශ්න ඇති වෙනවා. නාම යෝජනා ප්‍රතික්ෂේප වෙනවා. ප්‍රතික්ෂේප වුණාට පස්සේ උසාවි යනවා. අවුරුදු හතකට ඉස්සෙල්ලා කොළඹ මහ නගර සභාවේ නාම යෝජනා ප්‍රතික්ෂේප වුණාම අපි උසාවි ගියා. ඒක පැරදුණා. ඊට පස්සේ අපි ශබ්ද කළේ නැහැ.

අද අපේ මිත්‍ර ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාගෙන් මම ඇහුවා, කොළඹ මහ නගර සභාව වෙනුවෙන් corporation එකක් ද, department එකක්ද මොකක්ද හදන එක ගැන. ඒ වාගේ SMS එකක් මට එව්වා. අර කලින් එක වාගේ හරි තොරතුරක්ද, වැරදි තොරතුරක්ද කියන්න මා දන්නේ නැහැ. වැරදි නම් මාව නිවැරදි කරන්න පුළුවන්. නොදන්නා නිසායි ඇමතිතුමාගෙන් ඇහුවේ. එතුමා කිව්වා, "ඔව්. පහක් ඒකාබද්ධ කරලා එකක් හදනවා" කියලා. මොකක්ද මේ කරන දෙය? එක පැත්තකින් ඒවා විසුරුවා හැර තිබෙනවා. අනෙක් පැත්තෙන් ඡන්දය කල් දමා තිබෙනවා. මොකක්ද මේ තිබෙන ප්‍රශ්නය?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු මන්ත්‍රීතුමා මේ ගැන සඳහන් කළ නිසා මම කියන්න ඕනෑ. රජය පළාත් පාලන ආයතනවල ඡන්දය පවත්වනවා. ඡන්දය පිළිබඳ ගැටලුවක් නොවෙයි තිබෙන්නේ. මේ රටේ සංවර්ධනයට අදාළ සමහර ව්‍යාපෘති කරන්න තනි සභාවකට බැරි වුණාම, - [බාධා කිරීමක්] That is all. That is for development purposes.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Okay. I agree. Thank you very much.

ඒක අපි අගය කරනවා. ඒ වාගේ ඒවාට අපිත් සහයෝගය දෙනවා. ඒකට ප්‍රශ්නයක් නැහැ. ඉන්දියාවේ, ඒ වාගේම නිව්යෝක් නුවර, වොෂින්ටන් නුවර ඒ විධියට තිබෙනවා. ඒ වාගේ ආදර්ශවත් මට්ටමට කරනවා නම් හොඳයි. නමුත් දේශපාලනයෙන් පත් වන ඒ මන්ත්‍රීවරු නිකම් කුක්කෝ බවට පත් කරලා, ඊට උඩින් military rule එකකින් පාලනය කරනවා නම් අපි ඒක ප්‍රතික්ෂේප කරනවා. කොළඹ මහ නගර සභාවේ ගෙවල් හැටපන්දහස් පන්සියයක් කඩන්න නියෝග කර තිබෙන විධියට කරන්න ඉඩ දෙන්න එපා. කොළඹ දිස්ත්‍රික්කය ඔබතුමා නියෝජනය කරන දිස්ත්‍රික්කය; මම නියෝජනය කරන දිස්ත්‍රික්කය.

මේ අවස්ථාවේදී ගරු අගමැතිතුමා කිව්ව දෙය මම ප්‍රතික්ෂේප කරන්නේ නැහැ. එතුමා මම බොහොම ආදරය කරන, ගරු කරන අගමැතිතුමෙක්. නමුත් ඇත්ත වශයෙන්ම නිදහස් දවසේ අපේ නියෝජ්‍ය නායක කරු ජයසූරිය මැතිතුමාටත්, දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාටත්, මටත් ගැහුව ආකාරය! පොලීසියෙන් ගැහුවේ.

[ගරු රවි කරුණානායක මහතා]

බල බලා ගැහුවේ. "වන් නයින් වන්" එකක් එක්ක ගිහින් ක්‍රියා කළ ආකාරය! ඒ ගැන අදටත් විමසිල්ලක්වත් කරලා නැහැ. අපි ගිහින් පොලිස් මූලස්ථානයේ complain කරලා තිබෙනවා. මොකක්ද මේ සම්බන්ධයෙන් තමුන්නාන්සේලා කරලා තිබෙන්නේ? කවුරු ගැනද අපි කථා කළේ? සරත් ෆොන්සේකා මහතා වෙනුවෙන් අපි කථා කළේ. අසාධාරණ අන්දමට අද සිර ගෙදර ඉන්න පුද්ගලයා වෙනුවෙන් බොහොම සාමකාමීව විරෝධතා රැළියක් පැවැත්වීමක් කළේ. ඒකද අපි කළ වැරැද්ද? මේ ඡන්ද කාලයේ වුණු දේවල්. මෙය ඡන්දයට සම්බන්ධ දෙයක්. [බාධා කිරීම්] ඔන්න ඉතින් බලන්නකෝ. අපි නිදහස් දිනයේ, - [බාධා කිරීම්] ඔබතුමා කියන්නේ අපේ නියෝජ්‍ය නායකතුමාත්, මාත් නිකම් ඔහේ, - [බාධා කිරීම්]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

රටේම අභිමානවත් දිනය. ඉතින් කට්ටියක් රට ගිහින් එක එක කඩාකප්පල්කාරී, - [බාධා කිරීම්]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

නිදහස් දිනයේ අවසර තිබෙනවාද ඔය විධියට ගහන්න? මොකක්ද ලජ්ජා නැති වැඩක් කර, -[බාධා කිරීම්] මම හිතන්නේ නැහැ අගමැතිතුමා ඒකට අවසර දෙයි කියලා. මගේ රථ වාහනය විනාශ කළා. ඒ වාගේමයි කරු ජයසූරිය මැතිතුමාගේ; දයාසිරි ජයසේකර මැතිතුමාගේ. [බාධා කිරීම්] ඒ නිසා ගරු අගමැතිතුමනි, මීට වඩා හිතට ගන්න. අද ඔබතුමන්ලා ඉන්නේ ආණ්ඩුවේ. බොහොම සතුටින් සිටිනවා. හෙට විපක්ෂයට යන්නට පුළුවන්. එවැනි අවස්ථාවකදී අපි ඔය වාගේ වැඩ කළොත් කැමැතිද? නැහැ. කැමැති වන්නේ නැහැ. කරු ජයසූරිය මැතිතුමා ඉන්න ආණ්ඩුවක, අපි ඉන්න ආණ්ඩුවක ඔය වාගේ දේවල් වුණොත් අපි තමයි ඒවා ඉස්සෙල්ලාම ප්‍රතික්ෂේප කරන්නේ. කදිර්ගාමර් මැතිතුමා ආණ්ඩුවේ ඉඳලා විපක්ෂයට ගියාම කාර් විසි දෙකක් දුන්නේ අපි. මතක තියා ගන්න. එකම ඉල්ලීමයි කළේ. එල්ටීටීඊ ත්‍රස්තවාදය තිබුණා; ඉල්ලීමක් තිබුණා.

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Hon. Member, you have to wind up.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

එදා ඉල්ලීමක් කළා. ඒ ඉල්ලීමට අපි උත්තර දුන්නා. ඒ සම්බන්ධයෙන් කියන්නේ ගරු අගමැතිතුමා, ලක්ෂ්මන් කදිර්ගාමර්, - [බාධා කිරීම්]

මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! I now call upon the Hon. A.P. Jagath Pushpakumara to speak because the Opposition has already exhausted its time. Five minutes more have been given to the Opposition.

ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා (පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார - தெங்கு அபிவிருத்தி, மக்கள் தோட்ட அபிவிருத்தி அமைச்சர்)
(The Hon. A.P. Jagath Pushpakumara - Minister of Coconut Development and Janata Estate Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඉතාම සතුටින් බලා ගෙන සිටියා, එක්සත් ජාතික පක්ෂයේ ඊයේ පැවැති රැස්වීමේදී රවි කරුණානායක මැතිතුමාත් නියෝජ්‍ය නායකතුමකු හැටියට පත් වෙලා ගරු කරු ජයසූරිය මැතිතුමාත් එක්කම මේ ගරු සභාවේ කටයුතු කරයි කියලා. [බාධා කිරීමක්] සජිත් ප්‍රේමදාස මහත්මයා? [බාධා කිරීම්] අහගන්න කෝ. එතුමා ඔබතුමාගේ නියෝජ්‍ය නායකයා නොවෙයි? මම කියන දේට උත්තර දෙන්න කෝ. එතුමා නැද්ද? එතුමා ඔබතුමාගේ නියෝජ්‍ය නායකයා නොවෙයි. ඒක තමයි මට දැන ගන්න ඕනෑ. [බාධා කිරීම්]

ඒ කියන්නේ දැන් රවි කරුණානායක මැතිතුමා කියනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෘත්‍යාධිකාරී මණ්ඩලයෙන් පත් කරපු සජිත් ප්‍රේමදාස මහත්තයා එතුමාගේ නියෝජ්‍ය නායකයා නොවෙයි කියලා. ඉතින් මට ඒක පැහැදිලි කර ගන්න ඕනෑ නේ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

එහෙම නොවෙයි මම කිව්වේ. මම කිව්වේ නැහැ එහෙම. ඔබතුමා නේ කිව්වේ.

ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)

දැන් මේ ඡන්ද ක්‍රමය ගැන කථා කරන කොට විශේෂයෙන් මේ කරුණ කියන්න ඕනෑ. මේ ඡන්ද ක්‍රමය වෙනස් කළේ කවුද කරු ජයසූරිය මැතිතුමනි? තමුන්නාන්සේලා නේ වෙනස් කළේ. ඡන්දය දමන කොට, හැඳුනුම් පත අනිවාර්ය කරන කොට ඒක වෙනස් කළේ තමුන්නාන්සේලා නේ; තමුන්නාන්සේලාගේ පක්ෂය නේ. ඒක පිළිගන්න ඕනෑ නේ. ඊට පස්සේ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ හැඳුනුම් පත අනිවාර්ය කළේ අපේ ආණ්ඩුව ආවාට පස්සේ නේ කරු ජයසූරිය මැතිතුමනි. ඉස්සර කෝට්ටේ ඡන්ද කොට්ඨාසයට ඡන්දය තිබුණු අය ලියා පදිංචි කරනවා උතුරු කොළඹ ඡන්ද කොට්ඨාසයේත්. බොරැල්ලෙත් ලියා පදිංචි කරනවා. තුන් හතර පොළක ඡන්දය දමනවා. මේ වාගේ හොරට දමපු ඡන්ද ලක්ෂ ගණනක් නැති වුණා. මේ ඡන්ද හොරට පාවිච්චි කරන්න බැරි වුණ දවසේ ඉඳලා එක්සත් ජාතික පක්ෂය පරාජයට පත් වුණ බව අපි පැහැදිලිව මේ අවස්ථාවේදී මතක් කරන්නට කැමැතියි. ඒ නිසා අද යූඑන්පී එකට කථා කරන්න දෙයක් නැහැ.

කරු ජයසූරිය එක්සත් ජාතික පක්ෂ නියෝජ්‍ය නායකතුමනි, මම ඔබතුමාගෙන් මේ කරුණ දැන ගන්න කැමැතියි. ඊයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය රැස් වුණා. ඔබතුමන්ලාගේ පක්ෂයේ නායකයාව පත් කළා. නියෝජ්‍ය නායකවරු දෙපොළක් පත් කළා. -කරු ජයසූරිය මැතිතුමාට මම සුබ පතනවා. අද රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ උපන් දිනය. එතුමාටත් සුබ උපන් දිනයක් ප්‍රාර්ථනා කරනවා.- ඒ වාගේම නියෝජ්‍ය නායකයකු හැටියට සජිත් ප්‍රේමදාස මැතිතුමාවත් පත් කළා. එක්සත් ජාතික පක්ෂයේ ව්‍යවස්ථාව අනුව නියෝජ්‍ය නායක තනතුරු කීයක් තිබෙනවාද?

ගරු කරු ජයසූරිය මහතා
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)

ගරු ඇමතිතුමනි, අපි අදාළ ප්‍රශ්නයට යමුද? මැතිවරණය ගැන කථා කරමු.

ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)
නැහැ, නැහැ. ප්‍රශ්නය මටත් දැන ගන්න ඕනෑ. ඒකත් ඡන්දයක්. මම මේ ඡන්දය ගැන කථා කරන්නේ. [බාධා කිරීමක්] ඒකත් ඡන්දයක්. ඊයේ ඒ තනතුරු ඡන්දයෙන් පත් කරන්න ගියේ. මට පැහැදිලි කර ගන්න ඕනෑ. කරු ජයසූරිය මැතිතුමනි, ඔබතුමා එක්සත් ජාතික පක්ෂයේ නියෝජ්‍ය නායකතුමා. ඔබතුමාට මම ගරු කරනවා නේ. ඔබතුමාට මම හැම දාම ගරු කරනවා නේ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපේ ප්‍රශ්න අපි බලාගන්නම්. ඔබතුමා ඒ ගැන කලබල වන්න එපා.

ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)
නැහැ, මම මේ අහන්නේ ඒකත් ඡන්දයක් නේ. මම කරු ජයසූරිය මැතිතුමාගෙන් දැන ගන්න කැමැතියි, ඔබතුමාගේ පක්ෂයේ -ඔබතුමාගෙන් නේ මේ පක්ෂය ගැන අහන්න ඕනෑ.- එක්සත් ජාතික පක්ෂයේ ව්‍යවස්ථාව අනුව නියෝජ්‍ය නායක තනතුරු කීයක් තිබෙනවාද?

ගරු කරු ජයසූරිය මහතා
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)
මේ විවාදය ඉවර වුණාම ඒක පැහැදිලි කරලා දෙන්නම්.

ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)
මට දැන ගන්න කියන්න කෝ. ඒක ඡන්දයක් නේ. මේ බොරු කරන්න එපා. අර මනුස්සයාව රැවැට්ටුවා. අපි දන්නවා, එතුමා රැවටෙන බව. රවි කරුණානායක මහත්තයා මට කිව්වා, "අපි එයාට අන්දනවා" කියලා. රවි කරුණානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා නේද?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම කිව්වේ නැහැ අන්දනවා කියලා.

ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)
ඔබතුමා කිව්වා නේ, "අපි එයාට අන්දනවා" කියලා. [බාධා කිරීමක්]"සජිත්ට අන්දනවා" කියලා ඔබතුමා කිව්වා නේ. නේද? [බාධා කිරීමක්] ඒක තමයි. මම කියන්නේ රවි කරුණානායක මහත්තයා කිව්වා. [බාධා කිරීමක්] එක්සත් ජාතික පක්ෂයෙන් ඡන්දය ඉල්ලපු අපේක්ෂකයෝ පෝස්ටර් එකක ඔබතුමාගේ නම දාලා ඉල්ලුවාද? අපේක්ෂකයාගේ ෆොටෝ එක ගහනවා, පක්ෂයේ නායකයා හැටියට රනිල් වික්‍රමසිංහ මහත්තයාගේ ෆොටෝ එක නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම එක තැනකවත් රවි කරුණානායක මහත්තයාගේ ෆොටෝ එකක් දැක්කේත් නැහැ, කරු ජයසූරිය මහත්තයාගේ ෆොටෝ එකක් දැක්කේත් නැහැ. හැබැයි හම්බන්තොට දිස්ත්‍රික්කයේ හැම අපේක්ෂයකුගේම පෝස්ටරයක ඒ දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුගේ ෆොටෝ එකක් තිබුණා. නේද, රවි කරුණානායක මන්ත්‍රීතුමනි?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඡන්දය ගැන කථා කරන්න.

ගරු කරු ජයසූරිය මහතා
(மாண்புமிகு கரு ஜயசூரிய)
(The Hon. Karu Jayasuriya)
පළාත් පාලන මැතිවරණය ගැන කථා කරන්න.

ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)
ඡන්දය ගැන කියන්නේ. පළාත් පාලන මැතිවරණය ගැන මේ කථා කරන්නේ. [බාධා කිරීමක්] මම පළාත් පාලන මැතිවරණය ගැන කථා කරන්නේ. පළාත් පාලන මැතිවරණය වෙලාවේදී අඩු ගණනේ තමුන්නාන්සේලාගේ පක්ෂයේ නායකයාගේ ආශීර්වාදය ගන්න, එක අපේක්ෂකයකුවත් එතුමාගේ ෆොටෝ එකක් side එකකින් ගහලා තිබුණේ නැහැ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එහෙම ගහලා තිබුණා නම් අපටත්- [බාධා කිරීමක්]

ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)
මොකක්ද?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා කියන විධියට අපි- [බාධා කිරීමක්]

ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)
ඉතින් ඒක නේ. රවි කරුණානායක මන්ත්‍රීතුමා කියනවා, එහෙම කරපු නිසා - රනිල් වික්‍රමසිංහ මහත්තයාගේ ෆොටෝ එක ගැහුවේ නැති නිසා, කරු ජයසූරිය මහත්තයාගේ ෆොටෝ එක side එකෙන් ගැහුවේ නැති නිසා, රවි කරුණානායක මහත්තයාගේ ෆොටෝ එක ගැහුවේ නැති නිසා - පරාද වුණා කියලා පිළිගන්නවා කියලා? ඉතින් දැන් මෙතැන හොර වංචාවක් වෙලා නැහැ නේ. ඔබතුමන්ලා කියන්නේ සජිත් ප්‍රේමදාස මහත්තයාගේ ෆොටෝ එක ගහලා ඡන්දය ඉල්ලපු නිසා පරාදයි කියලා. රවි කරුණානායක මහත්තයා එහෙම කියනවා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ, නැහැ. එහෙම කිව්වෙ නැහැ.

ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)
දැන් ඔබතුමා එහෙම නේ කිව්වේ. මම තමුන්නාන්සේලාට කියනවා, සාධාරණ ඡන්ද ගැන කථා කරන්න එපා කියලා. 1981 දී දිස්ත්‍රික් සංවර්ධන සභා මැතිවරණය තිබ්බේ කොහොමද? කවුද, තමුන්නාන්සේලාගේ පක්ෂයේ සභාපතිතුමා?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
කවුද?

ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)
කවුද? මම අහන්නෙත් ඒකයි. මම දන්නේ නැහැ නේ. ඊයේ නේ පත් කළේ. කවුද, සභාපතිතුමා? ඔබතුමන්ලාගේ පක්ෂයට ඊයේ පත් වෙච්ච සභාපතිතුමා දන්නේ නැද්ද? මම අහන්නේ දැන ගන්න. යාල් දේවි කෝච්චියෙන් යාපනයට ගිහිල්ලා, බලහත්කාරකමෙන් ඡන්ද පෙට්ටි පුරවපු ඉතිහාසයක් එක්සත් ජාතික පක්ෂයට තිබෙන්නේ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඡන්දය ගැන කථා කරන්න කෝ.

ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)
අපි ඡන්දය ගැන කථා කරන්නේ. එක වචනයක් ඡන්දයෙන් පිට කථා කරන්නේ නැහැ. සංවර්ධන සභා මැතිවරණයේදී ඡන්ද පෙට්ටි පුරවපු ඉතිහාසයක් තිබෙන්නේ. 1988-89 භීෂණ සමයේ හමුදාව, පොලීසිය අරන් ගිහිල්ලා ඡන්ද පෙට්ටි පුරවපු තමුන්නාන්සේලා සාධාරණත්වය ගැන කථා කරනවා; ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරනවා. මට මතකයි, 2001 මැතිවරණයේදී කොළඹ දිස්ත්‍රික්කයෙන් මනාප 1,60,000ක් ගත්ත එක්සත් ජාතික පක්ෂයේ අයට 2004 මැතිවරණයේදී මනාප 60,000ට අඩු වුණු හැටි. ඒ කොහොමද? නොයෙක් ආකාරයෙන් සල්ලි දීලායි. ඡන්ද ගත්තේ සල්ලි බෙදලායි. දැන් තමුන්නාන්සේලා කියනවා, සල්ලි බෙදුවාලු, එළුවා බෙදුවාලු, බල්ලා බෙදුවාලු, කුකුළා බෙදුවාලු. සල්ලි බෙදා ඡන්ද ගත්තු ඉතිහාසයක් එක්සත් ජාතික පක්ෂයට තිබෙනවා. ඒ නිසා මම කියනවා, තමුන්නාන්සේලා අනුන්ට එක ඇඟිල්ලක් දික් කරන කොට තමුන්නාන්සේලාගේ පැත්තට ඇඟිලි හතරක් දික් වෙනවාය කියා. ඒක අමතක කරන්න එපා. [බාධා කිරීමක්] එදා පැවති රජය තුළ තමුන්නාන්සේලාට කර ගන්න දෙයක් නැති වුණා. අපේ හිටපු ජනාධිපතිතුමිය ඉස්සරහයි ඒ ඡන්දය තිබුණේ. එතුමිය රටේ විධායක ජනාධිපතිතුමිය, ආරක්ෂක ඇමතිතුමිය. ඒ නිසා තමුන්නාන්සේලාට මොකක්වත් කර ගන්න බැරි වුණා. එහෙම පුළුවන් වුණා නම් තමුන්නාන්සේලා අපට ඉඩ දෙයි. අසූ අටේදීත් එහෙමද? අසූහතේ, අසූ අටේ, අසූනවයේ මැතිවරණ තිබුණේත් එහෙමද? 2004 දී තමුන්නාන්සේලාගේ ආණ්ඩුවක් තිබුණත් රටේ ආරක්ෂක ඇමතිතුමිය වෙලා හිටියේ කවුද? විධායක ජනාධිපති වශයෙන් රට පාලනය කළේ කවුද? තමුන්නාන්සේලාට ඕනෑ හැටියට නටන්න හම්බ වුණේ නැහැ. [බාධා කිරීමක්] සමා වෙන්න. ගරු කරු ජයසූරිය මන්ත්‍රීතුමනි, අපි ඔබතුමාට හැම දාම සලකනවා. මේ රට බේරා ගන්න යුද්ධයක් කරන අවස්ථාවේදී තමුන්නාන්සේ අපත් එක්ක එකතු වෙලා මේ රට බේරා ගන්න අතිගරු ජනාධිපතිතුමාට ශක්තිය දීම සම්බන්ධයෙන් අප තුළ ඔබතුමා ගැන විශාල ගෞරවයක් තිබෙනවා. හැබැයි ඔබතුමා අදත් මේ පැත්තේ සිටියා නම් ආණ්ඩුවේ මුල් පෙළේ වැජඹෙන ජ්‍යෙෂ්ඨම ඇමතිවරයා ඔබතුමා. අපට කනගාටු අන්න ඒ ගැනයි. ඒ නිසා නැවත අපේ පැත්තට එන්නය කියා අපි ඔබතුමාට ආරාධනා කරනවා. කිසිම ප්‍රශ්නයක් නැහැ. අපි ඔබතුමාට සලකනවාය කිව්වේ ඒක නේ. අතිගරු ජනාධිපතිතුමා සමඟ මේ රට දියුණු කරන්න ගරු කරු ජයසූරිය මැතිතුමාට නැවත මේ පැත්තට එන ලෙසට අපි ආරාධනා කරනවා.

යුක්තිය සාධාරණත්වය ගැන කතා කරන්න එපා. ඡන්ද ගැන එක්සත් ජාතික පක්ෂයට තිබෙන්නේ ඒ තරම් හොඳ අතීතයක් නොවෙයි. ඡන්ද කල් දැම්මේ කවුද අපිද? ලාම්පු - කළ ගෙඩි සෙල්ලම් දැම්මේ අපිද? ඒ නිසා පිටු ගණනක් තිබෙන මේ වාර්තාවේ එක ඡේදයක් පෙන්වා, පොඩි වැරදි එකක් දෙකක් පෙන්වා ජනතාව නොමඟ යවන්න, රටට වැරදි පණිවුඩයක් දෙන්න සූදානම් වෙන්න එපාය කියා හිටපු ඇමතිවරයෙක් වශයෙන් අපි ගරු කරන ගරු කරු ජයසූරිය මැතිතුමාගෙන් ඉල්ලා සිටිමින් මගේ කතාව අවසන් කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 7.09ට, 2011 මාර්තු 25 වන සිකුරාදා අ. භා. 1.00 වන තෙක් කල් ගියේය.

அதன்படி பி. ப. 7.09 மணிக்கு பாராளுமன்றம், 2011 மார்ச் 25, வெள்ளிக்கிழமை பி. .ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Adjourned accordingly at 7.09 p.m. until 1.00 p.m. on Friday, 25th March, 2011.

සැ.යු.

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

NOTE

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to be Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

Contents of Proceedings :

Final set of manuscripts
Received from Parliament :

Printed copies dispatched :

දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.

சந்தா ; ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

Subscriptions : The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year . Late applications for subscriptions will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.